

වාර්ෂික වාර්තාව
2012

ශ්‍රී ලංකා වරාය අධිකාරිය



අපේ දැක්ම

ආසියානු කලාපයේ ප්‍රමුඛ සමුද්‍රික සේවා සැපයුම් මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව අත්පත් කර ගෙන ඇති තත්ත්වය තවදුරටත් ශක්තිමත් කර ගැනීම.

අපේ මෙහෙය

විශිෂ්ඨ සේවාවක් හා ලොව පිළිගත් පහසුකම් තුළින් අපගේ ලාභදායිතාවය හා ගණුදෙනුකරුවන් සමුදාය ඉහළ නංවාලීම.

අපේ ඉලක්කයන් සහ සාමූහික අරමුණු	3
වැදගත් මෙහෙයුම් තොරතුරු	5
වැදගත් මූල්‍ය තොරතුරු	8
අපේ අමාත්‍යවරුන්	9
සභාපතිතුමාගේ සමාලෝචනය	10
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්	12
කළමනාකරණ කමිටුව සහ විගණන කමිටුව	19
ව්‍යාපාර සංවර්ධනය	21
පොදු පරිපාලනය	22
මෙහෙයුම් සමාලෝචනය	25
මූල්‍ය සමාලෝචනය	75
සංස්ථාපිත සමාජමය වගකීම්	79
මානව ප්‍රාග්ධනය	80
අවදානම් කළමනාකරණය	82
සංයුක්ත පාලන වාර්තාව	85
වරාය සංඛ්‍යාලේඛන	90
වැදගත් සංධිස්ථාන	94
මූල්‍ය ප්‍රකාශ සටහන්	98
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	99
මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	101
විගණන කමිටු වාර්තාව	102
ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය	103
මෙහෙයුම් වැදගත් කරුණු	104
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	105
මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සවිස්තරාත්මක ආදායම	106
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	107
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	108
මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන්	109
ප්‍රස්ථාරික සමාලෝචනය	149
විගණකාධිපති වාර්තාව	152
විගණකාධිපති වාර්තාවට පිළිතුරු	166
සංස්ථාපිත තොරතුරු	180

අපේ ඉලක්කයන්

- ශ්‍රී ලංකාව සමුද්‍රික කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථාපනය කිරීම.
- බහළු මෙහෙයුම් සහ දකුණු ආසියා කලාපයේ සේවා සැපයුම් සඳහා ජාත්‍යන්තර මහා පරිමාන කේන්ද්‍රීය වරායක් ලෙස කොළඹ වරායේ පිහිටීම තහවුරු කිරීම.
- වාණිජ වරාය සේවාවන් සළසන අතරතුර වඩා ප්‍රියජනක මගී යාත්‍රා ගමනාන්තයක් ලෙස ගාල්ල වරාය සඳහා සැළසුම් සකස්කිරීම.
- නාවික කර්මාන්තය සඳහා පූර්ණ සේවාවක් සළසන අතරතුර මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ජාත්‍යන්තර නිදහස් කළාප/වරාය සහ සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් ලෙස පුළුල් කර වැඩි දියුණු කිරීම.
- විවේක කාලය ගතකිරීම සඳහා උසස් තත්ත්වයේ පහසුකම් සහ කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාජ්ත කරන ලද පහසුකම් සමහින් ත්‍රිකුණාමලය වරාය හරිත වරායක් ලෙස වැඩිදියුණු කිරීම.
- කලාපීය සංවර්ධන ක්‍රියාදාමය සඳහා පිවිසුම් මාර්ග ලෙස ඔලුවිල්, පේදුරුතුඩුව සහ කන්කසන්තුරේ කලාපීය වරායයන් සංවර්ධනය කිරීම.

සාමූහික අරමුණු

- ශ්‍රී ලංකාවේ වාණිජ වරායන් වඩාත් නවතම උපකරණ මහින් මෙහෙයුම් පහසුකම් වර්ධනය කිරීම හා අඛණ්ඩව පවත්වා ගෙනයාම.
- ඵළදායී සහ කාර්යක්ෂම අයුරින් වරාය සේවාවන් පවත්වා ගෙනයාම.
- පිරිවැය ඵළදායී කාර්යක්ෂම සහ විශ්වාසදායී සේවාවක් සැලසීම තුළින් ආනයන සහ අපනයනකරුවන්ට තරඟකාරීමය වශයෙන් වඩා වාසිදායක තත්ත්වයක් උදාකරදීම.
- නැව්, නැව්බඩු, වරාය සේවාලාභීන් සහ වරාය යටිතල පහසුකම්වල ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සහතික කිරීම.
- වරාය ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ සැමට හිතකාමී කාර්යය සහ සේවා පරිසරයක් සැලසීම.
- රජයේ ජංගම හා ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට දායකවීම.
- කඩිනමින් නැව්වල වැඩ නිමකිරීම තුළින් උසස් මට්ටමේ ඵළදායීතාවයක් පවත්වා ගෙන යාම.
- වැඩි රැකියා අවස්ථාවන් උත්පාදනය කිරීම සඳහා සමුද්‍රික කටයුතු හා සම්බන්ධ ආනුෂාංගික සේවාවන් වැඩි දියුණු කිරීම.
- වරාය සේවාලාභීන් සඳහා උසස් මට්ටමේ සේවාවන් සළසමින් වාණිජ වරායන් තුළ ලාභදායී මෙහෙයුම් ක්‍රියාදාමයක් පවත්වා ගෙන යාම තුළින් විශ්වාසදායී කාර්යක්ෂම මෙහෙයුම්කරුවෙකු ලෙස කීර්තිය වර්ධනය කර ගැනීම.

- අන්තරාල වෙළඳාම් හා බැඳුම්කර කටයුතු ඇතුළත්ව ප්‍රති නැවිගත කිරීමේ අවස්ථාවන් තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා බහළු මෙහෙයුම් සම්බන්ධයෙන් තරහකාරී හා උසස් මට්ටමේ සේවාවන් සැලසිම.

- සමුද්‍රාසන්න ප්‍රදේශ සංවර්ධනයේ ගාමක බලය ලෙස ක්‍රියාත්මක වීම පිණිස අවශ්‍ය කරන වරාය පහසුකම් සැලසීම තුළින් ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා දායකවීම.

- මිනිස් බල අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ පිරිස් බල අවශ්‍යතා ප්‍රතිශෝධනය ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන හා සංවිධානමය කාර්යයන් වැඩි දියුණු කිරිම. විදේශ රැකියා මඟින් රටේ ආර්ථිකයට සැළසෙන වාසීන් සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය වැටුප් රහිත නිවාඩු මත විදේශ රැකියා සඳහා යාමේ පිළිවෙත තව තවත් දිරි ගැන්වෙනු ඇත. මෙම යෝජනා ක්‍රමය තුළින් පැන නගින පුහුණු සේවක අවශ්‍යතාවයන් සැලසීම සඳහා මහපොළ අභ්‍යාස ආයතනය වැඩිදුර පුහුණු කිරිම් සහ නැවත පුහුණු කිරීම් කරනු ලැබේ.

- දියඹේදී සිදු කරනු ලබන සේවාවන්, යාත්‍රාවලට තෙල් සැපයීමේ කටයුතු, පිරිසිදු ජල සැපයුම් හා බහළු අළුත්වැඩියාවන් වැනි වරාය විෂය ක්ෂේත්‍රයට අදාළ සේවාවන් සැපයිම තුළින් විවිධාංගීකරණය කිරිම.

- ඉහළ බදු කාර්යක්ෂමතාවය, වඩා යහපත් ආයතනික ආයෝජන කළමනාකරණය හා වඩා දැඩි පිරිවැය පාලනයෙන් යුතු කළමණාකාරීත්වය මත පදනම් වූ මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම.

නෞකා පැමිණීම (සියළුම වරායයන්)

විස්තරය	2011	2012	වෙනස (%)
කොළඹ වරාය	4,124	3,870	-6.2
ත්‍රිකුණාමලය වරාය	126	161	27.8
ගාල්ල වරාය	73	69	-5.5
කන්කසන්තුරය, මයිලිඩ්ඩි, පේදුරුතුඩුව, හා කරෙයිනගර්	26	44	69.2
මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය	9	34	277.8
එකතුව	**4,358**	**4,178**	**-4.1**

සමස්ථ නැව් බඩු මෙහෙයුම් ප්‍රමාණය (සියළුම වරායයන්)

විස්තරය	2011	2012	වෙනස (%)
සමස්ථ නැව් බඩු ප්‍රමාණය මෙ.ටෝ.මිලියන	65.1	65.0	-0.2

කොළඹ වරාය බහළු මෙහෙයුම් (විස්සේ සම ඒකක)

විස්තරය	2011	2012	වෙනස (%)
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රීලවඅ)			
ආනයන	323,712	324,509	0.2
අපනයන	323,770	340,782	5.3
ප්‍රති නැව්ගත කිරීම්	1,583,195	1,584,985	0.1
නැවත අඩුක්කු කිරීම	68,769	66,573	-3.2
එකතුව	**2,299,446**	**2,316,849**	**0.8**
එස් ඒ ජී ටී (SAGT)			
ආනයන	200,078	183,537	-8.3
අපනයන	199,326	171,427	-14.0
ප්‍රති නැව්ගත කිරීම්	1,540,633	1,479,782	-3.9
නැවත අඩුක්කු කිරීම	23,404	35,525	51.8
එකතුව	**1,963,441**	**1,870,271**	**-4.7**
කොළඹ වරාය			
ආනයන	523,790	508,046	-3.0
අපනයන	523,096	512,209	-2.1
ප්‍රති නැව්ගත කිරීම්	3,123,828	3,064,767	-1.9
නැවත අඩුක්කු කිරීම	92,173	102,098	10.8
එකතුව	**4,262,887**	**4,187,120**	**-1.8**

කොළඹ වරාය නැව් බඩු ගොඩබෑම් (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

විස්තරය	2011	2012	වෙනස (%)
බහළුගත	15,317	15,460	0.9
තොග කඩන	692	608	-12.1
වියළි තොග	2,618	2,709	3.5
දියර තොග	4,499	4,835	7.5
එකතුව	**23,126**	**23,612**	**2.1**

කොළඹ වරාය නැව් බඩු පැටවුම් (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

විස්තරය	2011	2012	වෙනස (%)
බහළුගත	12,795	13,242	3.5
තොග කඩන	30	10	-66.7
වියළි තොග	2	0	-100.0
දියර තොග	66	3	-95.5
එකතුව	**12,893**	**13,255**	**2.8**

කොළඹ වරායෙන් මෙහෙය වූ සමස්ථ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

විස්තරය	2011	2012	වෙනස (%)
බහළුගත	28,112	28,702	2.1
තොග කඩන	722	618	-14.4
වියළි තොග	2,620	2,709	3.4
දියර තොග	4,565	4,838	6.0
එකතුව	**36,019**	**36,867**	**2.4**

ත්‍රිකුණාමලය වරායෙන් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

විස්තරය	2011	2012	වෙනස (%)
ගොඩබෑම්	2,337	2,646	13.2
පැටවීම්	237	213	-10.1
එකතුව	**2,574**	**2,859**	**11.1**

ගාල්ල වරායෙන් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

විස්තරය	2011	2012	වෙනස (%)
ගොඩබෑම්	464	422	-9.1
පැටවීම්	0	0	-
එකතුව	**464**	**422**	**-9.1**

කන්කසන්තුරෙයි, මයිලිඩ්ඩි, පේදුරුතුඩුව හා කරෙයිනගර් වරායයන්හි මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

විස්තරය	2011	2012	වෙනස (%)
ගොඩබෑම්	28	60	114.3
පැටවීම්	0	0	-
එකතුව	**28**	**60**	**114.3**

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායෙන් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

විස්තරය	2011	2012	වෙනස (%)
ගොඩබෑම්	05	17	240.0
පැටවීම්	10	3	-70.0
එකතුව	**15**	**20**	**33.3**

සමස්ථ සේවක සංඛ්‍යාව

විස්තරය	2011	2012	වෙනස (%)
කොළඹ වරාය	10,083	9,373	-7.0
ත්‍රිකුණාමලය වරාය	466	436	-6.4
ගාල්ල වරාය	433	391	-9.7
එකතුව	**10,982**	**10,200**	**-7.1**

සියළුම වරායයන්

(රු.මිලියන)

විස්තරය	2012	2011යළි ප්‍රකාශිත	වෙනස (%)
ආදායම හා වියදම			
සමස්ථ ආදායම	38,097.8	31,085.8	22.6
සමස්ථ වියදම	26,009.4	(23,472.4)	(10.8)
මෙහෙයුම් ලාභය	**12,088.4**	**7,613.3**	**58.8**
විදේශ ණය මත පොලී	(1,709.7)	(1,371.8)	(24.6)
විදේශ විනිමය (පාඩු)/ලැබීම්	(4,566.9)	(3,390.1)	(34.7)
ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනාවේ වියදම්	(600.4)	(2,594.6)	76.9
බදුවලට පෙර සහ විදේශ විනිමය ලැබීමෙන් පසු (පාඩු)/ ලාභ	**5,211.4**	**256.9**	**(1,928.8)**
බදු			
ආදායම් බදු	-	-	-
සැළකි ලාභාංශ බද්ද	(1,124.7)	(175.6)	(540.5)
විලම්භීත බදු	-	-	-
සමාජ වගකීම් බදු	(0.6)	(0.1)	(500.0)
ආදායම් බදු	-	(24.1)	100.0
බදු ප්‍රතිපාදන සැලසීමෙන් පසු ශුද්ධ ලාභය/පාඩුව	**4,086.1**	**57.1**	**7,056.0**
ශේෂ පත්‍රය			
ජංගම නොවන වත්කම්	214,072.5	205,678.4	4.1
ජංගම වත්කම්	35,218.3	17,075.8	106.2
ජංගම වගකීම්	15,644.2	14,475.4	(8.1)
ස්කන්ධගත සහ අනෙකුත් ප්‍රාග්ධන	7,591.4	7,591.4	(0.0)
වෙන්කිරීම් හා ප්‍රතිපාදන	70,060.9	67,515.1	(3.8)
ජංගම නොවන බැරකම්	155,994.3	133,172.3	(17.1)
අනුපාත			
ආදායමට මෙහෙයුම් මහින් ලාභ	31.7	24.5	
වාර්ෂික ආදායමේ වර්ධනය	22.6	9.9	
ප්‍රාග්ධන යෙදවුම් මත ලාභය	6.7	0.3	

අතිගරු මහින්ද රාජපක්ෂ
ශ්‍රී ලංකා ජනාධිපති
සහ වරාය හා මහාමාර්ග අමාත්‍ය

ගරු රෝහිත අබේගුණවර්ධන
වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය

ගරු නිර්මල කොතලාවල
වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය

නිරන්තරයෙන්ම කණ්ඩායමක් ලෙස විශිෂ්ඨ තත්ත්වයේ සේවයක් ඉටුකිරීම ඉහළ කාර්යය සාධනයටත්, උසස් තත්ත්වයටත්, ඵලදායිකත්වය වැඩි දියුණු කිරීමටත්, පිරිවැය අඩු කිරීමටත් හේතුවන බව 2012 වසර තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සනාථ කර ඇති අතර කාර්යය සාධනය ඉහළ දැමීමට මෙන්ම අති විශාල සාර්ථකත්වයක් ලභාකාර ගැනීමටත් ඉවහල් වී ඇත. මෙහිදි ව්‍යාපාරික සාර්ථකත්වය උදෙසා කණ්ඩායමක් ලෙස දක්වන ලද උද්‍යෝගය මම වඩාත් අගයකොට සලකමි. වරායේ සියළුම කටයුතු වර්ධනය කරගැනීමෙහිලා කාර්යයසාධනය නඟාසිටුවීමේදී කායීක්ෂමතාවය වැඩිදියුණු කිරීම මෙන්ම අපගේ ගණුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඉක්ම යන පරිදි ඵලදායකත්වය වැඩි දියුණු කිරීම සාක්ෂාත් කර ගැනීමටත් හැකි විය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාරික සාර්ථකත්වය ඉටුකිරීමෙහිලා ප්‍රත්‍යස්ථිතිකතාවය හා නම්‍යතාවය ප්‍රධාන මූලික බලවේග දෙකක් ලෙස වෙනස් වන තත්ත්වයන් කෙරෙහි භාවිතා කළහැකි වීම මාගේ බලවත් විශ්වාසය වේ. මනා යහපාලනය, විනිවිදභාවය, වරාය ව්‍යාපෘති සම්බන්ධ සීඝ්‍ර සංවර්ධනය පිළිබඳ වගවීම මෙන්ම පවත්නා යටිතල පහසුකම් නඟා සිටුවීම, වත්කම් වර්ධනය යන කරුණු අනුව ගුණාත්මක මෙන්ම සංඛ්‍යාත්මක කාර්යයසාධනය පිළිබඳව ප්‍රසිද්ධියක් ලබාදීම මෙහිදි වැදගත් වේ.

කාර්යය සාධනය

මෙහෙයුම් සහ මූල්‍යමය තිරසරභාවය දියුණු කිරීමෙහිලා ගෝලීය ආර්ථිකයේ පවත්නා කැළඹිලි ස්වභාවය බලපෑම් තිබියදී පවා මනා අන්දමින් සකස් කරන ලද පස් වසරක සංවර්ධන සැලැස්ම දියත් කරන ලද බව මම සතුටින් ප්‍රකාශ කරමි. කොළඹ වරාය කෙරෙහි ප්‍රධාන සහ පෝෂක නාවික සේවාවන් ආකර්ශනය කරගැනීම වසර තුළදී සමාලෝචනය කරන ලද අතර අපගේ සේවයේ විශිෂ්ඨත්වය සහ සාර්ථකත්වය අපගේ හිතවත් ගණුදෙනුකරුවන්ගේ පිළිගැනීමට මෙන්ම ගෞරවයට ද පාත්‍ර වී ඇත. තවද 2012 වසර තුළදී ඇතිකරගන්නා ලද පර්යන්ත සේවා ගිවිසුම් තුළින් අපගේ මෙහෙයුම් දක්ෂතාවය මෙන්ම වැඩිදියුණු කරන ලද කායීක්ෂමතාවයන් හෙලිකර ඇත. මෙහෙයුම් දක්ෂතාවයන් වර්ධනය කිරීමෙහිලා බහළු ගබඩා කිරීමේ ධාරිතාවය මෙන්ම මනා ලෙස නඩත්තු කිරීම සහ නැව් බඩු බහළු මෙහෙයවීම උදෙසා සාර්ථක ප්‍රතිචාර දැක්වීම පිණිස පිහිටුවන ලද නව්‍ය පද්ධතීන් විශාල ලෙස වැඩිදියුණු කර ඇත. මෙවැනි විවිධ ක්‍රමෝපායන් තුළින් අප විසින් ඵලදායකත්වය වැඩිදියුණු කර ඇති අතර වරාය මෙහෙයුම් කටයුතු හැකියාවන් ද වර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බහළු ධාරිතාවයන් අති විශාල වර්ධනයක් පෙන්නුම් කරයි.

2012 වසර තුළ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළු පර්යන්ත වලින් මෙහෙය වන ලද සමස්ථ මෙහෙයුම් ධාරිතාවය ඉකුත් වසරේ එම පර්යන්ත වලින් ඉටුකරන ලද පරිමාවන් හා සසඳන විට 0.8%ක වර්ධනයක් දැකගත හැකිවේ. 2012 වසරේදී මෙහෙය වන ලද ප්‍රති අපනයන ප්‍රමාණය විස්සේ සම ඒකක 1,584,985ක් වූ අතර මෙය 2011 මෙහෙය වන ලද විස්සේ සම ඒකක 1,583,195 සමඟ සසඳන විට 0.1%ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. දේශීය බහළු ධාරිතාවයේද 2.8%ක වැඩිවීමක් පෙන්නුම් කර ඇති අතර විස්සේ සම ඒකක 665,291ක ප්‍රමාණයක් මෙහෙයුම් කර ඇත. ඉකුත් වසරේ මෙහෙයුම් කරන ලද ප්‍රමාණය විස්සේ සම ඒකක 647,482ක් පමණි. මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ මෙම අභිවෘධිය සළකා බලන විට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විස්සේ සම ඒකක 2,316,849ක වාර්තා ගත වී ඇති අතර මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙය වන ලද ඉහළම බහළු ධාරිතාවය වේ. සමස්ථයක් වශයෙන් සලකන විට ශ්‍රී ලංකා වරාය අධිකාරිය 55.3%ක බහළු ධාරිතාවයක් මෙහෙයවීමෙන් දායකත්වයක් ලබා දී ඇති අතර 2011 වසරේදී මෙම දායකත්වය 53.9%ක් විය.

මූල්‍ය

සියළුම මෙහෙයුම් අංශ වල ප්‍රගතිය සමඟ 2012 වසර තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රසංසාත්මක මූල්‍ය කාර්යය සාධකත්වයක් පිළිඹිබු කරයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම 2011 වසර තුළ දී රුපියල් බිලියන 31.08ක් වූ අතර 2012 වසර තුළ දී උපයන ලද රුපියල් බිලියන 38.1ක මුදල සමඟ සසඳන විට 22.6%න් වැඩි වී ඇත. දැඩි පිරිවැය පාලනය පිළිබඳ ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් ලාභය වැඩි කිරීමේ දායකත්වයක් ලබාදිය හැකි විය. වාසිදායක මූල්‍යමය ලාභයන් තුළින් ඇතැම් යටිතල පහසුකම් සංවර්ධනයට මෙන්ම සමුද්‍රික අංශයේ තරඟකාරී ක්ෂේත්‍රයක් ඇති කිරීමේ අදහසින් සංවර්ධනය ව්‍යාපෘති හඳුන්වාදීමේ පහසුකම් දියත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

සංවර්ධන ව්‍යාපෘති

කොළඹ වරායේ ධාරිතාවය පුළුල් කිරීමේ අභිලාෂයෙන් දීර්ඝකාලීන සහ මධ්‍ය කාලීන වරාය සංවර්ධන ක්‍රමෝපායක් ලෙස කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වසර තුළ දී සාර්ථක අන්දමින් කළමනාකරණය කරන ලදි. නැගෙනහිර පර්යන්තය සහ දකුණු පර්යන්තය ඉදිකිරීමේ කටයුතු කඩිනමින් නිම කිරීමේ පරමාර්ථයෙන් ආරම්භ කරන ලද අතර දකුණු වරායේ මෙහෙයුම් කටයුතු පිළිවෙලින් 2013 සහ 2014 වර්ෂයන්හි දී ඇරඹීමට අපේක්ෂිතය.

2012 වර්ෂය පුරාම මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ව්‍යාපෘතියේ දෙවැනි අදියර සතුටුදායක ලෙසින් පවත්වාගෙන යනු ලබන අතර වරාය ආශ්‍රිත කර්මාන්ත රාශියක් ස්ථාපනය කොට එම කර්මාන්ත මෙහෙයුම් කිරීම ඇරඹීම සඳහා අත්‍යවශ්‍ය පහසුකම් සැපයීම කරගෙන යනු ලැබේ. මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ මෙහෙයුම් කර්තව්‍යයන් වාහන රැගත් නෞකා විශාල සංඛ්‍යාවක් මෙහෙයුම් කිරීම මගින් වර්ධනය කර ඇත.

තෙල් ටැංකි සංකීර්ණය ඇතුළු නැව් තෙල් සැපයීමට අදාළ සියළුම පහසුකම් සපුරා ඇති අතර මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායට සේන්දු වන සියළුම සමුද්‍ර යාත්‍රා වලදී නැව් තෙල් සැපයීම 2013 වසර තුළදී ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත. ඔලුවිල් වරායේ ඉදිකිරීම් කටයුතු නිමා කොට ඇත. ත්‍රිකුණාමලය සහ ගාල්ල වරායේ සංවර්ධන කටයුතු දැනට සීඝ්‍ර ලෙස සිදුවෙමින් පවති.

මානව සම්පත් සංවර්ධනය

ඕනෑම සංවිධානයක සියළුම මෙහෙයුම් කටයුතු සම්බන්ධ කරනු ලබන වඩාත් වැදගත් මූලිකාංගයන්ගෙන් එකක් වන්නේ මානව සම්පත්ය. මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියේද සාර්ථකත්වය රඳා පවත්නා වැදගත් ස්ථම්භයක් වේ. ව්‍යාපාරික ජයග්‍රහණ සාක්ෂාත් කරගැනීම උදෙසා අපගේ අභිප්‍රායන් ළඟාකර ගැනීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්ගේ කාර්යසාධන මට්ටම සහ සේවා තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහාත් නිපුණතා සහ අභිප්‍රේරණයන් සංවර්ධනය කරනු පිණිස විවිධ උපක්‍රම ක්‍රියාත්මක කරන ලදි. 2012 වසර තුළදී කොළඹ වරායෙන් බලාපොරොත්තු වූ සාර්ථක ප්‍රතිඵලදායකත්වය ලබාගනු වස් දැනුම නිපුණතා සහ ආකල්ප දියුණු කිරීමේ ප්‍රතිඵල ලෙස ඵලදායක අන්දමේ කණ්ඩායම් වැඩ පාරිභෝගිකයා මුල්කර ගත් මිත්‍රශීලී ආකල්ප සහ පවරන ලද කටයුතු වල සාර්ථක කාර්යසාධනය වර්ධනය කිරීමෙහිලා මානව සම්පත් ක්ෂේත්‍රයේ ක්‍රමානුකූල සංවර්ධන කටයුතු සිදුකරන ලදි.

සමාප්තිය

වරාය සංවර්ධන ව්‍යාපෘති සහ පවතින පහසුකම් ක්‍රියාත්මක කිරීමේදී අතිගරු ජනාධිපතිතුමන් විසින් ලබාදුන් මාහැඟි උපදෙස් නොමැකිව මෙම සියළුම විශිෂ්ඨ වූ සාර්ථකත්වයන් යථාර්ථයක් බවට පත්කරගත නොහැකි වනු ඇත. එතුමන්ගෙන් ලද සහයෝගය සහ මහපෙන්වීම පිළිබඳව මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනැමීමට මම මෙම අවස්ථාව උපයෝගී කරගනිමි. තවද 2012 වර්ෂය සාර්ථක කර ගැනීමට නොමසුරු අදහස් ලබාදුන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාට අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලයට අපගේ විධායක නිළධාරින්ට ශ්‍රම බලකායට වෘත්තීය සමිති වලට අපගේ වටිනා පාරිභෝගිකයන්ට හා වෙනත් සියළුම වරාය හා සම්බන්ධ කටයුත්ත කරන්නන් හට ද මාගේ ස්තූතිය පිරි නමමි.

මහා පැබ්ලෝ පිකාසෝ පවසන පරිදි "සියළුම සාර්ථකත්වයන් කෙරෙහි බලපානුයේ ක්‍රියාව නම් වූ මූලිකාංගය වේ" යන්න 2012 වර්ෂයේදී අප විසින් ඔප්පුකර ඇති අතර ජාත්‍යන්තර සමුද්‍රික නෞකා ජාලය තුළ වැදගත් සංකේතයක් ලෙස අප වරාය පත්කරනු පිණිස අප සියළුදෙනා එක්ව කටයුතු කළයුතු බව සඳහන් කරනු කැමැත්තෙමි.



ආචාර්ය ප්‍රියත් බී වික්‍රම
සභාපති

ආචාර්ය ප්‍රියත් බී වික්‍රම
සභාපති

ආචාර්ය උපාධිය (එංගලන්තය), පශ්චාත් උපාධි (ඩිප්ලෝමාව), විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) උපාධිය, වරලත් ඉංජිනේරු, එම්අයිඊ (ශ්‍රී ලංකා)

සුක්කානම නෞකාවක් මෙහෙය වන අන්දමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය නව්‍යතම මාර්ගයකට යොමු කළ පුරෝගාමියෙකු ලෙසින් ද, එන්ජිමක් නෞකාවක් බලගන්වන සේ ශ්‍රී ලංකා වරාය අංශයේ දැක්ම ඉදිරියට ගෙන යන නායකයෙකු ලෙසින් ද, නෞකාවක අවර පෙත්ත නැවක් ඉදිරියට යොමු කරන්නා සේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර නාවික ක්ෂේත්‍රයේ කැපී පෙනෙන සන්ධිස්ථානයක් බවට පත් කළ කැපී පෙනෙන වෘත්තිකයෙකු ලෙසින් ද නෞකාවක් සාර්ථක අන්මින් දීර්ඝ ගමනක් නිමාකරන්නා සේ ද ආචාර්ය වික්‍රම ශ්‍රී ලංකා නාවික ක්ෂේත්‍ර ඉතිහාසයේ විප්ලවීය වෙනසක් සිදුකරන ලදි.

සහජ ශක්තියෙන් යුත් උද්‌යෝගිමත් පුරෝගාමියෙකු ලෙස ආචාර්ය ප්‍රියත් බී වික්‍රම මහතා 2008 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ලෙස කටයුතු කරන අතර ඔහුගේ නවෝදාත්මක දර්ශනය හා අතිවිශිෂ්ට ව්‍යවසාය පිළිබඳ චින්තනය අනුව ශ්‍රී ලංකා සමුද්‍රික පසුබිම කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමේ නියැලි සිටී. ඔහුගේ මෙම හැකියාව තවදුරටත් ශක්තිමත් කරමින් එක්සත් රාජධානියේ ජාත්‍යන්තර ඇමරිකානු විශ්ව විද්‍යාලය මෙහෙයුම් කළමනාකරණය සඳහා වූ ආචාර්ය උපාධිය පිරිනමා ඇත.

මොරටුව විශ්ව විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු ගෞරව උපාධියක් ලබාගත් ආචාර්ය වික්‍රම මහතා තුළ ඉංජිනේරු සංකල්ප මෙන්ම සමුද්‍රික කටයුතු පිළිබඳ ඔහු තුළ ඇති පර්යාලෝකය එකට මුසුකර ගැනීමේ සුවිශේෂී දක්ෂතාවයක් ඇත. සිය හැකියාවන් මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රී ලාංකීය නාවික ඉතිහාසයේ අරඹන ලද දැවැන්තම සංවර්ධන ව්‍යාපෘතීන් දෙකක් වන හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතිය හා කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ මගින් නව වෙළඳ අවස්ථා බිහිකිරීම හරහා දකුණු ආසියාවේ තරඟකාරී පරිසරයක් ඇති කිරීමට හැකි වී ඇත.

සිය දූරදර්ශී නායකත්වය තවදුරටත් ලබාදෙමින් 100%ක් වරාය අධිකාරියට අයත් 2002 වසරේ සංස්ථාපිත කරන ලද ජයබහළු පුද්ගලික පර්යන්තයේ සභාපති ලෙස හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන සහාය සේවා සැපයුම්කරු වන වරාය කළමනාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගමේ සභාපති වශයෙන් ද ඔහු සේවය කරනු ලබයි.

ඔහු නාගරික සංවර්ධන අධිකාරිය, සීමාසහිත චෝටස් ඒජ් සමාගම, සීමාසහිත කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත සමාගම යන ආයතනයන්හි අධ්‍යක්ෂ ලෙස විවිධ ව්‍යාපාරික අංශයන්ගෙන් කැපී පෙනෙන ව්‍යාවසායකයෙකු ලෙස හඳුනාගෙන ඇත.

අන්තර්ජාතික වරාය හා තොටුපල සංගමයෙහි වරාය සැළසුම් හා සංවර්ධන කමිටුවේ සාමාජිකයෙකු ලෙස ඔහුගේ නිපුණතාවයන් ජාත්‍යන්තර තලයේ පිළිගැනීමට ලක් වී ඇත. ආර්ථික උන්නතිය සාක්ෂාත් කරලීම සඳහා කරන ලද දායකත්වය වෙනුවෙන් හොංකොං හා ෂැංහයි සමාගම **(HSBC)** මගින් පිරිනමනු ලබන 2010 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම තාරුණ්‍යයට හිමි සම්මානයෙන් ආචාර්ය වික්‍රම මහතා පුදනු ලැබී ය. එසේම ජාතික සංවර්ධනය උදෙසා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පෙන්වා ඇති විශිෂ්ටත්වය වෙනුවෙන් දක්වා ඇති නායකත්වය සඳහා ජාත්‍යන්තර සිංහ සමාජය විසින් පිරිනමනු ලබන 2011 වසරේ විශිෂ්ටතම පුරවැසියා සම්මානයෙන් ද, මැද පෙරදිග හා ඉන්දියානු උප අර්ධද්වීප කළාපයන්හි මුහුදු වෙළඳාම සම්බන්ධ හොඳම තරුණයාට හිමි සම්මානයෙන් ද පුදනු ලැබීය.

ඉන්දික කරුණාජීව මහතා
උප සභාපති

සොලිසිටර් (එ.රා.), එල්එල්එම් (වර්වික්)
නීතිඥ

කරුණාජීව මහතා 2010 ජුනි මසදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබීය. තවද, ඒ මහතා ශ්‍රී ලංකාවේ ගරු ජනාධිපතිතුමන්ගේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා වශයෙන් ද කටයුතු කරනු ලබයි.

කරුණාජීව මහතා කොළඹ රාජකීය විද්‍යාලයේ දී මූලික අධ්‍යාපනය හදාරන ලදී. ඒ මහතා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ දී සිය නීති අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කළ අතර 2000 වර්ෂයේ දී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් සිය වැඩ කටයුතු ආරම්භ කළේය.

කරුණාජීව මහතා පොදු අන්තර්ජාතික නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය එක්සත් රාජධානියේ වර්වික් (Warwick) විශ්ව විද්‍යාලයේ දී හදාරන ලද අතර 2003 වර්ෂයේ දී ගෞරව සහිතව උපාධිධාරියෙකු විය. විශේෂයෙන් ඔහු අපරාධ හා බුද්ධිමය දේපළ නීතිය සම්බන්ධව අධිකරණයන්හි දී නඩු කටයුතු ප්‍රගුණ කළේය.

ඒ මහතා එංගලන්තයේ සහ වේල්සයේ සොලිසිටර්වරයෙකු ද වන්නේය.

2006 ජුලි මාසයේ සිට 2010 මැයි මාසය දක්වා ඒ මහතා එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය උපදේශකවරයා වශයෙන් පත්කරනු ලැබීය.

කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා
කළමණාකාර අධ්‍යක්ෂ

මාස්ටර් මැරිනර්, එම්බීඒ, එම්එන්අයි, එම්සීඅයිඑල්ටී

කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් ශ්‍රී ලංකා නැව් සංස්ථාවට සම්බන්ධ වී බහළු නෞකා, සාමාන්‍ය නැව් බඩු නෞකා, තොග නැව් බඩු නෞකා, තෙල් සහ ගෑස් ටැන්කර් නෞකා වල යාත්‍රා කළේය.

1985 වසරේ දී ඔහු ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්හි සමුද්‍රීය විද්‍යාව සහ නාවුක යාත්‍රා පැදවීම පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගන්නා ලදී. Chepstow and Shipping - එක්සත් රාජධානිය, V Ships - මොන්ටිකාලෝ, Ahrenkiel - ජර්මනිය, Pan Ocean - කොරියාව වැනි ප්‍රධාන නැව් සමාගම් රාශියක සහ ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ කපිතාන්වරයෙකු ලෙස වසර ගණනාවක් නැව් ගමනාගමනයේ නිරතවීමෙන් අනතුරුව 1990 වසරේදී වරාය නියමුවරයෙකු ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියට එක්විය.

නියමුවරයෙකු ලෙස කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල යන සියළු වරායයන්හි සේවය කිරීමෙන් අනතුරුව ඒ මහතා 1999 වර්ෂයේ දී සියළුම වරායයන්හි හාබර් මාස්ටර් ලෙස උසස් කරන ලදී.

විවිධ වකවානු තුළ ඉහළ කළමණාකාරීත්වයේ ඉල්ලීම් පරිදි ඒ මහතා හාබර් මාස්ටර් තනතුරේ රාජකාරි කටයුතු වලට අමතරව සමුද්‍රීය කර්මාන්තය හා සම්බන්ධ මෙහෙයුම් කටයුතු, ආරක්ෂාව සහ සේවා සැපයුම් වැනි විශේෂිත වූ කාර්යයන්හි ද නිරත වන ලදී.

ඉන්පසු 2005 වසරේ දී ඔහු අධ්‍යක්ෂ මෙහෙයුම් ලෙස ද, 2006 වසරේ දී අතිරේක කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස ද උසස්වීම් ලැබීය. දැනට ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ ධුරය හොබවයි.

කපිතාන් කැප්පෙටිපොළ මහතා ජයබහළු පර්යන්ත (JCT), දකුණු ආසියා ගේට්වේ පර්යන්තය (SAGT) සහ කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත (CICT) සමාගම්හි ද අධ්‍යක්ෂ වේ. ඔහු එක්සත් රාජධානියේ නාවික ආයතනයේ (ශ්‍රී ලංකා ශාඛාවේ) හිටපු සභාපතිවරයා මෙන්ම සේවා සැපයුම් හා වරලත් ප්‍රවාහන ආයතනයේ සාමාජිකයෙකු ද වේ. ඔහු 2007/2010 කාලය තුළ ලංකා ඛණිජතෙල් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ද විය.

කපිතාන් කැප්පෙටිපොළ මහතා ඩෙක් නිලධාරි පරීක්ෂක වශයෙන් වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයට අනුයුක්තව සිටී.

වෛද්‍ය සංජය සේදර සෙනරත්
විධායක අධ්‍යක්ෂ

වෛද්‍ය සංජය සේදර සෙනරත් මහතා මාතර රාහුල විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබීය. පාසැල් දිවිය තුළ ජනාධිපති බාලදක්ෂයෙකු වශයෙන්, පාඨශාලීය වර්ණලාභියෙකු හා ශ්‍රී ලංකා වර්ණලාභියෙකු වශයෙන් මෙන්ම විදුහලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා වශයෙන් ලද පන්නරය ඔහුගේ පරිණත ජීවිතය සඳහා පිටිවහලක් විය. එමඟින් ලද පසුබිම තුළ මාතර රාහුල විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ කොළඹ ශාඛාවේ සභාපති වශයෙන් පත්වීමට ඒ මහතාට අවකාශ සැලසිණ.

උසස් පෙළ විභාගයෙන් පසු ඔහු නීති විද්‍යාලයට ඇතුලත් විය. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය හදාරමින් සිටිය දී රුසියාවේ මොස්කව් නුවර **"පීපල්ස් ප්‍රෙන්ඩ්ෂිප්"** විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබීමට සෙනරත් මහතාට ශිෂ්‍යත්වයක් ලැබුණු අතර එහිදී වෛද්‍ය උපාධිය මෙන්ම රුසියානු භාෂාව ඉගැන්වීම පිළිබඳ උපාධියක් ද හිමිකර ගැනීමට ඒ මහතාට හැකිවිය.

වෛද්‍ය උපාධිය ලැබීමෙන් අනතුරුව වෛද්‍ය සෙනරත් මහතා මාතර මහ රෝහලේ වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් සේවය කළේය.

ඉන් අනතුරුව රුසියාවේ මොස්කව් නුවර ව්‍යාපාර පරිපාලන අධ්‍යාපන ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ඒ මහතා ලැබීය.

වෙනත් සාර්ථකත්වයන්

රුසියාවේ මොස්කව් නුවර **"පීපල්ස් ප්‍රෙන්ඩ්ෂිප්"** විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර ශිෂ්‍ය සංගමයේ ලේකම් වශයෙන් පත්වීම හා වඩාත්ම කැපී පෙනෙන ශිෂ්‍යයා (විදේශ ශිෂ්‍ය අංශය 1995) වීම.

සෙනරත් මහතා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පුළුල් ජාත්‍යන්තර විවරණයක් ලබා ඇති අතර විදේශ විනිමය ආයෝජන ව්‍යාපාර කිහිපයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. සමූහ ව්‍යාපාර කිහිපයක් සාර්ථක අයුරින් මෙහෙයවීම හා සමාජ සුභසාධන ව්‍යාපෘති ගණනාවක් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ දක්ෂිණ දේශය තුළ පවත්වා ගෙන යාමට මැදිහත් වීම.

වෛද්‍ය සෙනරත් මහතා 2007 වසරේ අප්‍රේල් මස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්කරනු ලැබූ අතර පසුව අධිකාරියේ විධායක අධ්‍යක්ෂ ධුරයට පත්වීම් ලැබීය. ඉන් අනතුරුව ඒ මහතා ගාලු වරායේ නිරීක්ෂණ අධ්‍යක්ෂවරයා වශයෙන් හා කොළඹ වරායේ ඉඩම් සංවර්ධන ව්‍යාපෘතියේ සම සභාපති වශයෙන් ක්‍රියාශීලි කාර්යභාරයක නිරතව ඇත.

ශ්‍රී ලංකාවේ භූගෝලීයමය වශයෙන් පවත්නා වාසිදායක පිහිටීම ප්‍රයෝජනයට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උන්නතිය සඳහා ලොව නන් දෙස පවත්නා ව්‍යාපාරික අවස්ථා ලංකාව වෙත ග්‍රහණය කර ගැනීමේ ගවේෂණාත්මක කාර්යයෙහි ඒ මහතා උත්සුකව නිරතව සිටී.

අනුර ජයවික්‍රම මහතා
අධ්‍යක්ෂ

ලේකම්
ක්‍රීඩා අමාත්‍යාංශය

1982 වර්ෂයේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබාගත් අනුර ජයවික්‍රම මහතා 1984 ශ්‍රී ලංකා පරිපාලන සේවයට සම්බන්ධ විය. 2012 වර්ෂයේ ලේකම්වරයෙකු වශයෙන් ක්‍රීඩා අමාත්‍යාංශයට සම්බන්ධ වීමට ප්‍රථම ඔහු වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය හා වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන්හි පරිපාලන තනතුරු කිහිපයක් දරා ඇත.

ඔහු දකුණු ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් (Flinders) විශ්ව විද්‍යාලයෙන් ප්‍රතිපත්ති සහ පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ගත්තේය.

පරිපාලනය පිළිබඳ අතිමහත් නිපුණතාවයක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ විශේෂ ශ්‍රේණියේ නිලධාරිවරයෙකු වශයෙන් සුවිශේෂී වැඩ කිරීමේ පලපුරුද්දක් ඔහු සතුව ඇති අතර, දැනට ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි.

අනුර ජයවික්‍රම මහතා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කළේය.

ඒස්. ආර්. ආටිගල මහතා
අධ්‍යක්ෂ

නියෝජ්‍ය ලේකම්
මහා භාණ්ඩාගාරය

ආටිගල මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ගණිත අංශයෙන් විද්‍යාවේදී සහ එක්සත් රාජධානියේ, වර්වික් (Warwick) විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිධාරියෙකු වේ.

වසර ගණනාවක් ඔහු මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයෙකු ලෙස කටයුතු කළ අතර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂක සහ වැඩ බලන සභාපතිවරයා වශයෙන් ද, ෂෙල් ගෑස් ලංකා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද සේවය කර ඇත.

ඒ මහතා වර්තමානයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වශයෙන් කටයුතු කරනු ලබයි.

ඔහු ලංකා බැංකුවේ අධ්‍යක්ෂ ධුරයේ සහ ශ්‍රී ලංකා ආරක්ෂණ සහ විනිමය කොමිසමේ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ ද කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ද නිරීක්ෂකයෙකු වේ.

ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය
අධ්‍යක්ෂ

ලේකම්
ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව (සංඛ්‍යානය) පිළිබඳ ගෞරව උපාධිය ලබා ඇත. ඇය විසින් ඕස්ට්‍රේලියාවේ කැන්බරා නුවර පිහිටි ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයෙන් කෘෂි කාර්මික සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධිය ලබා ඇත. තවද, ඇමෙරිකාවේ ඔහියෝ කොලොම්බස්හි පිහිටි ඔහියෝ රාජ්‍ය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ද ඇය සතුව ඇත.

2010 අප්‍රේල් 25 දින සිට බලපැවැත්වෙන පරිදි ඇය ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම් ලෙස පත් කරන ලද අතර 2010 නොවැම්බර් 25 දින නැවතත් එම තනතුරටම පත් කරන ලදී. අමාත්‍යාංශ ලේකම් ලෙස කටයුතු කරන අතරතුර දැනට ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජාතික ජල සම්පත් සංවර්ධන (NARA) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලවල ද අධ්‍යක්ෂිකා තනතුරු හොබවයි. ඇය ජනාධිපති ලේකම් විසින් පත්කරන ලද බණිජ සම්පත් සංවර්ධන කමිටුවේ නියෝජිතවරියෙකි. පොහොර සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර මිළදී ගැනීම් සැළසුම් කමිටුවේ සභාපතිනිය වශයෙන් ඇයව පත්කර ඇත.

ආචාර්ය සොයිසා මහත්මිය ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවාවට අයත් වේ. විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් අනතුරුව මුදල් සහ ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන් මුල්ම වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය එහිදී සැලසුම් නිළධාරී, සහකාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අතිරේක අධ්‍යක්ෂ වැනි විවිධ තනතුරු වල සේවය කළාය. ඇය 1999 වසරේදී එම දෙපාර්තමේන්තුවෙහිම අධ්‍යක්ෂවරිය ලෙස උසස් කරන ලදී. ආචාර්ය සොයිසා මහත්මිය 2005 වර්ෂයේ දී එම අමාත්‍යාංශයේම පිස්කල් ප්‍රතිපත්තීන් පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස උසස් කරන ලදී. ඇය දැනට පවත්නා තනතුර දැරීමට පෙර මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, මූල්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස ද කටයුතු කළාය.

තවද, ඇය මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටින අතර, වැවිලි භාරකාර අරමුදලේ සභාපතිනිය ලෙසද, නැනෝ තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ (SLINTec) සහ නැනෝ තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගමේ (NANCO) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද සේවය කළාය. ඇය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, වී අලෙවි මණ්ඩලය, උසස් ඉදිකිරීම් පුහුණු කිරීමේ ඇකඩමිය සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වුවාය. තවද, ඇය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහ ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළාය. ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරිය ලෙස වැඩ භාර ගැනීමෙන් පසු ඇය ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරිය වශයෙන් ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය, 2012 අප්‍රේල් මාසයේ 18 -20 අතර ඕස්ට්‍රේලියාවේ, ප්‍රිමැන්ටල් හි පැවති ශ්‍රී ලංකාව 1994 වර්ෂයේ ජුනි 13 දින සාමාජිකත්වයට පත් ඉන්දියානු සාගරයේ ටූනා කොමිසමේ 16 වැනි සැසිවාරයේ එකඟතා කමිටුවේ 9 වන සැසිවාරයේ නියෝජිත පිරිස මෙහෙය වනු ලැබීය.

මෙම සැසිවාරයේ දී, යුරෝපා සංගමයේ රොබෙටෝ කෙසරි මහතා එකඟතා කමිටුවේ සභාපතිත්වයට නැවත පත් වූ අතර ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය එහි උප සභාපති තනතුරට

නම්කරනු ලදුව ඒකමතිකව එම තනතුරට පත්විය. ඉහතින් සඳහන් කළ ස්ථානයේ ද 2012 අප්‍රේල් 22 – 26 අතර පැවති ඉන්දියානු සාගරයේ ටූනා කොමිසමේ 16 වැනි සැසිවාරයේ නියෝජිතයින් ද ඇය විසින් මෙහෙය වනු ලැබීය.

ඕස්ට්‍රේලියා, බෙලිසිය (පැමිණ නැත), චීනය, කොමොරෝස්, එරිත්‍රියා (පැමිණ නැත), යුරෝපා සංගමය (සාමාජික සංවිධානය), ප්‍රංශය, ගිනි රාජ්‍යය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, (ඉස්ලාමී ජනරජය), ජපානය, කෙන්යාව, මැඩගස්කරය, මැලේසියාව, මාලදිවයින, මොරිසස්, මොසැම්බික්, ඕමානය, පාකිස්ථානය, පිලිපීනය, කොරියානු ජනරජය, සීෂෙල්, තායිලන්තය, එක්සත් රාජධානිය, සෙනගාලය (පැමිණ නැත), දකුණු අප්‍රිකාව (පැමිණ නැත) සහ වැනුවුටු යන රටවල් ඇතුළත් ඉන්දියානු සාගරයේ ටූනා කොමිසමේ 24ක් වූ සියළුම සාමාජික රටවල් ඇයගේ පත්වීම කෙරෙහි දැඩි සහයෝගයක් දැක්වීය.

2012 සැප්තැම්බර් 20 – 22 දක්වා වියට්නාමයේ ඩනාන්හි පවත්වන ලද ආහාර හා කෘෂිකාර්මික සංවර්ධන ආයතනයේ කළාපීය ධීවර ආයතනය වන ආසියානු ශාන්තිකර ධීවර කොමිසමේ 32 වැනි රැස්වීමේ දී ඉදිරියට එන දෙවසර කාලයේ උප සභාපති ලෙස ආචාර්ය සොයිසා මහත්මිය පත්කරන ලදී. මෙහි සභාපති ලෙස ඉන්දියාව තෝරාගන්නා ලදී. ආසියානු ශාන්තිකර ධීවර කොමිසම සාමාජික රටවල් 21කින් සමන්විත ධීවර හා ජලජ සම්පත් සම්බන්ධ අන්තර් රාජ්‍ය උපදේශක ආයතනයක් වේ. මෙම ආයතනය ආසියා පැසිපික් කළාපයේ ධීවර සහ ජලජ සම්පත් වැඩිදියුණු කිරීමෙහිලා අවබෝධය සහ දැනුවත් වීම අරභයා සහයෝගයෙන් කටයුතු කරන ආයතනයක් ද වේ. කොමිසමේ සහ ආසියා පැසිපික් ධීවර කොමිසමේ ලේකම් කාර්යාලයේ සාමාජික රටවල් 15ක 29 දෙනෙකුගෙන් සැදුම්ලත් දූත මණ්ඩල නියෝජිතයින් කොමිසමේ රැස්වීම සඳහා පැමිණ සිටියහ. එසේම වෙනත් ප්‍රාදේශීය ධීවර කණ්ඩායමක නිරීක්ෂණකයින් 21 දෙනෙකු ද පැමිණියහ.

ජගත් පී විජේවීර මහතා
අධ්‍යක්ෂ

රේගු අධ්‍යක්ෂ ජනරාල්

ජගත් පී විජේවීර මහතා 2012 වසරේදී අධ්‍යක්ෂ ධූරයට පත්කරනු ලැබීය. වර්තමානයේ ඔහු රේගු අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරන අතර ඊට පෙරාතුව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වශයෙන් ද කටයුතු කර ඇත.

ඔහු කැළණිය විශ්ව විද්‍යාලයේ ලලිතකලා විශේෂවේදී උපාධිය ලබා සිටින අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධි දෙකක් ද ලබා සිටී.

ඔහු ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් 2006 සිට 2010 වසර දක්වා සේවය කර ඇති අතර 1987 වසරේ සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ යෙදී සිටී.

ඒෂන ද සිල්වා මහතා
අධ්‍යක්ෂ

ඒෂන ද සිල්වා මහතා කොළඹ රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීය. ඔහු සහතික ලත් වෘත්තීය කළමණාකරුවන්ගේ ආයතනයේ (MCPM) සාමාජිකයෙකු මෙන්ම එක්සත් රාජධානියේ වෘත්තීයමය ආයතනයේ හවුල්කාර සාමාජිකයෙකු ද (AUKAP) වේ. ඔහු රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම ජ්‍යෙෂ්ඨ තනතුරු ගණනාවක්ම හොබවනු ලබයි. වර්තමානයේ ඔහු ඒෂන හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගමේ සභාපති ලෙස ද, ෂර්මන්ස් ලොජිස්ටික්ස් (පෞද්ගලික) සමාගමේ සභාපති ලෙස ද, ෂර්මන්ස් ප්‍රවාහන (පෞද්ගලික) සමාගමේ සභාපති ලෙස ද, එස්නා

(පෞද්ගලික) සමාගමේ උපසභාපති/කළමණාකාර අධ්‍යක්ෂ ලෙස ද, එස්නා ටෙක්නොලිජීස් (පෞද්ගලික) සමාගමේ සභාපති ලෙස ද, එස්නා විලාස් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙස ද, එස්නා පවර් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙස ද, එස්නා වෙන්චර්ස් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙස ද, පැන් ඒෂියා බැංකුවේ අධ්‍යක්ෂ ලෙසද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කමිටු සාමාජික ලෙස ද, මවුන්ට්බැටන් ලැන්ඩ්ස් (පෞද්ගලික) සමාගමේ කමිටු සාමාජික ලෙස ද, මැක් මැරයින් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙසද, ලංකා ෂිපිං ඇන්ඩ් ලොජිස්ටික්ස් සමාගමේ අධ්‍යක්ෂ ලෙස ද, සිමාටෙක් ඒජන්සි ලංකා හි අධ්‍යක්ෂ ලෙස ද, ෂර්මන්ස් පුත්‍ර (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙසද, ෂර්මන් ද සිල්වා සහ සමාගමේ අධ්‍යක්ෂ ලෙසද, ඩෙමිනිෂන් එක්ස් (පෞද්ගලික) සමාගමේ සහ ප්ලම්බගෝ ලංකා (පෞද්ගලික) සමාගමේ ද අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

ඔහු ශ්‍රී ලංකාවේ මහජන කසකස්ථාන කොන්සියුලර් කාර්යාලයේ ගරු කොන්සාල්වරයා වශයෙන් ද පත්වීම් ලැබ ඇත.

කපිල ලියනගමගේ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

නීති උපදේශක - ශ්‍රී ලංකා වරාය අධිකාරිය

කළමනාකරණ කමිටුව

ආචාර්ය ප්‍රියත් බී. වික්‍රම මහතා
සභාපති

ඉන්දික කරුණාජීව මහතා
උප සභාපති

කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා
කළමනාකාර අධ්‍යක්ෂ

වෛද්‍ය සංජය සේදර සෙනරත් මහතා
විධායක අධ්‍යක්ෂ

නෝමන් වීරරත්න මහතා
අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ

ශිරානි වන්නිආරච්චි මහත්මිය
අධ්‍යක්ෂ (මුදල්)

ජේ.කේ.පී. කුරුකුලසූරිය මහතා
අධ්‍යක්ෂ (දක්ෂිණ වරාය සංවර්ධන)

ඒ.ඩී.ටී. ගුණසේකර මහතා
අධ්‍යක්ෂ (තාක්ෂණ)

ඩී.ඩබ්ලිව් අතපත්තු මහතා
අධ්‍යක්ෂ (සේවා සැපයුම්)

මේජර් ජනරාල් එස්.ජී. කරුණාරත්න මහතා
අධ්‍යක්ෂ (ආරක්ෂක)

එම්.පී.එස්.එස්. පිරිස් මහතා
ප්‍රධාන ඉංජිනේරු

කේ.ඒ. අන්සාර් මහතා
ප්‍රධාන අභ්‍යාස කළමණාකරු

ඩී.ජී.අයි.සී. ලොකුහේවගේ මහත්මිය
ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්)

කපිතාන් ආර්.ඒ. ජයවික්‍රම මහතා
හාබර් මාස්ටර්

එල්. ප්‍රේමසිරි ද සිල්වා මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

වෛද්‍ය ඩී. රාජකාන්තන් මහත්මිය
ප්‍රධාන වෛද්‍ය නිලධාරිනි

එච්.ඩි.එච්. සමරසිංහ මහතා
ප්‍රධාන ඉංජිනේරු

එල්.එච්.ආර්. සේපාල මහතා
ප්‍රධාන මානව සම්පත් කළමනාකරු

පී.ඩබ්ලිව් වඩුගේ මහතා
ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ වැඩ)

ඩී.යූ.ඩබ්ලිව් ද සොයිසා මහතා
ප්‍රධාන කළමණාකරු (බහළු මෙහෙයුම්)

පී.ඒ.ඒ. හේවාගීගන මහතා
ප්‍රධාන ඉංජිනේරු (දක්ෂිණ වරාය සංවර්ධන)

ඊ.ඒ.ටී. එදිරිසූරිය මහතා
ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ)

ඒ. ඒ. එස්. ආර්. අබේසිරිවර්ධන මහතා
ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා සංවර්ධන)

ඩබ්ලිව්.එන්. ඇල්සන් මහතා
ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා)

ඩී.ඒ.ජේ.අයි.පෙරේරා මහතා
ප්‍රධාන කළමනාකරු (බහළු මෙහෙයුම්)

උපුල් ජයතිස්ස මහතා
ප්‍රධාන කළමනාකරු (අලෙවි හා ව්‍යාපාර සංවර්ධන)

පී. රණතුංග මහතා
ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්)

ආර්.එම්.ඒ.එස්. රත්නායක මහතා
ප්‍රධාන කළමනාකරු (පරිපාලන)

ඩබ්ලිව්.එම්.ඩී.බී. විජේකෝන් මහතා
ප්‍රධාන ඉංජිනේරු (විදුලි)

පී ආර් සිරිවංශ මහතා
ප්‍රධාන නීති නිලධාරි

එච්.ඒ.එන්.එස්. ප්‍රනාන්දු මහතා
වැ.බ. ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ)

එච්.එම්.යු.බී.ගලගොඩ මහතා
වැ.බ. ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති)

විජිත අබේසුන්දර මහතා
වැ.බ. ප්‍රධාන ඉංජිනේරු (නාවික)

පී එම් එස් සෝමරත්න
වැ.බ. ප්‍රධාන ඉංජිනේරු (සිවිල්)

විගණන කමිටුව

එස්.ආර්. ආටිගල මහතා
සභාපති

ජගත් පී විජේවීර මහතා
සාමාජික

ශිරාණි වන්නිආරච්චි මහත්මිය
සාමාජික

ඒ.ඩී.ටී. ගුණසේකර මහතා
සාමාජික

එල්. ප්‍රේමසිරි ද සිල්වා මහතා
ලේකම්

2012 වර්ෂයේදී ක්‍රියාකාරකම් සහ ප්‍රධාන සාර්ථකත්වයන් පහත දැක්වේ.

2012 වර්ෂයේදී පහත සඳහන් නව ප්‍රධාන නැව් සේවාවන් ආකර්ශනය කරගන්නා ලදි.

ප්‍රධාන නෞකා සේවාවන් - 06

- HDS - Far East සේවාව (E/B)
- G - 6 Loop 6 partners APL/MOL/HYUNDAI/OOCL/MNYK/Hapag Lloyd
- AEF (Asia East Africa) E/B Partners – Evergreen, SCI & XCL
- SGE (South India Gulf Express) W/B Partners – Evergreen
- Cheetah – MSC
- AEF – W/B – Asia East Africa Service – Partners – Evergreen/ SCI & XCL

ලෝකයේ දෙවන විශාලතම නෞකා සේවාව වන MSC නෞකා සේවාව සමඟ පර්යන්ත සේවා ගිවිසුම් වලට ඇතුළත් විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් කළමනාකරණය කරනු ලැබූ පර්යන්ත පහත ප්‍රතිඵල වාර්තා කෙරිණ.

- දේශීය බහළු මෙහෙයුම් ධාරිතාවය 2.8%න් වර්ධනය විය
- ප්‍රති අපනයන බහළු මෙහෙයුම් ධාරිතාවය වෙනස් නොවී පැවතිණ.
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය කළමනාකරණය කළ පර්යන්ත වල ධාරිතාවය 0.8%න් වර්ධනය විය.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙළඳපළ කොටස 55.3% දක්වා වර්ධනය විය (2011 – 53.9%).
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙතෙක් වාර්තා කළ ඉහළම බහළු මෙහෙයුම් ධාරිතාවය 2012 වර්ෂය තුළදී විස්සේ සම ඒකක 2,316,849කි.

කොළඹ වරාය පහත ප්‍රතිඵල වාර්තා කෙරිණ.

- දේශීය බහළු මෙහෙයුම් ධාරිතාවය 2.5%න් අඩු විය.
- ප්‍රති අපනයන බහළු මෙහෙයුම් ධාරිතාවය 1.9%න් අඩු විය.
- කොළඹ වරායේ සමස්ථ වර්ධනය 1.8%න් පහත වැටිණ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 1984 අංක 7 සහ 35 පනත්වලින් සංශෝධිත 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි විධිවිධාන යටතේ 1979.08.01 වන දින ස්ථාපිත කරනු ලැබීය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 6 (1) වගන්තියෙන් එහි අරමුණු සහ කාර්යයන් පහත සඳහන් ලෙස නිර්වචනය කර ඇත.

- ස්ටෙවඩෝරු කටයුතු, නැව්ගත කිරීම් හා ප්‍රතිනැව්ගත කිරීම්, ගොඩබෑම් හා ගුදම්ගත කිරීම, වාප්පු කටයුතු, යාත්‍රාවලට ජලය, ඉන්ධන හා විදුලිබලය සැපයීම, ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදන හා ලිහිසි තෙල් යාත්‍රාවලට සහ යාත්‍රා වලින් බන්කර් හා ගබඩා අතර ගෙනයාම සහ ගෙන ඒම, යාත්‍රා වල නියමු කාර්යය හා නැංගුරම්ලෑම සඳහා ද, කිමිදීම හා ජලය යට නැව් අළුත්වැඩියා කිරීම සහ ඊට අදාළ අනෙකුත් සේවා කාර්යක්ෂම හා අඛණ්ඩ සේවා සැපයීම.

- කාර්යක්ෂම හා නිත්‍ය සැසඳුම් හා ආරක්ෂක සේවා සැපයීම

- වරාය සීමාවන් තුළ හා වරාය වල ප්‍රවේශ මාර්ගයන්හි යාත්‍රාකරණය විධිමත් කිරීම හා පාලනය කිරීම

- වරාය ස්ථාපනයන් නඩත්තු කිරීම හා ඒවායේ පාවිච්චිය ප්‍රවර්ධනය, නිශ්චිත වරායන් තුළ වැඩි දියුණු කිරීම් හා සංවර්ධන කටයුතු

- යම් විශේෂිත වරායන් තුළ රේගු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් හැර අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම් හා ක්‍රමවත් කිරීම

- විශේෂිත වරායන් තුළට හා ඉන් බැහැරව යාත්‍රාකරණය සඳහා යාත්‍රා වලට මග පෙන්වීම හා ආරක්ෂාව සඳහා අවශ්‍ය ප්‍රදීප හා වෙනත් උපයෝගීතා ශ්‍රී ලංකා වෙරළෙහි හා ඉන් ඔබ්බෙහි පිහිටුවීම හා නඩත්තු කිරීම

- වරාය අධිකාරිය පනත මගින් පවරනු ලබන වෙනත් යම් කාර්යයන් ඉටු කිරීම

- වත්කම් ප්‍රතියෝජනය කිරීම පිණිසත්, නව ආයෝජන ඇති කිරීම පිණිසත්, ප්‍රමාණවත් පොදු සංචිතයක් පිහිටුවා පවත්වා ගෙන යාම පිණිසත්, අධිකාරියේ ආදායමට ගෙවනු ලැබීමට සුදුසු ගාස්තු ගෙවනු ලැබීම සඳහා සෑහෙන්නාවූ ආදායමකට නොඅඩු ආදායමක් අධිකාරියට ලැබෙන ආකාරයකින් වරාය අධිකාරියේ කටයුතු පවත්වා ගෙන යාම, ඉහත කී ආකාරයේ ගාස්තු අධිකාරිය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් අදාළ පනතට අනුකූලව අයකර ගැනීම

- පනතෙහි විධිවිධාන ප්‍රකාර විශේෂිත වරායන් හා එක් එක් වරාය මූල්‍ය වශයෙන් ස්වයංපෝෂිත ව්‍යාපාරයක් ලෙස කළමනාකරණය කිරීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 5 (1) වගන්තිය ප්‍රකාරව වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය ගරු අමාත්‍යවරයා පත්කළ අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ.

සභාපති, ප්‍රධාන විධායක නිළධාරී වන අතර ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි සමස්ථ පරිපාලනය භාරව කටයුතු කරයි.

2012 වසරේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වෙනස්වීම්

පී ආර් සිරිවංශ මහතා ප්‍රධාන නීති නිලධාරි වශයෙන් පත්කරන ලදී.

විජිත අබේසුන්දර මහතා වැ.ඛ. ප්‍රධාන ඉංජිනේරු (නාවික) වශයෙන් පත්කරන ලදී.

පී එම් එස් සෝමරත්න මහතා වැ.ඛ.ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) වශයෙන් පත්කරන ලදී.

ලංකා නැව් නියෝජිතයින්ගේ රැස්වීම්

වර්ෂය තුළදී ලංකා නැව් නියෝජිතයින්ගේ සංගමය (CASA) විසින් වරාය හා සම්බන්ධ කරුණු හා සිය සාමාජිකයන්ට බලපාන ප්‍රශ්න හා ගැටළු පිළිබඳ සාකච්ඡා කරනු පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්ව මණ්ඩලය සමග රැස්වීම් කිහිපයක් පවත්වනු ලැබීය. වරාය සේවාලාභීන්ට බලපාන ගැටළු නිරාකරණය කර ගැනීමටත් අන්‍යෝන්‍ය අවබෝධය හා සුහද සම්බන්ධතා පවත්වා ගැනීමටත් එමඟින් එළදායිතාවය වැඩි දියුණු කර ගැනීමටත් එම සාකච්ඡා එළදායී විය.

විනයානුකූල නියෝගයන්ට එරෙහිව අභියාචනා කමිටු

තමන් වෙත පනවා ඇති විනයානුකූල නියෝගයන්ට එරෙහිව සේවකයන් විසින් සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අභියාචනා හැත්තෑවක් (70) ඉදිරිපත් කොට තිබූ අතර ඒවා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීතිරීති හා රෙගුලාසි ප්‍රකාර පිහිටුවන ලද අභියාචනා මණ්ඩල පහක් (05) වෙත යොමු කරන ලදී.

මෙම අභියාචනා අතරින් පහක් (05) අනුමත කළ අතර පනස් හතරක් (54) ප්‍රතික්ෂේප විය. එකොළහක් (11) අවසන් කළ යුතුව ඇත.

විදේශ පුහුණුව සහ ශිෂ්‍යත්ව අවස්ථා

සමාලෝචනයට බදුන් වූ වර්ෂය තුළදී අධිකාරියේ ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු දරණ නිළධාරීන් හතළිස් හය දෙනෙකුට (46) ශිෂ්‍යත්ව පිරිනමා පුහුණු පාඨමාලාවන් හැදෑරීමටත්, ශ්‍රී ලංකාවෙන් බැහැරව ජාත්‍යන්තර සංවිධාන මගින් පවත්වනු ලැබූ සම්මේලන වලට හා සම්මන්ත්‍රණ වලට සහභාගීවීම සඳහාත් අවස්ථාව ලබා දෙන ලදී.

මීට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි සේවකයන් දහඅට දෙනෙකු (18) ක්‍රීඩා තරඟවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා විදේශ ගතවිය.

සන්නිවේදන හා මහජන සම්බන්ධතා

කළමනාකාරීත්වය හා සේවකයින් මෙන්ම වරාය හා සම්බන්ධ බාහිර පාර්ශවයන් අතර මනා සන්නිවේදන සම්බන්ධතාවයක් වර්ධනය කර ගැනීමට සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය පිහිටුවා ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආයතනයේ සමස්ථ ප්‍රතිරූපය ඉහළ නැංවීමට නවතම උපක්‍රමයක් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදුකර ඇත. දේශීය හා විදේශීය ප්‍රදර්ශනයන් සඳහා සහභාගී වන අතරම විද්‍යුත් මාධ්‍ය හා පුවත්පත් යන මාධ්‍ය හරහා මහජන සම්බන්ධතා කොට්ඨාශය මෙම කාර්යය සඳහා ප්‍රබල සහයෝගයක් ලබාදී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය වෙත පවරන ලද බහුවිධ කාර්යයන් අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා බාහිර දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සක්‍රීයව කටයුතු කිරීම මෙම කොට්ඨාශයේ කාර්යභාරයකි. වරාය ව්‍යාපෘතීන්හි ඉදිරියේදී සිදුකිරීමට නියමිත සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පුළුල් ප්‍රචාරයක් ගෙන දීමට කළ හැකි සෑම පියවරක්ම ගෙන ඇත.

ගෝලීය නාවික ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර කරළිය තුළ ආයතනික ප්‍රතිරූපය නඟාසිටුවීම පිණිස ජාත්‍යන්තර මිත්‍රශීලි වරාය (INAP), ජාත්‍යන්තර වරාය හා තොටුපල සංවිධානය (IAPH), සමුද්‍රික

වෙළඳාම සහ ප්‍රවාහනය ආශ්‍රිත අවස්ථා, ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ ආදිය කොට්ඨාශයේ සහයෝගීත්වය ඇතිව ඉතා මෑතකදි සංවිධානය කළ සුවිශේෂී අවසථාවන් විය. මෙම වසරේදී තම ප්‍රථම ඉදිරිපත්වීම වන ඩුබායි සමුද්‍රික ජාත්‍යන්තර උළෙලකදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය මුහුදු වෙළඳාම් ඩුබායි ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණයට සහභාගීවීම තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අලෙවි කොට්ඨාශය සහ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය හරහා සම්බන්ධීකරණය ඇතිව සාර්ථකව දියත් කරන ලදි.

කළමනාකාරීත්වය සහ සේවකයින් අතර මනා සන්නිවේදන තත්ත්වයක් වර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණ සඵල කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් අතර‘‘ තීරිථ ’’මාසික සඟරාව නොමිලයේ බෙදාහැරීම ,සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මඟින් සාර්ථකව කර ගෙන යනු ලැබීය .ක්‍රීඩා ,සෞන්දර්ය විෂයන් හා දර්ශනය වැනි සමාජ රුචිකත්වයක් ඇති විෂය ක්ෂේත්‍ර ගණනාවක් තුළ වරාය සේවකයින් දක්වන්නා වූ විශේෂිත දක්ෂතාවය හඳුනාගැනීමට එය උපකාරී වන අතර තවදුරටත් කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාලීන ක්‍රියාමාර්ග නීති සහ රෙගුලාසි පිළිබඳ වරාය සේවකයින් දැනුවත් කිරීම කොට ඇත.

ආයතනයේ පරිශීලනය සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය යන දෙවර්ගය සඳහා සංරක්ෂණ ලේඛනාගාරය, සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් පවත්වා ගෙන යනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අදාළව දේශීය පුවත්පත් වල සහ බොහෝ සඟරාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ප්‍රකාශයට පත් කරන ලද සියළුම කරුණු පරිගණක ගත කළ සහ මුල් පිටපත් වශයෙන් මෙම කොට්ඨාශය තුළ සුරක්ෂිතව පවතින අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ වාර්තාමය වීඩියෝ වැඩ සටහන් සඳහා අවශ්‍ය වන මෙන්ම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ආවරණය කළ අතීත හා වර්තමාන සියලු දෘෂ්‍ය වීඩියෝ වැඩ සටහන් අනාගත පරිහරණය වෙනුවෙන් නවීන විද්‍යුත් තාක්ෂණය උපයෝගී කරගත් චිත්‍රාගාරයක සුරක්ෂිතව තබා ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආවරණය කරමින් සකසන ලද සියලුම වාර්තාමය වැඩ සටහන් තැබීම සඳහා දෘඩ පිටපත් හා මෘදු පිටපත් (පරිගණක ගත කරන ලද) පුස්තකාලයක් ද මෙම අංශය සතුවේ.

අනුරාධපුර -ඔයාමඩුව ‘‘දැයට කිරුළ’’ සහ BMICHහි පැවති ටෙක්නෝ 2012 සහ කළුතර පැවති ‘‘තිස්සමේලා’’ වැනි ප්‍රදර්ශන ගණනාවකදී කොළඹ වරාය දකුණු ආසියාවේ ප්‍රමුඛපෙළේ කේන්ද්‍රස්ථානය වශයෙන් සහ ශ්‍රී ලංකාව සමුද්‍රික මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමට සහ පාසැල් සිසුන්ට සහ මහජනතාවට වරායේ පවතින පහසුකම් සහ සේවාවන් ද සිදුකරමින් පවතින සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවස්ථාව ලැබිණ. යාවත්කාලීන කරන ලද ප්‍රචාරක පත්‍රිකා සහ අත්පත්‍රිකා මුද්‍රණය කිරීමේ කාර්යය ද මෙම කොට්ඨාය මඟින් සිදුකරන ලදි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ උත්සව අවස්ථා සංවිධානය කරමින් මෙම කොට්ඨාශය වැදගත් කාර්ය භාරයක් ඉටු කළේය. විවිධ අවස්ථා වෙනුවෙන් පල කරන ලද පුවත්පත් අතිරේකයන් මෙම කොට්ඨාශය විසින් සකස් කොට සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය සහ ඵලදායීතාවය නඟා සිටුවීම සහ ආයතනයේ කාර්යය සාධනය ජාතික ආර්ථිකයට ඉමහත් පිටුවහලක් වන බව වඩාත් මතුකර පෙන්වීම පිණිස විවිධ මාධ්‍ය සාකච්ඡා කැඳවීමෙන් සහ වීඩියෝ සහ මුද්‍රිත තොරතුරු නිකුත්කිරීමෙන් ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධව බාහිර මාධ්‍ය ආයතන වලට මාධ්‍ය නිවේදන නිකුත් කිරීමෙන් ද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිළ හස්තය ලෙස සන්නිවේදන හා මහජන සම්බන්ධතා අංශය ක්‍රියාකරයි.

මෙහෙයුම් සමාලෝචනය

ක්‍රියාකරවන

නැවේ සිට වෙරළ දක්වා වූ දොඹකර 06, රබර් ටයර් යෙදූ ග්‍රැන්ට් දොඹකර 30 සහ අංගන ට්‍රැක්ටර් 50ක් එකතු කිරීමෙන් 2012 වර්ෂයේ පළමු කාර්තුව තුළ නවතමයෙන් මිළ දී ගත් උපකරණ සම්පූර්ණයෙන්ම මෙහෙයුම් වල යෙදවිණ. නවතමයෙන් යොදවන ලද උපකරණ සඳහා ක්‍රියාකරුවන්ගේ කුසලතාවය සහ නිපුණතාවයන් ඵලදායීව මෙහෙය වනු වස් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානය වන මහපොළ අභ්‍යාස ආයතනයේ සහයෝගීත්වය ඇතිව උපකරණ පුහුණු පාඨමාලාවක් පවත්වනු ලැබීය. අළුතින් ඉදිකල අංගන බහළු තබන කොටස් 2,500ට වඩා ඇති ප්‍රදේශයට දේශීය බහළු කොටසක් සහ එස්ඒජීටී ආයතනයේ බහළු අඩුක්කිරීම පිණිස යවන ලදි.

ජයබහළු පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව දැනටමත් වසර 27ක් ගෙවීගොස් ඇති බැවින් බහළු පර්යන්තය මතුපිට සමතලා අංගනයක් බවට සහතික වනු වස් අංගන ප්‍රදේශයේ සිවිල් නඩත්තු කටයුතු සිදුකිරීමේ අවශ්‍යතාවයත් රබර් ටයර් යෙදූ ග්‍රැන්ට් දොඹකර මාවත සහ බහළු අඩුක්කිරීමේ කොන්ක්‍රීට් කොටස් එසවීමේ කටයුතු කඩිනම් කෙරිණ. නැව් වල කටයුතු බාධාවකින් තොරව පවත්වාගැනීම සහ අංගන මෙහෙයුම් පිළිබඳව සහතික වෙමින් මෙහෙයුම් උපකරණ අක්‍රියව පවතින කාලය අවම කිරීමට ක්‍රියාකරවන සහ අදාළ ඉංජිනේරු කොට්ඨාසයන් අතර මනා සම්බන්ධීකරණයකින් සහ සහයෝගීතාවයකින් කටයුතු කිරීම ඉවහල් විය. නාවික කටයුතු වලදී සිදුවන අනවශ්‍ය ප්‍රමාදවීම් අවම කිරීම වෙනුවෙන් නාවික කොට්ඨාසය සමඟ මනා සන්නිවේදනයක් පවත්වාගෙන යාමට පියවර ගැණිණ.

කොට්ඨාසය විසින්ම එහි පර්යන්තයන්හි දී මෙන්ම මහපොළ අභ්‍යාස ආයතනයේදී ඉතා හොඳින් වැඩ කිරීමේ අභ්‍යාසයන්, ආකල්පමය වෙනස්කම්, භාණ්ඩ වල සහ පුද්ගල සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සම්බන්ධ දැනුවත්වීමේ වැඩසටහන් පවත්වනු ලැබීය. විවේකාගාරයන්හි සහ අංගන ප්‍රදේශයන්හි පවිත්‍රතාවය පිළිබඳව සහතික වනු වස් අතිරේක කාර්ය මණ්ඩලයක් බාහිරව ලබාගැනීමට පියවර ගැනීම මගින් සේවකයින්ගේ සුභසාධනයට වැඩි අවධානයක් යොමු කළ අතර සේවකයින් සඳහා හොඳ ආහාර වේලක් සැපයීම වෙනුවෙන් මධ්‍යම මුළුතැන්ගෙයි ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම පිණිස සභාපතිවරයා විසින් විශේෂ කමිටුවක් පත්කරනු ලැබීය.

ජයබහළු පර්යන්තයේ/සමගි බහළු පර්යන්තයේ කාර්යසාධනය පිළිබඳව ප්‍රතිචාර ලබාගැනීම සඳහා නැව් නියෝජිතයින් සමඟ සාමාන්‍ය රැස්වීම් පවත්වනු ලැබූ අතර අවශ්‍ය වැඩි දියුණු කිරීම් ඇති කිරීම සඳහා පිළියම් යෙදීමේ ක්‍රියාමාර්ග ගනු ලැබිණ.

ප්‍රධාන පෙළේ නෞකා බහළු මෙහෙයුම් දොඹකර පැයකට සාමාන්‍යය මෙහෙයුම් 25ක ප්‍රමාණයක ඉලක්කය සපුරා ගැනීමට ජයබහළු පර්යන්තය තුළ මෙහෙය වන නෞකාවන්හි ඵලදායිතාවය වර්ධනයට සහාය කර ගැනීම පිණිස 2012 වර්ෂය තුළ ඉහත සියළුම ක්‍රමෝපායන් ඇති කරන ලදි. පසුගිය වර්ෂය තුළ ඉතිහාසයේ වැඩිම වාර්ෂික බහළු මෙහෙයුම් ධාරිතාවය වාර්තා කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකි විය. මෙහෙය වන ලද සමස්ථ ධාරිතාවය විස්සේ සම ඒකක 2,316,849ට ළඟාවීමට හැකිවිය. එය පසුගිය වසරේ ධාරිතාවයට අනුරූපීව 0.8%ක වර්ධනයක් වශයෙන් පෙන්නුම් කරයි. දේශීය බහළු ධාරිතාවය සහ ප්‍රතිඅපනයන බහළු ධාරිතාවය එකම තත්ත්වයක පවත්වාගෙනයමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2.8%ක වර්ධනයක් ළඟාකරගෙන ඇත.

සේවා සැපයුම්

සේවා සැපයුම් කොට්ඨාසයේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ වරායට පැමිණෙන පූර්ණ බහළු පැටවුම් (FCL), ඌණ බහළු පැටවුම් (LCL), තොගකඩන, ඇසුරුම් සහ මෝටර් රථ වලින් සමන්විත ගොඩබාන ලද සියළු නැව් භාණ්ඩ භාරදීමත්, ගණුදෙනුකරුවන්ට අදාළ අනෙකුත් නැව් භාණ්ඩ ආශ්‍රිත සේවාවන් ඉටුකිරීමත් වේ.

දවසේ පැය 24 පුරාම සේවා සැපයීම තුළින් පාර්භෝගික සේවා මධ්‍යස්ථානයෙන් 2012 වසර තුළ පූර්ණ බහළු පැටවුම් විස්සේ සම ඒකක 284,014 සෘජුවම බෙදා හැර ඇත. පූර්ණ බහළු පැටවුම් (FCL) වෙනුවෙන් පාරිභෝගිකයන්ට සපයනු ලබන සේවා වැඩි කිරීමට සහ ලිපි ලේඛන සඳහා ගතවන කාලය අවම කිරීමට නේවිස් (NAVIS) නැවිබඩු මොඩියුල වැඩ සටහන හඳුන්වාදීමට කටයුතු කර ඇත.

දේශීය, ප්‍රති අපනයන, බහු රාජ්‍යවලට යැවෙන නැවිබඩු ඒකරාශි කිරීම (MCC) සහ විශේෂ වර්ගයේ නැවි බඩු සඳහා වරාය තුළ ඇති ගුදම්වල ඉඩකඩ සලසන අතර ඌණ බහළු පැටවුම් වලින් වැඩි ප්‍රමාණයක් (විස්සේ සම ඒකක 8,157) වෙන්කොට ඇසිරීම සඳහා පැලියගොඩ බහළු රඳවා ගැනීමේ මධ්‍යස්ථානය වෙත මාරුකර ඇත. ඌණ බහළු පැටවුම් වෙන්කොට ඇසිරීමෙන් රුපියල් මිලියන 180.9ක ආදායමක් උත්පාදනය කර ඇත. බහුරාජ්‍ය වලට යැවෙන නැවිබඩු එක්රැස් කිරීමෙන් රුපියල් මිලියන 135.9 උපයාගෙන ඇත. මීට අමතරව හිස් බහළු ගබඩා කිරීමේ කුළිය වශයෙන් රුපියල් මිලියන 2.6 ක ආදායමක් අයකරගෙන ඇත.

වසර තුළදී නිශ්කාෂණ ආයතන වලට නව බලපත්‍ර 78ක් නිකුත් කර ඇති අතර බලපත්‍ර 843ක් අළුත්කිරීමෙන් සමස්ථ බලපත්‍ර 925ක් සඳහා රුපියල් මිලියන 13.5ක ආදායමක් උපයාගෙන ඇත. ‘‘ඒ’’ සහ ‘‘බී’’ වර්ගයේ වාප්පු ලිපිකරුවන්ට වාප්පු අනන්‍යතා පත්‍ර නිකුත් කිරීමෙන් සහ අළුත්කිරීමෙන් රුපියල් මිලියන 6.8ක මුදලක් එකතු කරගෙන ඇත. වසර තුළ නිකුත් කරන ලද සහ අළුත්කරන ලද ‘‘ඒ’’ වර්ගයේ බලපත්‍ර සංඛ්‍යාව 2,123ක් ලෙස වාර්තා වී ඇති අතර ‘‘බී’’ වර්ගයේ බලපත්‍ර 302ක් විය.

බහළු රැඳවුම් මධ්‍යස්ථාන අංක V (CFS V) දරණ ගුදම අළුත්වැඩියා කිරීම මගින් බන්ධිත සහ අන්තරාල නැවි බඩු සඳහා ගුදම් පහසුකම් වැඩි කරන ලද අතර බන්ධිත සහ අන්තරාල වෙළඳාම සඳහා ඉල්ලුම වැඩි වූ අතර එමඟින් රුපියල් මිලියන 43.5ක සම්පූර්ණ ආදායම ලබාගෙන ඇත. මෙය 2011 දී උපයාගත් රුපියල් මිලියන 335.6ක මුදල හා සැසඳීමේදී 2012 වර්ෂය තුළදී සේවා සැපයුම් කොට්ඨාසය විසින් ඉටුකරන ලද සේවාව තුළින් රුපියල් මිලියන 383.5ක ආදායමක් උපයා ගෙන ඇත.

අතහැර දමන ලද නැවි බඩු ඉවත් කිරීම සඳහා ප්‍රසිද්ධ ටෙන්ඩර් මඟින් විකිණීමෙන් සහ වෙන්දේසි මඟින් රුපියල් මිලියන 188.7ක සම්පූර්ණ මුදලක් එකතු කරගෙන ඇති අතර සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා ආයතනය මඟින් අබලි යකඩ, භාවිතා කරන ලද තෙල් සහ පරණ ටයර් විකිණීමෙන් රුපියල් මිලියන 11.4ක අතිරේක ආදායමක් උත්පාදනය කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ඉවත් කරන ලද අතිරේක ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ ටෙන්ඩර් මඟින් විකිණීමෙන් රුපියල් මිලියන 1.8ක මුදලක් උපයාගෙන ඇත. තවද, මීට අමතරව ඇතැම් පුද්ගලයන් වෙත පැවරූ නිශ්කාෂණය නොකළ භාණ්ඩ රාජසන්තක කිරීමෙන් රු. 945,000/= ක ආදායමක් ලබාගෙන ඇත.

2012 වසර තුළදී ප්‍රේක්ෂණලාභින් විසින් වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද කුළී සහන වෙනුවෙන් ඉල්ලුම්පත්‍ර 61ක් ලැබී තිබිණ. මෙයින් ඉල්ලුම් පත්‍ර 28ක් නිර්දේශ කරන ලද අතර 18ක් ප්‍රතික්ෂේප කරන ලදී. ඉතිරි ඉල්ලුම් පත් සම්බන්ධව වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් තීරණය කළ යුතුව ඇත.

සේවා සැපයුම් අංශය විසින් ඉටුකරනු ලබන සේවයේ ගුණාත්මක බව වර්ධනය කිරීමේ අරමුණින් අපගේ ගණුදෙනුකරුවන්ට 2012 වසර තුළදී කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සහතික කරනු වස් නේවිස් (NAVIS) නැවි බඩු බෙදා හැරීමේ මොඩියුල පද්ධතියක් හඳුන්වා දෙනු ලැබීය. පූර්ණ භාණ්ඩ සහිත බහළු බෙදාහැරීම සඳහා ගනිමින් සිටින සියළුම ක්‍රියාමාර්ග ඌණ භාණ්ඩ සහිත නැවි බඩු ගුදම් වෙත ගොඩබැමට ද පියවර ගනිමින් සිටී.

මූල්‍ය

කාර්යක්ෂම හා ඵලදායී ලෙස ආදායම එක්රැස් කිරීම, එම ආදායම ප්‍රයෝජනයට ගෙන ලබාගත් සේවා සඳහා ගෙවීම, සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් බෙදාහැරීම සහ අතිරික්ත ආදායම ආයෝජනය කර මූල්‍ය කළමනාකරණ ක්‍රියාවන් අවහිරයකින් තොරව පවත්වාගෙන යාම මගින් වරාය අධිකාරියේ අනෙකුත් අංශයන්හි මනා කාර්ය සාධන මට්ටමක් සාක්ෂාත් කර ගැනීමට සහාය වීම මූල්‍ය අංශයේ වගකීම වේ.

තවද, මෙම අංශය මගින් සුදුසු අයවැය පාලන ක්‍රමවේදයක් තුළින් වියදම් අධීක්ෂණය, සියළු වරාය කටයුතු වල හා අනෙකුත් සේවාවන් වල අයවැය එකතු කිරීම වාසිදායක ලෙස සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ද සිදු වේ. නිරවද්‍ය, අංග සම්පූර්ණ හා කාලානුරූප ලෙස මූල්‍ය තොරතුරු සැපයීම සඳහා ඒකීයකරණය වූ මූල්‍ය ගණකාධිකරණ පරිපාටියක් සකසා ගැනීමේ තොරතුරු තාක්ෂණය ක්‍රියාවට නැංවීම හා පවත්වාගෙන යාම මෙම අංශයෙන් සිදුවන තවත් වැදගත් කාර්යභාරයක් වේ. මීට අමතරව සියළු වරාය කටයුතු හා සේවා සඳහා අයවිය යුතු මුදල් එකතු කිරීම, වැය අධීක්ෂණය, අදාළ මූල්‍ය ප්‍රකාශන සම්පාදනය පිළිබඳව මූල්‍ය අංශය නිරතුරුවම වගකිව යුතු වේ.

මූල්‍ය අංශයේ කාර්යභාරය ක්‍රියාත්මක කරනු ලබන්නේ;

රජයේ ආදායම, බඩුබෑම සඳහා වන වරාය තීරුබදු, නාවික අංශය

මෙම අංශයේ සියළු බහළුකරණය කරන ලද නැව් භාණ්ඩ, බහළුකරණය නොකරන ලද නැව් භාණ්ඩ, නාවික සේවා, බහු රාජ්‍ය නැව් භාණ්ඩ ක්‍රියාවලි හා අනෙකුත් විවිධ සේවා සඳහා ලේඛනගත කිරීම මෙම අංශයෙන් සිදුකරනු ලැබේ.

ආදායම්, ගොඩබෑම් හා බෙදාහැරීමේ අංශය

ආනයනකරුවන් වෙත නැව් භාණ්ඩ බෙදාහැරීම, අපනයනය සඳහා නැව් භාණ්ඩ ලබාගැනීම, දේශීය බඩු ලැබිය යුත්තන්ගෙන් බඩු බෙදාහැරීම් වෙනුවෙන් මුදල් එකතු කිරීම හා ඉන්වොයිස්ගත කිරීම මෙහි කාර්යයන් වේ. මෙම කාර්යභාරය සිදුකරනු ලබන්නේ කැනැල් අංගනය, පිටකොටුව, පැලියගොඩ, ආයෝජන මණ්ඩලය ප්‍රධාන කාර්යාලය, කටුනායක හා බියගම යන ස්ථාන වල පිහිටා ඇති තොරතුරු මධ්‍යස්ථාන වලිනි.

ආදායම්, ණය පාලන අංශය

නාවික නියෝජිතයන්ගේ ගණුදෙනු වල ගණුදෙනු වාර්තා තබාගැනීම, ණයකරුවන්ගේ ලෙජර් සටහන් අධීක්ෂණය, අර්බුද විසඳාගැනීමේ පරිපාටිය සම්බන්ධීකරණය ආදිය මෙහි ප්‍රධාන කාර්යභාරයන් වේ.

වියදම්, නාවික සහ අනෙකුත් කොට්ඨාසයන් අංශයන්

මෙම අංශ දෙක එක්ව සියළු සේවකයන්ගේ වැටුප් හා වේතන සම්පාදනය කරනු ලබයි. මීට අමතරව කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන්ගෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා මුදල් ගෙවීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

මූල්‍යමය ගණකාධිකරණය හා කළමනාකරණ ගණකාධිකරණ අංශය

මූල්‍යමය ගණාකාධිකරණ අංශයෙහි ප්‍රධාන වගකීම වන්නේ වරාය අධිකාරිය කරනු ලබන ගණුදෙනු වල වාර්තා තබාගැනීම හා එම වාර්තා භාවිතයෙන් වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන

සම්පාදනය කොට එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පසු විගණකාධිපති, භාණ්ඩාගාරය හා වරාය සහ මහාමාර්ග අමාත්‍යාංශය වෙත යැවීමයි. ඵලදායී පාලන ක්‍රමවේදයක් වශයෙන් අයවැය ලේඛනය තත්‍ය වියදම හා සන්සන්දනය කොට අධීක්ෂණය මෙන්ම කලින් කලට වාර්ෂික අයවැය සැකසීම හා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කළමනාකරණ ගිණුම් වල සියළු බදු ගෙවීම්, සැකසීම් හා සැපයීම් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකරණය මෙන් ම අනෙකුත් ආයතනයන් වෙත සැපයීම කරනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම මෙම අංශයේ තවත් වැදගත් කාර්භාරයකි.

මුදල් හා ආයෝජන අංශය

උපරිම ආදායමක් ලබාගැනීම සඳහා අතිරික්ත මුදල් ආයෝජනය මෙම අංශයෙන් සිදු කෙරේ.

නාවික

නියමු සේවා

සමාලෝචිත වසර තුළදී කොළඹ වරායට පැමිණි සියළුම වර්ගවල යාත්‍රා සඳහා නිතිපතා අඛණ්ඩව නියමු සේවා සපයන ලදී.

නෞකා වර්ගය	නෞකා සංඛ්‍යාව	පැමිණි කාර්යය	නෞකා සංඛ්‍යාව
බහළු	3,093	නැව් තෙල් සැපයීම	51
සාම්ප්‍රදායික	52	අළුත්වැඩියා	35
වියළි තොග	195	මගී නෞකා	34
තෙල් නැව්	258	වෙනත් සේවා	14
රෝල් ඔන් රෝල් ඔෆ්	67		
වෙනත්	71		
එකතුව			**3,870**

ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ටග් යාත්‍රා අංශය යාත්‍රා නැංගුරම්ලෑම සහ යාත්‍රාකරණය සඳහා අඛණ්ව හා කාර්යක්ෂම ටග් සේවාවන් ලබාදීම මඟින් සාර්ථක මෙහෙවරක් ඉටුකරන ලදී. මෙයට අමතරව පහත සඳහන් වෙනත් කටයුතු ද ඉටු කරනු ලැබිය.

- ✦ ටග් යාත්‍රාවල තට්ටු (ඩෙක්) අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු කරගෙන යාම.
- ✦ නැව් බැඳ තැබීමට උපයෝගී කරගනු ලබන ඉවතලූ කඹ ආශ්‍රයෙන් ටග් යාත්‍රා සඳහා අවශ්‍ය ලණු පැදුරු නිෂ්පාදනය කිරීම සහ ටග් යාත්‍රාවන් සහ වෙනත් අංශයන් සඳහා කැන්වස් ආවරණ සෑදීමේ කටයුතු.

නෞකා හැසිරවීම සඳහා ප්‍රමාණවත් ටග් යාත්‍රා සංඛ්‍යාවක් දෛනිකව ක්‍රියාත්මක වූ අතර හදිසි අවශ්‍යතාවයන් සඳහා ටග් යාත්‍රාවන් පොරොත්තු සේවයේ යොදවා ඇත.

ටග් යාත්‍රා ආධාරයෙන් මෙහෙය වූ මුළු නෞකා ගණන

නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා මඟින් ඉටුකළ සම්පූර්ණ මෙහෙයුම් ගණන වූ 14,288හි සවිස්තර වාර්තාව පහත පරිදි වේ.

ටග් යාත්‍රාවේ නම	එකතුව
රාජා මෝටර් යාත්‍රාව	2,045
නන්දිමිත්‍ර මෝටර් යාත්‍රාව	1,358
සුරනිමල මෝටර් යාත්‍රාව	3,012
ගෝඨයිම්බර මෝටර් යාත්‍රාව	3,244
විජයබාහු මෝටර් යාත්‍රාව	2,333
බරණ -II මෝටර් යාත්‍රාව	2,283
වේළුසුමන මෝටර් යාත්‍රාව	13

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිය ටග් යාත්‍රා ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සඳහා මුදාහැරීම පිණිස ටොන් 60ක ඇදගෙන යාමේ නව ටග් යාත්‍රා දෙකක් සිංගප්පූරුවේ සී/ස ස්පාකල් ඕවර්සීස් (පෞද්ගලික) සමාගමෙන් මාස හයකට (06) ලබාගන්නා ලදී.

පිටත වරායයන්හි නවතා ඇති ටග් යාත්‍රා

ත්‍රිකුණාමලය වරාය

- මහසෙන් මෝටර් යාත්‍රාව
- නීලමහ මෝටර් යාත්‍රාව
- වසභ මෝටර් යාත්‍රාව
- නන්දිමිත්‍ර මෝටර් යාත්‍රාව (20BP)

ගාල්ල වරාය

- ථෙරපුත්තාභය මෝටර් යාත්‍රාව

කන්කසන්තුරය

- කංචදේව මෝටර් යාත්‍රාව
- ධීර මෝටර් යාත්‍රාව

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය

- වේළුසුමන මෝටර් යාත්‍රාව

මුහුදු සංචාරයන්

- වේළුසුමන මෝටර් යාත්‍රාව (කොළඹ සිට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය දක්වා)

පුහුණු කටයුතු

මහපොළ අභ්‍යාස ආයතනයෙන් මෙහෙයවනු ලැබූ ගිනි නිවීම පිළිබඳ උසස් පාඨමාලාව, උසස් ඉංග්‍රීසි පාඨමාලාව, මූලික ගිනි නිවීමේ පාඨමාලාව, මූලික ප්‍රථමාධාර, පුද්ගල ආරක්ෂාව හා සමාජ

වගකීම සහ පුද්ගල ජීවිතාරක්ෂණ ක්‍රමෝපායන් යන පාඨමාලා සඳහා නිලධාරීන් සහ සේවකයින් සහභාගී කර ඔවුන්ගේ දැනුම කුසලතා වර්ධනය කර ගැනීමට පෙළඹවීම.

උපයන ලද ආදායම

2011 සත්‍ය ආදායම	-	රුපියල් මිලියන 319.735
2012 සංශෝධිත ආදායම	-	රුපියල් මිලියන 349.401
2013 ප්‍රක්ෂේපිත ආදායම	-	රුපියල් මිලියන 370.006

ප්‍රධාන ඉංජිනේරු නිලධාරී අංශය

කාර්ය මණ්ඩලය

2012 වර්ෂය තුළ සියළුම වර්ගයේ ටග් යාත්‍රා, නියමු සහ නැංගුරම්ලෑමේ යාත්‍රාවල මෙහෙයුම් හා අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යාම.

මෙම අංශයේ කාර්යය මණ්ඩලය විසින් සිදුකරනු ලබන සියළුම සාමාන්‍ය නඩත්තු කිරීම් කටයුතු වලට අමතරව දෛනිකව දියත් කිරීමට අවශ්‍ය යාත්‍රාවන් සඳහා නියමු සහ මෙහෙයුම් සේවා සැපයීම.

ඉංජිනේරු නිලධාරී අංශය ඉතාමත් උද්යෝගයෙන් යුතුව ටග් යාත්‍රාවල සියළුම නඩත්තු කිරීම් කටයුතු සිදුකරනු ලබන හෙයින් වැඩපලවල් සඳහා ආම්පන්න රැස්කිරීමට කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කොට ඇත.

වරාය ගිනි නිවීමේ ඒකකය

වරාය ගිනි නිවීම් ඒකකය 2012 වර්ෂය තුළ ගිනි සහ වෙනත් හදිසි අවස්ථාවලදී ඇති වන ආපදා තත්ත්වයන් අවම කරමින් හදිසි අවශ්‍යතා ආවරණය කිරීමට අමතරව අභ්‍යන්තරික වශයෙන් ගිනි ආරක්ෂණයන් ප්‍රමිතිගත කිරීමත් ක්‍රියාවේ යෙදවීමත් සිදුකරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිනි නිවීම් ඒකකය සමුද්‍රතෙල් දූෂණය, අන්තරායකාරී නැව් බඩු ඉහිරීම් වැනි හදිසි අවස්ථාවන් වලදී වගකීමකින් යුතුව ක්‍රියාත්මක වන කණ්ඩායමකි.

සමාලෝචිත වර්ෂය තුළ වරාය ගිනි නිවීම් ඒකකය පහත සඳහන් සේවාවන් සපයනු ලැබ ඇත.

ගිනි නිවීම සඳහා ප්‍රතිචාර	05
හදිසි ඇමතුම්	15
තෙල් නැව් සඳහා පොරොත්තු රාජකාරි	118
ගෑස් නැව් සඳහා පොරොත්තු රාජකාරි	21
නැව්වල අධිතාප වැඩ සඳහා පොරොත්තු රාජකාරි	1,071
අන්තරාදායක නැව්බඩු මෙහෙයවීමේදී පොරොත්තු රාජකාරි	19
ජැටි/ගුදම් යනාදිය සේදීම සඳහා ජලය ලබාදීම	61
ජලය පිටතට පොම්ප කිරීම	18
තෙල් දූෂණය පාලනය කිරීමේ කාර්යයන්	03
තෙල් නැව් පරීක්ෂාවට පිටත්ව යාම්	728

ගිනි ආරක්ෂණ ක්‍රියාකාරකම්

ගාල්ල, ත්‍රිකුණාමලය සහ මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ගොඩනැගිලි/දොඹකර/පාවෙන යාත්‍රාවල ගිනි ආරක්ෂණ පරීක්ෂා කිරීම් සිදුකරන ලදී.

පුහුණු කටයුතු

කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩමුළු	16
පිටස්තර පුද්ගලයින් දැනුවත් කිරීමේ සංචාරයන්	04
කොක්සන්වරු පුහුණු කිරීමේ පාඨමාලාව	04
නැව් තට්ටු ආවේක්ෂණ කටයුතු පුහුණුවන්නන් සඳහා ගිනි නිවීම් පුහුණුව	02
ලාෆ් සිමෙන්ති ගිනි නිවීම් පුහුණුව	01
ගිනි නිවීමේ ඒකකයේ කායී මණ්ඩලය සඳහා නැවත මතක් කිරීමේ ගිනි පුහුණුව	08
පොලිස් නිලධාරීන් සඳහා ගිනි නිවීම් පුහුණු	01
මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සඳහා බදවාගත් ගිනි භටයින් පුහුණුව	01
මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සේවකයින් සඳහා කාර්යාල පුහුණුව	13
කළමනාකරණ පුහුණු පාඨමාලාව	02

ලංකා බණිජ තෙල් ගබඩා පර්යන්තය, කොළඹ නැව් තටාකාංගනය හා කොළඹ විදුලිජනක යන්ත්‍රයන්හි (Colombo Power Plant) ගිනි නිවීමේ ඒකකයන් සමඟ ඒකාබද්ධව ගිනි නිවීමේ අභ්‍යාසයන් සිදුකිරීම.

ආදායම

2012 වර්ෂය තුළ වරාය ගිනි නිවීම ඒකකය උපයන ලද ආදායම

විස්තරය	ඇ.ඒ.ජ.ඩො.	රුපියල්
තෙල් නැව් සඳහා පොරොත්තු රාජකාරි	188,057	
ගෑස් නැව් සඳහා පොරොත්තු රාජකාරි	26,060	
අන්තරාදායක නැව් බඩු සඳහා පොරොත්තු රාජකාරි	33,240	90,000
පරීක්ෂණ චාරිකා සඳහා අයකිරීම්	18,060	
තෙල් දූෂණ වැලැක්වීම සඳහා අයකිරීම්	8,600	982,500
මුළු ආදායම	**274,017**	**1,072,500**

වරාය නිරාපද අංශය

වරාය නිරාපද අංශයෙන් වරාය තුළ සියළුම වර්ගයේ අන්තරාදායක නැව් බඩු මෙහෙයවීම සහ එහි ආරක්ෂණ තත්ත්වයන් නිරන්තරව නිරීක්ෂණයට ලක් කිරීම.

රසායන ද්‍රව්‍ය ඉහිරියාමේ සහ ගිනි ගැනීමේ සිද්ධීන් කිහිපයක් වරාය ගිනි නිවීම් ඒකකයේ සහයෝගයෙන් පාලනය කිරීම. එමෙන්ම අනතුරුදායක නැව් බඩු සහිත ගුදම් ඇතුළුව ගුදම් පරීක්ෂා කිරීම සහ බහළු පරීක්ෂා කිරීමේ කටයුතු ද වරින් වර කරගෙන යනු ලැබීය.

වරාය තුළ අවසර ලත් අධිතාප වැඩ කටයුතු වලට අමතර අනවසර අධිතාප වැඩ කටයුතු අනාවරණය කරගැනීම හා නවතා දැමීම සම්බන්ධ පරීක්ෂාවන් සිදුකෙරිණ. තවද සමුද්‍ර දූෂණ සම්බන්ධයෙන් ද පරීක්ෂාවන් සිදුකිරීමට අමතරව සේවක මණ්ඩල හා නාවික කටයුතු සම්බන්ධයෙන් ද හදිසි අනතුරු විභාග කොට විශ්ලේෂණය කරන ලදී.

- 2012 වසර තුළ කොළඹ වරායේදී මෙ.ටො. 421,748,377 ක අන්තරාදායක නැව් බඩු මෙහෙයවීම් සිදුකර ඇත.
- අනතුරුදායක ප්‍රති අපනයන නැව් බඩු ප්‍රවාහනය කරන බහළු 31,085ක් මෙහෙයවීම.
- ක්‍රියාකරවන කොට්ඨාසයේ සේවකයින් සඳහා වරාය තුළ අන්තරාදායක නැව් බඩු මෙහෙයවීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ ඊට අදාළ ආරක්ෂක පිළිවෙත් සම්බන්ධයෙන් දේශන මාලාවක් හඳුන්වාදීම.
- අධි පුපුරණ ද්‍රව්‍ය මෙ.ටො. 32,372 (GPIE) හා පුපුරණ ස්වභාවයේ ද්‍රව්‍ය මෙ.ටො. 9,428.709 (GP IAE/IIE) මෙහෙයුම් කර තිබේ.
- ජයබහළු පර්යන්තයේ සේවකයින්ගේ පෞද්ගලික ආරක්ෂාව සහ නාවික කොට්ඨාසයට අනුයුක්ත නැව් කම්කරුවන් පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතා කිරීම සම්බන්ධ කටයුතු සහකාර වරාය ආරක්ෂක පරීක්ෂකයින්ගේ සහාය ඇතිව ඉටු කිරීම.

තෙල් නැව් 13ක් කොළඹ වරායට පැමිණි අතර පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් බණිජ තෙල් වර්ග මුදාහරින ලදී.

නැව් භාණ්ඩ වර්ගය	ප්‍රමාණය (මෙ.ටො.)
ද්‍රව පෙට්‍රෝලියම් වායු	187,667,736
ගෑස් ඔයිල්/ජෙට් AI/ගැසොලින්/භූමිතෙල්	2,536,911,227
බොර තෙල්	933,054,525
ඉන්ධන	840,944,422
බේස් තෙල්	21,438,191

වෙරළ ප්‍රදීපාගාර අංශය

ජාත්‍යන්තර නෞකා මාර්ගය හරහා බස්නාහිර සහ දකුණු වෙරළ තීරය දිගේ පිහිටුවා ඇති ප්‍රදීපාගාරයන් නිසි පරිදි නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සිදු කරන ලදී.

ප්‍රවේශ ඇළ මාර්ගයන්හි ස්ථාපිත ආලෝක බෝයාවන්

ආලෝක බෝයාවන් නිරන්තර පරීක්ෂා කොට නඩත්තු කිරීම් සිදුකරන ලදී. හැරීම සඳහා පහසුකම් සැළසීමත්, කොළඹ වරායේ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ආශ්‍රිතව තෙල් නළ නැවත එලීමටත් කොළඹ වරායේ ප්‍රධාන නිරිතදිග ප්‍රවේශය නිරන්තරවම වෙනස් කිරීමට සිදුවිය.තවද නාවිකයින්ට නිරන්තරයෙන්ම CASA, SLAVO, LASO සහ එක්සත් රාජධානියේ ජල ශාස්ත්‍රීය කොට්ඨාසය වෙතින් ලැබෙන චක්‍රලේඛ ප්‍රකාරව නිසි පරිදි අවවාද කිරීම ද කරන ලදි.

උත්පාදිත ආදායම 2011/2012 ප්‍රදීපාගාර ගාස්තු

රු. මිලියන

	2010	2011 ඇස්තමේන්තුගත	2012 ප්‍රතික්ෂේපිත
ඒකාබද්ධ	534.93	511.761	544.877

වරාය යාත්‍රා අංශය

වරාය යාත්‍රා අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ කොළඹ වරායට පැමිණෙන යාත්‍රා සඳහා නියමු යාත්‍රා,නැංගුරම්ලෑමේ යාත්‍රා, නැංගුරම්ලෑමේ කණ්ඩායම් සැපයීම සහ සේවා පහසුකම් සැලසීමත්ය. මීට අමතරව විවිධ වැඩ කණ්ඩායම්, දූපත් දියකඩන හා නිරිත දිග දියකඩන වෙත ප්‍රවාහනය කිරීමත්, වරාය තුළ ජලය පිරිසිදුව තබා ගැනීමත්, ජීරාෆ් දියත් දොඹකර ආධාරයෙන් බර වැඩි එසවුම් මෙහෙයවීමත් සිදු කෙරේ.

ජලගුණ විද්‍යා සමීක්ෂණ අංශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයුම් කරනු ලබන සියළුම වරායයන්හි ජලගුණ විද්‍යා සමීක්ෂණ මෙන්ම වරායේ අදාළ කොට්ඨාසයන් මගින් කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් මිනින්දෝරුවන් සියළුම මිණුම් කටයුතු සඳහා සහභාගී විය.

- ප්‍රවේශ ඇළ මාර්ගයේ ගැඹුර මැනීම
- දකුණු වරාය ඉඩම් මැනීම සහ ගැඹුර මැනීම
- ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ ගැඹුර මැනීම
- වරාය ඇතුළත ජල ද්‍රෝණිය සහ නැංගුරම්පල වල ගැඹුර මැනීම
- ප්‍රවේශ ඇළ මාර්ගයේ පිහිටි බෝයා පිහිටීම පරීක්ෂා කිරීම
- කොළඹ වරාය සිතියම නැවත පරීක්ෂා කර බැලීමේ කාර්යය
- මෙහෙයුම් ස්ථානයේ මැනුම් කටයුතු (අඛණ්ඩව)
- බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ මැනුම් කටයුතු (තෙල් ටැංකි ව්‍යාපෘතිය)
- වරාය අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ සමීක්ෂණ සහ මට්ටම් කිරීම
- වරාය ප්‍රවේශ මාර්ගය පුළුල් කිරීමේ මධ්‍යම රේඛා ස්ථාපිතය සහ මට්ටම් කිරීම
- සමගි බහළු පර්යන්ත නැවත ඉදිකිරීම්හි ජලගුණ විද්‍යා සහ ඉඩම් මැනීම
- බදු ගිවිසුම් සඳහා සමීක්ෂණ කටයුතු
- බණ්ඩාරනායක පාලම දුම්රිය හරස් මාර්ගය නැවත ස්ථාපිත කිරීමේ කටයුතු වල මට්ටම් කිරීම් සහ සළකුණු කිරීම්

ගාල්ල වරාය

- යෝජිත නව මාර්ගයේ හරස්කඩය සහ සළකුණු කිරීම්
- පිටස්තර පුද්ගලයින් විසින් බලෙන් අල්ලාගත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ රූමස්සල පිහිටි ඉඩම් මැනීම
- සැහැල්ලු රුවල් යාත්‍රාංගනය වෙනුවෙන් බදු සැළසුම් කිරීම සඳහා වූ සමීක්ෂණය
- ගාලු සැළැස්ම යාවත්කාලීන කිරීම පිළිබඳ සමීක්ෂණය

ත්‍රීකුණාමලය වරාය

- බලෙන් අල්ලාගත් ඉඩම් මැනීම
- අෂ්රෆ් ජැටියේ සම්පූර්ණ ප්‍රදේශයම මට්ටම් කිරීමේ කටයුතු
- බදු ගිවිසුම් සැළැස්ම සඳහා සමීක්ෂණය

ඔලුවිල් වරාය

- පාලන ස්ථාන පරීක්ෂා කිරීම සහ ව්‍යාපෘති ප්‍රදේශයේ ඉඩම් සමීක්ෂණය
- මිණුම් උපදේශකයන් සමඟ ජලගුණ විද්‍යා සමීක්ෂණය

කන්කසන්තුරය වරාය

- යාපනය දිස්ත්‍රික් මිනුම් කාර්යාලයේ ඇති පැරණි සමීක්ෂණ සැළසුම් පරීක්ෂා කිරීම
- වරාය භූමි ප්‍රදේශය විමර්ශනය

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය

- අත්‍යවශ්‍ය කටයුත්තක් වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අදියර I පවරාදීම පිණිස සැළසුම් කටයුතු සහ ඉඩම් පිළිබඳ විස්තර ලේඛනය පිළියෙල කිරීම මිනුම් කොට්ඨාසය අධීක්ෂණය යටතේ සිදුකෙරේ.
- අදියර IIහි ඉඩම් පවරා ගැනීම සහ නැවත පදිංචි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමත කළ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් සහභාගී වීම
- ජල ද්‍රෝණිය, ප්‍රවේශය. ඇළ මාර්ගය මතුපිට ජලගුණ විද්‍යා සමීක්ෂණය සහ බෝයාවන්හි පිහිටීම සළකුණු කිරීම (ජනවාරි,පෙබරවාරි,මාර්තු සහ නොවැම්බර්)
- ජාතික ජලජීවී පර්යේෂණ ආයතනයේ නිලධාරීන් සමඟ නාවික ප්‍රස්ථාර අලුත්කිරීමේ සමීක්ෂණය
- CHC ආයතනය සමඟ එක්ව සාගර විද්‍යාත්මක දත්ත උපකරණ ස්ථාපිත කරනු ලැබීය
- ආයෝජකයින්ගේ ඉඩම් සඳහා බදු සැළසුම් පිළියෙල කිරීමේ සමීක්ෂණය
- මාර්ග ජාලය දිගේ පිරිසිදු කිරීම් සඳහා සළකුණු කිරීමේ වැඩ සිදුකිරීම
- පරිපාලන සංකීර්ණය අසළ නව ගොඩනැඟිල්ල සඳහා මිනුම් කටයුතු සහ සළකුණු කිරීමේ වැඩ කටයුතු
- සමස්ථ තෙල් ටැංකි සංකීර්ණ ප්‍රදේශය මිනුම් කිරීම සහ මට්ටම් කිරීම
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නව ගල් කැඩීමේ යන්ත්‍රාගාර භූමිය මට්ටම් කිරීම සහ සළකුණු කිරීම
- අදියර Iහි ඉදිකරන ලද ප්‍රදේශය, පරිපාලන ගොඩනැඟිලි සංකීර්ණය සහ දියකඩනය ප්‍රදේශයෙහි පාලන ජාලය නැවත ස්ථාපිත කිරීම
- ව්‍යාපෘති ඉංජිනේරුවන් විසින් ලබාදුන් විස්තර අනුව වෙනත් ආශ්‍රිත මිනුම් කටයුතු

නාවික අංශය

වාර්ෂික ලියාපදිංචි කිරීම් සහ නැව් සේවා සපයන්නන්, යාත්‍රා ක්‍රියාකරවන්නන්, නාවික සමීක්ෂකයන්, සුළු හා මහා පරිමාණ අළුත්වැඩියා කර්මාන්තශාලා, තෙල් සහ තෙල් මිශ්‍රිත ජලය සහ අපවිත්‍ර එකතුකිරීමේ සේවාවන් මෙම අංශයේ සම්බන්ධීකරණයෙන් සිදුකෙරිණි. වාර්ෂික ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

උපයන ලද ආදායම 2012

බලපත්‍රයේ නම	නිකුත් කළ ගණන	ආදායම
නැව් අළුත්වැඩියා බලපත්‍ර	124	3,508,140.19
නැව් තටාකාංගන බලපත්‍ර	73	1,150,846.69
සමීක්ෂණ බලපත්‍ර	36	673,667.75
නැව් සේවා සැපයුම් බලපත්‍ර	76	2,482,536.59
බෝට්ටු බලපත්‍ර	47	1,189,697.30
එස්ඒපීටී සහ වෙනත් බලපත්‍ර	21	375,990.21
එකතුව		**9,380,878.73**

සැළසුම් හා සංවර්ධන

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ඇතුළුව ව්‍යාපෘති කිහිපයක වැඩ කටයුතු සැළසුම් හා සංවර්ධන කොට්ඨාසය විසින් කරගෙන යනු ලැබීය.

1 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

ජාත්‍යන්තර නෞකා කර්මාන්තයේ වර්ධනය වන සේවා ඉල්ලුම සැපයීම සඳහා කොළඹ වරාය පුළුල් කිරීම ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ඇත. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය පහත සඳහන් අදියර දෙකකින් සමන්විත වේ.

1.1 වරාය යටිතල පහසුකම්

දියකඩනය ඉදිකිරීම, නව වරාය ද්‍රෝණිය සහ නාවික ඇළ මාර්ගය හැරීම සහ බොර තෙල් නල නැවත එලීම යන අංග වලින් වරාය යටිතල පහසුකම් සමන්විත වේ.

ඇස්තමේන්තුගත පිරිවැය	**ව්‍යාපෘති**	: රුපියල් බිලියන 44.8
පිහිටීම		: වර්තමාන ගිනිකොණ දිග දියකඩනය බටහිර දිශාව
වරාය ප්‍රදේශය		: අවම වශයෙන් හෙක්ටයාර 600
ප්‍රධාන දියකඩනය		: දිග මීටර් 5140
ද්විතික දියකඩනය		: දිග මීටර් 1100
බහළු පර්යන්ත		: 03කි. නැංගුරම්පල 3 සිට 4ක් සහිත එක් පර්යන්තයක දිග මීටර් 1200
ධාරිතාවය		: එක් පර්යන්තයක බහළු විස්සේ සම ඒකක මිලියන 2.4
වරාය ද්‍රෝණියේ ගැඹුර		: මීටර් 18 (අනාගතයේදී මීටර් 20 දක්වා ගැඹුරු කිරීමට පහසුකම් සහිතව)
ප්‍රවේශ ඇළ මාර්ගය		: පළල මීටර් 560, ගැඹුර මීටර් 20
නෞකා සැළැස්ම		: සමස්ථ දිග මීටර් 400, බඳ මීටර් 55, ගැඹුර මීටර් 16

වර්තමාන තත්ත්වය : සුළු වැඩ කොටසක් හැර ඉතිරිය සම්පූර්ණ කෙරිණ

1.2 පර්යන්ත සහ වෙනත් ආශ්‍රිත සේවා ඉදිකිරීම

1.2.1 දකුණු බහළු පර්යන්තය (SCT)

යෝජිත කොළඹ දකුණු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ පළමු පර්යන්තය ඉදිකර, මෙහෙයුම් කර භාරදීමේ (BOT) පදනම යටතේ දකුණු බහළු පර්යන්තය ඉදිකෙරෙනු ඇත.

සංවර්ධනකරු	කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත සමාගම (CICT)	
ක්‍රියාත්මක දිනය	2011 දෙසැම්බර් 01	
BOT ගිවිසුමේ කාලය	අවුරුදු 35	
ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය	ඇ.එ.ජ ඩොලර් මිලියන 500	
ජැටි බැම්මේ දිග	මීටර් 1200	
නැංගුරම්පල සංඛ්‍යාව	3 – 4	
ජල ගැඹුර	මීටර් 18	
ධාරිතාවය	විස්සේ සම ඒකක මිලියන 2.4	
BOT ගිවිසුම අත්සන් කිරීම	2011 අගෝස්තු 12	
ඉදිකිරීම් ආරම්භක දිනය	2011 දෙසැම්බර් 16	
මෙහෙයුම් කිරීමට අපේක්ෂිත වසර	මීටර් 360ක ජැටිය	2013 ජූනි
	මීටර් 600ක ජැටිය	2013 දෙසැම්බර්
	සමස්ථ ජැටිය	2014 අප්‍රේල්

වර්තමාන තත්ත්වය

ගොඩකිරීමේ කටයුතු, ජැටි බැම්මේ අත්තිවාරම සැකසීමේ කටයුතු, දිය ඇවුරුම් කුටිය ඉදිකිරීම දිය ඇවුරුම් කුටිය ඉදිකිරීම ඇරඹීම සහ පරිපාලන ගොඩනැඟිල්ල ඉදිකිරීම සාර්ථකව සිදුවෙමින් පවති.

1.2.2 නැඟෙනහිර බහළු පර්යන්තය (ECT)

දකුණු බහළු පර්යන්තයට සමගාමීව දකුණු වරායේ නැඟෙනහිර බහළු පර්යන්තයේ මීටර් 400ක දිගින් යුත් කොටසක් ඉදිකිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පියවර ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඇ.එ.ජ.ඩොලර් මිලියන 140ක් වන අතර 2013 වසරේදී සම්පූර්ණ කිරීමට නියමිතය.

නැඟෙනහිර බහළු පර්යන්තය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පවතින බහළු පර්යන්තයන් සමඟ කටයුතු කිරීමට වැඩි ගැඹුරකින් යුත් බහළු පර්යන්තයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුවනු ඇත.

2 යෝජිත කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ වරායට සමීපයෙහි යෝජිත වරාය නගරය සුඛෝපභෝගී හෝටල්, නිවාස සංකීර්ණ, සාප්පු සංකීර්ණ, පෞද්ගලික අංශය සඳහා නවීන කාර්යාල ඉඩ පහසුකම්, සැහැල්ලු රුවල් යාත්‍රාංගන සහ මෝටර් රථ ධාවන පථ, විවේකයෙන් ගතකිරීම සඳහා විනෝදජනක ක්‍රීඩා ක්‍රියාකාරකම් ආදියෙන් සමන්විත වනු ඇත.

ව්‍යාපෘති පිරිවැය	:	ඇ.එ.ජ.ඩොලර් මිලියන 900
ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය	:	2013 වර්ෂය

වර්තමාන තත්ත්වය

- පාරිසරික නිශ්කාෂණයන් ලබාගෙන ඇත.

- විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව ආයෝජනකරු විසින් ඉදිරිපත් කර ඇත.
- විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සියුම්ව පරීක්ෂා කිරීමට ලක්ව පවති

3 ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

බහුකාර්යය පර්යන්තයක් සහ සැහැල්ලු රුවල් යාත්‍රා සඳහා නැංගුරම්ලෑමේ පහසුකම් සළසනු පිණිස සමස්ථ ගාලු බොක්ක ප්‍රදේශය ආරක්ෂා කිරීමට දියකඩනයක් ඉදිකිරීම සඳහා වූ සංශෝධිත යෝජනාවක් සළකා බලමින් සිටී.

ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියේ පවතින අරමුදලින් දියකඩනය ඉදිකිරීමටත් PPP පදනම යටතේ අදියර IIහි බහුකාර්ය පර්යන්තය සංවර්ධනය කිරීමටත් සැළසුම් කෙරේ.

දියකඩනය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ජපන් යෙන් මිලියන 14,495කි.

වර්තමාන තත්ත්වය

- විෂයපථය වෙනස්කිරීම සඳහා විස්තරාත්මක නිර්මාණාත්මක කටයුතු දැනටමත් ආරම්භකර ඇත.
- නිර්මාණාත්මක කටයුතු වලින් 30%ක් මේ වන විට සම්පූර්ණ කර ඇත.
- ස්ථානයක් හඳුනාගෙන ඇති අතර මූලික සැළැස්ම සඳහා උපයෝගී කර ගැණින.
- ඉදිකිරීම් කටයුතු 2013 අගෝස්තු මාසයේදී ආරම්භ කිරීමට නියමිතය

4 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වූ යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල

සියළුම සේවකයින් වෙනුවෙන් එකම වහළක් යට පහසුකම් සළසනු පිණිස ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකිරීම. කැනල් අංගනයේ කලින් තීරණය කරගත් ස්ථානය වරාය පරිශ්‍රය තුළ නව ස්ථානයකට මාරු කෙරිණ. භූමියේ ඉඩකඩ ප්‍රමාණය සෘන මීටර් 31,000කි.

වර්තමාන තත්ත්වය

- අළුත් ස්ථානයේ පාංශු පරීක්ෂණයන් දැනටමත් ආරම්භ කර ඇති අතර 2013 ජනවාරි මස දී සම්පූර්ණ කෙරෙනු ඇත.
- ඉන්දියානු විදේශ බැංකුව සමඟ අරමුදල් පිළිබඳ කටයුතු සිදුකෙරෙමින් පවතී.

5 කොළඹ වරායේ අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීම - නැවත ස්ථාපනය කිරීමේ කටයුතු

නැවත ස්ථාපිත කිරීමේ කටයුතු කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව වරාය අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවති. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව අදාළ කොන්ත්‍රාත්කරු විසින් වරාය මාර්ග පුළුල් කිරීම් වලින් කොටසක් දැනටමත් සම්පූර්ණ කර ඇත.

මාර්ග පුළුල් කිරීමේ කටයුතු ඉදිරියට කරගෙන යාම ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආරම්භ කරන ලදි. ඉඩ ලබාගැනීම පිණිස ඇතැම් ගොඩනැඟිලි කඩා ඉවත් කිරීමට සිදුවිණ.

වර්තමාන තත්ත්වය

කලින් සඳහන් කළ ගොඩනැඟිලි වල සිටි කාර්ය මණ්ඩල අළුත් ස්ථානයකට යොමු කිරීමේ කටයුතු සාර්ථකව සිදුකෙරේ.

6 ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය

වර්තමානය වන විට විධිමත් ආකාරයෙන් භාවිතා නොකරන ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් අක්කර 3000ක ප්‍රමාණයක් භාවිතයට ගෙන ආර්ථික සහ සම්පත් වලින් ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ ඊශාන දිග පළාත සඳහා අගනගරයට අභිමුඛ වර්ධිත මධ්‍යස්ථානයක් වශයෙන් ත්‍රිකුණාමලය සංවර්ධනය කෙරේ.

මුදල් ප්‍රතිපාදන : රුපියල් මිලියන 40

වර්තමාන තත්ත්වය

- කාර්මික කළාපය සඳහා යෝජනා කැඳවීම් සම්පූර්ණ කෙරිණ. යෝජනා නවයක් ඉදිරිපත්විණ.
- යෝජනා අටක් පමණක් සුදුසුකම් ලැබීය.
- ප්‍රාථමික ඇගයීම් සඳහා ඇගයීම් කටයුතු සිදුකෙරමින් පවති.

7 යෝජිත පෑලියගොඩ ගුදම සහ අංගන සංකීර්ණය

කොළඹ පවතින මාර්ග තදබදය අවම කිරීමටත්, වරාය හා සම්බන්ධිත කටයුතු සිදුකරන පුද්ගලයින්ට කාර්යක්ෂම සේවයක් ලබාදීම සඳහාත් ගුදම් සංකීර්ණය පෑලියගොඩ ප්‍රදේශයේ ඉදිකෙරෙනු ඇත.

උණ බහළු පැටවුම් මෙහෙයුම් කටයුතු අළුතින් යෝජිත ගුදම් සංකීර්ණය වෙත මාරු කරනු ඇති අතර පූර්ණ බහළු පැටවුම් මෙහෙයුම් වලින් කොටසක් ද පෑලියගොඩට මාරුකෙරෙනු ඇත.

යෝජිත ගුදම සහ අංගන සංකීර්ණය සඳහා අක්කර 28ක වපසරියකින් යුත් ඉඩමක් පෑලියගොඩ ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇත. දුම්රිය මාර්ග පද්ධතියක් මගින් මෙම ගුදම් සංකීර්ණය වරාය හා සම්බන්ධ කෙරෙනු ඇත.

වර්තමාන තත්ත්වය

ඉහත සඳහන් කළ ඉඩම සඳහා වන පාංශු පරීක්ෂණය 2012 නොවැම්බර් මස 18 වැනි දින ආරම්භ කරන ලද අතර කටයුතු සිදුවෙමින් පවති.

දකුණු වරාය සංවර්ධන

හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ව්‍යාපෘතිය සහ නැව් තෙල් සැපයීමේ හා තෙල් ටැංකි සංකීර්ණය වැනි ව්‍යාපෘති කිහිපයක වැඩ කටයුතු දකුණු වරාය සංවර්ධන කොට්ඨාසය විසින් ආරම්භයේ සිටම තවදුරටත් කරගෙන යනු ලැබේ.

හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු සෑහෙන තරමකට සම්පූර්ණ කර ඇති අතර රෝ-රෝ නෞකා ඇතුළු අනෙකුත් මෙහෙයුම් කටයුතු 2012 වසර තුළදී පවත්වාගෙන යන ලදි. මේ අනුව දේශීය පරිහරණය සඳහා වූ වාහන 6,515ක් සහ ප්‍රතිඅපනයනය සඳහා වූ වාහන 4,388ක් මෙහෙයුම් කර ඇත.

කලින් කරන ලද යෝජනා කැඳවීම් ක්‍රියාපටිපාටිය සමඟ ආයෝජකයින් 07 දෙනෙකු තෝරාගෙන ඇති අතර වරාය තුළ සීනි,පෙට්‍රෝලියම් රසායන, පොහොර,සිමෙන්ති සහ ගුදම් පහසුකම් සඳහා ව්‍යාපාර ඇති කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. එක් ව්‍යාපාරයක් සඳහා

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ ගිවිසුමක් අත්සන් කොට ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට බලපොරොත්තු වෙන් සිටින අතර අනෙක් ගිවිසුම් අවසන් කරමින් පවති. වරාය තුළ ආයෝජක අවස්ථා උදෙසා අධික ඉල්ලුමක් ඇති බැවින් මෙම වසර තුළදී යොජනා කැඳවීමේ ක්‍රියාවලිය දෙවන වරටත් දියත් කර ඇත. මේ සඳහා ආයෝජකයින් 10 දෙනෙකු තම යෝජනා ඉදිරිපත් කර ඇති අතර ඒවා දැනට ඇගයීම් කරමින් පවති.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දකුණු වරාය සංවර්ධන කොට්ඨාසය මෙම වසර තුළ පළමු සහ දෙවන අදියර සඳහා අවශ්‍ය ඉඩම් පිළිබඳ මෙතෙක් පැවති ගැටළු සහගත තත්ත්වයන් නිරවුල් කිරීම ඇතුළුව ඉදිකිරීම් කටයුතු සඳහා මිළදී ගැනීම/පවරා ගැනීම් සම්පූර්ණ කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද කමිටුවක් මගින් මිළදී ගැනීමට සහ පවරා ගැනීමට අදහස් කරන ඉඩම් මිළදී ගැනීම සහ පවරා ගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳව මෙම කොට්ඨාසය තවදුරටත් කටයුතු කරගෙන යනු ලැබේ. පවුල් 600ක් නැවත පදිංචි කරවීම ද මීට ඇතුළත්ය. ඉහත සඳහන් කාර්යයේ කොටසක් වශයෙන් හෙක්ටයාර 500ක පමණ ඉඩම් වල මිනුම් කටයුතු දැනට නිමකර ඇත.

නැව්තෙල් සැපයීමේ පහසුකම සහ තෙල් ටැංකි සංකීර්ණ ව්‍යාපෘතිය මුළුමනින්ම පාහේ අවසන් කර ඇත. තෙල් ටැංකි සංකීර්ණයේ අතිරේක යටිතල පහසුකම් ඉදිකිරීම සඳහා ඇ.එ.ජ.ඩොලර් මිලියන 20ක අතිරේක ණය මුදලක් අනුමත කර ඇති අතර ඉදිකිරීම් කටයුතු මෑතකදි අරඹා ඇත. එමෙන්ම පළමු අදියරේ ගිවිසුමට අදාළ අතිරේක වැඩ කටයුතු දැනට සිදුවෙමින් පවති.

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියරේ ඉදිකිරීම් 2012 නොවැම්බර් මස ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා වූ සම්පූර්ණ පිරිවැය ඇ.එ.ජ.ඩොලර් මිලියන 808ක් පමණ වන අතර 2015 අග වන විට නිමකිරීමට නියමිතව ඇත. මෙමගින් පළමු අදියරේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මෙහෙයුම් උපකරණ සහ අනෙකුත් යටිතල පහසුකම් සමඟ මීටර් 2000ක පමණ අතිරේක ජැටි දුර ප්‍රමාණයක් සපයනු ලැබේ.

ඉහත සඳහන් ප්‍රධාන කර්තව්‍යයන්ට අමතරව මූලික ඉදිකිරීම් හැර වරාය මෙහෙයුම් නඩත්තු සහ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වල ද දකුණු වරාය සංවර්ධන කොට්ඨාසය නියැළී සිටී. ඇඹරුම් යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම, බිම් ඇතුරුම් ගල් නිෂ්පාදනය සහ නිලධාරීන්ගේ නිල නිවාස වලට ගෘහ භාණ්ඩ සැපයීම මීට ඇතුළත්ය.

සිවිල්

වරාය ව්‍යුහයන්,ගොඩනැඟිලි,මාර්ග,නිල නිවාස නඩත්තු කිරීම, වරායේ ගැඹුර පවත්වාගෙන යාම සහ වරාය කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත වෙනත් විවිධ වූ සේවාවන් සපයන සිවිල් ඉංජිනේරු කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රමුඛතම කොටසක් වේ. වරාය හා තොටුපළ සහ රටපුරා ඇති ප්‍රදීපාගාර වල නඩත්තු කටයුතු සිදුකරමින් එහි සේවාව තව දුරටත් පුළුල් කර ඇත.

පසුගිය වර්ෂ හා සැසඳීමේදී කරන ලද කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවශ්‍යතාවයන්ට සමගාමීව නඩත්තු කිරීමේ කටයුතු සැළසුම් කර ඇත. විධිමත් ක්‍රියාකාරකම් හඳුන්වා දී ඇති අතර ඉහළ ඵලදායිතාව සහ මනා පාලනයක් වෙනුවෙන් මෙහෙයුම් කටයුතු සඳහා ඒවා යොදාගැනීම සහ ආකල්පමය වෙනසක් ඇති කිරීම පිණිස කණ්ඩායමක් ලෙස මනා විනයක් සේවකයින් අතර පවත්වාගෙන ගොස් ඇත. ඉහළ ප්‍රමුඛතාවයක් සහිත නඩත්තු ක්‍රියාකාරකම් වෙනුවෙන් උචිත වන්නාවූ වැදගත්කමක් ලබා දී ඇති අතර ඒ අනුව පිළිගත හැකි මට්ටමක දී ප්‍රතිඵල කළමනාකරණය කෙරේ. නඩත්තු කිරීමේ කටයුතු වලට අමතරව ශ්‍රමය සහ යන්ත්‍රෝපකරණ උපරිම ලෙස භාවිතා කිරීම පිණිස ආයතනයේ ශ්‍රමිකයින් සමඟ සුළු ප්‍රමාණයේ සංවර්ධන කටයුතු ක්‍රියාවට නංවනු ලැබීය. ජයබහළු පර්යන්තයේ අංගන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සහ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කොරිඩෝරය ඉදිකිරීම යනාදිය උදාහරණ වේ.

පසුගිය වසර වලදී මුහුණ දුන් ප්‍රධානතම කරුණක් වුයේ වරායේ පවිත්‍රතාවය වන අතර අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සහ කොළඹ මහ නගර සභාව වැනි වගකිම් දරණ බලයලත් ආයතන සමඟ සහයෝගීත්වයෙන් ස්ථීර විසඳුම් ලබාගනිමින් ඒ සඳහා ආරම්භක කටයුතු සිදුකර ඇත.

කොට්ඨාසය තුළ සිටින අතිරික්ත ශ්‍රමිකයින් ඔවුන්ගේ හැකියාවන් අනුව වෙනත් ස්ථාන කිහිපයකට යොමුකර ඇති අතර ශ්‍රමික බලය අඩුකිරීමත් සමඟ පිළිගත හැකි මට්ටමකට නඩත්තු ක්‍රියාකාරකම් මෙහෙයවීම කළමනාකරණය කෙරිණ.

ද්‍රව්‍ය ලැබීම සහ පවරන ලද කාර්යයන් සඳහා ඒවා බෙදාහැරීම පිණිස මනා පාලනයක් මෙන්ම කොට්ඨාසය තුළ සිටින සියළුම ශ්‍රමිකයින්ගේ දීර්ඝ කරන ලද සේවා කාලයන් මාර්ගගතව අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා කොට්ඨාසය යටතේ ඇති සියළුම අංශ වෙත එකම ස්ථානයකින් ගබඩා කිරීමේ පහසුකම් ඇති කිරීමට සිවිල් ඉංජිනේරු කොට්ඨාසයට හැකියාවක් ලැබිණ.

සිවිල් ඉංජිනේරු කොට්ඨාසය විසින් මෙහෙය වන ලද එක් ප්‍රධාන සංවර්ධන කටයුත්තක් වුයේ කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීමයි. ඉන්දියානු රජයේ සංවර්ධන ආධාර යටතේ අබලි ද්‍රව්‍ය සම්පූර්ණයෙන් ඉවත්කිරීම සිදුකෙරුණු අතර කන්කසන්තුරය වරායේ යෝජිත සංවර්ධන කටයුතු සඳහා විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව ද පිළියෙල කරන ලදි.

විදුලි හා විද්‍යුත්

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විෂය පථයට අදාළ සියළුම වරාය වල සියළුම ඉංජිනේරු ව්‍යාපෘති සහ විදුලිබලය සහ සංදේශන ඉංජිනේරු ක්ෂේත්‍රවල පහසුකම් සැළසුම් කිරීම, කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් නඩත්තුව පිළිබඳව විදුලි සහ විද්‍යුත් කොට්ඨාසය වගකියනු ලැබේ.

විදුලිබල සහ සංදේශන ක්ෂේත්‍රවල සියළුම අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව සිදු කිරීම සඳහා 24 පැය පුරාම ප්‍රධාන ඉංජිනේරු සහ නියෝජ්‍ය ඉංජිනේරුවරුන් දෙදෙනෙකුගේ පාලනය යටතේ ඉහළ සුදුසුකම් ලත් වෘත්තීමය විදුලි/සංදේශන ඉංජිනේරුවරුන්ගේ කණ්ඩායමක් යොදවා ඇත. මෙය ලෝකයේ අනෙකුත් ජාත්‍යන්තර කේන්ද්‍ර වරාය වල පවත්නා තත්ත්වයට සරිලන පරිදි වරාය කටයුතු වලට අදාළ සියළුම සේවාවන්ගෙන් 95% ට වඩා සාර්ථක කර ගැනීම උදෙසා ඉවහල් වී ඇත.

විදුලිබල ඉංජිනේරු ක්ෂේත්‍රය යටතේ ආවරණය කරන ලද කටයුතු

- විදුලිබල මණ්ඩලයෙන් ලබා ගන්නා කි.වො.11ක විදුලිය බෙදාහැරීම; සමස්ථ ස්ථාපිත ධාරිතාවය මෙ.වො.18කි
- සියළුම ඌණ බලැති විදුලි ස්ථාපිතයන් සඳහා වූ විදුලි උපාංග ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම
- භාරන යාත්‍රාවල, ටග් යාත්‍රාවල සහ අනෙකුත් පාවෙන යාත්‍රාවල විදුලි උපකරණ ආදිය නඩත්තු කිරීම
- බහළු මෙහෙයුම් දොඹකරවල (Ship to shore yard crane) විදුලි උපකරණ නඩත්තු කිරීම
- නෞකා තොග නැව් බඩු මෙහෙයවීමේ දොඹකර නඩත්තු කිරීම
- විදුලි මෝටර් (AC/DC) සහ බහළු දොඹකරවල අනෙකුත් උපකරණ අළුත්වැඩියා කිරීම
- සමස්ථ ධාරිතාවය මෙ.වො. 15.5 සහිත පොරොත්තු සේවාවේ ඇති විදුලි උත්පාදක යන්ත්‍ර නඩත්තු කිරීම
- කි.වො.11ක භූගත විදුලි රැහැන් ජාලය ස්ථාපිත කිරීම, නඩත්තුව සහ ගැටළු සහගත තත්ත්වයන් නිරවුල් කිරීම
- වායු සම්කරණ පද්ධති සැළසුම් කිරීම, ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම

- නව රබර් ටයර් යෙදූ ග්‍රැන්ටි දොඹකර සඳහා ඉඩකඩ සැලසීම පිණිස ජයබහළු පර්යන්තයේ පහන් කණුවල උස වැඩිකිරීම
- කි.වො.500ක ෆොටෝ වෝල්ටීය පද්ධතියට සම්බන්ධිත ජාලකය සැළසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- කි.වො.11 පැමිණීමේ හා බෙදාහැරීමේ උපපොළ 03ක් වැඩිදියුණු කිරීම

විද්‍යුත් සහ සංදේශන ඉංජිනේරු ක්ෂේත්‍රය යටතේ ආවරණය කරන ලද කටයුතු

- VHF ගුවන් විදුලි තරංග ජාලය සැළසුම් කිරීම සහ නඩත්තු කිරීම (නාවික තරංග)
- බහළු පර්යන්තයේ ගෙගාහර්ට්ස් 2.4 Wi-Fi දත්ත සංදේශන ජාලය සැළසුම් කිරීම හා නඩත්තු කිරීම
- බහළු පර්යන්තයේ ගුවන් විදුලි තරංග හඳුනා ගැනීමේ (RFID) පද්ධතිය නඩත්තු කිරීම
- ඔප්ටිකල් ෆයිබර් ජාලය සහ දත්ත ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය සැළසුම් කිරීම සහ නඩත්තු කිරීම
- දුරකථන මාර්ග 2000ක ධාරිතාවයක් සහිත වරාය දුරකථන PABX පද්ධතිය සැළසුම් කිරීම හා නඩත්තු කිරීම
- රේඩාර්, ප්‍රතිරාව ශබ්දමානය (ECHO SOUNDER), චන්ද්‍රිකා සංදේශන උපකරණ, දිශාන්තර මිහිමත මංසෙවීමේ පද්ධතිය (DGPS) පදනම් කරගත් සමීක්ෂණ පද්ධති ආදිය ඇතුළත්ව නාවික පද්ධතීන් නඩත්තු කිරීම
- CCTV පද්ධතීන් සැළසුම් කිරීම හා නඩත්තු කිරීම
- පවතින ඔප්ටිකල් ෆයිබර් ජාලය පුළුල් කිරීම
- VHF ඩුප්ලෙක්ස් වැනලය සඳහා ඉඩකඩ සලසනු වස් ශබ්ද සන්නිවේදන (Voice Communication) පහසුකම් වැඩි කිරීම

කොන්ත්‍රාත් හා සැළසුම්

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොන්ත්‍රාත් හා සැළසුම් කොට්ඨාසයේ ප්‍රධාන වගකීම වන්නේ සිවිල් ඉංජිනේරු ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක සැළසුම් සකස්කිරීම හා එම ව්‍යාපෘති කළමනාකරණය කිරීමයි. වරාය අධිකාරියේ මෙවන් ව්‍යාපෘතීන් ලෙස, ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වලට පහසුකම් සපයනු ලබන නැංගුරම්පලවල්, පාලම්, ගොඩනැගිලි ව්‍යුහයන්, ගොඩනැගිලි හා මාර්ග වැනි වරාය යටිතල පහසුකම් සැපයීම දැක්විය හැකිය. තවද, සියළුම ප්‍රාදේශීය වරායන්ද ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම කොට්ඨාසවල නඩත්තුව සහ සංවර්ධනය සඳහා අවශ්‍ය වන සියළුම සැළසුම් සහ ඇඳීමේ කටයුතු කොන්ත්‍රාත් සහ සැළසුම් කොට්ඨාසය මඟින් ඉටු කෙරේ. ව්‍යාපෘති කළමනාකරණයට ඇතුළත් වන්නේ ටෙන්ඩර් ක්‍රියාවලිය,උපදේශක සේවා, ඉදිකිරීම් අධීක්ෂණය සහ එවැනි ව්‍යාපෘති වල තත්ත්ව පාලනය සහ ගිවිසුම් කළමනාකරණයි.

ඉහත සඳහන් දෑට අමතරව පෙරසවි අංගනයට අනුයුක්ත කර සිටි සේවකයින්ගේ කම්කරු ශ්‍රමය සෘජුව භාවිතා කරමින් කළ හැකි සුළු ඉදිකිරීමේ ව්‍යාපෘතීන් ද භාර ගෙන තිබේ. තවද, මෙම කොට්ඨාසය විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ඔලුවිල් සංවර්ධන ව්‍යාපෘතියේ ද නියැලී සිටී.

2012 වර්ෂයේ මෙම කොට්ඨාසය විසින් ඉටුකරන ලද ප්‍රධාන කර්තව්‍යයන් පහත පරිදි වේ.

ඔළුවිල් වරාය ව්‍යාපෘතිය

පළමු අදියර සඳහා හෙක්ටයාර 16ක ප්‍රමාණයේ ජල ප්‍රදේශයක් ආවරණය වන මීටර් 550 ක දිග ප්‍රමාණයකින් යුතු උතුරු දියකඩනය සහ මීටර් 773 ක දිග ප්‍රමාණයකින් යුත් දකුණු දියකඩනය

ලෙස සක්කගල් යෙදූ දියකඩන 02ක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අන්තර්ගත වේ. ධීවර කටයුතු සඳහා හෙක්ටයාර 06ක පමණ ජල ප්‍රදේශයක් වෙන් කෙරේ. දළ බර ටොන් 5000ක නෞකා වලට අවශ්‍ය ගැඹුර සැපයීම සඳහා වාණිජ වරාය ද්‍රෝණිය පළමු අදියර මීටර් 08ක් දක්වා හැරීමට සිදුවනු ඇත.

ඩැනිඩා ආයතනය මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන ආයතනය වේ. ව්‍යාපෘතියේ සමස්ථ වියදම වන යූරෝ මිලියන 46.1ක අඩුම සාර්ථක ලංසුකරු වෙත ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කෙරිණ. බලාපොරොත්තු නොවූ කාලගුණික තත්ත්වයන් සහ ඇතැම් නිර්මාණාත්මක/තාක්ෂණික ප්‍රශ්න හේතුවෙන් ව්‍යාපෘතියේ සමස්ථ වියදම යූරෝ මිලියන 43.13ක් වූ අතර එය 2012 දෙසැම්බර් මාසයේදී අවසන් කෙරිණ.

සියළුම උපදේශන සේවාවන්,ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු, තත්ත්ව පාලන ආදි කටයුතු කොන්ත්‍රාත් සහ සැළසුම් කොට්ඨාසය මගින් සිදුකරගෙන යනු ලැබිණ.

ඔලුවිල්හි වෙරළ සංරක්ෂණ කටයුතු

ඔලුවිල් වරායේ සමුද්‍රික කටයුතු වල සැළසුම්කරු වන ලංකා හයිඩ්‍රොලික් ආයතනය මගින් ඔලුවිල් වරායේ උතුරු කොටසේ සිදුවන වෙරළ බාදනය සඳහා පිළියම් ලෙස යොදාගත හැකි විසඳුමක් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අධ්‍යයනයක් ආරම්භ කළේය.

අරමුදල් පාවිච්චි කිරීම සඳහා ඩැනීඩා (DANIDA) ආයතනයේ අනුමැතිය සහිතව වැඩ කටයුතු පවරා දී ඇති අතර 2012 මැද භාගය වන විට නිම කිරීමට අපේක්ෂිතය. එකක් මීටර් 100ක දිගින් යුක්ත වූ මීටර් 4.0ක් ගැඹුරැති වෙරළින් ඔබ්බට දියකඩන 3ක් ඉදිකිරීම සඳහා සැළසුම් කර ඇති අතර මෙයින් වෙරළ තීරය දිගේ කි.මී. 2.5ක් ආවරණය වේ.

හර්තාල් පාලම පුළුල් කිරීම

පවතින පාලමේ අවශ්‍ය අළුත්වැඩියාකිරීම් ද ඇතුළත්ව හර්තාල් පාලම පුළුල් කිරීමේ ඉදිකිරීම් කටයුතු සාර්ථක කොන්ත්‍රාත්කරුවෙකු හට ප්‍රදානය කෙරුණු අතර රුපියල් මිලියන 209.7ක සමස්ථ වියදමකින් සම්පූර්ණ කෙරිණ.

සමගි බහළු පර්යන්තයේ අළුත්වැඩියාවන්

සමස්ථ වියදම රුපියල් මිලියන 372ක් වූ සමගි බහළු පර්යන්තයේ අළුත්වැඩියා කටයුතු සාර්ථක කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කෙරිණ. ජපාන රජය විසින් ව්‍යාපෘති නොවන සමාන්තර ආධාර අරමුදල් යටතේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 400ක් ලබා දී ඇත. ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවති.

ත්‍රිකුණාමලයේ පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම් මැනීම

ඉඩම් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කිරීමට සමගාමීව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් මැනීමේ කටයුතු සමස්ථ වියදම රුපියල් මිලියන 18.5කින් සම්පූර්ණ කෙරිණ.

අභ්‍යන්තර වරාය මාර්ග පුළුල් කිරීම

කොළඹ වරායේ අභ්‍යන්තර මාර්ග සහ වරාය ප්‍රවේශ මාර්ගය පුළුල් කිරීමේ සැළසුම් කිරීම් සහ ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙමින් පවතී. 2012 වර්ෂය තුළ දී කි.මී.1.5ක දුර ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇත.

ගාලු වරාය සංවර්ධනය

- සැහැල්ලු රුවල් යාත්‍රා අළුත්වැඩියා කිරීමේ කර්මාන්තශාලා ගොඩනැගිල්ල සමස්ථ වියදම රුපියල් මිලියන 21න් සම්පූර්ණ කෙරිණ.
- ගාල්ල රුමස්සල සංචාරක නිවාඩු නිකේතනයේ අළුත්වැඩියා කටයුතු සමස්ථ වියදම රුපියල් මිලියන 7.94න් සම්පූර්ණ කෙරිණ.
- යෝජිත සැහැල්ලු රුවල් යාත්‍රාංගනය සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කෙරිණ. යෝජිත සැහැල්ලු රුවල් යාත්‍රාංගනය සඳහා ටෙන්ඩර්පත් සැළසුම් කිරීම සහ සැකසීමේ කටයුතු සම්පූර්ණ කෙරිණ
- සැහැල්ලු රුවල් යාත්‍රාංගනය සඳහා අවශ්‍ය ආධාරක පහසුකම් සළසනු වස් යෝජිත සැළස්මේ ගොඩනැගිල්ල සැළසුම් කිරීම සිදුකෙරෙමින් පවතී.

වෙනත් කටයුතු

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිනි නිවීමේ හමුදාව සඳහා යෝජිත ගොඩනැගිල්ල වෙනුවෙන් සැළසුම් ඇඳීම සහ ටෙන්ඩර් ලිපි ලේඛන පිළියෙල කිරීම සම්පූර්ණ කර ඇත.
- වරාය අභ්‍යන්තර මාර්ග පුළුල් වීම හේතුවෙන් නැවත ස්ථාපිත කරනු ලබන සියළුම අවශ්‍යතා සඳහා ව්‍යුහයන්/පහසුකම් සැළසුම් කිරීම
- ගාල්ල වරායේ යෝජිත විදුලිය උපපොළ සැළසුම් කිරීම
- කොළඹ කොටුවේ සිට බිලුමැන්ඩල් තෙල් ටැංකි සංකීර්ණය දක්වා යෝජිත තෙල් නළ මාර්ගය සැළසුම් කිරීම
- දකුණු බහළු පර්යන්ත ව්‍යාපෘතියේ සැළසුම සමාලෝචනය
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවශ්‍යතාවයන් සඳහා පැලියගොඩ පිහිටි පෙර සැකසුම් අංගනයෙන් පෙර සැකසුම් ඒකක/සිමෙන්ති අච්චු නිෂ්පාදනය සහ බෙදාහැරීම
- යෝජිත විමධ්‍යගත මධ්‍යම මුළුතැන්ගෙයි සැළැස්ම

පරිශ්‍ර සහ භූගෝලීය තොරතුරු පද්ධති අංශය

කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය සහ ඔළුවිල් හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සියළුම නිශ්චල දේපළ/ඉඩම් සහ ගොඩනැගිලි පරිශ්‍ර අංශය විසින් කළමනාකරණය කරන අතර වත්කම් පරිසණකගත කිරීම සහ විස්තර සැකසීම භූගෝලීය පද්ධති අංශය විසින් සිදුකරනු ලැබේ.

දිවයින පුරා ඉඩම් අක්කර 8000ක් පමණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුවන අතර ඒවායින් පරිශ්‍ර 75ක් පමණ පිටස්තර පාර්ශ්ව/ආයතන වලට බදු දී ඇත.

වැඩි බදු කුලියක් සහිත නව බදු ගිවිසුම් 21කට ඇතුළත්වීම හරහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් පරිශ්‍ර අංශය පියවර ගෙන ඇති අතර 2012 වර්ෂය තුළ බදු කුලී වශයෙන් රුපියල් මිලියන 146.8ක පමණ මුදලක් උපයාගැනීමට හැකි විය.

මේ අතර 2012 නව චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් පද්ධතියට අනුකූලව හිස් වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිවාස සේවකයින්ට වෙන්කර දීමට හැකි විය.

යන්ත්‍රෝපකරණ

යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාසයේ ප්‍රධාන වගකීම වනුයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැව් භාණ්ඩ මෙහෙය වන උපකරණ සංචිතය වඩාත් යහපත් අන්දමින් නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සැළසුම් සකස් කිරීමත් මෙම උපකරණ බහළුගත සහ සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයවීම සඳහා අඛණ්ඩව පවත්වාගෙන යාමත්ය.

උපකරණ වල අනපේක්ෂිත හෝ හදිසි අළුත්වැඩියාවන් සිදුකිරීමට ඉතා ඉක්මනින් ප්‍රතිචාර දැක්වීමේ උපක්‍රමය හා අනුගතවෙමින් සැලසුම්සහගත නිවාරණ නඩත්තු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම තුළින් 2012 වර්ෂය තුළදී මෙම කොට්ඨාසය විසින් පහත සඳහන් දේ ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැව් භාණ්ඩ මෙහෙයුම් උපකරණ සමූහයක් සාර්ථක ලෙස නඩත්තු කරන ලදී.

- නෞකාවේ සිට වෙරළ දක්වා වූ බහළු දොඹකර 23
- රබර් ටයර් යෙදූ ග්‍රැන්ට් දොඹකර 77
- පීලි මත ක්‍රියාකරවන ග්‍රැන්ට් දොඹකර 04
- බහළු මෙහෙයුම් එසවුම් යන්ත්‍ර 19
- අඩු එසවුම් ට්‍රක් රථ (ටොන් 2.5 සිට 10 දක්වා) 119
- ප්‍රයිමුවර් රථ 185
- ට්‍රේලර් 220
- ඩ්‍රෝබාර් ට්‍රැක්ටර් 04
- ජංගම දොඹකර, වෝල් ඉලෙක්ට්‍රික්, ෆ්ලෝටින් සහ ඕවර් හෙඩ් දොඹකර සහ එලිවේටර්ස් 78
- නැව් බඩු මෙහෙයුම් කටයුතු සඳහා අඛණ්ඩ විදුලිබලය සැපයීම වෙනුවෙන් අවශ්‍ය පොරොත්තු විදුලි ජනක යන්ත්‍ර 07
- ෂංටින් ලොකොමෝටිව් එන්ජින් 03
- මෝටර් වාහන 685 (බස් රථ, ලොරි, වෑන් රථ, ඩබල් කැබ්, මෝටර් රථ, ත්‍රිරෝද රථ සහ යතුරු පැදි)

වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට විස්සේ සම ඒකක මිලියන 2.3කට වඩා සමස්ථ ප්‍රමාණයක් මෙහෙයවීමට හැකි වූ අතර කාර්යය සාධනය මෙම තත්ත්වයට ළඟාකර ගැනීමට හැකි වූයේ 90%ට වැඩි ප්‍රමාණයක් උපකරණ පැවති හෙයිනි. මෙය සැළසුම් සහගත උපකරණ නඩත්තු කිරීමේ සෘජු ප්‍රතිඵලයකි.

යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාසයේ විවිධ අංශ මඟින් 2012 වසර තුළදී පහත සඳහන් කටයුතු නිමකර ඇත.

සැළසුම් කළ නිවාරණ නඩත්තු වැඩ සටහනේ කොටසක් වශයෙන් නෞකාවේ සිට වෙරළ දක්වා වූ දොඹකර, පීලි මත සවිකළ ග්‍රැන්ටි දොඹකර සහ හුවමාරු දොඹකර සඳහා නඩත්තු කටයුතු 115ක් සිදුකරනු ලැබීය. ඊට අමතරව ව්‍යුහාත්මක අළුත්වැඩියාවන් 22 ද, අනතුරු හානි අළුත්වැඩියාවන් 69ක් ද සිදුකෙරිණ.

එන්ජින් සහ සම්ප්‍රේෂණ යන්ත්‍ර වල සම්පූර්ණ අළුත්වැඩියා 39ක් ඇතුළුව ප්‍රයිමූවර් රථ, අංගන ට්‍රැක්ටර් සහ බහළු මෙහෙයුම් ට්‍රක් රථ වලට අදාළ සැළසුම් කළ නිවාරණ නඩත්තු කටයුතු 65ක් සිදුකරන ලදී. සම්පූර්ණ අනතුරු හානි අළුත්වැඩියාවන් 45ක් සිදුකෙරිණ.

අඩු එසවුම් යන්ත්‍ර, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ, ට්‍රෙලර් සහ සියළුම වර්ග වල දොඹකර යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා ඇතුළු සාමාන්‍යයෙන් සිදුකරන නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු 1645ක් ඉංජිනේරු කොට්ඨාසය විසින් සාර්ථකව කරනු ලැබීය.

යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාසයේ වගකීම් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෝටර් වාහන සංචිතය (බස්,ලොරි,වෑන්,ඩබල් කැබ්,කාර්,ත්‍රීරෝද රථ සහ යතුරු පැදි) සහ ෂංටින් දුම්රිය එන්ජින් දක්වා ව්‍යාප්ත කෙරේ. සාමාන්‍යයෙන් සිදුකරන නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු 3,847ක් අදාළ කාලපරිච්ඡේදය තුළ ආවරණය කෙරිණ.

බදු ක්‍රමය මත මෙහෙයුම්කරුවන් දෙදෙනෙකු විසින් මෙහෙයුම් කර නඩත්තු කරනු ලබන "සමර්හිල්"හි තෙල් තොග ගබඩා සංකීර්ණය මෙම අංශයේ අධීක්ෂණය යටතේ වසර තුළදී සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක කරන ලදී.

යන්ත්‍රෝපකරණ වැඩ

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යාන්ත්‍රික වැඩ ඉංජිනේරු කොට්ඨාසය සියළුම වානේ ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව වගකිව යුතු වේ. සියළුම නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා, නියමු යාත්‍රා, හාරන යාත්‍රා වලට අදාළ සියළුම වානේ අළුත්වැඩියා කටයුතු සහ ජයබහළු පර්යන්තය සහ සමගි බහළු පර්යන්තයන්ට අදාළ බහළු මෙහෙයුම් දොඹකර, බහළු ගෙන යන කුඩා ටෙලර් වලට අදාළ සියළුම ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු පිළිබඳ සේවය සැපයීමෙන් මෙම කොට්ඨාසය තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරයි. නැව් බඩු මෙහෙයුම් උපකරණ සහ සමුද්‍රික යාත්‍රා සඳහා අවශ්‍ය අමතර කොටස් යාන්ත්‍රිකව නිපදවීමේ කාර්යයේ ද මෙම කොට්ඨාසය නිරතව සිටී. තවද මෙම කොට්ඨාසය දම්වැල් සහ කොකු පරීක්ෂා කිරීම මෙන්ම මෙහෙයුම් අවශ්‍යතා සඳහා ග්‍රෑබ් උපකරණ නඩත්තු කිරීම පිළිබඳව ද වගකිව යුතු වේ. කොළඹ තෙල් සංකීර්ණයේ සංවර්ධන ව්‍යාපෘතීන් ද භාර වී ඇත්තේ මෙම අංශයට ය. මේ අනුව කොළඹ වරායේ සිට කොළඹ තෙල් සංකීර්ණය දක්වා දැනට භාවිතා වන තෙල් නළ වෙනුවට අළුතින් පෙට්‍රොලියම් තෙල් නළ මාර්ගයක් එලීමේ ව්‍යාපෘතිය සැළසුම් කර ඇත. නිෂ්පාදන වැඩි ටොන් ප්‍රමාණයක් වැඩි පීඩනයක් සහිතව මාරුකිරීම අරභයා මෙම තෙල් නළ පද්ධතිය විශ්කම්භය අඟල් 12ක් වූ නළ දෙකකින් ද විශ්කම්භය අඟල් 10න් යුක්ත වූ නළ එකකින් ද සමන්විත වේ. මෙයින් කොළඹ වරායේ නැව් තෙල් සැපයීමේ ව්‍යාපාරයට වැඩි ආදායමක් උපයාගත හැකි වේ.

මෙම වසර තුළදී පෑස්සුම්කරුවන්ගේ පහසුව සඳහා මෙම කොට්ඨාසය විසින් TIG පෑස්සුම් සම්බන්ධ පුහුණු පාඨමාලාවක් ද පැවැත්වීය. මෙම පුහුණුකරුවන්ගෙන් හය දෙනෙකු ඕනෑම වර්ගයක නිෂ්පාදන කටයුතු සම්බන්ධිත TIG පෑස්සුම් වැඩ සඳහා සුදුසුකම් ලැබූ අතර එමඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට තෙල් නළ පෑස්සීම වැනි නිශ්චිත පෑස්සුම් කටයුතු භාරගැනීමට හැකි වී තිබේ.

2012 වසර තුළදී ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා කුඩා බෝල යොදා දිනුම් ඇදීමට භාවිතා කරනු ලබන ලොතරැයි යන්ත්‍රයක් රුපියල් මිලියන 4.2 වියදමකින් නිෂ්පාදනය කරන ලදී. එමඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට රුපියල් මිලියනයක ආදායමක් ලැබුණු අතර රටට විදේශ විනිමය ද ඉතිරි කර ගත හැකි විය.

ඉහත සඳහන් කටයුතු වලට අමතරව මෙම කොට්ඨාසය විසින් පහත සඳහන් ප්‍රධාන කර්තව්‍යයන් ඉටුකරන ලදි.

- බහු රාජ්‍ය රට වලට යැවෙන නැව් බඩු සඳහා වූ බණ්ඩාරනායක පාලමේ අංක 3 දරණ ගුදමේ දොරවල් 08ක් සහ අංක 4 දරණ ගුදමේ දොරවල් 06ක් අළුත්වැඩියා කිරීම
- මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ ඉන්ධන හල සඳහා තෙල් ටැංකි දෙකක් සහ ඉන්ධන බෙදාහැරීමේ යන්ත්‍ර දෙකක් ස්ථාපනය කිරීම සහ තෙල් නළ එලීම
- ''සිංහබාහු'', ''අයිරාවණ'' සහ ''නීලමහ'' නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා වල බඳේ ප්‍රධාන අළුත්වැඩියාවන් සම්පූර්ණ කරන ලද අතර ''මේඝා'' ගිනි නිවන යාත්‍රාවේ සහ ''හංසකාවා'' භාරන යාත්‍රාවේ බඳෙහි අළුත්වැඩියා කටයුතු මෙම වසර තුළ දී ආරම්භ කරන ලදි.
- හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ රෝ- රෝ වාහන අංගනය සඳහා මීටර් 650ක් දිගැනි වැටක් ඉදිකරන ලදි.
- කොට්ඨාස වල භාවිතා කරනු ලැබූ වානේ අල්මාරි 15ක් ප්‍රතිසංස්කරණය කරන ලද අතර එමගින් මෙම භාණ්ඩ ප්‍රාග්ධන වියදමින් අයදුම් නොකොට භාවිතා කිරීමට හැකි විය.
- සුභසාධක කටයුත්තක් ලෙස සේවකයින් හට නැවුම් කිරි සැපයීම සඳහා ජාතික පශු සම්පත් මණ්ඩලයේ කිරිහල් කොට්ඨාස පරිශ්‍රයන් තුළ ස්ථාපනය කිරීම සඳහා කටයුතු කරන ලදි.
- ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා කුඩා බෝල යොදා දිනුම් අදිනු ලබන ලොතරැයි යන්ත්‍ර 03ක් අළුත්වැඩියා කෙරිණ.
- බණ්ඩාරනායක පාලම සඳහා වානේ ගරාදි 80ක් නිෂ්පාදනය කිරීම සහ ගැල්වනයිස් කිරීම
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිනි නිවන ඒකකය සඳහා භාවිතා කරන පොම්ප 6ක් සම්පූර්ණයෙන්ම අළුත්වැඩියා කිරීම
- අනෙකුත් කොට්ඨාස සඳහා ප්‍රධාන යාන්ත්‍රික වැඩ 253ක් නිම කිරීම

නාවික ඉංජිනේරු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම පාවෙන යාත්‍රා නඩත්තු කිරීමේ සහ අළුත්වැඩියා කිරීමේ ප්‍රධාන වගකීම නාවික ඉංජිනේරු කොට්ඨාසයට පැවරී ඇත. නාවික කටයුතු, මෙහෙයුම් කටයුතු, සිවිල් ඉංජිනේරු නඩත්තු කටයුතු සහ සිය මෙහෙයුම් කාර්යයන් සඳහා ආරක්ෂක අංශය වෙත අවශ්‍ය ප්‍රමාණවත් තරම් පාවෙන යාත්‍රා සපයාදීම මෙම අංශය මගින් සහතික කෙරේ. නාවික කටයුතු, සිවිල් ඉංජිනේරු කටයුතු සහ ආරක්ෂක අංශ විසින් භාවිතා කරනු ලබන පිටතින් එන්ජින් සවිකරන ලද බෝට්ටු නඩත්තු කිරීමට ද නාවික ඉංජිනේරු අංශයේ වගකීම වී ඇත.

එමෙන්ම තොග නැව්බඩු මෙහෙයවීම සඳහා මෙහෙයුම් අංශයට අවශ්‍ය උපකරණ සැපයීම ද මෙම අංශයේ වගකීමයි. එසේම ගෑස් උඳුන්, බත් පිසින උඳුන්, ඇළුමිනියම් භාජන සහ අනෙකුත් උපකරණ වැනි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළුතැන්ගෙයි උපකරණ නඩත්තු කිරීම ද මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යාත්‍රා දියත් කරන මාර්ග නඩත්තු කිරීම සහ මෙහෙයවීම ද මෙම අංශය මඟින් සිදුවේ.

නාවික ඉංජිනේරු කොට්ඨාසය අංශ දෙකකින් සමන්විත වන අතර වසර තුළ එම අංශයන් ලබාගත් සාර්ථක ප්‍රතිඵල පහත දැක්වේ.

නාවික අංශය 1

නැවත සැකසීමේ ඉංජිනේරු අංශය

වරායේ සියළුම නැංගුම් ලෑමේ ටග් යාත්‍රා, ''මේඝ'' ගිනි නිවීමේ යාත්‍රාව, ''ප්‍රදීප - II'' ප්‍රදීපාගාර සේවා යාත්‍රාව, ''සේරුවිල'' මගී යාත්‍රාව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භාරන යාත්‍රා සහ පිටතින් එන්ජින් සවිකල සියළුම යාත්‍රා නඩත්තු කිරීමේ සහ අළුත්වැඩියා කිරීමේ කටයුතු සම්බන්ධීකරණය පිළිබඳව, සමුද්‍රික I අංශය යටතේ පවත්නා නැවත සැකසීමේ ඉංජිනේරු අංශය වගකියනු ලැබේ. කොළඹ වරායේ නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා 05ක්, ත්‍රිකුණාමල වරායේ නැංගුරම්ලෑමේ ටග්යාත්‍රා 01ක්, ගාලු වරායේ නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා 01ක්, කන්කසන්තුර වරායේ නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා 01ක් සඳහා මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට මෙම අංශය කටයුතු කර ඇත. මෙම කටයුතු ක්‍රියාත්මක කරන අතරතුර මෙම පාවෙන යාත්‍රා සඳහා වූ ලොයිඩ් ලේඛන වර්ගීකරණ සමීක්ෂණ අවශ්‍යතා අනුව යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාවන් ද ඉටුකර ඇත.

තවද මෙම වසර තුළදී ප්‍රධාන භාරන යාත්‍රා දෙක වන ''හංසකාවා'' ට්‍රෙලින් සක්ෂන් භාරන යාත්‍රාව සහ ''දිය කොවුලා'' ග්‍රැබ් හොපර් භාරන යාත්‍රාව මනා මෙහෙයුම් තත්ත්වයකින් පවත්වාගෙන යාම සඳහා නඩත්තු කටයුතු කරගෙන යනු ලැබීය. තවද, ''බුවල්ලා'' කටර් සක්ෂන් භාරන යාත්‍රාවේ සියළුම ව්‍යුහාත්මක සහ පින්තාරු කිරීම ද ඇතුළුව යාත්‍රා ඔදෙහි අළුත්වැඩියා කටයුතු ද මෙම කොට්ඨාසය විසින් සම්පූර්ණ කර ඇත. තවද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක, නාවික සහ සිවිල් ඉංජිනේරු කොට්ඨාස වල භාවිතා කරනු ලබන පිටතින් එන්ජින් සවිකල යාත්‍රාවල සාමාන්‍ය අළුත්වැඩියා නඩත්තු කටයුතු ද මෙම කොට්ඨාසය මඟින් සිදුකර ඇත.

''සිංහබාහු'' සහ ''අයිරාවණ'' ටග් යාත්‍රා වල වියළි තටාකාංගනගත අළුත්වැඩියාවන් ඇතුළුව ප්‍රධාන අළුත්වැඩියා කටයුතු වර්ෂය තුළදී සිදුකරනු ලැබීය. ''හංසකාවා'' භාරන යාත්‍රාව හදිසි අළුත්වැඩියා කටයුත්තක් වෙනුවෙන් වියළි තටාකාංගනගත කෙරිණ. එසේම ''බරණ'' සහ ''විජයභාහු'' මෝටර් ටග් යාත්‍රා සඳහා තටාකාංගන සමීක්ෂණය වෙනුවට ජලය මත සමීක්ෂණයන් සිදුකරනු ලැබූ අතර ඒවායේ සියළුම අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලැබිණ.

වියළි තටාකාංගන වෙනුවට පේටන්ට් දියත් මඟ භාවිතා කරමින් සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සහභාගීත්වයෙන් ''මේඝා'' පාවෙන ගිනි නිවීමේ යාත්‍රාවේ දැඩි පීඩනයක් එල්ලකර සිදුකරන පිරිසිදු කිරීම් සහ සම්පූර්ණයෙන් පින්තාරු කිරීමේ කටයුතු ඉතා සාර්ථකව කරගෙන යනු ලැබිණ.

වරාය යාත්‍රා අංශය

නියමු දියත් යාත්‍රා සහ මුරින්ග් යාත්‍රා ආදිය අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම ප්‍රධාන වශයෙන් වරාය යාත්‍රා අංශයට පැවරී ඇත. මේ අනුව නාවුක කොට්ඨාසයේ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට සමත්ව ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම නියමු බෝට්ටු, මූරින් යාත්‍රා සහ වෙනත් යාත්‍රාවල කාලීනව සිදුකළ යුතු නඩත්තු කටයුතු සහ අළුත්වැඩියා කටයුතු වල නිරතවෙමින් සිටින අතරතුර ''නියමු 10'', ''නියමු 14'' නියමු යාත්‍රාවන් ද ''රුහුණ 1'' මුරින් යාත්‍රාව ද වරාය යාත්‍රා ඉංජිනේරු අංශය විසින් වර්ෂය තුළ දී නැවත සකස්කරනු ලැබීය. නියමු යාත්‍රා 10,11,12,13,14 හා 15 ද , මූරින් යාත්‍රා 2, 3 සහ එකෝ 3 යාත්‍රාවේ ද වර්ගීකරණ සමීක්ෂණ කටයුතු සාර්ථකව කරගෙන යනු ලැබිණ.

නාවික අංශය II

නැව් තැනීමේ අංශය

නැව් තැනීමේ අංශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාවෙන යාත්‍රාවන්හි සියළුම දැවමය අළුත්වැඩියා කටයුතු සහ ෆයිබර් ග්ලාස් අළුත්වැඩියාවන්ට ප්‍රධාන වශයෙන් වගකිව යුතු වේ. තවද එය ශ්‍රී ලංකා

වරාය අධිකාරියේ දියත් යාත්‍රා වල සහ කිමිදුම් බෝට්ටු වල ෆෙන්ඩර් අළුත්වැඩියාවන්, ලී වැඩ සහ යාත්‍රාවන්හි ලී බඳ වල අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදුකරන ලදී. සියළුම ජීආර්පී බෝට්ටු වල සහ දැවමය බඳ සහිත දියත් යාත්‍රා වල ෆයිබර් ආවරණ අළුත්වැඩියා කිරීමට ද හැකි විය. නාවික කොට්ඨාසය විසින් භාවිතා කරනු ලබන නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා වල දැවමය ගෘහභාණ්ඩ අළුත්වැඩියාව, පනේල වැඩ (Paneling) සහ ෆෙන්ඩර්ස් අළුත්වැඩියා කටයුතු නැව් තැනීමේ අංශය විසින් සිදු කරන ලදී.

වර්ෂය තුළදී පේටන්ට් දියත් මගෙහි ටොන් 600ක දියත් මෙහෙයුම් දෙකක් සිදුකරනු ලැබූ අතර අංක 01 සහ 02 දියත්මගෙහි දියත් මෙහෙයුම් 12ක් සිදුකරනු ලැබිණ. නියමු යාත්‍රා 02ක්, මූරින් යාත්‍රා 04ක්, කුඩා ප්‍රමාණයේ යාත්‍රා කිහිපයක්, නැංගුරම්ලෑමේ ටග්යාත්‍රා 05ක් සහ වෙනත් යාත්‍රා 04ක වෙනත් නඩත්තු කටයුතු සහ අළුත්වැඩියා කටයුතු සිදුකරගෙන යන අතරතුර යාත්‍රා 03ක ප්‍රධාන අළුත්වැඩියාවන් වර්ෂය තුළ දී සිදුකරනු ලැබිය.

නැව්බඩු යාත්‍රා අළුත්වැඩියා අංගනය

ක්‍රියාකරවන කොට්ඨාසය විසින් භාවිතා කරනු ලබන ඇඳගෙනයාමේ ටග් යාත්‍රා, මෝටර් දියත් යාත්‍රා, වතුර බත්තල්, තට්ටු බත්තල් වල නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු කෙරෙහි මෙම අංගනය වගකිව යුතු අතර මෙම යාත්‍රා වල මලකඩ ගැටිති ඉවත් කර සුද්ද කිරීම (Grit Blasting) හා පින්තාරු වැඩ කරගෙන යනු ලැබේ. ක්‍රියාකරවන කොට්ඨාසය විසින් ඉහත සඳහන් කරන ලද යාත්‍රාවල මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට මෙම අංගනයට හැකි විය.

වර්ෂය තුළ ක්‍රියාකරවන, නාවික, ආරක්ෂක හා ඉංජිනේරු කොට්ඨාස, ගාල්ල වරාය, ත්‍රිකුණාමලය වරාය සහ අනෙකුත් බාහිර ආයතන විසින් ඉල්ලා සිටින ලද විවිධ ප්‍රමාණයේ කම්බි හා මැනිලා කඹ සිලිංග 527ක් ද, විවිධ ප්‍රමාණයේ තිර රෙදි 210ක් ද, විවිධ ප්‍රමාණයේ කැන්වස් ආවරණ 21ක් ද මෙම අංශය විසින් නිෂ්පාදනය කර සපයන ලදී.

අත් කරත්ත, අපද්‍රව්‍ය ගෙන යන කරත්ත, විල්බැරෝ වැනි විවිධ වර්ගයේ කරත්ත වල අළුත්වැඩියා කටයුතු සිදු කරන අතරතුර විල්බැරෝ සහ අත්කරත්ත 16ක් නිෂ්පාදනය කෙරිණ. එමෙන්ම විවිධ වර්ගයේ පයිප්ප නිෂ්පාදනය සහ අළුත්වැඩියා කටයුතු මෙම අංගනය විසින් කර ගෙන යනු ලැබිණ. ඊට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාස විසින් ඉල්ලා සිටින ලද විවිධ උපකරණ නිෂ්පාදනය කිරීම සහ මුළුතැන්ගෙයි උපකරණ, ඇළුමිනියම් නිෂ්පාදන හා අත් මෙවලම් අළුත්වැඩියා කිරීම ද සිදු කෙරිණ.

මෙම අංශය කොළඹ වරායේ දියත්මඟ 06ක් නඩත්තු කර මෙහෙයුම් කරනු ලබයි. වර්ෂය තුළදී දියත් මෙහෙයුම් 19ක් සිදුකරන ලද අතර යාත්‍රාවල අළුත්වැඩියා කටයුතු වල නිරත විය. (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යාත්‍රා 13 සහ පෞද්ගලික අංශයේ යාත්‍රා 06) මෙම අංශය දියත් මඟ පෞද්ගලික පාර්ශ්වයන් වෙත කුලියට ලබාදීම මගින් රු.10,355,688.87ක ආදායමක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට උපයා දී ඇත.

බේරේ අංගනය

ක්‍රියාකරවන කොට්ඨාසය මගින් භාවිතා කරනු ලබන වානේ නැව්බඩු බත්තල් වල නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු සඳහා මෙම අංශය වගකියනු ලැබේ. වර්ෂය තුළ දී නැව්බඩු බත්තල් සහ වතුර බත්තල් වල වානේ අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදුකරනු ලැබීය. මහනුවර අමරපුර සංඝසභා උපසම්පදා උළෙල වෙනුවෙන් ද පාවෙන වේදිකාවක් අංගන කාර්යය මණ්ඩලය විසින් වසර තුළදී සපයනු ලැබීය. වසර තුළ දී ජයබහළු අංගනයේ ට්‍රෙලර් 04ක සම්පූර්ණයෙන් මලකඩ කඩා ඉවත්කර, පින්තාරු කෙරිණ. නළ මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වානේ නිෂ්පාදනයන් සම්පූර්ණයෙන් මලකඩ කඩා ඉවත්කර පින්තාරු කරන ලදී.

නාවික ඉංජිනේරු කොට්ඨාසය සියළුම කොට්ඨාසයන් සඳහා ඉතා සාර්ථකව සේවාවන් සැළසීය. කාර්යය මණ්ඩලයේ සහ සේවකයිනේග් ඇපකැපවීම සමඟින් පවත්නා සම්පත් උපයෝගී කරගැනීම හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාවෙන යාත්‍රා සම්බන්ධයෙන් වූ සියළුම මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට මෙම කොට්ඨාසයට හැකි විය.

සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ

මෙම කොට්ඨාසයේ මූලික කාර්යයන් පහත පරිදි වර්ග කළ හැක.

ද්‍රව්‍ය ප්‍රසම්පාදනය

අදාළ බලධාරීන් විසින් ප්‍රාග්ධන භාණ්ඩ හෝ පාරිභෝජන භාණ්ඩ මිළදී ගැනීම උදෙසා වරක් අනුමැතිය ලබාදුන් පසු මිළ දී ගැනීම සඳහා අවශ්‍ය වන අනෙකුත් පහසුකම් සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාසය මගින් පිළියෙල කරනු ලබයි.

වට්ටෝරු කළමනාකරණය

මිළ දී ගැනීමේ ඇණවුමට අනුව ද්‍රව්‍ය ලැබුණු විට සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාසය විසින් භාණ්ඩ ලබාගැනීම් සහ වට්ටෝරු පාලනය කිරීම සිදුකරනු ඇත.

කොට්ඨාස ආශ්‍රිත අදාළ ව්‍යාපෘති කළමනාකරණය

නව ස්වයංක්‍රීය ප්‍රසම්පාදන සහ වට්ටෝරු කළමනාකරණ පද්ධතියක් මිළ දී ගත් අතර ව්‍යාපෘතිය සක්‍රීයව කරගෙනයාම පිණිස වර්තමානයේ දී පූර්ව ක්‍රියාත්මක කිරීමේ පරීක්ෂණයක් සිදුකරගෙන යනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ අනුමත කළ ටෙන්ඩර් සංඛ්‍යාව

විස්තරය	ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව	ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය
කැබිනට් මණ්ඩලය පත් කළ ටෙන්ඩර් මණ්ඩලය (අනුමත සීමාව රුපියල් මිලියන 100ට වැඩි)	නැත	නැත
අධ්‍යක්ෂ මණ්ඩලය (දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය අංක 1) (රුපියල් මිලියන 20 සිට මිලියන 100 දක්වා)	12	03
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය (දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල අංක 2) (රු. 250,000/- සිට රුපියල් මිලියන 20 දක්වා)	51	1,376
"බී" ටෙන්ඩර් මණ්ඩලය (දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල අංක 03) (අනුමත සීමාව රු. 250,000/- ට අඩු)	51	3,432

දේශීය මිළදී ගැනීම් සඳහා 2012 වර්ෂය තුළ සමස්ථ වියදම

ප්‍රාග්ධන නොවන භාණ්ඩ	රු.550,718,675/=
ප්‍රාග්ධන අයිතම	රු.236,265,628/=

විදේශීය මිළදී ගැනීම් වෙනුවෙන් 2012 වර්ෂය තුළ සමස්ථ වියදම (පිරිවැය සහ නැව් ගාස්තු වටිනාකම)

ප්‍රාග්ධන නොවන අයිතම	රු.513,343,924/=
ප්‍රාග්ධන භාණ්ඩ	රු.198,434,232/=

විවෘත කළ ණයවර ලිපි	131
විවෘත කළ ටෙලිග්‍රැෆික් හුවමාරු සංඛ්‍යාව	16

2012 වර්ෂය තුළ වාප්පු අංශය මඟින් නිශ්කාෂණය කර ගන්නා ලද භාණ්ඩවල විස්තරය

නැව් භාණ්ඩ	71
ගුවන් භාණ්ඩ	78
තැපැල් පාර්සල්	05

2012.12.31 දිනට තොග වටිනාකම රු. 1,793,911,686/=

ප්‍රධාන ගබඩාව සහ තොග පාලන

2012 වර්ෂය තුළ ගබඩා වලට ලැබුණු භාණ්ඩ වටිනාකම (ප්‍රාග්ධන සහ ප්‍රාග්ධන නොවන)	රු. 2,738,178,299/=
භාවිතා කරනු ලබන අංශයන් වෙත නිකුත් කළ භාණ්ඩ වටිනාකම (ප්‍රාග්ධන සහ ප්‍රාග්ධන නොවන)	රු. 3,270,540,720/=

තොරතුරු පද්ධති කොට්ඨාසය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තොරතුරු තාක්ෂණය පිළිබඳ පරමාර්ථයන් සමස්ථ වශයෙන්ම එහි ව්‍යාපාරික අරමුණු සමඟ බැඳී පවතී. තොරතුරු පද්ධති කොට්ඨාසයට වරායේ තොරතුරු තාක්ෂණ පද්ධති ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත. එමෙන්ම ව්‍යාපාරික කටයුතු සඳහා වඩාත් නවීනතම තොරතුරු පද්ධති යෙදවීම පිළිබඳව එය මූලිකත්වය ගෙන ක්‍රියාකරයි. තොරතුරු තාක්ෂණය හා වරාය ව්‍යාපාර අතර දැඩි සම්බන්ධයක් පවතී. වරායේ ව්‍යාපාරික කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා තොරතුරු තාක්ෂණයට ඇති හැකියාව අතිමහත් වන අතර මෙම හැකියාව තුළින් කළාපයේ අනෙකුත් තරඟකාරී වරායයන් අභිබවා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉදිරියට ගෙන යා හැක. තොරතුරු තාක්ෂණය මඟින් මෙහෙය වනු ලබන ව්‍යාපෘති ගැන සළකා බලන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාර්ථකත්වය උදෙසා තොරතුරු තාක්ෂණ කොට්ඨාසය විසින් ඉමහත් මෙහෙයක් සිදුකළ හැක.

2012 වසරේ දී තොරතුරු පද්ධති කොට්ඨාසය මඟින් භාරගන්නා ලද අරමුණු දැනට භාවිතා කරන පද්ධති යටතේ විස්තර කර ඇත. තවද මෙමඟින් එම පද්ධති වල වැදගත් දියුණුවක් එක්කර ඇත.

බහළු පර්යන්ත කළමනාකරණ පද්ධතිය (සීටීඑම්එස්) - ජයබහළු පර්යන්තය/සමගි බහළු පර්යන්තය

නේවිස් (NAVIS) පර්යන්ත කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු නව/වෙනස් වන ව්‍යාපාරික අවශ්‍යතා හේතුකොට ගෙන මුහුණපෑමට සිදුවූ ප්‍රශ්න රැසක් මෙම නව ක්‍රමවේද අනුබද්ධතාවය තුළින් සාර්ථක කිරීම සහතික කර ඇත. භාවිතා කරන්නන් විශාල සංඛ්‍යාවකට අන්තර්ජාල ප්‍රවේශ මොඩියුල පහසුකම් වඩාත් ප්‍රචලිත කිරීමට පියවර ගෙන ඇත. මෙම කාර්යය සම්පූර්ණ කිරීමෙන් පසුව නියෝජිතයින් වරායට පැමිණීමේ අවශ්‍යතාවය අවම කර ඇති අතර ලිපි කටයුතු අවම කිරීමෙන් තොරතුරු හුවමාරුව වඩාත් වේගවත් කර ඇත. මෙම පද්ධතියට බාධාවක් වනුයේ ‘‘එක්ස්ප්‍රස්’’ දත්ත සමුදායට අදාළ තොරතුරු ගබඩා කිරීමේ පහසුකමින් වැඩි ප්‍රමාණයක් ඉතා සීඝ්‍රයෙන් වැඩිවන දත්ත පරිමාවට ඇතුළත් කරගැනීමට සිදුවීමයි. මෙම තත්ත්වය මඟහැරවීම සඳහා **පර්ජින් මොඩියුලයක්** (Purging Module) මිළට ගත් අතර වසර තුළදී නිෂ්පාදන පද්ධතිය සඳහා එය සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඇත.

විද්‍යුත් දත්ත හුවමාරු පද්ධතිය (EDI)

බහළු පර්යන්ත කළමනාකරණ පද්ධතිය(CTMS) හරහා පහත දක්වා ඇති විද්‍යුත් දත්ත අන්තර් හුවමාරු පහසුකම් ක්‍රියාත්මක කර ඇත.

මෙම පහසුකම් දැනට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන අතර නැව් සමාගම්/නියෝජිතායතන සඳහා භාවිතයේ පවති.

CODECO

බහළු දොරටුවෙන් ඇතුළුවීමේ/පිටවීමේ වාර්තාව

එක්සත් ජාතීන්ගේ EDIFACT පණිවුඩ ආකෘතිය අනුව නියෝජිතායතන වලට දිනපතා පෙරවරු 08.00 වාර්තාවක් ඉදිරිපත් කෙරේ.

COARRI

බහළු ගොඩබෑමේ/පැටවීමේ වාර්තාව

එක්සත් ජාතීන්ගේ EDIFACT පණිවුඩ ආකෘතිය අනුව නියෝජිතායතන වලට දිනපතා පෙරවරු 08.15ට වාර්තාවක් ඉදිරිපත් කෙරේ.

BAPLIE

වරාය සැළැස්ම/ඇසිරීමේ ව්‍යුහය - දැනට භාවිතයේ යොදවා ඇති සහ ඉඩකඩ ඇති හිස් ස්ථාන පිළිබඳ පණිවුඩය

ඇතුළත පැමිණෙන BAPLIE සමඟ පර්යන්තයෙන් පිටත්වීමේ වාර්තාව (TDR) බහළු පර්යන්ත කළමනාකරණ පද්ධතිය මඟින් අනුබද්ධ කෙරේ. මෙහි කොළඹදී බෑමට නියමිත බහළු පිළිබඳ විස්තර අඩංගු වන අතර පිටතට යැවෙන BAPLIE පිළිබඳව විස්තර ද පිළියෙල කෙරේ. පිටතට යැවෙන BAPLIE පිළිබඳව, පිටත්වී යන යාත්‍රාවේ භාණ්ඩ ඇසිරීමේ ව්‍යුහය, යාත්‍රාවේ නියෝජිතායතනය වෙත සපයනු ලැබේ.

අන්තර්ජාල ප්‍රවේශ මොඩියුලය

බහළු පර්යන්ත කළමනාකරණ පද්ධතියේ අන්තර්ජාල ප්‍රවේශ මොඩියුලය දැනට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කෙරේ. පිටත සිටින නැව් සේවා වලට/නියෝජිතායතන වලට පහත සඳහන් විමසිම් අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පද්ධතියට දැන් ප්‍රවේශ විය හැක.

- නෞකා උපලේඛන පිළිබඳ විමසීම
- බහළු ගොඩබෑමේ ලේඛන
- බහළු පැටවීමේ ලේඛන
- EDI ක්‍රමයට එක්කිරීම
- පවත්නා බහළු ප්‍රමාණය විමසීම
- උපකරණ පවත්නා ස්ථානය සොයා ගැනීම (බහළු, ට්‍රක් යනාදිය)

නැව් බඩු කළමනාකරණ පද්ධතිය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගණුදෙනුකරුවන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් CTMS නැව් භාණ්ඩ මොඩියුලයක් 2011 දී මිළට ගන්නා ලදි. නැව් බඩු නිශ්කාෂණය කිරීමේ කටයුත්තේදී මෙම ක්‍රමයෙන් බොහෝ වාසිදායක තත්ත්වයන් ඇති විය. ඒ අතර පහත සඳහන් කරුණු ප්‍රධාන වේ. එනම් ගණුදෙනුකරුවන්ගේ සේවා ඉල්ලීම් ඔවුන්ගේ කාර්යාල වලින්ම ආරම්භ කිරීම, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉන්වොයිස් කෙටුම්පත් නිකුත්කිරීම, ලංකා බැංකුවේ ගිණුම් හිමියන්ට ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් මුදල් ගෙවීමේ පහසුකම හෝ අන්තර්ජාල මුදල් හුවමාරු පහසුකම සහ ඕනෑම බැංකුවක හරපත්/බැරපත් මගින් අන්තර්ජාල භාවිතා කිරීමෙන් ගෙවීම් කිරීමට හැකි වීම

මෙම මොඩියුලය අවධීන් දෙකකින් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත. අපනයන ක්‍රියාවලිය දැනටමත් ක්‍රියාත්මක කර ඇති අතර ආනයන පද්ධතිය දෙවන අවධියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

EDI හරහා මෙම මොඩියුලය මගින් උපකාරී වන පහසුකම් - අපනයන

- අපනයනකරුගේ කාර්යාලයෙන් අන්තර්ජාල හරහා සේවා ඉල්ලීම් ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් බිල්පත් සකස් කිරීම සහ ඒවායේ හරි වැරදි බැලීම සඳහා අන්තර්ජාලය හරහා අපනයනකරුට යැවීම. යම් සාවද්‍යතාවයක් පිළිඹිබු වේ නම්, අපනයනකරුට එය ප්‍රතික්ෂේප කළහැකි අතර එමගින් අර්බුද සහ ප්‍රමාදයන් මගහරවා ගැනීමට හැකි වේ.
- CTMS එසැනින් යථාවත් කිරීමෙන් තම කාර්යාල වලින් විද්‍යුත් බැංකු ක්‍රමය හරහා මාර්ගගත ගෙවීම් කිරීමේ පහසුකම හෝ දිවයිනේ ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් මුදල් ගෙවීමේ පහසුකම
- අන්තර්ජාල ප්‍රවේශය හරහා තම කාර්යාල වලින් විද්‍යුත් මාර්ගයෙන් නිවැරදි ලෙස බහළු අඩුක්කිරීමේ තොරතුරු හුවමාරුව
- ගණුදෙනුකරුවන් තම තොරතුරු අන්තර්ජාලය හරහා සැපයීමත් සමඟ දොරටු කටයුතු වඩාත් නවීකරණය සහ කඩිනම් කිරීම

- මාර්ගගත තොරතුරු බිහිදොර සමඟ ගෙවීම් කිරීමෙන් අපනයන කාර්යාලයේ දී භෞතික වේගවත් ලේඛන පරීක්ෂා කිරීමේ හැකියාව
- බහළු පිළිබඳව අන්තර්ජාල හරහා කලින් උපදෙස් දීම මගින් CTMS සමඟ සම්බන්ධ වීම
- නිවැරදි රේගු ප්‍රකාශන අංක මගින් රේගු දෙපාර්තමේන්තුවට නිරවද්‍යතාවය සොයබැලීමට සහාය දැක්වීම
- මානව මැදිහත්වීම අවම කරමින් උපරිම වශයෙන් විනාඩි 45 තුළ සම්පූර්ණ ක්‍රියාවලියට ගතවන කාලය අඩු කිරීම
- ස්වයංක්‍රීය පරීක්ෂා කිරීම් තුළින් නිරවද්‍යතාවය උපරිම කිරීම සහ සාවද්‍ය ක්‍රියාකාරකම් ඉවත් කිරීම

ඔරැකල් මූල්‍ය පද්ධතිය

ඉතා උසස් මට්ටමකින් යුත් කාර්යය සාධනයක් අරමුණු කරගනිමින් ඉතාමත් පහළ මට්ටමක සේවයක් සැළසූ සර්වරය, පොදු ලෙජරය, ලැබිය යුතු ගිණුම් සහ මුදල් කළමනාකරණ මොඩියුලය වැඩි පහසුකම් සහිතව නව සර්වරයක් වෙත 2011 වසරේදී මාරුවිය. මෙය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව අතින් සිදුකරන ලද බොහෝ කටයුතු ස්වයංක්‍රීය කරන ලද අතර, මුදල් කොට්ඨාසයේ ක්‍රියාවලීන් සරල කිරීම තුළින් එහි කටයුතු කාර්‍යක්ෂමතාවයකින් සහ නිරවද්‍යතාවයකින් යුක්තව සිදුකරනු ලැබීය. විද්‍යුත් ව්‍යාපාරයන්හි (e-Business) වට්ටෝරු සහ මිළ දී ගැනීම් කළමනාකරණ මොඩියුලය සඳහා නව සර්වරයේ ධාරිතාවයන් ඉවහල් වේ. එය 2012 වර්ෂයේදී අදාළ යන්ත්‍රය තුළ ඔරැකල් මූල්‍ය පද්ධතිය ඉහළින්ම ක්‍රියාත්මක කරවීමට මගපාදයි.

වට්ටෝරු ගත භාණ්ඩ පාලනය සහ ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය

දැනට පවත්නා පද්ධතිය කොට්ඨාසයේ සියළුම කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව පෙනී ගිය අතර සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාසයේ අවශ්‍යතාවයන් ප්‍රමාණවත් අන්දමින් ඉටුකිරීම උදෙසා විකල්පයක් අවශ්‍ය බව පෙනී ගියේය.

සියළුම අවශ්‍යතා වලට මුහුණදීමට අවශ්‍ය වන සුදුසු විසඳුමක් ලෙස විද්‍යුත් ව්‍යාපාර එකතුවක වට්ටෝරුගත සහ ප්‍රසම්පාදන කළමනාකරණ මොඩියුලයක අවශ්‍යතාවය සළකා බැලිණ. මොඩියුල දෙකක් මිළට ගන්නා ලද අතර දැනට ඒවා ක්‍රියාත්මක කිරීමේ අවධියේ පවති.

මොඩියුලය අවශ්‍ය අන්දමින් සකසාගැනීමේ ක්‍රියාවලිය 2012 වසරේ අවසාන භාගයේදී සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද අතර වසර පුරාම ඊට සමගාමීව භාවිතා කරන්නන් සඳහා පුහුණුව ලබාදෙන ලදි. නව පද්ධතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නැවැත්වීමට සිදුවූයේ මුදල් අංශයේ ගිණුම් සහ දැනට පවත්නා මාදුකාංග මොඩියුලය (PSCAPS) විසින් දෙනු ලැබූ සැපයුම් කොට්ඨාසයේ ගිණුම් අතර පැවති අසමානත්වය නිසාය. එබැවින් නිවැරදි තොග තත්ත්වය දැනගැනීම සඳහා වට්ටෝරු ලේඛන භෞතික වශයෙන් දැනට පරීක්ෂා කරගෙන යනු ලැබේ. මේ තත්ත්වය තෝරාගැනීමෙන් පසු නව පද්ධතිය යොදාගත හැකිවේ.

නව වැටුප් පත්‍රිකා පද්ධතිය

අවශ්‍යතා එක් කිරීම,පද්ධති අධ්‍යයනය, විශ්ලේෂණය සහ සංවර්ධනය යන අවධීන් ඉකුත් වූ පසු 2011 අගභාගයේදී ක්‍රියාත්මක කිරීමේ අදියර ආරම්භ කරන ලද අතර එය 2012 දී අවසන් කරන ලදි. මෙම පද්ධතිය ප්‍රධාන වශයෙන් මුදල් අංශයේ අවශ්‍යතාවයන් ඉටුකිරීමට යොදාගනු ලබන අතර අවසාන අවධි වලදී එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම අංශයන් සමඟ බද්ධ කෙරේ. නව වැටුප් පත්‍රිකා පද්ධතිය මානව සම්පත් පද්ධතිය සමඟ අනුබද්ධ කෙරෙන අතර යථෝක්ත පද්ධතිය

සම්පූර්ණ ක්‍රියාත්මක කිරීමෙන් පසු නිවාඩු/අතිකාල නඩත්තුව සහ මාර්ගගත (Online) ණය ක්‍රියාවලිය ස්වයංක්‍රීය පත්කළ හැකිවේ. දැනට එහි නිරවද්‍යතාවය සඳහා මෙම ක්‍රමය පවත්නා වැටුප් පත්‍රිකා පද්ධතිය සමඟ පරීක්ෂා කරගෙන යනු ලබයි.

සේවක කොටස් වල සෞඛ්‍ය පහසුකම් කළමනාකරණ පද්ධතිය (EHMS) - වෛද්‍ය පද්ධතිය

වෛද්‍ය අංශයේ දත්ත සැකසීමේ කර්තව්‍යයන් සංවර්ධනය කිරීම සඳහා වූ පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය 2012 වසරේදී නිමකරන ලදි. ගිගා බයිට් (GB) 146ක දෘඩ තැටි 4ක් සමඟ IBM සර්වර් X 3850 M2 එකක් මිළට ගත් අතර LINUX RED HAT ක්‍රියාත්මක පද්ධතියට සවිකරන ලදි.

සේවක කොටස් වල සෞඛ්‍ය පහසුකම් කළමනාකරණ පද්ධතිය LINUX ක්‍රියාත්මක පද්ධතිය යටතේ Oracle 10g දත්ත සමුදායේ ඇතිව සමඟ VB ජාලය භාවිතා කරමින් වැඩිදියුණු කරන ලදි. මෙය වෛද්‍ය කොට්ඨාසයේ වාර්තා තබාගැනීමේ කර්තව්‍යයන් සපුරා ගැනීමට ඉවහල් කරගනු ලබන අතර එමගින් රෝගීන් ලියාපදිංචි කිරීම, ප්‍රතිකාර, ඖෂධ නිකුත් කිරීම, රෝගීන්ගේ වෛද්‍ය පරීක්ෂණ වාර්තා, ඇතුළත් කරගැනීම් සහ වෙනත් ආශ්‍රිත කාර්යයන් පහසු කෙරේ. වර්තමානයේදී මෙම පද්ධතිය සමාන්තරව ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම්ව ඇත.

පවත්නා පද්ධතීන් නඩත්තු කිරීම

යොදාගැනීමේ පද්ධති ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි මෘදුකාංග සහ සහායක දෘඩාංග නඩත්තු කිරීම තොරතුරු පද්ධති කොට්ඨාසයේ ප්‍රධාන වගකීම වේ. ඕනෑම තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමේ සම්පූර්ණ ප්‍රයත්නයන්ගෙන් 60%ක් පමණ පද්ධති නඩත්තු කිරීම සඳහා වේ. මෙය පද්ධති සංවර්ධන චක්‍රයේ දීර්ඝතම ක්‍රියාත්මක කිරීමේ අවධිය වශයෙන් සැළකේ. පද්ධතියේ කටයුතු අවසන් කිරීමත් සමඟ නඩත්තු කිරීමේ අවධියද අවසන් වේ. පද්ධතීන් ඇරඹීම සහ පවත්වාගෙන යාම තොරතුරු පද්ධති කොට්ඨාසයේ වගකීම වන බැවින් තොරතුරු පද්ධති කොට්ඨාසයට භාරකරනු ලබන නඩත්තු කටයුතු වල ප්‍රමාණය විශේෂ අවධානයට යොමුවිය යුතු කරුණකි. මෘදුකාංග සහ දෘඩාංග කාලීනව නඩත්තු කිරීම උදෙසා තොරතුරු පද්ධති කොට්ඨාසය විසින් ගනු ලබන ක්ෂණික ක්‍රියාමාර්ග තොරතුරු පද්ධති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය ලබාදේ.

සමාලෝචිත වර්ෂය තුළදී තොරතුරු පද්ධති කොට්ඨාසය විසින් පහත දැක්වෙන පද්ධති නඩත්තු කිරීම භාරගෙන තිබේ.

එෆ්සීඑල්/එල්සීඑල්/ගොඩබෑම් හා බෙදාහැරීමේ පද්ධතිය

යථෝක්ත පද්ධතීන් ක්‍රියාත්මක කරනු ලබන්නේ IBM මූලික රාමුව සහිත යන්ත්‍රසූත්‍ර මගින් වන අතර ගණුදෙනුකරුවන්ට බාධාවකින් තොර සේවයක් ලබාදීම සඳහා අවශ්‍ය ආරක්ෂිත ක්‍රියාමාර්ග තුළින් මනා ලෙස ඉටුකරනු ලබන සේවයක් සහතික කිරීම සඳහා පියවර ගෙන ඇත. ආයෝජන මණ්ඩලය, කටුනායක සහ පිටකොටුවේ ලේඛන සැකසුම් මධ්‍යස්ථානයන්හි ඇති ගොඩබෑමේ හා බෙදාහැරීමේ පද්ධති තවමත් ක්‍රියාත්මක කරනු ලබන්නේ මූලික රාමුව සහිත යන්ත්‍රසූත්‍ර වලිනි.

බහළු රැඳවුම් මධ්‍යස්ථානය/පැලියගොඩ

පද්ධති සහයෝගය හා පුහුණුව ලබාදෙන ලදී. තත් කාර්යය වාර්තා සඳහා කරනු ලබන ඉල්ලීම් සපුරා ඇත. සර්වර් නඩත්තුව සහ දත්ත තබාගැනීමේ ක්‍රියාවලි අධීක්ෂණය කරන ලද අතර සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී.

ආරක්ෂක පාලනය සහ බලපත්‍ර නිකුත්කිරීමේ පද්ධතිය

භාවිතා කරන්නන් සඳහා පද්ධති සහයෝගය,පුහුණුව සහ තත්කාර්යය වාර්තා සපයන ලදි. සර්වර් නඩත්තුව සහ දත්ත තබාගැනීමේ ක්‍රියාවලි අධීක්ෂණය කරන ලද අතර සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි. වැඩි මෙහෙයුම් පද්ධතියක් සහිත නව P ඛණ්ඩයේ පද්ධතියක් දක්වා සර්වර් යන්ත්‍ර වැඩිදියුණු කරන ලද අතර මූලික දත්ත ස්වරූපය ද ඔරැකල් 8- i සිට 10 g දක්වා සාර්ථක ලෙස වැඩිදියුණු කරන ලදි.

මානව සම්පත් සංවර්ධන

වෘත්තීය දක්ෂතා/නිපුණතා සහිත පුද්ගලයින් ලබාදීම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාමූහික අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් මානව සම්පත් කොට්ඨාසය විශාල කාර්යයභාරයක් ඉටුකරයි.

නිසි කලට ආයතනයේ ඉලක්ක සපුරාගැනීම සඳහා අදාළ තනතුරු වෙනුවෙන් සුදුසු පුද්ගලයින් ආකර්ශනය කරගැනීම පිළිබඳව මානව සම්පත් සංවර්ධන කොට්ඨාසය වගකිව යුතුවේ. සුදුසු ස්ථාන වලට සුදුසු සේවකයින් අනුයුක්ත කළ පසු මානව සම්පත් කර්තව්‍යයන් උපරිම මට්ටමින් නඩත්තු කිරීමෙහිලා ඔවුන් රඳවාගැනීම අවශ්‍ය වේ.

2012 වසර ආරම්භයේදී විධායක නිලධාරීන්, විධායක නොවන නිලධාරීන් සහ තාක්ෂණික හා තාක්ෂණික නොවන කොටස් වල නිලධාරීන් ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ථ ශ්‍රම බලකාය 11,008ක් විය. 2012 අවසාන වන විට එම සංඛ්‍යාව 10,200ක් විය. මෙම සමස්ථ ශ්‍රම බලකායෙන් 9,373ක් කොළඹ වරායේ සේවයේ යෙදී සිටි අතර ගාල්ල සහ ත්‍රිකුණාමලය වරාය වල පිළිවෙලින් 391 සහ 436ක් සේවයේ යෙදී සිටියහ.

2012 වසර තුළ අභ්‍යන්තර උසස් කිරීම් පිළිබඳ විස්තර

අනුමත කළ බඳවාගැනීමේ පටිපාටි පදනම් කරගෙන අනුමත කළ සේවක සංඛ්‍යාව තුළ අභ්‍යන්තර වශයෙන් පැවති පුරප්පාඩු 395ක් පිරවීමට කටයුතු කරන ලදි.

බාහිර බඳවාගැනීම් පිළිබඳ විස්තර

2012 වසර තුළ ස්ථීර සහ කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් 64 දෙනෙකු බාහිරව බඳවාගන්නා ලදි. බාහිර බඳවාගැනීම් සහ අභ්‍යන්තර උසස්කිරීම් වලට වඩා විධායක නොවන ශ්‍රේණි වලට අදාළ නව බඳවාගැනීමේ පටිපාටි වල අඩංගු නිර්ණායකයන්ට අනුකූලව සේවකයින් බොහෝ ප්‍රමාණයක් ඔවුන්ගේ කාර්යසාධනය, පැමිණීම සහ හැසිරීම සැළකිල්ලට ගෙන ඔවුන්ගේ වැටුප් පරිමානයේ ආසන්නතම ඉහළ තලයේ තබන ලදි.

නව අනුමත සේවක සංඛ්‍යාව

සේවා අත්‍යවශ්‍යතාවය සහ පහත සඳහන් කරුණු සැළකිල්ලට ගෙන සියළුම අංශ ප්‍රධානීන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 12,987 සිට 9,990 දක්වා අඩුකරන ලදි.

- නව බඳවාගැනීමේ පටිපාටිය සහ නව වැටුප් ව්‍යුහය
- බහුවිධ නිපුණතා බාණ්ඩ පිළිබඳ සංකල්පය
- පරිගණක භාවිතාකිරීමේ පද්ධති
- නවීනතම තාක්ෂණය සහ උපකරණ හඳුන්වාදීම
- යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල

- දැනට පවත්නා කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය
- උසස් පුහුණු වැඩසටහන්
- මධ්‍යගත කරන ලද ප්‍රවේශය
- බාහිරව ලබාගැනීමේ සංකල්පය
- ආකල්පමය වෙනස්කම්

තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම

මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සමඟ සමස්ථ වැටුප් පත්‍රිකා සහ පැමිණීමේ ලේඛන සම්බන්ධ ප්‍රධාන කර්තව්‍යයන් 90%ක් සම්පූර්ණ කර ඇත. කොළඹ වරායේ සියළුම කොට්ඨාසයන් වෙත මාර්ගගත නිවාඩු අයදුම්කිරීමේ පද්ධතිය හඳුන්වා දී ඇත. මානව සම්පත් කොට්ඨාසයේ කාර්යය මණ්ඩලයට එදිනෙදා කටයුතු පහසුවෙන් කරගෙනයාම සඳහා මානව සම්පත් තොරතුරු පද්ධතියේ බොහෝ කාර්යයන් හඳුන්වා දෙන ලදී. මහපොළ අභ්‍යාස ආයතනයේ සහාය ඇතිව මානව සම්පත් කොට්ඨාසයේ සේවකයින්ගේ පරිගණක පිළිබඳ සාක්ෂරතාවය වැඩිකිරීමෙහිලා ඒ සඳහාම සකස්කරන ලද දත්ත මූලික කළමනාකරණ වැඩසටහන් ආරම්භ කරන ලදී. ලේඛන කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු සම්පාදනය කර ඇත.

ජාතික වෘත්තීය සුදුසුකම හඳුන්වාදීම

විධායක නොවන ශ්‍රේණි වල නව අනුමත බඳවාගැනීමේ පටිපාටියේ අඩංගු අවශ්‍යතා පදනම් කරගෙන තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිසමේ සම්පත් දායකයින්ගේ සහාය ඇතිව ජාතික වෘත්තීය සුදුසුකම් සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. සේවක කොටස් වලට තම සහතික ලබාගැනීම පහසුකරලනු වස් විවිධ ශ්‍රේණි වල තක්සේරුකරුවන් පුහුණු කිරීම සඳහා දැනට කටයුතු යොදා ඇත.

හදිසි අනතුරු සඳහා වන්දි ගෙවීම

වසරේදී සිදු වූ හදිසි අනතුරු සංඛ්‍යාව 90ක් වූ අතර හදිසි අනතුරු වලින් මරණයට පත්වූවන්/අර්ධ ආබාධිත තත්ත්වයට පත්වූවන් සඳහා ගෙවන ලද සම්පූර්ණ සේවක වන්දි මුදල රු.632,500/-ක් වේ.

කාර්යය පටිපාටි සංග්‍රහය සහ මුදල් රෙගුලාසි ප්‍රතිශෝධනය කිරීම

දැනට පවත්නා අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි පවත්නා කාර්යය පටිපාටි සංග්‍රහය සහ මුදල් රෙගුලාසි ප්‍රතිශෝධනය කිරීම වෙනුවෙන් මානව සම්පත් කොට්ඨාසය සහ මුදල් කොට්ඨාසයේ නිලධාරීන්ගෙන් මෙන්ම මුදල් අමාත්‍යාංශයේ බලයලත් නිලධාරීන්ගෙන් සමන්විත විශේෂයෙන් නම් කරන ලද කමිටුවක් මගින් සාකච්ඡාවට භාජනය කර ඇත.

ආරක්ෂක

ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන සියළුම වාණිජ වරායන්ගේ ආරක්ෂාව පිළිබඳ වූ වගකීම ආරක්ෂක කොට්ඨාසය වෙත පැවරී ඇති අතර, එය ඉටු කරලනු වස් පුරා පැය 24 ක අඛණ්ඩ වූ කාර්යක්ෂම ආරක්ෂක සේවාවක් පවත්වා ගෙන යනු ලැබේ. කොළඹ වරාය අධි ආරක්ෂිත කලාපයක පිහිටා ඇති බැවින් එයට අයත් දේපළ සහ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා නව දැනුම, නව තාක්ෂණික මෙවලම් හා ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් මෙම කොට්ඨාසය ඉහත අරමුණු කරා යාමට විශිෂ්ඨ සේවාවක් සැපයීමට කැපවී සිටී.

පූර්ණ කාලීනව එදිනෙදා ආරක්ෂක රාජකාරී කටයුතු හොඳින් පවත්වා ගනිමින් වරායේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අප කොට්ඨාසය මඟින් උපයාගත් ආදායම පහත සඳහන් පරිදි වේ.

වරාය පාවිච්චි කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම්

විස්තරය	රුපියල්
පුද්ගල සහ වාහන බලපත්‍ර නිකුත් කිරීමෙන්උපයාගත් ආදායම	92,914,186
වරාය බලපත්‍ර අස්ථාන ගතකර ගැනීමෙන් පසු නැවත නිකුත් කිරීමෙන් දඩ මුදල් වශයෙන් උපයාගත් ආදායම	44,286
SAGT ආයතනය වෙත සහ සී/ස කොළඹ නැව් තටාකාංගනය වෙත බලපත් නිකුත් කිරීමෙන් ලද ආදායම	4,179,326
වාර්ෂික බලපත්‍ර සමඟ පවුවස් සහ උරපටි නිකුත් කිරීමෙන් ලද ආදායම	544,700
එකතුව	**97,682,497**

මෙයට අමතර වශයෙන් පහත සඳහන් ආදායම් ද උපයාගෙන ඇත.

විස්තරය	රුපියල්
2012 වර්ෂයේ රථවාහන නීති රීති උල්ලංඝණය කිරීම වෙනුවෙන් අධිකාරියේ පවරන ලද නඩුවලින් උපයාගෙන ඇති දඩ මුදල්	105,500
2012 වර්ෂය තුළ හදිසි අනතුරු වලින් වරාය අධිකාරියට සිදු වූ අලාභ උදෙසා අයකර ගත් මුදල	1,584,228

මෙම උපයාගත් මුදල් වලට අමතරව සේවා සැපයුමක් ලෙස බලපත්‍ර කාර්යාලය මඟින් මෙම වසර තුළ නිකුත් කළ බලපත්‍ර වර්ග සහ ප්‍රමාණ පහත දැක්වේ.

වරාය සේවක ඡායාරූප බලපත්‍ර කාර්යාලය

2012 වසර තුළදී වරාය සේවකයින් සඳහා ඡායාරූප හැඳුනුම්පත් සංඛ්‍යාව

විස්තරය	ප්‍රමාණය
නව පත්වීම් සඳහා	17
ත්‍රිකුණාමලය වරාය වෙත නව බලපත්‍ර නිකුත් කිරීම	427
දත්තයන් වෙනස් වීම අනුව නැවත නිකුත් කිරීම	949
2012 වසර තුළදී වරාය අධිකාරියේ සංචිත වාහන සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව	524
වරාය සේවකයින්ගේ පෞද්ගලික වාහන සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව	3,837
වර්ෂය තුළදී මුද්‍රණය කර ඇති R.P.U. බලපත්‍ර සංඛ්‍යාව	5,032

තවද, මහත් මෙහෙවරක යෙදෙන මෙම කොට්ඨාසයේ ආරක්ෂක පුහුණු අංශය නියාමකවරයාගේ සිට අධිකාරී තනතුර දක්වා නිලයන්ට ද විශේෂ විමර්ශන ඒකකයට ද අභ්‍යාස ලබාදෙමින් සහ වැඩමුළු පැවැත්වීමෙන් උසස් ප්‍රමිතියෙන් යුත් සේවයක යෙදවීමට මහත් කැපවීමකින් කටයුතු කර ඇත. ඒ අනුව වාර්ෂිකව පහත සඳහන් පුහුණු පාඨමාලාවන් ආරක්ෂක නිලයන් සඳහා පවත්වනු ලැබේ.

ආරක්ෂක කොට්ඨාසයේ සියළුම තනතුරුවල ආරක්ෂක නිලයන් සඳහා සිදුකරන ලද පුහුණු පාඨමාලා

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක අංශයේ සහ අනුබද්ධ ආයතන වල රාජකාරි පිළිබඳ අවබෝධයක් ලබාදීම සඳහා 2012.01.04 දිනසිට 2012.05.09 දින දක්වා වැඩමුළු 16ක් පවත්වා ඇත. මේ සඳහා විධායක නිලධාරීන් ඇතුළු ආරක්ෂක නිලයන් 978ක ප්‍රමාණයක් සහභාගී කරගන්නා ලදි. වට්ටෝරු භාණ්ඩ කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් 2012.11.21 වන දින පැවැත්වූ අතර ඒ සඳහා විධායක නිලධාරීන් 20ක් සහභාගී විය. තවද ස්ථානීය රාජකාරි සහ වගකීම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු 11ක් 2012.09.28 දි සිට 2012.12.10 දක්වා පවත්වන ලද අතර ඒ සඳහා ආරක්ෂක නිලයන් 158ක් සහභාගී කරගන්නා ලදි.

ගිනි අවි ප්‍රායෝගික පුහුණු කටයුතු සහ වෙඩි අභ්‍යාස (2012.08.11, 2012.09.01 සහ 2012.09.15)

ආරක්ෂක කොට්ඨාසයේ වයස අවුරුදු 45 ට අඩු ආරක්ෂක නිලයින් සඳහා බහුවාර ගිනි අවි වෙඩි තැබීම් පුහුණුව ද රාජකාරි අවශ්‍යතාවයන් මත තෝරාගත් ආරක්ෂක නිලයන් හට මි.මී. 9 පිස්තෝල වෙඩි අභ්‍යාස පුහුණුව ද සිදු කරන ලද අතර, රාජකාරි අවශ්‍යතාවයන් මත අදාළ විධායක නිළධාරින්ට මි.මී. 9 පිස්තෝල වෙඩි අභ්‍යාස පුහුණුව සහ බහුවාර වෙඩි අභ්‍යාස පුහුණුව ලබාදෙන ලදි. ඒ අනුව වාර්ෂික වෙඩි අභ්‍යාස පුහුණු වලදී මි.මී. 9 පිස්තෝල වෙඩි පුහුණු සඳහා ආරක්ෂක නිලයින් 95ක් පුහුණු කටයුතු සිදුකළ අතර, ඒ සඳහා මි.මී.9 ජීව පතරොම් 561ක් භාවිතා කරන ලදී.

ඉහත සඳහන් සියළුම නිලයන් විසින් HK 512 සහ M3 සුපර් 90 යන ගිනි අවි වලින් ආරක්ෂක නිලයන් 486 දෙනෙක් (ගාල්ල/ත්‍රිකුණාමලය/ඔලුවිල් ඇතුළුව) වෙඩි අභ්‍යාස පුහුණු කටයුතු සිදු කළ අතර, ඒ සඳහා SG වර්ගයේ ජීව පතරොම් 4890ක් උපයෝගී කර ගන්නා ලදී. (සෑම වර්ෂයක් පාසාම ආරක්ෂක කොට්ඨාසයේ තෝරාගත් ආරක්ෂක නිලයන් සඳහා වෙඩි අභ්‍යාස පුහුණු කටයුතු සිදුකරනු ලැබේ.)

වරාය ආරක්ෂක ඩිප්ලෝමා පාඨමාලාව

සියළුම ආරක්ෂක නිලයන් සඳහා අවශ්‍ය වන න්‍යායාත්මක දැනුම ප්‍රමාණවත් ලෙස ලබාදීම, වරාය ආරක්ෂාව පිළිබඳ කාර්යයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන කුසලතා සංවර්ධනය කිරීම සහ වෘත්තිකයින්ගේ හැකියාවන්ගෙන් පරිපූර්ණ නිලයන් බිහි කිරීමට අවශ්‍ය වන ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මහපොල අභ්‍යාස ආයතනයේ සම්බන්ධීකරණයෙන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් මෙහෙයවනු ලබන වරාය ආරක්ෂක ඩිප්ලෝමා පාඨමාලාවක් මෙම කොට්ඨාසය මගින් ආරම්භ කරන ලදී. මෙය වසර එකහමාරක (01½) පාඨමාලාවක් වශයෙන් 2012.08.18 දින ආරම්භ කළ අතර, 2014.02.22 දින අවසන්වීමට නියමිතව ඇත. රාජකාරියට බාධාවක් නොවන පරිදි සහභාගීත්වය සිදුකෙරෙන මෙම පාඨමාලාවට වසර එකහමාරක (01½) කාලසීමාව තුළ සෑම සෙනසුරදා දිනකම පෙ.ව.07.00 පැයේ සිට ප.ව.15.00 පැය දක්වා මෙහි නිලයන් සහභාගීවීමට කටයුතු කෙරේ. එම සහභාගීත්වය පහත සඳහන් පරිදි වේ.

කළමනාකරු (ආරක්ෂක)	01
ප්‍රධාන අධිකාරි (ආරක්ෂක)	02

අධිකාරි (ආරක්ෂක)	06
සහකාර ආරක්ෂක නිලධාරී	05
ආරක්ෂක සැරයන්	14
ආරක්ෂක නියාමක	15
එකතුව	**43**

මේ අතර වරාය පරිශ්‍රය පරිහරණය කරන රියදුරන්ගේ විශේෂිත පිරිසක් වූ බර වාහන පදවන ලොරි රියදුරන් සඳහා ද වැඩමුළු පැවැත්වීම අපි ආරම්භ කළෙමු.

මෙම බර වාහන රියදුරන් දැනුවත් කිරීම සම්බන්ධ වැඩමුළු 21ක් 2012.07.16 වන දින සිට 2012.12.31 දින දක්වා කාලය තුළ පැවැත්වූ අතර, ඒ සඳහා සහභාගී වූ රියදුරන් සංඛ්‍යාව 3,562ක් විය. එක් රියදුරෙක් සඳහා රු.650/=ක් වශයෙන් සහනදායී ගාස්තුවක් අයකළ අතර ඒ සඳහා රු.2,315,300/-ක මුදලක් මහපොල අභ්‍යාස ආයතනය උපයාගෙන ඇත.

මෙය ඉතාම සාර්ථකව ඵලදැරූ පාඨමාලාවක් වේ.

ඊට අමතරව විවිධ විෂයන් පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබාදීම අරමුණ කර 2012 වර්ෂය තුළ දී මහපොල අභ්‍යාස ආයතනය මගින් විවිධ පාඨමාලා සහ වැඩමුළු පවත්වා ඇත.

සුභසාධක හා කාර්මික සම්බන්ධතා

සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාසය මඟින් අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත සපයනු ලබන මූල්‍ය හා මූල්‍ය නොවන සුභසාධක පහසුකම් රැසක් ඇත. එම පහසුකම් දිගින් දිගටම සේවක හිතසුව පිණිස වරින් වර සංශෝධනය කරමින් සහ වර්ධනය කරමින් 2012 වර්ෂය වන විට ප්‍රසස්ථ මට්ටමේ සුභසාධක පහසුකම් රැසක් සපයනු ලැබීය. එම පහසුකම් විස්තර සහිතව පහත දැක්වේ.

කාර්ය මණ්ඩලය වෙත නොමිලේ ආහාරපාන සැපයීම

වරාය අධිකාරියේ සේවා මුර පදනම මත සේවයේ යොදවා ඇති සේවකයින් හට දිවා/රාත්‍රී ආහාරපාන මෙන්ම තේ සහ කෙටි කෑම වැනි ආහාර සැපයීම සිදුකරනු ලබන අතර කාර්යාල ගණයේ සේවකයින්ට දිවා ආහාර නොමිලේ සැපයීම සිදු කරයි. මෙම කාර්ය සඳහා 2012 වර්ෂයේදී රුපියල් මිලියන 581.88ක මුදලක් වැය කොට ඇත. එමෙන්ම 2012 වර්ෂයේ දී අධිකාරිය විසින් නොමිලයේ දෙනු ලබන දිවා ආහාරය ලබා නොගන්නා සේවකයින් වෙනුවෙන් දිවා ආහාර වේලක් සඳහා ගෙවනු ලැබූ රු. 40/= ක මුදල රු. 80/= දක්වා වැඩි කරන ලදී.

සේවකයින් සඳහා වන හදිසි අනතුරු හා රක්ෂණ යෝජනා ක්‍රමය

2011 වර්ෂයට පෙර පැවති වෛද්‍යාධාර යෝජනා ක්‍රමය 2011 අගෝස්තු මස 31 වන දින සිට අත්හිටුවනු ලැබීය. මේ අනුව කලින් පැවති වෛද්‍යාධාර ක්‍රමයට වඩා වැඩි වාසිදායක ප්‍රතිලාභ ඇතුළත් වන පරිදි නව රක්ෂණ යෝජනා ක්‍රමයක් ජාතික රක්ෂණ භාර අරමුදල සමඟ එක්ව 2011 සැප්තැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ කලින් ලැබූ ප්‍රතිලාභයන්ට වඩා වැඩි පහසුකම් ලැබෙන අතර හදිසි අනතුරකදි රුපියල් මිලියනය දක්වා වූ රක්ෂණාවරණයක් හිමිවන අතර ස්වභාවික මරණයක දී රුපියල් ලක්ෂයක රක්ෂණාවරණයක් හිමිවනු ඇත. එයට අමතරව බාහිර වෛද්‍ය ප්‍රතිකාර සඳහා වාර්ෂිකව රු. 7500/= මුදලක් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. තවද, ආරෝග්‍යශාලා ගතව ප්‍රතිකාර ගැනීමේදී වියදම් සඳහා රුපියල් ලක්ෂය (රු. 100,000/=) දක්වා වූ රක්ෂණාවරණයක් හිමි වනු ඇත. මෙහි විශේෂ ලක්ෂණය වන්නේ සේවකයෙකුට සිය කැමැත්තෙන් තම පවුලේ සාමාජිකයින් මෙම රක්ෂණයට දායක කරගත හැකි වීමයි. ඒ සඳහා සිය භාර්යාව හෝ ස්වාමි පුරුෂයා වෙනුවෙන් වාර්ෂිකව රු. 1,500/= ක මුදලක් ද දරුවෙකු වෙනුවෙන් රු. 720/= ක

මුදලක් ද වාර්ෂිකව ගෙවිය යුතු වේ. තවද 2012 සැප්තැම්බර් මස 01 දින සිට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ එක්ව මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි.

නියමුවන් සඳහා වූ රක්ෂණ යෝජනා ක්‍රමය

ඉහත රක්ෂණ යෝජනා ක්‍රමයට අමතරව අධිකාරියේ නාවික කොට්ඨාසය යටතේ සේවය කරන නියමුවන් සඳහා විශේෂ රක්ෂණයක් පවත්වාගෙන යනු ලබන අතර මේ සඳහා නාවික කොට්ඨාසය යටතේ සේවයේ යෙදෙන සියළුම නියමුවන්ට මෙම රක්ෂණ ආවරණය ලබා ගත හැක. මේ යටතේ නියමුවන්ට රු. 3,000,000/= රක්ෂණාවරණයක් හිමි වන අතර රක්ෂණ වාරික මුදලින් 50%ක් අධිකාරිය මඟින් දරනු ලබන අතර ඉතිරිය නියමුවන් විසින් දරනු ලබයි.

නිවාස ණය යෝජනා ක්‍රමය

වරාය අධිකාරියේ සේවකයින්ට නිවසක් මිලදී ගැනීම, නිවසක් තනා ගැනීම, අළුතින් කොටසක් එකතු කිරීම හෝ නිවසක් තැනීම සඳහා ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් ලක්ෂ පහක උපරිමය දක්වා නිවාස ණය ලබාදීමේ වැඩසටහනක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සහය ඇතිව ක්‍රියාත්මක වේ. සහන පොලී 6%ක අනුපාතිකයක් අයකරනු ලබන අතර වාර්ෂිකව දශලක්ෂ පනහක මුදලක් මේ සඳහා වෙන් කොට ඇත. මෙම නිවාස ණය වැඩ සටහන සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත 2012 වර්ෂය තුළදී රු. 16,996,000/= මුදලක් මුදා හරින ලදී.

ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය

අධිකාරියේ සේවකයින්ගේ දූ දරුවන් හට විශ්ව විද්‍යාල අධ්‍යාපනය සහ අ.පො.ස. (උ/පෙ) හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව වර්ග දෙකක් පිරිනැමේ.

මේ අනුව අ.පො.ස. (උ/පෙ) හැදෑරීම සඳහා මසකට රු.750/= බැගින් මාස 24ක් සඳහා ශිෂ්‍යත්ව දීමනා ප්‍රදානය කෙරේ. මෙම ශිෂ්‍යත්වය සඳහා සමාලෝචිත 2012 වර්ෂයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා රු. 3,145,550/= ක මුදලක් ප්‍රදානය කරනු ලැබීය.

විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා තෝරාගන්නා අධිකාරියේ සේවකයින්ගේ දරු දැරියන්ට වර්ෂයකට රු. 25,000/= බැගින් වන සේ අධ්‍යයන කාලය අනුව උපරිමය වර්ෂ 05 ක් දක්වා ශිෂ්‍යත්ව ප්‍රදානයක් සිදු කරනු ලැබේ. මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ 2012 වර්ෂයේ දී රු.8,167,575/= ක මුදලක් ප්‍රදානය කරන ලදී.

මෙම ශිෂ්‍යත්ව ප්‍රදානයේදී කැපීපෙනෙන ලක්ෂණයක් වූයේ 2011 වර්ෂයේ සිට ශිෂ්‍යත්වලාභීන්ගේ සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබීමයි. එය මෙම වර්ෂය තුළදී ද පෙන්නුම් කරනු ලැබීය. තවද මෙම වසරේ සිට ශිෂ්‍යත්වලාභීන් වෙත ඔවුන්ගේ ශිෂ්‍යාධාර මුදල් ලබාදීම බැංකු ගිණුම් මගින් සෘජුව සිදුකිරීමට පියවර ගන්නා ලදි.

සුභසාධක බස් රථ

අධිකාරියේ සේවකයින්ට හා ඔවුන්ගේ පවුල්වල අයට වන්දනා සහ විනෝද චාරිකාවල යෙදීම සඳහා අනුග්‍රාහාත්මක ගාස්තු ප්‍රමාණ මත බස් රථ ලබාදෙනු ලබන අතර සේවක අවමඟුල් සඳහා නිශ්චිත කාලසීමාවන් තුළ නොමිලේ බස් රථයක් ලබාදීම සිදු කෙරේ. එවැනි අවස්ථාවක බස් රථයක් ලබාදිය නොහැකි නම් රු. 6,500/= ක උපරිමයකට යටත්ව වියදම ප්‍රතිපූර්ණය කරනු ලැබේ. තවද, අධිකාරියේ සේවකයින්ට සිය සේවා ස්ථානයන්ට පහසුවෙන් ගමන් කිරීම සඳහා අධිකාරියේ බස් රථ මඟින් වරාය පරිශ්‍රය තුළ නොමිලේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවය සමාලෝචිත වර්ෂය තුළදී ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

2012 වර්ෂයේ දී සුභසාධන කටයුතු සඳහා බස්රථ ධාවනය කිරීමෙන් අධිකාරිය රුපියල් 3,095,562/= ක ආදායමක් උපයාගෙන ඇත.

2012 වර්ෂයේ සුභසාධක බස්රථ ධාවනය සුභසාධක බස් රථ ධාවනයෙන් පසු චාරිකාව වෙනුවෙන් ඉතිරි වන මුදල් හා ඉන්ධන සඳහා වැය වූ මුදල් චාරිකා සංවිධානය කළ සේවක මහත්ම/මහත්මීන් වෙත සිය මාසික වැටුප් සමඟ ගෙවීමට පියවර ගන්නා ලදි.

විශේෂ නිවාඩු හිමිකම් දීමනා ගෙවීම

රෝගී තත්ත්වයක දී හෝ හදිසි අනතුරක දී, තමන් හට හිමි සියළුම නිවාඩු අවසන් වී ඇති අවස්ථාවක දී නැවත සේවයට සුදුසු තත්ත්වයකට පත් වන තෙක් වෛද්‍ය උපදෙස් මත උපරිම වශයෙන් මාස 06ක් දක්වා සුභසාධක ක්‍රමය යටතේ අනුමත වැටුප් සහිත නිවාඩු ලබාදෙනු ලැබේ. 2012 වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ලැබුණු අයදුම්පත් 122ක් සලකා බලන ලද අතර ඒ අනුව දින 4,384 ½ ක් අනුමත වැටුප් සහිත නිවාඩු සහ දින 537ක් වැටුප් රහිත නිවාඩු ලෙස ප්‍රදානය කිරීමට අනුමැතිය දෙන ලදී.

සුභසාධක ආපනශාලා

අධිකාරියේ පරිශ්‍රය තුළ අධිකාරියේ සේවකයින්ට මෙන්ම විවිධ කටයුතු සඳහා වරාය පරිශ්‍රයට පැමිණෙන්නන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන් ආපනශාලා 15ක් පවත්වාගෙන යනු ලබන අතර සහන මිල ගණන් යටතේ ආපනශාලා මගින් ආහාර පාන සැපයීම සිදුකරනු ලබයි. වාර්ෂිකව ටෙන්ඩර් කැඳවා බදුකරුවන් තෝරාගෙන මෙම ආපනශාලා බදු දෙනු ලබන අතර 2012 වර්ෂය තුළදී එමගින් ලද මුළු ආදායම රු. 6,362,183/= ක් වේ.

සේවකයින්ට තිළිණ ප්‍රදානය

අධිකාරියේ සියළුම සේවකයින්ට සිය සේවා කාලය වසර 30ක් සම්පූර්ණ කළ පසු වටිනා තිළිණයක් ප්‍රදානය කරනු ලබන අතර වසර 40ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින්ට වරාය චෛත්‍ය ආකෘතියේ අනුරුවක් හෝ සමරු සිහිවටනයක් තිළිණ කරනු ලැබේ. 2012 වර්ෂයේ දී වසර 30 සපුරන ලද සේවකයින් 80කට හා වසර 40ක සේවා කාලයක් සපුරන ලද සේවකයින් 07 දෙනෙකු හට මෙසේ තිළිණ ප්‍රදානය කොට ඇත.

සමුද්‍රික කෞතුකාගාරය

වරාය හා නාවික ක්ෂේත්‍රයේ ඓතිහාසික විකාශනය දැක්වෙන අනුරූ සහ ප්‍රදර්ශන පුවරු මෙන්ම පැරණි වරාය පරිශ්‍රය තුළ භාවිත කළ භාණ්ඩ මෙහි ප්‍රදර්ශනයට තබා ඇත. පාසැල් සිසුන් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත් ව ඇති මෙය වරාය හා නාවික කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන සියළුදෙනාට ප්‍රයෝජනවත් වන මධ්‍යස්ථානයකි. 2011 වර්ෂය තුළදී කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව විශේෂ ප්‍රදර්ශන පුවරු සවිකරන ලදී. ගාස්තු අය කිරීමකින් තොරව මෙය පෙ:ව: 10.00 සිට ප:ව: 07.00 දක්වා විවෘත කොට ඇත. මෙම මධ්‍යස්ථානය ප්‍රකාශන, පොත් පත් සහ පින්තූර පත්‍රිකා විකිණීම මඟින් වර්ෂය තුළදී රු. 345,360/=ක ආදායමක් උපයාගෙන ඇත.

සුභසාධක හා ක්‍රීඩාගාර පහසුකම්

අධිකාරිය මඟින් සුභසාධක මධ්‍යස්ථාන වලට ක්‍රීඩාගාරයක් බැගින් ලබාදී ඇත. මීට අමතරව වරාය අධිකාරියේ ක්‍රීඩා සංගමය සඳහා වර්ෂයකට රු. 712,000/= ක උපරිමයකට යටත්ව මුදලක් එම සංගමයේ ක්‍රීඩා සංවර්ධන කාර්යයන් සඳහා ලබාදීම සිදුකරයි.

පුස්තකාල පහසුකම්

අධිකාරියේ සේවකයින්ගේ කියවීමේ රුචිය වර්ධනය සඳහා සේවකයින් විසින් පවත්වාගෙන යනු ලබන සෑම පුස්තකාලයක් සඳහාම වාර්ෂිකව රු. 45,000/= ක උපරිමයකට යටත්ව ප්‍රදානයන් ලබාදෙනු ලැබේ. මෙවැනි පුස්තකාල 16ක් වරාය පරිශ්‍රය තුළ ක්‍රියාක්මක වේ. 2012 වර්ෂය තුළ දී පුස්තකාල 18ක් වෙනුවෙන් රු. 300,000/= ක මුදලක් පොත් පත් මිලදී ගැනීම සඳහා ප්‍රදානය කරන ලදී.

දිවා සුරැකුම් මධ්‍යස්ථානය හා පෙර පාසැල

අධිකාරියේ සේවා වනිතා ඒකකය මගින් අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ දූ දරුවන් සඳහා පවත්වාගෙන යනු ලැබූ දිවා සුරැකුම් මධ්‍යස්ථානය හා පෙර පාසැල මෙම වර්ෂය තුළ දී සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාසයේ පරිපාලනය යටතට පත්කරන ලදි. එසේම පසුගිය වර්ෂ වලදී මෙන්ම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ දරු දැරියන් සඳහා නොමිලේ දිවා ආහාරය සපයනු ලබන අතර අවශ්‍ය අවස්ථා වලදී ඉල්ලා ඇති පහසුකම් සැපයීම සිදුකරන ලදි.

උපකරණ සැපයීම

සේවක මහත්ම මහත්මීන්ගේ සුභසාධක තත්ත්වයන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් සුභසාධක මධ්‍යස්ථාන වල විවේකය එළදායී ලෙස ගතකිරීම සඳහා සේවක ඉල්ලීම පරිදි රූපවාහිනී හා වෙනත් උපකරණ නොකඩවා සැපයීමට ක්‍රියාකරන ලදී.

නීති

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීති නිලධාරීන් කොළඹ, ගාල්ල ත්‍රිකුණාමලය සහ මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ යන වරායන්හි නීති උපදේශකයන් වන අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට, අධ්‍යක්ෂවරුන්ට, කොට්ඨාස ප්‍රධානීන්ට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙනත් අංශ වලට උපදෙස් ලබාදෙති.

උපදේශනයන්

2012 වර්ෂය තුළ 218ට අධික උපදේශනයන් ප්‍රමාණයක් කළමනාකාරීත්වයට ලබාදී ඇත.

ඊට අමතරව කෙටුම්පත් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන කොන්ත්‍රාත්, ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු, බදු ගිවිසුම් යනාදිය සම්බන්ධ වෙනත් ගිවිසුම් වලට එළඹීමත් නීති කොට්ඨාසයේ විෂය පථයට අදාළ වේ.

ඔප්පු, ගිවිසුම් සහ කොන්ත්‍රාත්

බදුදීමේ ගිවිසුම් 35ක්, බදු ගැනීමේ ගිවිසුම් 01ක් සහ ගිවිසුම්/කොන්ත්‍රාත් 04ක් සහ නිවැරදි කිරීමේ ගිවිසුම් 01ක් 2012 වර්ෂය තුළ දී නීති කොට්ඨාසය විසින් ක්‍රියාවට නංවනු ලැබීය. මෙම නීතිමය ලේඛන වලට අමතරව පහත සඳහන් ගිවිසුම් සහ බැඳුම්කරයන් ක්‍රියාවට නංවන ලදී.

- අත්සන් කළ බැඳුම්කරයන්ට/ගිවිසුම් වලට පරිපූරකයන් 05
- විදේශයන්හි රැකියා නියුක්තිකයන් වෙනුවෙන් වැටුප් රහිත නිවාඩු සම්බන්ධ ගිවිසුම් සහ බැඳුම්කර 03.

- ශ්‍රී ලංකාව තුළත්, විදේශගතව පුහුණු සහ අධ්‍යාපනික කටයුතු සම්බන්ධයෙන් ගිවිසුම් සහ බැඳුම්කර 03.

- කණිෂ්ඨ කළමනාකාර පුහුණුවන්නන් සම්බන්ධයෙන් ගිවිසුම්/බැඳුම්කර පහක් (05) අත්සන් කිරීම.

- මානව සම්පත් ඩිප්ලෝමාව සහ ඉංග්‍රීසි ඩිප්ලෝමාව හදාරනු ලබන සේවක කොටස් වලට අදාළව ගිවිසුම් සහ බැඳුම්කර 41ක් අත්සන් කරන ලදි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන සියළුම අධිකරණ කටයුතු නීතිපතිගේ සහ පෞද්ගලික නීතිඥ මණ්ඩල වල සහයෝගය ඇතිව නීති කොට්ඨාසය විසින් මෙහෙයවනු ලැබේ.

2011 දෙසැම්බර් අග වන විට ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණ, දිසා අධිකරණ, කම්කරු විනිශ්චය මණ්ඩල, මහේස්ත්‍රාත් අධිකරණ,කම්කරු දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිසම, ඔම්බුස්මන්, කම්කරු උසාවි, සේවක වන්දි කොමසාරිස් සහ බෙරුම්කාර මණ්ඩල ඉදිරියේ නඩු කටයුතු/පැමිණිලි සහ ඉල්ලුම්පත්‍ර 257ක් විභාග වෙමින් පැවතිණ.

2012 වසර තුළ අළුත් නඩු කටයුතු, පැමිණිලි සහ ඉල්ලුම්පත්‍ර 55ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට විරුද්ධවත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසිනුත් පවරා තිබුණි. (ඉහත සඳහන් ඡේදයේ අඩංගු සියළුම අධිකරණ සහ ආයතන) මෙයින් නඩු කටයුතු 03ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගොණු කර තිබූ අතර ඉතිරි ඒවා වරාය අධිකාරියට එරෙහිව පවරා තිබුණි. 2012 වසර තුළදී සමස්ථ නඩු කටයුතු සංඛ්‍යාව වූ 312 න් 36ක කටයුතු අවසාන කර ඇත. මෙයින් නඩු කටයුතු 27ක් වරාය අධිකාරියට වාසි සහගත ලෙස තීරණය වී ඇති අතර නඩු කටයුතු 03ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවාසි සහගත ලෙස තීරණය කර ඇත. නඩු කටයුතු 03ක් සමථයකට පත්කර ඇති අතර නඩු 03ක් පාර්ශවකරුවන් විසින් ඉල්ලා අස්කර ගෙන ඇත.

2012 දෙසැම්බර් 31 දින වන විට නඩු කටයුතු/පැමිණිලි සහ ඉල්ලුම්පත්‍ර 276ක් ඉහත සඳහන් ආයතනයන්හි විභාග වෙමින් පැවතිණි.

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු

2011 වර්ෂය අවසන් වන විට නඩු කටයුතු 07ක් විභාග වෙමින් පැවතිණි. 2012 වසර තුළ අළුත් නඩු කටයුතු 11ක් ගොණු කර ඇති අතර එයින් 10ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ද එක් නඩුවක් වරාය අධිකාරිය විසින් ද ගොණු කර ඇත. සියළුම නඩු කටයුතු 18න් 08ක කටයුතු 2012 වසර තුළ අවසන් කර ඇත. නඩු කටයුතු 07ක් තව දුරටත් ඉදිරියට ගෙනයාමට අවසර නොදුන් අතර ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව එම නඩු කටයුතු 07 ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත ලෙස තීරණය කර ඇත. එක් නඩුවක් සමථයකට පත්කර ඇත. 2012.12.31 දිනට නඩු කටයුතු 10ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පැවැතිණි.

අභියාචනාධිකරණ නඩු

2011.12.31 දිනට නඩු කටයුතු 17ක් විභාග වෙමින් පැවතුණි. 2012 වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව අළුතින් නඩු 03ක් ගොණු කර ඇත. මෙම නඩු කටයුතු 20 අතරින් 06ක් නිමකර ඇති අතර 02ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත ලෙස තීරණය විය. නඩු කටයුතු 02ක් පෙත්සම්කරුවන් විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී. 02ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවාසි සහගත ලෙස තීරණය විය. 2012.12.31 දින වන විට නඩු කටයුතු 14ක් අභියාචනාධිකරණයේ විභාග වෙමින් පැවතිණි.

මහාධිකරණ නඩු

2011.12.31 දින වන විට මහාධිකරණය ඉදිරියේ නඩු කටයුතු 11 විභාග වෙමින් පැවතුණි. 2012 වසර තුළ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අළුත් නඩු 03ක් ගොණු කර ඇත. නඩු කටයුතු 14න් 2ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත ලෙස තීරණය විය. 2012.12.31 දිනට නඩු කටයුතු 12ක් මහාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පැවතුණි.

දිස්ත්‍රික් අධිකරණ නඩු

2011 දෙසැම්බර් 31 දිනට නඩු කටයුතු 12ක් විභාග වෙමින් පැවතුණි. 2012 වසර තුළ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව අළුත් නඩු කටයුතු 01ක් ගොණු කර ඇත. නඩු කටයුතු 13න් 04ක් 2012 දී අවසන් කර ඇති අතර මෙයින් 01ක් සමථයකට පත් වී ඇත. 02ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත ලෙස ප්‍රතික්ෂේප කර ඇත. එක් නඩුවක් පාර්ශ්වකරුවන් විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී. 2012.12.31 දිනට නඩු කටයුතු 09ක් දිස්ත්‍රික් උසාවි වල විභාග වෙමින් පැවතුණි.

මහේස්ත්‍රාත් අධිකරණ නඩු

2011.12.31 දිනට මහේස්ත්‍රාත් උසාවි වල නඩු කටයුතු 08ක් අවසන් නොවී පැවතුණි. 2012 වසර තුළ දී රජයේ නිල නිවාස (සන්තකය ආපසු පවරා ගැනීමේ) පනත යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් නිල නිවාස වලින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සහ රජයේ ඉඩම් (සන්තකය ආපසු පවරා ගැනීම) පනත යටතේ අයදුම්පත්‍ර ද ඇතුළුව අළුතින් නඩු කටයුතු 03ක් මහේස්ත්‍රාත් උසාවියේ ගොණුකර ඇත. 2012 වසර තුළ නඩු කටයුතු 05ක් අවසන් කර ඇත. ඉහත දක්වන ලද මහේස්ත්‍රාත් නඩු කටයුතු වලට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් පාර්ශවකරුවන් වන්නා වූ අවස්ථා වල දිවයිනේ විවිධ පළාත් වල පිහිටි මහේස්ත්‍රාත් අධිකරණ වලින් ලැබෙන සිතාසි සම්බන්ධව ද නීති කොට්ඨාසය කටයුතු කරනු ලබයි. 2012.12.31 දින වන විට නඩු කටයුතු 06ක් මහේස්ත්‍රාත් උසාවි වල විභාගවෙමින් පැවතුණි.

කම්කරු විනිශ්චය මණ්ඩල නඩු

2011.12.31 දින වන විට කම්කරු විනිශ්චය මණ්ඩල වල නඩු 18ක් විභාග වෙමින් පැවතුණි. 2012 වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව අලුතින් නඩු 18ක් ගොණු කරන ලද අතර මෙයින් 02ක් අවසන් කරන ලදී. මෙයින් එක් නඩුවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත අයුරින් නිමකරන ලද අතර එක් නඩුවක් පෙත්සම්කරුට වාසි සහගත අයුරින් තීරණය විය. 2012.12.31 දිනට කම්කරු විනිශ්චය මණ්ඩල වල විභාග වෙමින් පැවතුණු නඩු සංඛ්‍යාව 34ක් විය.

මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ අයදුම්පත්, කම්කරු ආරවුල් සම්බන්ධව කම්කරු දෙපර්තමේන්තුවට යොමු කරන ලද පැමිණිලි (සමථ මණ්ඩල නඩු) ඔම්බුස්මන් වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සහ සේවක වන්දි කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි

2011.12.31 දිනට මානව හිමිකම් කොමිසමේ අයදුම්පත් 132, කම්කරු කොමසාරිස් ඉදිරියේ වූ සමාදාන කිරීමේ පැමිණිලි 32ක් සහ ඔම්බුස්මන්වරයා ඉදිරියේ වූ පැමිණිලි 17ක් විභාග වෙමින් පැවතුණි.

2012 වසර තුළ දී මානව හිමිකම් කොමිසම වෙත නව අයදුම්පත් 5ක්, කම්කරු කොමසාරිස්වරයා වෙත නව සමාදාන කිරීමේ පැමිණිලි 08ක්, සේවක වන්දි කොමසාරිස්වරයා වෙත පැමිණිලි එකක් ද ඉදිරිපත් කෙරිණ.

මානව හිමිකම් කොමිසමේ ඉදිරිපත් කළ අයදුම්පත් 06ක් සහ සමාදාන කිරීමේ පැමිණිලි 03ක් 2012 වර්ෂය තුළ දී අවසන් කෙරිණ.

ඒ අනුව, 2012.12.31 දිනට, මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ අයදුම්පත් 131, සමාදාන කිරීමේ පැමිණිලි 37, ඔම්බුස්මන්වරයා ඉදිරියේ වූ පැමිණිලි 17ක් සහ සේවක වන්දි කොමසාරිස්වරයා ඉදිරියේ වූ එක් අයදුම්පත්‍රයක් ද විභාග වෙමින් පැවතුණි.

බේරුම්කාර නඩු

වාණිජ බේරුම්කරණ සම්බන්ධ කටයුතු 02ක් සහ කාර්මික බේරුම්කරණ සම්බන්ධ කටයුතු 01ක් 2011.12.31 දිනට විභාග වෙමින් පැවතුණි. 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට විරුද්ධව නව කාර්මික බේරුම්කරණ නඩු 02ක් පවරා තිබුණි. ඒ අනුව කාර්මික බේරුම්කරණයන් 03 සහ වාණිජ බේරුම්කරණයන් 02ක් 2012.12.31 දිනට විභාග වෙමින් පැවතුණි.

වෛද්‍ය

සේවකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය පවත්වාගෙනයාම සඳහා රෝග ප්‍රතිකාරක සහ රෝග නිවාරණ අංශ වල කටයුතු මෙහෙයවීම මෙන්ම මානසික, ශාරීරික සහ සාමාජික යහ සාධනය ශක්තිමත් කිරීමට සහාය දෙන අතර එමඟින් ශ්‍රම බලකායේ ඵලදායිතාවය කාර්යක්ෂම ලෙස වැඩිදියුණු කිරීමට දායකත්වයක් ලබාදේ.

2012 වසර තුළ දී වෛද්‍ය කොට්ඨාසය ප්‍රධාන වෛද්‍ය නිලධාරියෙකු, නියෝජ්‍ය ප්‍රධාන වෛද්‍ය නිලධාරියෙකු, වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු, ස්ථානීය වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු, දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු, පරිපූරක වෛද්‍ය මණ්ඩලයක් සහ පරිපාලන කාර්ය මණ්ඩලයකින් සේවය ලබාදෙන ලදි.

රෝගී උපස්ථාන

අන්ධභාවය, ආඝාතය, වකුගඩු අක්‍රීයවීම සහ දීර්ඝ කාලීන වණ, තුවාල වැනි සංකූලතා වැළැක්වීම හෝ අවම කිරීම වෙනුවෙන් දියැවැඩියාව, අධි රුධිර පීඩනය, හෘද රෝග, ඇදුම සහ මානසික ව්‍යාධීන් වැනි බෝ නොවන රෝගාබාධ, ජීවන රටාව නිසා ඇතිවන රෝගාබාධ වලට ප්‍රතිකාර කිරීම සහ නිතිපතා පරීක්ෂා කිරීම් සිදුකරනු ලැබේ.

සේවයේ නියුක්තව සිටියදී ඇති වන හදිසි අනතුරු

- හදිසි අනතුරු සහ උද්ගත වන හදිසි තත්ත්වයන් සඳහා ඉක්මනින් ප්‍රතිකාර කිරීම
- සුළු අනතුරු සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයේ දී ප්‍රතිකාර කරන අතර ප්‍රධාන අනතුරු වල දී කොළඹ ජාතික රෝහල වෙත යොමු කෙරේ.
- සේවයේ යෙදී සිටිය දී ඇතිවන හදිසි අනතුරු සම්බන්ධව විශ්ලේෂණය කරනු ලබන අතර ඒවා අවම කිරීම උදෙසා උචිත පරිදි ආරක්ෂක උපකරණ භාවිතා කිරීම සහ ආරක්ෂිත ක්‍රියාමාර්ග පිළිපැදීම පිළිබඳව සේවකයින් උනන්දු කෙරේ.
- සේවයේ යෙදී සිටිය දී සිදුවන හදිසි අනතුරු අවම කිරීම සහ එමඟින් සිදුවන පාඩු මහහැරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස වෛද්‍යවරුන් විසින් පැය 24 පුරාම සේවා කාලය තුළ මධ්‍යසාර පරිභෝජනය පිළිබඳව පරීක්ෂා කරනු ලැබේ.

ගිලන් රථ සේවය

නවීන උපකරණ සහිත ගිලන් රථ දෙකක සේවය පැය 24 පුරාම සපයනු ලැබේ.

රෝග පාලනය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොට්ඨාසගත ඩෙංගු මර්ධන කමිටුවේ සාමාජිකයෙකු සහ කොට්ඨාස ප්‍රධානියාගේ අධීක්ෂණය යටතේ එක් එක් කොට්ඨාස වලට අදාළ ඩෙංගු පාලන කණ්ඩායම් විසින් වරාය පරිශ්‍රය තුළ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන සතිපතා පරීක්ෂා කරනු ලැබේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරුන්ගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඩෙංගු රෝගය වැළැක්වීමේ කමිටුවක් ස්ථාපනය කරන ලදි.

එක් එක් කොට්ඨාස වලින් ප්‍රධාන වෛද්‍ය නිලධාරියා සහ අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ වෙත මාසික වාර්තාවක් යොමුකරනු ලබන අතර ඔවුන් විසින් මෙම වාර්තා වරාය හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කෙරේ.

මේ සම්බන්ධ ප්‍රශ්න සාකච්ඡා කිරීම සහ නිවැරදි ක්‍රියාමාර්ග ගනු ලැබීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඩෙංගු රෝගය වැළැක්වීමේ කමිටුවේ රැස්වීම් පවත්වනු ලැබේ.

වරාය පරිශ්‍රය තුළ දඩාවතේ යන සුනඛයින් ව්‍යන්ධ්‍යාකරණ සහ එන්නත් කිරීමේ වැඩ සටහන

දඩාවතේ යන සුනඛයින් සපාකෑම හේතුවෙන් පැන නැඟිය හැකි උග්‍ර ප්‍රශ්න වැළැක්වීම සඳහා ඉවහල් වන පරිදි සුනඛයින් ව්‍යන්ධ්‍යාකරණය සහ එන්නත් කිරීමේ වැඩ සටහනක් නොමිළයේ පවත්වාගෙන යනු ලැබිණ.

මෙම වැඩ සටහන බිලු පවු ට්‍රස්ට් නමැති ලාභ නොලබන ආයතනයක් විසින් ඔවුන්ගේ හවුල්කරුවන් කොළඹ මහ නගර සභාව හා එක්ව 2012 නොවැම්බර් මස 21 සිට 23 දින දක්වාත් 26 සිට 30 දින දක්වාත් කරගෙන යනු ලැබීය.

සම්පූර්ණ එන්නත් කිරීම්	-	208
සම්පූර්ණ ව්‍යන්ධ්‍යාකරනයන්	-	39

මුළුතැන්ගෙයි සේවකයින් සඳහා වෛද්‍ය පරීක්ෂණයන්

ආහාර පිළිබඳව කටයුතු කරන සේවකයන් වෙනුවෙන් වෛද්‍ය පරීක්ෂණයක් සිදුකරනු ලැබීය.

එච් අයි වී සහ ඒඩ්ස් රෝග වැළැක්වීමේ වැඩසටහන්

සේවකයින් දැනුවත් කිරීම පිණිස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගීත්වය ඇතිව එච් අයි වී රෝග වැළැක්වීමේ වැඩ සටහන් මහපොළ අභ්‍යාස ආයතනයේ දී පවත්වනු ලැබීය.

සෞඛ්‍ය අධ්‍යාපනය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩ සටහනකට සමගාමීව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් අතර බෝ නොවන රෝග වලින් වැළැක්වීම සම්බන්ධයෙන් වූ සෞඛ්‍ය වැඩ සටහන මහපොළ අභ්‍යාස ආයතනයේ දී කරගෙන යනු ලැබේ.

වෙනත් පහසුකම්

සාමාන්‍ය එක්ස් කිරණ සහ ඊසීජී පහසුකම්, දත් සම්බන්ධ එක්ස් කිරණ පහසුකම්, රසායනාගාර පහසුකම් යනාදිය සුපුරුදු පරිදි සපයනු ලැබිණ.

අවශ්‍ය සේවකයින් සඳහා විශේෂ ක්ෂය රෝග සහ සුඛසාධක නිවාඩු ලබා දී ඇත.

දන්ත වෛද්‍ය පහසුකම්

දත් ගැලවීම, දත් වල මැලියම් ඉවත් කිරීම, ස්ථීර පිරවුම්, කල්ක කුහර චිකිත්සාව සහ වෙනත් දන්ත වෛද්‍ය ප්‍රතිකාරයන් සපයන ලදී.

කොට්ඨාසය පරිගණකගත කිරීම

තොරතුරු පද්ධති කොට්ඨාසය සමඟ සහයෝගීත්වයෙන් කොට්ඨාසය පරිගණකගත කිරීම සිදුකෙරෙමින් පවති.

එම් - 3 (මීනිසුන්, යන්ත්‍ර සහ ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම)

සභාපතිතුමාගේ උපදෙස් අනුව වෛද්‍ය කොට්ඨාසයේ සම්පත් භාවිතය උපරිම ආකාරයෙන් සුපුරුදු පරිදි කළමනාකරණය කරනු ලැබීය. වෛද්‍යමය මිළදී ගැනීමේ වියදම් රු.600,000/- සිට රු.450,000/- පමණ වන තෙක් අඩු කර ඇත.

කොට්ඨාසයේ දැක්ම තවදුරටත් පවත්වාගෙන යාම පිණිස සියළුම සම්පත්, සේවාවන් සහ පහසුකම් අඛණ්ඩව උසස් තත්ත්වයකට පත්කිරීම සහ වැඩිදියුණු කිරීම සිදුකරනු ලැබීය.

මහපොළ අභ්‍යාස ආයතනය

පොදු

වරාය සේවකයින්, වරාය භාවිතා කරන්නන් සහ සමුද්‍රික අංශයේ වෙනත් අය සඳහා පුහුණු පහසුකම් සැලසීම මුඛ්‍ය පරමාර්ථය කොට ගත් මහපොළ පුහුණු ආයතනය (MPTI) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉතා වැදගත් අංශයක් වන බව කිවමනාය. අරමුණු කරගත් සේවක කොට්ඨාස වල දැනුම, නිපුණතා හා ආකල්ප වර්ධනය අරභයා සැකසුනු දේශනමාලා, සම්මන්ත්‍රණ, වැඩ මුළු සහ ප්‍රායෝගික පුහුණු වැඩ සටහන් කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම ආයතනය විසින් 2012 වාර්ෂික පුහුණු දින දර්ශන අනුව වැඩ සටහන් පවත්වාගෙන යන ලදී. 2012 වසර තුළ වරාය සේවකයින් වෙනුවෙන් ඵලදායිතාව, කණ්ඩායම් හැඟීම් වර්ධනය, තාක්ෂණික නිපුණතා දියුණු කිරීම, ගණුදෙනුකාර සේවා සහ තත්ත්ව අභිවෘද්ධිය අරමුණු කරගත් වැඩ මුළු කීපයක් පවත්වන ලදී. සේවකයින්ගේ දක්ෂතා මට්ටම් ඉහළ දැමීමටත්, පිළිගත හැකි සහතික ලබාගැනීම දක්වා වරාය සේවකයින්ට සිය නිපුණතා වර්ධනය කරගැනීම සඳහාත් වරාය මෙහෙයුම් වලට අදාල තෝරාගත් සේවා වල විශේෂඥ දැනුමක් ලබාගැනීම උදෙසාත් මහපොළ අභ්‍යාස ආයතනය ව්‍යුහාත්මක මාවතක් සපයා දෙනු ලබයි.

2012 වසර තුළ මිනිස් පැය 583,970ක් ආවරණය කරමින් මහපොල පුහුණු ආයතනය විසින් අපේක්ෂකයින් (සේවයේ යෙදී නොසිටින) 6,857 දෙනෙකු පුහුණු කර ඇත. ඉකුත් වසර සමග සසඳන විට මෙය 32% පමණ වර්ධනයක් පෙන්නුම් කරයි. මීට අමතරව සේවයේ යෙදී සිටින විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින්, කාර්මික විදුහල් ශිෂ්‍යයින් සහ වෙනත් සමාන වෘත්තීය අධ්‍යයන ආයතන සේවකයින් 193 දෙනෙකු සඳහා මහපොළ පුහුණු ආයතනය විසින් රැකියාවේ නිරතව සිටිමින් පුහුණු පහසුකම් සපයා ඇත.

2012 වසර තුළ සමස්ථ පුහුණු කිරීම් කාර්ය සාධනය.

ප්‍රවාහය	පුහුණු කරන ලද අපේක්ෂක සංඛ්‍යාව	සමස්ථ මිනිස් පැය
උපකරණ ක්‍රියාකරවීම	2,473	25,422
නැවිබඩු මෙහෙයවීම	223	807
කළමනාකරණය	1,435	393,249
තොරතුරු පද්ධති	371	38,958
තාක්ෂණික	415	82,349
ගිනි නිවීම්, නිරාපද සහ වෘත්තීය සෞඛ්‍ය	1,004	13,080
සමුද්‍රීය සහ නාවිකත්ව	936	30,105
ජාතික ආධුනිකත්ව හා පුහුණු අධිකාරියේ (NAITA) ආධුනිකයන් සහ වෘත්තීය පුහුණු (VTA) සහ කාර්මික විද්‍යාල	140	132,000
විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින්	53	31,500
එකතුව -සේවයේ යෙදී සිටියදී (with OJT)	**7,050**	**747,470**
එකතුව-සේවයේ යෙදී නොසිටියදී (without OJT)	**6,857**	**583,970**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ උසස්වීම් සඳහා වන පරිපාටිය යටතේ සුදුසුකම් සඳහා ප්‍රතිපාදන

නව උසස්වීම් පටිපාටියේ කොන්දේසි අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා වූ සුදුසුකම් වලට අදාළ ප්‍රතිපාදන මූලික සුදුසුකම වන අ.පො.ස. (සා/පෙළ) නොමැති වීම හේතුවෙන් උසස්වීම් සඳහා කිසිම බලාපොරොත්තුවක් නොමැතිව එකම තැන රැඳී සිටින වරාය සේවකයින් බොහෝ දෙනෙකු සිටින බව නිරීක්ෂණය කෙරිණ. මෙම තත්ත්වය මහහැරීම සඳහා මෙම සුදුසුකම් වලින් තොරවූ ව්‍යුහාත්මක වැඩ සටහන් පෙළක් මහපොළ අභ්‍යාස ආයතනය විසින් සැළසුම් කර ඇත. 2012 වර්ෂය තුළ එවැනි වැඩ සටහන් දෙකක් අයදුම්කරුවන් 67 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීය.

තවද විධායක නිලධාරීන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා වැඩ සටහන, උසස් ඉංග්‍රීසි පාඨමාලාව සහ වරාය ආරක්ෂක පාඨමාලා 2012 වර්ෂය තුළ දී පවත්වනු ලැබිණ. මීට අමතරව මුහුදු යාත්‍රා කිමිදුම්කරුවන්ගේ හැකියාව වැඩි දියුණු කිරීමට නව වැඩ සටහනක් සංවර්ධනය කෙරිණ.

සමස්ථ වරාය ඵලදායිතාවය වැඩිදියුණු කිරීම

සමස්ථ වරාය ඵලදායිතාවය වැඩි දියුණු කිරීම පිණිස වරාය කටයුතු පිළිබඳ විවිධ පුහුණු කිරීම් සඳහා කුසලතා සංවර්ධන වැඩ සටහන් කිහිපයක් මහපොළ අභ්‍යාස ආයතනය පවත්වනු ලැබීය.

- වරාය මූල්‍ය
- විගණන
- මිළ දී ගැනීම් සහ පරිපාලන
- ලිපිකරු කුසලතා සංවර්ධනය
- මානව සම්පත් කළමනාකරණය
- ධනාත්මක සිතුවිලි
- සෞඛ්‍ය සහ නිරාපද අංග

- ක්‍රමෝපාය වරාය කළමනාකරණය
- UNCTAD කොමිසමේ නවීන වරාය කළමනාකරණය

2012 වර්ෂය තුළ දී 700ක් පමණ පිරිසකට එවැනි වැඩ සටහන් 19ක් පවත්වනු ලැබීය. තවද බහළු පර්යන්තයන්හි සිටින මිනිසුන්ගේ සහ ඒ තුළ පිහිටි උපකරණ වල ආරක්ෂාව වර්ධනය කිරීම වෙනුවෙන් පෞද්ගලික ලොරි රථ රියදුරුවරුන් 2,018 දෙනෙකු වෙනුවෙන් ආරක්ෂාව පිළිබඳ දැනුවත්වීමේ වැඩසටහන් 13ක් පවත්වනු ලැබීය. බහළු රැගත් ප්‍රයිම්මූවර් රථ ආපසු හරවා පැමිණීමේ කාලය අඩුකර ගැනීම සහ පර්යන්ත ක්‍රියාකාරකම් වල ආරක්ෂාව වැඩිවීමට මෙම වැඩසටහන් බෙහෙවින් ඉවහල් විය.

නාවික කර්මාන්තයට සහයෝගය ලබාදීම

නාවික කටයුතු හා සම්බන්ධිත පුහුණු පාඨමාලා සැළසීම මගින් මහපොළ අභ්‍යාස ආයතනය ගෝලීය නාවික කර්මාන්තයට සැළකිය යුතු තරමේ දායකත්වයක් ලබා දී ඇත. දහස් ගණන් ශ්‍රී ලංකාවේ තරුණයින් අතරින් රැකියා විරහිත සහ වරප්‍රසාද රහිත බොහෝ දෙනෙකු මෙම වැඩසටහන හරහා ජාත්‍යන්තර නෞකා සේවාවන්හි රැකියා අපේක්ෂා කරමින් සිටී. 2012 වර්ෂය තුළ ඉල්ලුම්කරුවන් 1,079ක් වෙනුවෙන් එවැනි පාඨමාලා 69ක් පවත්වනු ලැබිය.

ISO – 9001 – 2008 සහතිකය

නාවිකයින් වෙනුවෙන් IMO/STCW පුහුණු පාඨමාලාව පැවැත්වීමට අවශ්‍ය මනා කළමනාකරණ පද්ධතිය සඳහා වන ISO-9001-2008 සහතිකය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අධ්‍යාපනික ආයතනය වන මහපොළ අභ්‍යාස ආයතනය වෙත ප්‍රදානය කරනු ලැබිණ. 2012 වර්ෂය තුළ කළමනාකරණ සමාලෝචන තුනක් සහ අභ්‍යන්තර විගණන හතරක් පවත්වා ඇත. පාරිභෝගික පැමිණිලි මෙහෙයවීම සඳහා ඔවුන් සඳහා ආවේනික වූ සම්මත ක්‍රියාපටිපාටියක් මහපොළ අභ්‍යාස ආයතනය සතුව ඇත. ආයතනයේ නිරන්තර අභිවෘද්ධිය උදෙසා මහපොළ අභ්‍යාස ආයතනයේ සේවකයින් කාලයෙන් කාලයට දැනුම්වත් කෙරේ.

නවීන තාක්ෂණය භාවිතයට ගැනීම

මහපොළ අභ්‍යාස ආයතනය එහි ක්‍රියාකාරකම් වලට නවීන තාක්ෂණය හඳුන්වාදීම මගින් ආයතනයේ පවත්නා පුහුණු පාඨමාලාවන්ගේ තත්ත්වය වර්ධනය කර ඇත.

- අළුතෙන්ම ස්ථාපනය කරනු ලැබූ මෙකාට්‍රොනික් විද්‍යාගාරය භාවිතාකර ඉල්ලුම්කරුවන් 47 දෙනෙකු පුහුණු කරනු ලැබිය.
- අළුතෙන්ම හඳුන්වාදුන් HRIS පද්ධතිය ඵලදායි ලෙස භාවිතා කිරීම පිණිස මානව සම්පත් කොට්ඨාසයේ කාර්යය මණ්ඩලය 33 දෙනෙකු පුහුණු කිරීම සඳහා නව දත්ත පදනම් කරගත් සංවර්ධන පැකේජයක් භාවිතා කරනු ලැබිය.
- වරාය සඳහා ග්‍රැන්ට් දොඹකර මෙහෙයවන්නන් පුහුණු කරවීම සඳහා බහළු අනුකාරකය සෑමවිටම යොදාගනු ලැබේ.

ප්‍රයෝජනයට ගතහැකි ශ්‍රම බලකාය

අනාගත අවශ්‍යතා සම්පූර්ණ කිරීමට සහ අළුතෙන් සංවර්ධනය කළ වරාය සම්බන්ධව කටයුතු කිරීමට සමත් කායීක්ෂම ශ්‍රමික සංචිතයක් පවත්වාගෙනයාමේ ක්‍රියාවලියක මහපොළ අභ්‍යාස ආයතනය නිරතව සිටී. මෙම කාර්යය සඳහා 2012 වර්ෂය තුළ වරාය යන්ත්‍ර සූත්‍ර මෙහෙයවන්නන් 260ක් පමණ ද විධායක ශ්‍රේණියේ කළමනාකරණ පුහුණුවන්නන් 08 දෙනෙකු ද පුහුණු කරනු ලැබිණ. මීට අමතරව අළුතින්ම ඉදිකළ හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සඳහා බහුවිධ නිපුණතා ශිල්පී තනතුරේ 300ට වැඩි තරුණ පිරිසක් පුහුණු කරවීමට මහපොළ අභ්‍යාස ආයතනය ආරම්භ කර ඇත.

භාෂා හා තොරතුරු තාක්ෂණ නිපුණතාවය වැඩිදියුණු කිරීම

ගෝලීය ව්‍යාපාර සඳහා ගණුදෙනුකරුවන් තෘප්තියට පත්කිරීම වැදගත් කරුණක් වන බැවින්, ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රධාන මෙවලම් දෙකක් උදෙසා සැළකිල්ලක් දක්වා ඇත. එනම් ආයතනයේ සේවකයින්ගේ භාෂා නිපුණත්වය දියුණු කිරීම සහ ගණුදෙනුකරුවන්ගේ තෘප්තිය නහා සිටුවනු වස් සේවකයින්ගේ තොරතුරු තාක්ෂණ ඥානය දියුණු කිරීම මගින් ඔවුන් බලගැන්වීමත්ය. මහපොළ අභ්‍යාස ආයතනය මෙම කර්තව්‍ය සාර්ථක කරගැනීමේ වගකීම සඳහා උරදී ඇති අතර 2012 වසර තුළ දී එයට විවිධ තොරතුරු තාක්ෂණ වැඩසටහන් සපයා දී ඇති අතර සේවකයින් 350 දෙනෙකු පුහුණු කර ඇත. තවද තෝරාගනු ලැබූ අයදුම්කරුවන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වැඩසටහන් පවත්වා ඇත.

කාර්මික සහයෝගය සැපයීම

රාජ්‍ය විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතන වල සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන පාඨමාලා සම්පූර්ණ කරගැනීම පිණිස කාර්මික පුහුණුවක් ලබාදීම මගින් සහය ලබාදීමේ ක්‍රියාවලියක ශ්‍රී ලංකා වරාය අධිකාරිය නිරතව සිටී. 2012 වර්ෂය තුළ විවිධ විශ්ව විද්‍යාල වල උපාධි අපේක්ෂකයින් 53කටද, ඩිප්ලෝමාධාරීන් 37 දෙනෙකුටද, නිර්මාණ ශිල්පීන් 103 දෙනෙකුට ද ඔවුන්ගේ පුහුණුව සම්පූර්ණ කරගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අවස්ථාව සළසා දී ඇත.

උපයන ලද ආදායම

2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ මහපොළ අභ්‍යාස ආයතනය මගින් බාහිර පාර්ශ්වයන් සඳහා මුදල් අයකර පවත්වනු ලැබූ වැඩ සටහන් මගින් ආදායම වශයෙන් රු.18,617,950/=ක සම්පූර්ණ මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට උපයා දී ඇත. සමස්ථ බහළු කායීක්ෂමතාවය පිළිබඳව වරාය සේවකයින් දැනුවත් කිරීම පිණිස පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් රු.10,767,549/=ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාස වලින් උපයාගන්නා ලදී. එබැවින් මහපොළ අභ්‍යාස ආයතනය මගින් 2012 වර්ෂය තුළ රු.29,385,499/=ක සමස්ථ ආදායමත් ඉපැයීය.

මීට අමතරව සමුද්‍රික පුහුණු ආයතනය (ඔලුවිල්) විසින් රු.96,134/-ක ආදායමක් ඉපැයීය.

2012 වර්ෂය තුළ මහපොළ අභ්‍යාස ආයතනයේ සහ ඔලුවිල් සමුද්‍රික පුහුණු ආයතනයන්හි පවත්වන ලද පාඨමාලා සඳහා වූ සමස්ථ වියදම රු.7,115,501/=කි.

අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණන කොට්ඨාසයේ කටයුතු වාර්ෂික විගණන වැඩ සටහන මගින් මහ පෙන්වනු ලැබූ අතර එය විගණන කමිටුව මගින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම් හා වියදම් ක්ෂේත්‍ර වල අභ්‍යන්තර පිරික්සීම් සහ සාමාන්‍ය අභ්‍යන්තර විගණක කටයුතු කර ගෙන යනු ලැබිණ.

අභ්‍යන්තර පරීක්ෂා කිරීම්

පැමිණීම

කම්කරු හා කම්කරු නොවන සේවකයින් සේවා ස්ථානයේ රැඳී සිටීම සම්බන්ධයෙන් හදිසි පරීක්ෂණ කටයුතු හදිසි වැටලීමේ කණ්ඩායම විසින් දිවා රාත්‍රී මුර සේවා තුළ දී අඛණ්ඩව කරගෙන යනු ලැබීය. අනවසරයෙන් සේවා ස්ථානයෙන් බැහැරව සිටි සේවකයින් සඳහා විනයානුකූල

ක්‍රියාමාර්ග ගැනීම පිණිස වාර්තා කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සේවකයින් ඔවුන්ගේ සේවා ස්ථානයට පැමිණීම යහපත් අතට පත්විය.

මුදල්

මුදල් හා සුළු මුදල් අග්‍රිමය වරින් වර හදිසි පරීක්ෂා කටයුතු වලට භාජනය කරගෙන යනු ලැබූ අතර වෙනස්කම් පිළිබඳව වාර්තා කරන ලදී.

ආදායම් විගණනය

විගණන වැඩසටහනට අනුව වසරේ ආදායම් එකතුව විගණනය කරන ලද අතර වරාය ගාස්තු අඩුවෙන් අයකර ගැනීම් අනාවරණය කරගැනීමට හැකිවන පරිදි විශේෂ පැවරුම් කාර්යයන් තුළින් කරගෙන යනු ලැබීය.

ණයගැති ගිණුම්, විවාදිත බිල්පත් සහ අගරු වූ චෙක්පත් පරීක්ෂණයට භාජනය කළ අතර ඒවායේ වෙනස්කම් වාර්තා කරනු ලැබීය. කටුනායක සහ බියගම ගොඩබෑම් සහ හාරදීම් ඒකක වල නිතිපතා පරීක්ෂණයන් සිදුකරන ලදී.

වියදම් විගණනය

ප්‍රාග්ධන සහ පුනරාවර්ථන වියදම් සහ ගබඩා ගෙවීම් වවුචර් සම්බන්ධයෙන් වරින්වර පරීක්ෂා කරගෙන යනු ලැබීය. වාහන ධාවන සටහන් පත් සහ වාහන අනුමත ආකෘති පත්‍ර පරීක්ෂා කෙරුණු අතර අඩුපාඩු පෙන්වා දෙනු ලැබිණ. වැටුප් හා වේතන සකස් කිරීම් නිතිපතා පරික්ෂා කරගෙන යනු ලැබූ අතර සොයාගනු ලැබූ අසමානතාවයන් පිළිබඳව වාර්තා කෙරිණ.

ගබඩා පිළිබඳ භෞතික නිරවද්‍යතාවයන් පරීක්ෂා කිරීම

කොළඹ වරායේ ගබඩා පිළිබඳ භෞතික නිරවද්‍යතාවයන් පරීක්ෂා කරබැලීම් අඛණ්ඩව සිදුකරනු ලැබූ අතර ගාල්ල සහ ත්‍රිකුණාමලය යන වරායයන්හි වාර්ෂික තොග පරීක්ෂා කර බැලීම්වලදී ද සහාය දක්වනු ලැබිණ.
ප්‍රධාන ගබඩාවේ අඛණ්ඩ නිරවද්‍යතාවයන් සලකා බැලීමේදී ගබඩාවේ පවතින නිරන්තරයෙන් අවශ්‍ය නොවන තොග අයිතමයන් හඳුනාගත් අතර සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීම සඳහා සැපයුම් කොට්ඨාසය වෙත යොමු කෙරිණ.

පරීක්ෂාවන්

වසර තුළ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂගේ ඉල්ලීම පරිදි විශේෂ පරීක්ෂණ සිදුකරන ලදී.

අවසාන ගිණුම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වෙමින් මුල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීම සහතික කිරීමේ අදහස ඇතිව අධිකාරියේ අවසාන ගිණුම් පරීක්ෂා කිරීම ද මෙම කොට්ඨාසයේ වගකීම වේ.

පූර්ව විගණන

සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු, ආපසු ගෙවීම් සහ වරාය ගාස්තු අතහැර දැමීම පිළිබඳව පූර්ව විගණනයන් කරනු ලැබීය.

ගාල්ල හා ත්‍රිකුණාමලය වරායයන්

ගාල්ල හා ත්‍රිතුණාමලය වරායයන් වෙනුවෙන් ආදායම් සහ වියදම් දෙඅංශයේම ගිණුම් විගණනය කර වාර්තා සකස් කරන ලදි.

ත්‍රිකුණාමලය වරාය

නාවික (යාත්‍රා)

ටග් යාත්‍රා 04ක් හා දියත් යාත්‍රා 04ක් ද එක් ටනැක් යාත්‍රාවක් ද ත්‍රිකුණාමලය වරාය සතුව පවති. ඒවා අතුරින් යාත්‍රා 05ක් මෙහෙයුම් කටයුතු සිදුනොකරන අතර ටී ටී ඒ සහ මඩකෝව් ජැටි වල නවතා ඇත. සේරුවිල II මගී යාත්‍රාව ද ප්‍රධාන නඩත්තු කටයුත්තක් නිසා ටී ටී ඒ ජැටියේ නවතා ඇත.

ආරක්ෂක අංශය

(ගිනි නිවීමේ වැඩ සටහන)

පෙර සිදුකළ පරිදි ගිනි නිවීමේ වැඩ සටහන පිළිබඳව පැහැදිලි කිරීමේ පන්ති මාලාවක් කොළඹින් පැමිණි නිලධාරීන් විසින් පවත්වනු ලැබීය.

ඉංජිනේරු කොට්ඨාසය විසින් සිදුකරනු ලැබූ කාර්යයන්

සිවිල්

- ටී ටී ඒ හි රේගු ගොඩනැගිලි පද්ධතිය ඉදිකිරීම සිදුකරනු ලැබීය
- ශ්‍රී ලංකා නාවික හමුදා නැවියන්ගේ කාර්යාලය අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකරගෙන යනු ලබන අතර CB II (නියෝජ්‍ය හාබර් මාස්ටර්වරයාගේ නිල නිවස)හි අළුත්වැඩියා කටයුතු සිදුකෙරෙමින් පවති. මෙවා 2013 වසරේදී සම්පූර්ණ කෙරෙනු ඇත.
- අෂ්රෆ් ජැටිය, රයිෆල් ග්‍රීන් නිල නිවාස, දානියාගම ජී 10 නිල නිවාස, ඕර්ස් හිල්හි CB I (VIP) නිල නිවස, ජපන් නිල නිවස සහ බෝට්ටු යාත්‍රාංගනයේ අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදුකරනු ලැබීය.
- සපයන ලද මිනුම් වාර්තාවට අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් වල සීමාවන් ලකුණු කිරීමේ කටයුතු සපයන ලද මිණුම් සැළසුම අනුව කරගෙන යනු ලැබීය

යාන්ත්‍රික ඉංජිනේරු

- රෝසා බස් රථ, පික්අප් රථය (GC-9429), ලේලන්ඩ් බස් රථය, වොට් 35ක ජෙනරේටරයේ අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලැබූ අතර UD නිසාන් බස් රථයේ එන්ජිමේ අළුත්වැඩියා කටයුතු කොළඹ ඩීසල් වැඩ කර්මාන්ත ශාලාවේදී සිදුකර, ඉන් අනතුරුව අළුත්වැඩියා කටයුතු ත්‍රිකුණාමලය යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ දී සිදුකරනු ලැබිණ.
- වතුර බත්තල II, නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා, නියමු යාත්‍රා III, බෝයාවන්හි අළුත්වැඩියා කටයුතු කරගෙන යනු ලැබූ අතර කොළඹ නාවික කණ්ඩායම විසින් එන්ජිම අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව නියමු යාත්‍රා Vහි පින්තාරු කටයුතු සිදුකරනු ලැබීය.

- අෂ්රෆ් ජැටියේ ටයර් වලින් නිර්මිත ගැටීම වලක්වනයන් නැවත සවිකරන ලදි. මඩකෝච්හි ඩීසල් අංගනයේ තෙල් ටැංකි සහ නළ මාර්ග අළුත්වැඩියා කළ අතර ටී ටී ඒ හි ශ්‍රී ලංකා නාවික හමුදා නාවිකයන්ගේ කාර්යාලයේ සහ අලුතින් ඉදිකළ රේගු කාර්යාලයේ විදුලි රැහැන් ඇදීමේ කටයුතු සම්පූර්ණ කෙරිණ.

ගාල්ල වරාය

වර්ගය	නෞකා සංඛ්‍යාව	ගොඩබෑම් (මෙ.ටො.)	පැටවීම් (මෙ.ටො.)
ක්ලින්කර්	35	322,144	-
සිමෙන්ති තොග	10	82,487	-
සිමෙන්ති මළු	01	2,010	-
ජිප්සම්	02	14,400	-
සාමාන්‍ය නැව් බඩු	02	652	-
ප්‍රති අපනයන නැව් බඩු	03	02	08
එකතුව	53	421,665	08
මෙහෙය වූ සමස්ථ ටොන් ප්‍රමාණය			421,673
සමස්ථ භාණ්ඩ රැගත් නෞකා			53
වෙනත් නෞකා(මගී, නාවුක,තෙල් ලබාගැනීම්, අළුත්වැඩියා යනාදිය)			85
2012 වර්ෂයේ දී නැංගුරම් ලද සමස්ථ නැව් සංඛ්‍යාව			138
නැංගුරම්ලෑම්			71
වරාය සීමාවෙන් පිටත නෞකා			9,634
රුවල් යාත්‍රා			143

මූලාශ්‍ර සමාලෝචනය

ආදායම සියළුම වරායයන්

(වරාය කටයුතු සැකසුම්)
(රු.මිලියන)

විස්තරය	2012	2011 යළි ප්‍රකාශිත	විස්තරය	2012	2011 යළි ප්‍රකාශිත
වරාය කටයුතු වලින් ආදායම	32,354	27,525	නාවික	4,860	4,095
වෙනත් ආදායම්	5,744	3,561	ස්ටෙවඩෝරින්	19,433	16,625
			වාප්පු මෙහෙයුම්	3,634	3,273
			වරාය පහසුකම්	3,682	2,761
			වෙනත් සේවා මෙහෙයුම්	746	770
මුළු ආදායම	**38,098**	**31,086**	**උප එකතුව**	**32,354**	**27,525**


මෙහෙයුම් සහ වෙනත් වියදම් (සියළු වරායයන්)

විස්තරය	2012 වියදම	2011 වියදම	(අඩුවීම)/ වැඩිවීම	%
ප්‍රමාණ ප්‍රතිදාන සඳහා ගෙවීම	1,466	1,123	(343)	(31)
වත්කම් නඩත්තුව	1,274	1,367	93	7
ඉන්ධන සහ විදුලිබලය	2,103	2,028	(76)	(4)
විදේශ ණය මත පොලිය	1,710	1,372	(338)	(25)
අතිකාල	3,260	3,177	(83)	(3)
ක්ෂයවීම්	5,196	4,345	(851)	(20)
වේතන, වැටුප් හා දීමනා	10,521	9,616	(905)	(9)
වෙනත්	2,189	1,816	(373)	(21)
මුළු වියදම	**27,719**	**24,844**	**(2,875)**	**(12)**
විදේශ විනිමය පාඩු/ලැබීම්	4,567	3,390	(1,177)	(35)
ස්වේච්ඡාවෙන් විශ්‍රාමයාමේ වියදම්	600	2,595	1,994	77
මුළු වියදම විදේශ විනිමය පාඩුව ඇතුළුව	**32,886**	**30,829**	**(2,057)**	**(7)**

වරායයන් අනුව ක්‍රියාකාරීත්වය


කොළඹ වරාය

2012 වර්ෂයේ දී කොළඹ වරාය බදු අයකිරීමකට පෙර රුපියල් මිලියන 5,499ක ලාභයක් ඉපැයීය. 2011 වර්ෂයේ ආදායම වූ රුපියල් මිලියන 30,360 හා සසඳා බලන විට 2012 වර්ෂයේ ආදායම රුපියල් මිලියන 37,077ක් වූ අතර එය රුපියල් මිලියන 6,717ක වැඩිවීමකි. බදු අයකිරීමට පෙර මුළු වියදම (ස්.වි.ගැ. ඇතුළුව) රුපියල් මිලියන 29,302ක් වූ අතර 2011 (යළි ප්‍රකාශි පරිදි) වර්ෂයේ වියදම රුපියල් මිලියන 31,578කි. එය 8%ක වැඩිවීමකි.




ගාල්ල වරාය

2012 වර්ෂයේ දී ගාලු වරායේ බදු අයකිරීමකට පෙර අලාභය රුපියල් මිලියන 48ක් ලෙස වාර්තා කරන ලදී. 2011 වසරේ දළ ආදායම වන රුපියල් මිලියන 441 හා සැසඳීමේ දී 2012 වර්ෂයේ දී දළ ආදායම රුපියල් මිලියන 597ක් වන අතර එය (යළි ප්‍රකාශිත පරිදි) රුපියල් මිලියන 156ක වර්ධනයකි. බදු වලට පෙර මුළු වියදම (ස්.වි.ගැ. ඇතුළුව) රුපියල් මිලියන 645ක් වූ අතර 2011 වසරේ දී (යළි ප්‍රකාශිත පරිදි) එය රුපියල් මිලියන 699ක් විය. එය 8%ක පහත වැටීමකි.



ත්‍රිකුණාමලය වරාය

2012 වර්ෂයේ දී රුපියල් මිලියන 240 බදු අයකිරීමට පෙර පාඩුවක් ත්‍රිකුණාමලය වරායෙන් වාර්තා විය. 2011 වර්ෂයේ ලැබූ දළ ආදායම රුපියල් මිලියන 285 හා සසඳා බලන විට 2012 වර්ෂයේ දී රුපියල් මිලියන 423ක ආදායමක් ඉපැයූ අතර එය රුපියල් මිලියන 138ක වැඩිවීමකි. බදු අයකිරීමට පෙර වියදම (ස්.වි.ගැ. ඇතුළුව) රුපියල් මිලියන 828ක් වූ අතර 2011 වර්ෂයේ වියදම රුපියල් මිලියන 663කි. එය 20%ක වැඩීමකි.



සමාලෝචනයට භාජිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය සංස්ථාපිත සමාජ වගකීම් අඛණ්ඩව සිදු කරනු ලැබීය.

- අ.පොස (සා/පෙළ) සහ අ.පොස. (උ/පෙළ) විශිෂ්ඨ ලෙස සමත් වූ වරාය සේවකයින්ගේ දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනැමීම.

- වරාය සේවකයින්ගේ කුඩා දරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් අංග සම්පූර්ණ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබයි.

- පවතින වරාය පහසුකම් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කර ගෙන යනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳව පාසල් සිසුන් සහ මහජනතාව හොඳින් දැනුවත් කිරීමට අවස්ථාවක් සලසනු වස් ''දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය'' ඇතුළුව ප්‍රදර්ශණ ගණනාවකට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහභාගී විය.

- අංග සම්පූර්ණ වරාය ගිනි නිවීමේ ඒකකය, කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි ගිණි නිවීම් කටයුතු මෙන්ම වෙනත් හදිසි අවස්ථාවන්වලදී ද කොළඹ මහ නගර සභාවට සහාය වීම.

- මුල්ලේරියාව මානසික රෝහලේ වාට්ටු අංක 09 ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පවත්වාගෙන යනු ලැබේ. මෙහි රෝගීන්ගේ අවශ්‍යතා සැපයීමට අමතරව මසකට වරක් ඔවුන් බැහැ දැක දානය පිරිනැමීම ද සිදු කෙරේ.

ආයතනයක සේවකයින් එහි ජීවනාලිය වේ. සෑම සේවකයෙකුම තම සේවා කාලය තුළ පළපුරුද්ද, විවෘතවීම, පුහුණුව තුළින් යම් නිපුණතාවයන් රැසක් ලබාගන්නා අතර අවසානයේදී එයින් සංවිධානයට ලබාදෙන ප්‍රතිලාභ වැඩි වේ. මානව ප්‍රාග්ධනය යනු සේවකයින් යම් සේවා කාලයක් තුළ සංවර්ධනය කරගන්නා වූ දැනුම සහ විශේෂඥතාවය සංවිධානයේ ඵලදායිතාවය තවදුරටත් වැඩිකර ගැනීම වේ.

සංවිධානයක ඵලදායිතාවය ඉහළ නැංවීම සහ යහපත් ප්‍රතිඵල ලබාගැනීම සඳහා මානව ප්‍රාග්ධනය තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරනු ලබන බැවින් ඕනෑම සංවිධානයක් තම නව සේවකයින් පුහුණු කිරීම උදෙසා මූල්‍ය සහ සම්පත් ආයෝජනය කරනු ලබයි.

සේවකයින්ගේ නිපුණතා, දැනුම සහ ආකල්ප වර්ධනය කිරීම පිණිස මානව සම්පත් කොට්ඨාශය, මහපොල අභ්‍යාස ආයතනය, සුභසාධන හා කාර්මික සබඳතා කොට්ඨාශය සෘජුවම මැදිහත් වේ.

විධායක නිලධාරීන්, විධායක නොවන නිලධාරීන්, තාක්ෂණික සහ තාක්ෂණික නොවන කොටස් ඇතුළුව 2012 වසර අවසානයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ථ ශ්‍රම හමුදාව 10,200ක් විය. ඔවුන් අතුරින් 42කු පශ්චාත් උපාධිධාරීන් වන අතර 36 දෙනෙකු පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් වේ. 436 දෙනෙකු උපාධිධාරීන් වන අතර 325 දෙනෙකු ඩිප්ලෝමාධාරීන් වේ.

සේවකයින්ගේ මානව ප්‍රාග්ධනය වඩාත් හොඳින් අවබෝධකර ගෙන මහපොළ අභ්‍යාස ආයතනය සහ වෙනත් පිළිගත් බාහිර සංවිධාන වල එකඟත්වය ඇතිව මානව සම්පත් කොට්ඨාශය විසින් වඩාත් ඉහළ පුහුණුවීම් සහ සංවර්ධන වැඩසටහන් හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනුම් මධ්‍යස්ථානය වන මහපොළ අභ්‍යාස ආයතනය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ මානව ප්‍රාග්ධනය නඟාසිටුවීමෙහිලා දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු මාලාවක් සහ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් රැසක් පවත්වා ඇත.

ප්‍රතිපත්ති පටිපාටි, නීති සහ රෙගුලාසි වැනි කටයුතු වලට අවශ්‍ය මූලික පසුබිම් තොරතුරු සපයාදීම වස් උත්ප්‍රේරණය සහ හැඩගැස්වීමේ වැඩසටහන් සේවකයින් සඳහා හඳුන්වා දෙන ලදි. කාර්යසාධනය තක්සේරු කිරීම යනු පූර්ව ස්ථාපිත නිර්නායකයන් සහ සංවිධානයේ පරමාර්ථ සම්බන්ධව එක් එක් සේවකයාගේ කාර්යසාධනය සහ ඵලදායිතාවය තක්සේරු කරනු ලබන ක්‍රමානුකූල සහ කලින් කලට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාවලියක් වේ. දැනට සේවය කරන සේවකයින්ගේ දුර්වලතාවයන් සහ හැකියාවන් හඳුනාගැනීම පිණිස කාර්යසාධන ඇගයීමේ ප්‍රතිඵල වඩා වැදගත් සාධකයක් වේ. අතීතයේ සිදුකළ අන්දමට 2012 වසරේදී ද දෙවරක් කාර්යසාධන ඇගයීම් සිදුකරන ලදි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරමාර්ථයන් සාක්ෂාත් කරගැනීමෙහිලා දුර්වලතා අවම කිරීමටත් හැකියාවන් වර්ධනය කිරීමටත් පියවර ගැනීම වැදගත් වේ.

විධායක සහ විධායක නොවන ශ්‍රේණි සඳහා අඛණ්ඩ ක්‍රියාත්මක කරන ලද බඳවාගැනීමේ පටිපාටි සේවකයින්ගේ දැනුම සහ වෘත්තීය සංවර්ධන නිපුණත්වය නඟාසිටුවීම සඳහා ඉවහල් වේ. පවත්නා වෘත්තීමය හිමිකම් ක්‍රම වේදය සේවකයින් උසස් අධ්‍යාපනයට සහ වෘත්තීය සුදුසුකම් සපුරාගැනීමට පෙළඹවීමක් ඇති කරයි. තවද විධායක නිලධාරීන් ඔවුන්ගේ වෘත්තියකට අදාළ වේ නම් ඔවුන්ගේ සාමාජිකත්වය වෙනුවෙන් ගෙවනු ලැබූ ගාස්තුව ප්‍රතිපූර්ණය කරගත හැක.

පවත්වනු ලබන වැඩමුළු දැනුම බෙදාහදා ගැනීමටත්, ඵලදායක අන්දමින් ආයතනමය අරමුණු ඉටුකර ගැනීමත් පිණිස නිලධාරීන්ට සහ සේවකයින්ට උපකාරී වේ.

සේවකයින්ට තම දැනුම, නිපුණත්වය සහ ආකල්ප වැඩිදියුණු කර ගැනීමට පහසු කිරීම පිණිස කොට්ඨාශ විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල සඳහා පොත්පත් මිළදී ගැනීම වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සළසා ඇත. 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුස්තකාල 18ක් වෙනුවෙන් රු.300,000ක මුදලක් ප්‍රදානය කරනු ලැබීය.

මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සේවකයින්ට එදිනෙදා කටයුතු පහසුවෙන් කරගෙනයාමට උදව් වේ. සේවකයින්ගේ පරිගණක සාක්ෂරතාවය වැඩිදියුණු කරනු වස් මහපොළ අභ්‍යාස ආයතනයේ එකඟත්වය ඇතිව දත්ත මූලික කළමනාකරණ වැඩසටහන 2012 වර්ෂයේදී ආරම්භ කරනු ලැබිණ.

ඉහත සඳහන් පුහුණු සහ සංවර්ධන වැඩසටහන් වලට අමතරව සේවකයින්ට තම දැනුම,නිපුණත්වය සහ ආකල්ප වර්ධනය කරගනු පිණිස දේශීය සහ ජාත්‍යන්තර බාහිර ආයතන වෙත යවනු ලැබීය. අවසාන වශයෙන් මෙම සියළුම දේ ආයතනයේ ඵලදායිතාවය වර්ධනය කිරීම පිණිස ඉවහල් වේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, එහි භාවිතා කරනු ලබන මූල්‍යමය ලියවිලි වලින් පහත සඳහන් අවදානම් අනාවරණය කරගනු ලැබී ය.

1. ණය අවදානම
2. ද්‍රවශීලතා අවදානම
3. වෙළඳපොළ අවදානම (මුදල් අවදානම සහ පොලී අනුපාත අවදානම)

අධිකාරියේ මූල්‍යමය ලියවිලි ව්‍යාපාර වස්තු ආයෝජනය (ලේඛනගත සහ ලේඛනගත නොවූ), ණයකර වල ආයෝජනය, කාලීන තැන්පතු, මූල්‍ය වෙළඳපොළ ආයෝජනය සහ මුදල් වලින් සමන්විත වේ. කාලීන තැන්පතු වල ආයෝජනය සහ මූල්‍ය වෙළඳපොළේ ආයෝජනයන්හි ප්‍රධාන අරමුණ වන්නේ මෙහෙයුම් සඳහා ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සහ පවත්වාගෙන යාමයි. ව්‍යාපාර වස්තු සහ ණයකර ආරක්ෂණයන්හි ආයෝජනය ක්‍රමෝපායික ආයෝජනයන් වන අතර වෙළඳ සහ වෙනත් ලැබීම් වැනි වෙනත් මූල්‍යමය ලියවිලි සහ එහි ව්‍යාපාරික කටයුතු වලින් සෘජුවම පැන නගින වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව පවතී. තවද, වරාය පුළුල් කිරීම සහ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ශ්‍රී ලංකා රජයෙන් සහ මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය වෙනුවෙන් පොලිය ගෙවීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වේ.

1. ණය අවදානම

ශ්‍රී ලංකා හමුදා, වෙනත් රාජ්‍ය ආයතන හා ආයෝජන ආරක්ෂණ ඇතුළුව ගණුදෙනුකරුවන් හට ගිවිසුම් ප්‍රකාරව බැඳීම් ඉටුකිරීමට නොහැකි වීමෙන් අධිකාරියට ඇතිවන මූල්‍ය පාඩුව ණය අවදානම වේ.

වෙළඳ ලැබීම්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය නැව් නියෝජිතයින් සහ රාජ්‍ය ආයතන සමඟ ප්‍රධාන වශයෙන් වෙළඳ කටයුතු වල නිරත වේ. අතීත පළපුරුද්ද සහ නැව් නියෝජිතයින්ගේ මූල්‍යමය සහතිකවීම් වැනි වෙනත් කටයුතු පදනම් කරගනිමින් නැව් නියෝජිතයින්ගේ ණය තත්ත්වය පිළිබඳව කළමනාකාරීත්වය තක්සේරු කරනු ලබයි. ඊට අමතරව, කළමනාකරණ කමිටුවේදී සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පවත්නා පදනම මත ගෙවීමට ඇති ශේෂයන් අධීක්ෂණය කරනු ලැබේ.

විශේෂිත නොවන ගණුදෙනුකරුවන් සඳහා සාමූහික හානිකිරීම් සඳහා (මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන් සඳහා 2.11 විස්තරය බලන්න) වන පාඩු සහ විශේෂිත ගණුදෙනුකරුවන් තනිතනිව තක්සේරු කිරීම සම්බන්ධව ඔවුන්ට තනි වශයෙන් සිදුවන හානි නිසා ඇති වන පාඩු මෙම ප්‍රතිපාදන වල මූලික සංරචක වේ.සාමූහික හානිකිරීම් නිසා සිදුවන පාඩු තීරණය කරනු ලබන්නේ ගෙවීම් රටාවේ ඓතිහාසික දත්ත පදනම් කරගෙන ය. පිහිටුවන ලද හානිකිරීමේ ප්‍රතිපත්ති වලට අනුකූලව හානිකිරීමේ පාඩු මැන බැලීම පිණිස ශ්‍රී ලංකා හමුදාවන්, වෙනත් රජයේ ආයතන, නඩු කටයුතු වලට යටත් නැව් නියෝජිතයින් සහ විශේෂිත නැව් නියෝජිතයින් පෞද්ගලිකවම සමාලෝචනය කෙරිණ. අනෙක් අය සාමූහිකව සමාලෝචනය කෙරිණ. වෙළඳ ලැබිය යුතු දේ සහ හානිකිරීමේ පාඩු වෙනුවෙන් වූ ප්‍රතිපාදන වල විස්තර සඳහා කරුණාකර මූල්‍ය ප්‍රකාශන සඳහා වන 12 සටහන බලන්න.

වෙනත් මූල්‍ය වත්කම්

අධිකාරියේ වෙනත් මූල්‍යමය වත්කම් වලින් පැන නගින ණය අවදානම සමන්විත වන්නේ කාලීන තැන්පතු මුදල් හා මුදල් සමක සහ ණයකර වල ආයෝජන වලිනි. මෙම මූල්‍යමය ලියවිලි වල ඉදිරියට ගෙන එන ලද මුදලට සමාන උපරිම අනාවරණයක් සහිතව ගිවිසුම් ප්‍රකාර පාර්ශවයන්ගේ ගිවිසුම් ප්‍රකාර වගකීම් හමුවේ වූ පැහැර හැරීම් වලින් පැන නගින ණය අවදානම අධිකාරිය

අනාවරණය කරයි. රාජ්‍ය මූල්‍ය ආයතන සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ ප්‍රධාන වශයෙන් එහි අරමුදල් යෙදවීම මගින් මෙම මූල්‍යමය ලියකියවිලි සම්බන්ධයෙන් අධිකාරිය එහි ණය අවදානම කළමනාකරණය කරයි.

2. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු අධිකාරියට නියමිත වන මූල්‍ය වගකීම් ඉටුකිරීමට හැකියාවක් නොමැතිවීම වේ. සාමාන්‍ය හා අනපේක්ෂිත අවස්ථාවන් වලදී දරාගත නොහැකි පාඩු අත්විඳීමකින් තොරව හෝ අධිකාරියේ කීර්ති නාමයට හානියක් සිදුවන අන්දමේ අවදානමක් නොගෙන හැකි සෑම විටම නියමිත කලට මුදල් ගෙවිය යුතු අවස්ථාවන් වලදී ගෙවීමට ප්‍රමාණවත් මුදල් තබාගැනීම අධිකාරියේ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමේ ක්‍රමවේදය වේ. වාර්ෂිකව මෙහෙයුම් මුදල් ප්‍රවාහ සහ ප්‍රාග්ධන අයවැය වල පුරෝකථනයන් පිළියෙල කරනු ලැබේ.

මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහයන් (පුනරාවර්තන අයවැය) සහ ප්‍රාග්ධන අයවැය වල පුරෝකථනයන් වාර්ෂිකව පිළියෙල කෙරේ. මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් අධිකාරිය සතු බවට සහතික කරනු වස් පුනරාවර්තන අයවැය සහ ප්‍රාග්ධන යන ද්විත්වය හා ද්‍රවශීලතා අවශ්‍යතාවයන් මුදල් කොට්ඨාශය විසින් අධීක්ෂණය කරනු ලැබේ. වාර්තා සැකසීමේ කාලපරිච්ඡේදය අවසානයේදී රුපියල් 8,449,746,16/= (2011: රුපියල් 8,358,716,838/=) මුදලකට අධිකාරිය විසින් කාලීන තැන්පතු, කෙටි කාලීන රාජ්‍ය සුරැකුම්පත් සහ වෙනත් ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යනු ලැබිණ.

ගිවිසුම් ප්‍රකාරව පරිණත වන දිනයට, වාර්තාකරනු ලබන කාලසීමාවේ අවසන් දින වන විට පවත්නා කාල සීමාව පදනම් කරගත් අධිකාරියේ මූල්‍ය වගකීම් වල පරිණත විශ්ලේෂණයන් පහත වගුවෙන් නිරූපනය කෙරේ. වට්ටම් නොලැබූ ගිවිසුම් ප්‍රකාර මුදල් ප්‍රවාහයන් වගුවේ අගයන්ගෙන් පෙන්නුම් කෙරේ.

මූල්‍ය වගකීම්	2012 දෙසැම්බර් 31			2011 දෙසැම්බර් 31		
	වසරකට අඩු	වසරකට වැඩි	එකතුව	වසරකට අඩු	වසරකට වැඩි	එකතුව
ණයට ලබාගැනීම්- රජය	6,477,929,305	134,887,281,927	141,365,211,232	4,932,194,888	111,904,320,057	116,836,514,945
ණයට ලබාගැනීම් - මූල්‍ය ආයතන	1,610,566,021	3,825,094,300	5,435,660,321	1,436,281,824	4,847,451,155	6,283,732,978
වෙළඳ සහ වෙනත් ණය හිමියන්	1,161,128,806	-	1,161,128,806	733,071,211	-	733,071,211
එකතුව	9,249,624,132	138,712,376,227	147,962,000,359	7,101,547,923	116,751,771,212	123,853,319,134

3. වෙළඳපොළ අවදානම

අධිකාරියේ ආදායමට හෝ මූල්‍ය ලියකියවිලි වල ගෙන එන ලද රඳවාගත් අගයට බලපෑමක් ඇතිකරනු ලබන විදේශ හුවමාරු අනුපාත සහ පොලී අනුපාතයන් වැනි වෙළඳපොළ මිළ වෙනස්වීමේ අවදානම වෙළඳපොළ අවදානම වේ.

මුදල් අවදානම

වාර්තාකරනු ලබන කාල සීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල පාවීමට ඉඩහැරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇ.එ.ජ.ඩොලරයේ වටිනාකමේ උච්ඡාවචනයන් නිසා අධිකාරියට මූල්‍ය අවදානමකට මුහුණ දීමට සිදු වේ. සමාගමේ බොහෝ ගණුදෙනු සිදුකරනු ලබන්නේ එහි භාවිතා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් මගිනි. නමුත් වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘති, සංවර්ධන ව්‍යාපෘති සහ සමහර බැංකු ශේෂයන් සහ නාවික නියෝජිතයන්ගෙන් ලැබිය යුතු ලැබීම් (APL ලංකා පුද්ගලික සමාගම) ආදී පොලී සහිත ණය ගැනීම් විදේශ විනිමය (ජපන් යෙන් සහ ඇ.එ.ජ. ඩොලරය) භාවිතයෙන් සිදු කරයි.

ඇ.එ.ජ.ඩොලරය පාවීමේ ප්‍රතිඵලයක් ලෙස 2012 වර්ෂයේ වාර්තා කරන කාල සීමාවේ ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්ෂය වීමෙන් මෙහෙයුම් සඳහා ඇති වූ බලපෑම රු.4,566,871,693/=ක් වූ අතර මෙය APL ලංකා පුද්ගලික සමාගමට සැපයූ සේවාවන් ඉන්වොයිස්ගත කිරීම හා ලබාගත් ණය නැවත ගෙවීමෙන් උපයාගන්නා ලදී.

නමුත් එකම මුදල් ඒකකයක් මගින් පවත්වාගෙන යන මුදල් තැන්පතු හරහා යළි ගෙවීම් සහ ලබාගත් ණය නැවත ගෙවීම හා මුදල් සංචලනයේ බලපෑම අවම කිරීමට අධිකාරිය විසින් එකම මුදල් ඒකකයක් භාවිතා කරනු ලැබේ.

පොලී සහිත ණය හා විදේශ විනිමය මගින් නිරූපණය කොට ඇති ණය ගැනීම් පිළිබඳ තොරතුරු සඳහා කරුණාකර මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 21 හා 22 බලන්න.

පොලී අවදානම

රාජ්‍ය සුරැකුම්පත්, බැංකු තැන්පතු සහ ස්ථාවර හා සංචරණ පොලී සහිත ණය ගැනීම් හා සම්බන්ධ වෙළඳපොළ පොලී අනුපාතයේ වෙනස්කම් අධිකාරියේ පොලී අවදානමට හේතු වේ.

රු.8,971,662,529/= (2011 : රු.10,304,532,478/=) වන අධිකාරියේ පොලී සහිත ණය සහ ලබාගැනීම් වල පොලිය වල අනුපාතයට අනුව ගණනය කෙරෙන අතර අනෙකුත් මුදල වන රු.137,829,209,024/= (2011: 112,815,714,945/=)හි පොලිය ස්ථාවර අනුපාතයට අනුව ගණනය කරනු ලැබේ.

රාජ්‍ය බැංකු සහ රජය සමග ඇති තැන්පතු ඇතුළුව මුදල් හා බැංකු ශේෂයන් අධිකාරිය සතුව ඇත. අධිකාරිය විසින් ක්‍රියාකාරී ලෙස පොලී අනුපාත චලනයන් අධීක්ෂණය තුළින් පොලී අවපාත අවදානම අධීක්ෂණය කරනු ලබයි.

සංයුක්ත පාලනය යන්නෙන් අදහස් කෙරෙනුයේ ව්‍යාපාරයට සම්බන්ධ සියළුම පාර්ශවවල යහපත උදෙසා සම්පත් සාර්ථක ලෙස උපයෝගී කර ගනිමින් අදාළ ආයතනය සම්බන්ධ නිසි මාර්ගෝපදේශකත්වයකින් යුතුව පාලනය පවත්වා ගෙන යාම සඳහා එම ආයතනය විසින් පිහිටුවනු ලබන සමස්ථ යාන්ත්‍රණයයි. යහ පාලනයක් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් මූලික වගකීම අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. සංවිධානයේ මූලික අරමුණු ළඟා කරගනු වස් එහි ක්‍රියාවලියන් හා පාලන ක්‍රම නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වන බවට ඔවුන් සහතික විය යුතු අතර මේ සඳහා වෘත්තිමය නිළධාරීන් ඔවුන්ට අදාළ ක්‍රියාකාරී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වගකීම දැරීම තුළින් පහසුකම් සැලසිය යුතුය. මෙම කර්තව්‍ය තුළ අභ්‍යන්තර විගණක නිලධාරීන්ට ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂා කිරීමට හා අනුමත පිළිවෙත් තුළින් බැහැරවීමේ අවස්ථා ඇත්නම් ඒ පිළිබඳ වාර්තා කිරීම තුළින් වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට පැවරී ඇත. යම් බැහැරවීමක් වේ නම් විශේෂයෙන් මෙහෙයුම් හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් අපේක්ෂිත කාර්යය සාධනය ළඟාකර ගැනීම පිණිස ඒවා ප්‍රතිශෝධනය කළයුතු වන්නේ කෙසේ දැයි නිර්දේශ කෙරෙන අතර එමඟින් යහ පාලනය කෙරෙහි දායකත්වයයක් සපයයි.

මූල්‍යමය හා අනෙකුත් මෙහෙයුම් ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ උසස් මට්ටම හා නිරතුරුබව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන්ට භාරවූ කටයුතු කොතෙක් දුරට ඉටු කරයි ද යන්න වග, කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ හුවමාරු කරගනු ලබන තොරතුරු වල උසස් මට්ටම, විනිවිදභාවයකින් යුත් සංවිධානයක් කළමනාකරණය කිරීමෙහිලා ඔවුන්ගේ කැපවීම වටිනාකම උපරිමකර ගැනීම සඳහා වැදගත් අවශ්‍යතාවයක්ව ඇත. එහිලා උසස්ම මට්ටමේ සංයුක්ත පාලනයක් අඛණ්ඩව පවත්වා ගෙන යාමට අධිකාරිය කැප වී ඇත.

අධිකාරියේ පාලනය සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මනා පරිචයක් ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා නීතිරීති හා රෙගුලාසි, ව්‍යුහයන් හා ක්‍රියාදාමයන් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු අවධානයක් යොමු කිරීම අධිකාරිය විසින් අඛණ්ඩව සිදු කර ගෙන යනු ලැබේ. අධිකාරිය විසින් එහි පාලන කාර්යයන් පිළිබඳ ව්‍යුහයන් මනා අන්දමින් ප්‍රතිශෝධනයට ලක් කොට ඇත.

මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් අනුගමනය කර ඇති මනා සංයුක්ත පාලන මූලධර්ම පහත සඳහන් ශීර්ෂ යටතේ දක්වා ඇත.

- අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු
- අභ්‍යන්තර පාලන
- අභ්‍යන්තර විගණන
- විනය නීති
- මහා භාණ්ඩාගාරය සහ වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ සම්බන්ධතාවය
- ව්‍යවස්ථාපිත හා නෛතික අවශ්‍යතාවයන්ට අනුකූල වීම
- යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්

මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසායකත්ව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ මාලාවේ නිශ්චිතව හඳුනාගත් වගන්ති වලින් බැහැරව කටයුතු කිරීම සඳහා වරාය සහ මහාමාර්ග අමාත්‍යවරයා හා මුදල් හා සැළසුම් අමාත්‍යවරයා විසින් ඒකාබද්ධව සිදු කරන ලද නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීමට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය අනුගමනය කරමින් කර්මාන්තය තුළ උසස් මට්ටමකින් තරඟකාරී සහ ප්‍රායෝගික රාජ්‍ය ආයතනයක් බවට පත්වීම සහ අවශ්‍ය කරන නම්‍යශීලිත්වය සහ ස්වාධීනත්වය තහවුරු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පාලන ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, උපසභාපති හා අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මන්ඩලයේ සාමාජිකයින්, ඉහළම වෘත්තියමය සහ පෞද්ගලිකමය ආචාර විද්‍යාත්මක වටිනාකම් සහිතව අධිකාරිය ක්‍රියාත්මක වන කර්මාන්තයෙහි පළපුරුද්දක් ඇති අයවලුන් විය යුතුවේ.

වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ පහත ආකාරයටය;

- වරාය සංවර්ධනයෙහි හෝ වරාය මෙහෙයුම් කාර්යයන්හි හෝ නෛතික හෝ මූල්‍ය කටයුතු හෝ නාවික කටයුතු, වාණිජ හෝ ඉංජිනේරු කටයුතුවල හෝ පරිපාලනයෙහි හෝ කම්කරු සම්බන්ධතා කටයුතු සම්බන්ධ පළපුරුද්දක් සහිත සහ එම කටයුතුවල හැකියාව ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන්නේ නම් ඔවුන් අතරින් සභාපතිවරයා සහ තවත් අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.

- කළමනාකාර අධ්‍යක්ෂවරයා පනතේ 13.1 වගන්තිය ප්‍රකාරව ඇමතිවරයා විසින් පත්කරනු ලැබේ.

- මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්.

- රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ ධීවර කටයුතු විෂය පවරනු ලැබ ඇති ඇමතිවරයා භාරයේ පවතින අමාත්‍යාංශයේ එම ඇමතිවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්.

වරාය අධිකාරියේ සභාපතිවරයා හැරෙන්නට, (1) (අ) උපවගන්තිය හෝ (1) (ඇ) උප වගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂවරුන්ගෙන් කෙනෙකු වරාය අධිකාරියේ උප සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබීය හැක.

සභාපතිවරයා, උප සභාපතිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා සතු කාර්යභාරය පැහැදිලි ලෙස වෙන් කොට, අර්ථ නිරූපනය කර ඇත. විධායක නොවන සියළු අධ්‍යක්ෂවරු ඔවුන් සතු ගැඹුරු හසළ දැනුම් හා පළපුරුද්ද මත අධිකාරියට සේවය සලසයි. මෙම ප්‍රකාශයේ දිනට ධූරයන් දරමින් සිටි අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ඔවුන් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පිටු අංක 12 – 18 වල දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූලික කටයුතු සහ වගකීම් පහත දැක්වේ

- ක්‍රමෝපායගත පරමාර්ථ, ප්‍රතිපත්ති, අභිලාෂයන් හා ඉලක්ක ස්ථාපනය තුළින් විධානයන් නියම කිරීම

- අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම උදෙසා වූ කාර්යසාධනය අධීක්ෂණය කිරීම

- ප්‍රමාණවත් අභ්‍යන්තරික පාලනයක් සහ ඉහළම ආචාරධර්ම පද්ධතියක් පවත්වා ගන්නා බවට සහතික වීම.

- මාර්ගෝපදේශයන් සම්පාදනය කිරීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඒවායේ සාර්ථකත්වය පිළිබඳව සහතික වීම.

- සියළු ව්‍යාපාරික අවදානම් හඳුනාගෙන යෝග්‍ය හා ප්‍රමාණවත් පාලනයක් ඇති කිරීම, අවදානම් තත්ත්වයන් සම්බන්ධයෙන් කාලීනව අවශ්‍ය පියවර ගැනීම සඳහා එම තත්ත්වය වාර්තා කිරීමේ අධීක්ෂණ යාන්ත්‍රණය යථා පරිදි ක්‍රියාත්මක වන බවට සහතික වීම.

අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්වන අතර සමාලෝචිත වර්ෂය තුළ 14 වතාවක් රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කටයුතු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට කාලීනව කටයුතු කළහ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් සභාපති විමසා අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කරනු ලබන අතර එක් එක් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමට පෙර තොරතුරු පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සියළුම අධ්‍යක්ෂවරුන් වෙත යවනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කළ විෂයවලට අනෙකුත් කරුණු අතර මෙහෙයුම් හා මූල්‍ය ක්‍රියාකාරීත්ව දර්ශකයන් සමාලෝචනය කිරීම ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති හා යෝජනා සිය සීමාවන් තුළ අනුමත කිරීමත් ඇතුළත් විය.

ඉදිරිපත් වූ සියළුම නිර්දේශයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසන් අනුමැතියට යටත් වනසේ සමහර නිර්දේශයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම ප්‍රධාන වශයෙන් විගණන කමිටුව සහ කළමනාකරණ කමිටුව වැනි අනුකමිටු ගණනාවක් වෙත පවරා ඇත.

කළමනාකරණ කමිටුව

සභාපති, උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ සහ විධායක අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් හතර දෙනෙකු (04) සහ අනෙකුත් පූර්ණ කාලීන අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකු (07) මෙන්ම හාබර් මාස්ටර්වරයා ද මෙම කමිටුවේ සාමාජිකයින් වශයෙන් සේවය කළහ.

සාර්ථක වාණිජමය සංවිධානයක් වශයෙන් මෙන්ම සමාජමය වගකීමක් සහිත සංයුක්ත රාජ්‍ය ආයතනයක් ලෙස වරාය භාවිතා කරන්නන්ට වඩාත් දියුණු සේවයක් සලසමින් ඵලදායකත්වය නංවාලීමට මෙන්ම අනෙකුත් හවුල්කරුවන්ගේ යහපත සඳහා සම්පත් උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගෙන එදිනෙදා පරිපාලනය, කළමනාකරණය සහ මෙහෙයවීමේ කටයුතු පිළිබඳ තීරණවලට එළඹීමේදී කළමනාකරණ කමිටුව ඉහත විස්තර කරන ලද විවිධ පැතිකඩ සම්බන්ධව කටයුතු සලසා දෙන ලදී.

කළමනාකරණ කමිටුව එහි රැස්වීමවලදී සියළුම ප්‍රතිපත්තිමය කරුණු මෙන්ම තීරණ ක්‍රියාත්මක කිරීමට පූර්වයෙන් ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ එකඟත්වය සඳහා ඉදිරිපත් කිරීමට පෙරාතුව ද මනා ලෙස පරීක්ෂාවට භාජනය කරන ලදී. මෙම ක්‍රියාවලිය පවත්වා ගෙන යාමේදී ප්‍රමාදයන් වලකාලීම සඳහා කළමනාකරණ කමිටුව මසකට දෙවරක් රැස්වී තීරණවලට එළඹේ.

මෙම වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් දහයක් (07) ක් පවත්වා ඇත.

විගණන කමිටුව

විගණන කමිටුව සමන්විත වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා සහ තවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙනි. විගණන කමිටුව 2012.12.13 දින නැවත පත් කරන ලදී.

විගණන කමිටුව විසින් ප්‍රතිපත්ති හා අභ්‍යන්තර පාලන පිළිවෙත් විමර්ශණය කිරීමත්, අභ්‍යන්තර විගණකගේ වාර්තා හා රජයේ විගණන ලිපි පරීක්ෂා කිරීමෙන් ඒවා සම්බන්ධව නිර්දේශයන් කොටයාශ ප්‍රධානීන් විසින් පිළිපදිනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩලය හරහා පසු විපරම් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ මහ පෙන්වීම යටතේ මූල්‍යමය සහ මෙහෙයුම් සම්බන්ධ අවදානම් හඳුනා ගැනීමටත් මනා ලෙස නිර්වචනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් තුළින් එවැනි අවදානම් කළමනාකරණය කර ගැනීම සහතිකවනු වස් ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණයන් අධිකාරිය සතුවේ.

සේවකයන්ගේ සහ වරාය කටයුතු හා සම්බන්ධ අයගේ යහපත වෙනුවෙන් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට සහ සම්පත්වල ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස මූල්‍යමය සහ මෙහෙයුම් සම්බන්ධ පවත්නා ක්‍රමවේදයන් සහ පිළිවෙත් සවිමත් කිරීම උදෙසා නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම කමිටුවේ වගකීමයි.

අභ්‍යන්තර පාලනය

ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සංවිධානයක කාර්යක්ෂම කළමනාකරණයන් සඳහා අත්‍යාවශ්‍ය අංගයකි. අධිකාරියේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙම පාලන ක්‍රියාදාමයේ ක්‍රියාශීලිත්වය සමාලෝචනය කිරීම සම්බන්ධව සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සහ පිළිවෙත් සම්බන්ධයෙන් විස්තරාත්මක රිති මාලාවක් අධිකාරිය විසින් සකස් කරනු ලැබ ඇත. ඒවා නිරන්තරයෙන් සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබීය. ව්‍යාපාරික පරමාර්ථ ළඟා කර ගැනීමේදී ඇතිවන බාධක මඟින් උද්ගතවන අවදානම් තත්ත්වයන්ට මුහුණදීම සඳහා ක්‍රමවේදයක් සැලසුම්කර ඇත. වත්කම්වලට අනවසරයෙන් හිමිකම් කීම හෝ ඒවා බැහැරවීම වැලැක්වීම සඳහා මෙන්ම විධිමත් වාර්තා පවත්වා ගෙන යාමට උත්පාදනය වන්නා වූ තොරතුරු වල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකවීමක් මෙම කමිටුව සලසයි. අධිකාරියේ ස්ථාපිත ප්‍රතිපත්ති සහ මඟ පෙන්වීම තුළින් දක්ෂතාවය, අවංකභාවය, ආචාර්ය විද්‍යාත්මක සාරධර්ම සහ මනා පාරිසරික සන්නිවේදන වටපිටාවක් පවත්වා ගෙන යාම කෙරෙහි අධිකාරියේ ඇපකැපවීම තුළින් අභ්‍යන්තර පාලන පද්ධතිය සඳහා සහාය දක්වයි.

අභ්‍යන්තර විගණකයින්

සුදුසුකම් සහිත වරලත් ගණකාධිකාරිවරයෙකු අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ප්‍රධානියා වේ. මෙම කොට්ඨාශය ස්වාධීනව කටයුතු කරන අතර සෘජුවම සභාපතිතුමන්ට හා විගණන කමිටුවට වාර්තා කරයි.

මෙම කොට්ඨාශයට අදාළ විෂය පථය සකස් කරනුයේ සභාපති සහ විගණන කමිටුවේ උපදෙස් ප්‍රකාරවය. විෂය පථය අවශ්‍ය අවස්ථාවලදී අදාළ සංශෝධන සඳහා අඛණ්ඩව සමාලෝචනය කෙරේ. මූලික වශයෙන් සමස්ථ අභ්‍යන්තර පාලන පද්ධතිය අධීක්ෂණය කරනුයේ අභ්‍යන්තර විගණන කොට්ඨාසය මඟින් වන අතර විගණන කමිටුව අවශ්‍ය සහාය සලසයි. අභ්‍යන්තර විගණනය අභ්‍යන්තර පාලන පිළිවෙත්හි කාර්යක්ෂමතාවය හා ක්‍රියාශීලිභාවය පිළිබඳ පරමාර්ථගත දර්ශනයක් සපයන අතර අභ්‍යන්තර පාලන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමෙහිලා වූ කාර්ය සැලසුම් තක්සේරු කරයි.

විනය නීති

පිළිගත හැකි මට්ටමේ හැසිරීම් රටාවක් පවත්වා ගෙනයාම සඳහා මග පෙන්වනු පිණිස විනය නීති පනවා ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්, කොට්ඨාස ප්‍රධානීන් හා සේවකයින් විසින් සිය එදිනෙදා රාජකාරී කටයුතු ඉටු කිරීමේදීත්, තමන්ගේ ක්‍රියාකාරකම් අධිකාරියේ කීර්තිනාමයට හා ප්‍රතිරූපයට හානිකරවිය හැකි වන්නා වූ අවස්ථාවලදීත්, ඉහළම මට්ටමේ සදාචාරාත්මක හා අවංකභාවයකින් යුතුව කටයුතු කරනු ලැබීම අධිකාරිය අපේක්ෂා කරයි.

විනය නීතිවල මූලිකාංග

- සියළුම කටයුතු වලදී සාධාරණත්වය අවංකමකම හා අපක්ෂපාතීත්වය
- නීතිය පිළිබඳව දැන සිටීම හා එයට කීකරු වීම
- ඉටු කරනු ලබන සියළු කටයුතු වල රහස්‍යභාවය
- අධිකාරියට අහිතකර ලෙස බලපෑ හැකි හැසිරීමෙන් වැළකීම

රාමු පද්ධතිය අනුකූලවීම සහ ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලවීම

සියළුම නීතිමය සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවයන් අධිකාරිය පිළිගෙන ඇත. මෙම අරමුණු පෙරදැරි කොට ගෙන අධිකාරියේ සියළුම ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සඳහා මුදල් කොට්ඨාශය හා අභ්‍යන්තර විගණන කොට්ඨාශය සෑම පරිශ්‍රමයක්ම දරමින් සමගාමීව ක්‍රියාකරති.

එයට අමතරව අධිකාරියේ ව්‍යාපාරික කටයුතු සහ වෙනත් කාර්යයන් නීති සහ රෙගුලාසිවල අනුගමනය කරමින් සිදුවන බවට නීති කොට්ඨාසය සහතික වේ.

වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධතාවය

පැහැදිලි විධානයන් මගින් ක්‍රමෝපායගත පරමාර්ථයන් සාක්ෂාත් කර ගනුවස් සැලසුම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වන ගරු වරාය හා මහා මාර්ග අමාත්‍යවරයා සහ එහි ලේකම්වරයා සහ උපාය මාර්ග ව්‍යවසායකත්ව කළමනාකරණ ආයතනය (SEMA) සමඟ අධිකාරිය අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගෙන යයි. එයට අමතරව මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයට අවශ්‍ය වන පරිදි වසර 03 ක් සඳහා වන ව්‍යාපාරික සැලසුමක් සහ මූල්‍යමය වාර්තා සහ අනෙකුත් මෙහෙයුම් ක්‍රියාකාරීත්වයන් පිළිබඳ සම්පූර්ණ වාර්තා අධිකාරිය විසින් ත්‍රෛමාසික පදනමක් මත ඉදිරිපත් කරන ලදී.

අදාළ පාර්ශව සම්බන්ධ අනාවරණය කිරීම්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ ගණුදෙනු පවත්වා ගෙන යනු ලබන කුමන හෝ පාර්ශවයන් සමඟ පෞද්ගලික හිතවත්කමක් හෝ සම්බන්ධතාවයක් නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර සනාථ කර සිටී.

වගවීම

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අධිකාරියට අදාළ කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ ස්වරූපයක් පිළිබිඹු කරන බවත් එම වාර්තා පිළිගත් අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කර ඇති බවත් මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

අනාගතය

සංයුක්ත පාලනයක සැබෑ වටිනාකම රැඳී පවතින්නේ හොඳම ක්‍රම පද්ධති, ප්‍රතිපත්ති සහ මූලධර්ම මාලාවක් අන්ධානුකරණයෙන් අනුගමනය කිරීම තුළ නොවන බවත්, සියළුම හවුල්කරුවන්ගේ විශ්වාසය දිනා ගනිමින් බවත් අධිකාරිය විශ්වාස කරයි. මෙමඟින් සිය ව්‍යාපාරික කටයුතු විනිවිදභාවයෙන් යුක්තව ඉහළම විශ්වාසය හා සාධාරණත්වයෙන් ඉටු කිරීමෙන් ඔවුන් ද අපගේ ක්‍රමෝපායන්ට සහාය වනු ඇත.

වරාය සංඛ්‍යාලේඛන

කොළඹ වරාය

වරාය පරිමාණය

වරාය ප්‍රදේශය

ජල ප්‍රදේශය	හෙක්ටයාර් 184.6
නිරිත දිග දියකඩනයේ දිග ප්‍රමාණය	මීටර් 1570
වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය	මීටර් 810
ඊශාන දිග දියකඩනයේ දිග ප්‍රමාණය	මීටර් 330
බටහිර පිවිසුම	මීටර් 230 X 16
උතුර පිවිසුම	මීටර් 190 X 13

වැඩ කරන වේලාවන්

වසරේ සෑම දිනකම පැය 24 සේවා පදනම මත කොළඹ වරාය සේවයේ යෙදෙයි.

2012 වර්ෂයේදී මෙහෙයුම් කළ වර්ග අනුව නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය	
බහළුගත	86.8%
තොග කඩන	1.0%
වියළි තොග	4.4%
දියර තොග	7.8%

කොළඹ නව දකුණු වරාය

ජල ප්‍රදේශය	හෙක්ටයාර් 192.0
නිරිත දිග දියකඩනයේ දිග ප්‍රමාණය	මීටර් 5140
වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය	මීටර් 1550
ප්‍රධාන පිවිසුම	මීටර් 570 X 18

ගාල්ල වරාය

වරාය පරිමාණය

ජල ප්‍රදේශය	හෙක්ටයාර් 15.3593
පිවිසුම් දියත් මාර්ගය	මීටර් 140
ගොඩබිම් ප්‍රදේශය	හෙක්ටයාර් 16.414
අනුමැතිය ලත් ප්‍රවේශ මාර්ගයේ දිග	මීටර් 130
අනුමත ගැඹුර	මීටර් 7.3

වැඩ කරන වේලාවන්

මැයි දින දිවා කාලයේ පමණක් නාවුක කටයුතු නොකරනු ලබන අතර පැය 24 පදනම මත වසරේ සෑම දිනකම තම සේවාවන් පවත්වා ගෙන යයි.

අපගමන වේලාව

නැඟෙනහිර - බටහිර ප්‍රධාන මාර්ගය

නැංගුරම්ලෑමේ පහසුකම්

අද්දර නැංගුරම්පල සංඛ්‍යාව **05**

නැංගුරම්පළ	මුළු දිග (මීටර්)	අද්දර ගැඹුර (මීටර්)
ක්ලොසන්බර්ග් පාලම	420	8.9
නව පාලම	162	8.9
නව පාලම/හරස්	84	8.9

ගුදම් පහසුකම්

නම	සාමාන්‍ය උස (අඩි)	ප්‍රදේශය (වර්ග අඩි)	ධාරිතාවය (ඝන අඩි)	බහළු තැන්පත් කිරීමේ උස (අඩි)
අංක 01	23	13333	306667	10
අංක 02	23	40000	920000	10

ත්‍රිකුණාමලය වරාය

වරාය පරිමාණය

ජල ප්‍රදේශය	හෙක්ටයාර් 1630
පිවිසුම් දියත් මාර්ගය	මීටර් 500
ගොඩබිම් ප්‍රදේශය	හෙක්ටයාර් 2254

වැඩ කරන වේලාවන්

මැයි දින දිවා කාලයේ නාවුක කටයුතු නොකිරීම හැරුණු කොට ත්‍රිකුණාමලය වරාය වසරේ සෑම දිනකම පැය 24 පදනම මත තම සේවා පවත්වා ගෙන යයි.

නැංගුරම්ලෑමේ පහසුකම්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය නැංගුරම්පල

නැංගුරම්පල	මුළු දිග (මීටර්)	අද්දර ගැඹුර (මීටර්)
අෂ්රෆ් ජැටිය	250	12.5
පැති නැංගුරම්පළවල්	90 x 2	8.5
මඩකොව් ප්‍රදේශයේ පිහිටි ජැටිය	45	3.5
ටීටීඒ හි පිහිටි ජැටිය	190	2.0-4.0
සිලෝන් ජැටිය	50	2.5
නගර ජැටිය	50	2.5
වීඑස්ඕ ජැටිය	25	1.5
පරණ නගර ජැටිය	60	2.0

වෙනත් නැංගුරම්පළ

නැංගුරම්පල	මුළු දිග (මීටර්)	අද්දර ගැඹුර (මීටර්)
ප්‍රීමා ජැටිය (අභ්‍යන්තර)	122	5.9
ප්‍රීමා ජැටිය (බාහිර)	227	13
ප්‍රීමා ජැටිය (බහුකාර්ය)	179	10
ටෝකියෝ සිමෙන්ති ජැටිය	155	9.3
තෙල් ගොඩබෑමේ ජැටිය (ඛණිජ තෙල්)	200	9.75

ගුදම් පිළිබඳ විස්තර - ටීටීඒ

ගුදම	පරිමාණය (අඩි)	සාමාන්‍ය උස (අඩි)	ප්‍රදේශය (ව.අ.)	බහළු තැන්පත් කිරීමේ උස (අඩි)	ධාරිතාවය (ඝණ අඩි)
අංක **02** සහ **03**	90 X 70	15	6300	12	75600
අංක **04**	190 X 95	19	18050	14	252700
අංක **05** ඒ	150 X 110	25	16500	15	247500
අංක **05** බී	150 X 80	15	12000	12	144000
අංක **06**	300 X 110	20	24000	15	360000

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය - අදියර 1

වරාය පරිමාණය

වරාය ප්‍රදේශය

ද්‍රෝණි ප්‍රදේශය	හෙක්ටයාර් 55.5
බටහිර දිකඩනයේ දිග	මීටර් 988
නැගෙනහිර දියකඩනයේ දිග	මීටර් 312
ප්‍රවේශ ඇළ මාර්ගය	මීටර් 210 x16
හැරවුම් වක්‍රය	මීටර් 600

පාලම් දිග

සාමාන්‍ය නැව් බඩු පාලම	මීටර් 600
සේවා පාලම	මීටර් 105
තෙල් පාලම	මීටර් 610

ද්‍රෝණියේ ගැඹුර	මීටර් 17
නෞකා නිර්මාණය	ද.බ.ඩො. 100,000

1505 පෘතුගීසීන් විසින් නාවික කඳවුරක්/වරායක් වශයෙන් භාවිතයට ගැනීම ආරම්භ කිරීමෙන් පසුව කොළඹ අපරදිග රටවල දැන ගැනීමට ලක්විය.

1875 VII එඩ්වඩ් රජු විසින් දෙසැම්බර් 09 වන දින නිරිත දිග දියකඩනයට මුල් ගල තබනු ලැබීය.

1882 කොළඹ වරාය පරිපාලනය කිරීම සඳහා වරාය මණ්ඩලය පිහිටුවන ලදී.

1885 මීටර් 1285 ක් දිග නිරිත දිග දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1898 මීටර් 335 ක් දිග ඊසාන දිග දියකඩනයේ ඉදිකිරීම නිමකිරීම.

1899 වියළි තටාකයේ ඉදිකිරීම ආරම්භ කිරීම.

1906 මීටර් 814 ක් දිග අයිලන්ඩ් දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1906 වියළි තටාකයේ ඉදිකිරීම නිම කිරීම.

1909 වියළි තටාකය සඳහා මීටර් 250 ක් දිග ගයිඩ් පියරය (නියමු පාලම) ඉදිකර නිමකිරීම (පළමු වැනි ගැඹුරු දිය අද්දර නැංගුරම් පොළ).

1912 වත්මන් ජයබහළු පර්යන්තය පිහිටි ස්ථානයේ අහුරු ජැටි 18 ක් ඉදිකර නිමකිරීම.

1912 නිරිත දිග දිය කඩනයේ මීටර් 550 ක් දිග දිගුව ඉදිකර නිමකිරීම.

1913 වරාය සංවර්ධන හා නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා කොළඹ වරාය කොමිෂන් සභාව පිහිටුවන ලදී.

1922 ඛනිජ තෙල් මෙහෙයුම් පහසුකම් සැලසීමේ කාර්යය නිම කිරීම.

1950 මීටර් 9-11 දිය ගැඹුරක් සහිත අද්දර නැංගුරම්පළවල් පහළොවක් සහ මීටර් 7.5 ක දිය ගැඹුරක් සහිත වෙරළාසන්න යාත්‍රා නැංගුරම් පොළවල් දෙකක්ද, වර්ග මීටර 55,800 ක යාබද මාර්ගස්ථ බඩු ගබඩා සහ ගුදම් ඉඩකඩ ඉදි කිරීම ආරම්භ කිරීම.

1954 නිරිතදිග දිය කඩනයෙහි ඉදිකර නිමකළ අද්දර නැංගුරම්පළවල් II වැනි එළිසබෙත් මහ රැජිණ විසින් විවෘත කරනු ලැබීම සහ එය "එළිසබෙත් රැජින ජැටිය" යනුවෙන් නම් කිරීම. "ගොතික්" රාජකීය රුවල් යාත්‍රාව එළිසබෙත් රැජිණ ජැටියෙහි නැංගුරම් ලද පළමු යාත්‍රාව විය.

1956 අද්දර නැංගුම්පළවල් 17 ක්, මාර්ගස්ථ බඩු ගබඩා හා ගුදම් තනා නිම කිරීම.

1958 කොළඹ වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කරන ලද්දව වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය පිහිටුවන ලදී.

1964 ගාලු වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කරන ලදී.

1967 වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව පිහිටුවන ලදී.

1967 ත්‍රිකුණාමලය වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කරන ලදී.

1979 කොළඹ වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවන ලදී.

1980 කොළඹ වරාය සඳහා ප්‍රධාන සැලැස්ම ජපන් රජයේ සහයෝගය ඇතිව පිළියෙළ කරන ලදී.

1980 එළිසබෙත් රැජිණ ජැටියේ නව පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

1982 පළමු වැනි ග්‍රෑන්ට් දොඹකරය - ටැන්ගෝ 80 සේවය සඳහා යොදා ගැනීම.

1982 නව බහළු පර්යන්ත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ජපානයේ පෙන්ටා ඕෂන් වකචිකු ඒකාබද්ධ සමාගම සමඟ අත්සන් කිරීම.

1983 සම්පූර්ණ උපකරණ සහිත බහළු පර්යන්තයේ I වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

1984 සම්පූර්ණ උපකරණ සහිත බහළු පර්යන්තයේ II වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

1984 එළිසබෙත් රැජිණ ජැටියේ බහළු නැංගුරම්පොළෙහි "හිටාචි" ට්‍රාන්සර් දොඹකර හතරක් (04) සේවය සඳහා යොදා ගැනීම.

1985 ජයබහළු පර්යන්තයේ 1 වැනි අදියර විවෘත කිරීම.

1987 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය ආරම්භ කිරීම.

1987 ජයබහළු පර්යන්තයේ II වැනි අදියර විවෘත කිරීම.

1988 වෙරළෙන් ඔබ්බෙහි ඒක ලක්ෂිත බෝයා නැංගුරම්පළ පිහිටුවා සේවය සඳහා යොදා ගැනීම.

1994 නව වරාය ප්‍රවේශ මාර්ගය තනා නිම කිරීම.

1995 ජයබහළු පර්යන්තයේ III වැනි අදියර විවෘත කිරීම.

1996 ජයබහළු පර්යන්තයේ IV වැනි අදියර විවෘත කිරීම.

1998 සමඟි බහළු පර්යන්තය ආරම්භ කිරීම.

1998 අනුබද්ධිත වරාය සමුළුව.

1999 නැගෙනහිර වෙරළෙහි ඔලුවිල් ප්‍රදීපාගාරය සේවය සඳහා යොදා ගැනීම සහ ඔලුවිල් නාවික පුහුණු ආයතනය විවෘත කිරීම.

1999 රැජිණ බහළු පර්යන්තයේ දකුණු ආසියාතික පිවිසුම් පර්යන්ත සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

1999 ත්‍රිකුණාමලයේ අද්දර නැංගුරම්පළ ව්‍යාපෘතියක් ඉදිකිරීම ආරම්භ කිරීම.

2000 දකුණු කොළඹ වරාය ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කිරීම.

2000 ගාලු වරායේ නව නැංගුරම්පොළක් ආරම්භ කිරීම.

2000 පෑලියගොඩ බහළු නැව්බඩු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2000 කළාපීය වරායක් වශයෙන් ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අවසාන වාර්තාව ඉදිරිපත් කිරීම.

2000 උතුරු පියරය සංවර්ධනයෙහි II වැනි අදියර ආරම්භ කිරීම.

2000 තනි-නැවතුම් ලේඛණ කටයුතු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2001 ගාලු වරායේ නව ජැටිය ආරම්භ කිරීම.

2003 ඔලුවිල් වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ආරම්භ කිරීම.

2003 ඌන පැටවුම් බහළු (LCL), තොග-කඩන නැව්බඩු සඳහා ගණුදෙනුකාර සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2003 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමුද්‍රික කෞතුකාගාරය විවෘත කිරීම.

2003 සිවිල් වැඩ කටයුතු සම්පූර්ණ වීමත් සමඟම සමඟි බහළු පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 සමඟි බහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 25 වන සංවත්සරික උත්සවය පැවැත්වීම.

2004 මහා පරිමාණ සේවා අංශයේ ජාතික ඵළදායීතා සම්මානය ජයබහළු පර්යන්තය විසින් දිනා ගන්නා ලදී.

2004 කොළඹ වරායේ බහළු දසලක්ෂ 2 ක් (මිලියන 02 ක්) මෙහෙයවීම.

2005 ඔලුවිල්හි වරාය හා නිවාස යෝජනා ක්‍රමයෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

2005 මධ්‍යම පරිමාන සේවා අංශය යටතේ කුසලතා සහතිකයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය වෙත ජාතික ඵළදායීතා ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කරනු ලැබීම.

2006 කොළඹ වරාය සඳහා බහළු ආරක්ෂක උපනයනයන් සහ මෙගා පෝර්ට් උපනයනයන් හඳුන්වාදීම.

2006 කොළඹ දකුණු වරාය ඉදිකිරීම සඳහා උපස්ථම්භක වන යෝජිත කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

2006 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අදියර I සඳහා විස්තරාත්මක සැලසුම් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

2007 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම හා මුදල් ගිවිසුම අත්සන් කිරීම.

2008 ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ වීම.

2008 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වීම.

2008 හම්බන්තොට වරායෙහි නැව් තෙල් සැපයීමේ පහසුකම් සැලසීම සඳහාත් තෙල් ටැංකි සංකීර්ණය ඉදිකිරීම සඳහාත් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම.

2009 හම්බන්තොට වරායේ නැවතෙල් සැපයීමේ පහසුකම හා තෙල් ටැංකි ව්‍යාපෘතිය සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

2009 ජයබහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතිය "NAVIS" දක්වා වර්ධනය කිරීම.

2010 2010.08.15 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ ජල ද්‍රෝණියට මුහුදු ජලය පිරවීමේ උත්සවය.

2010 2010.11.18 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2010 ජයබහළු පර්යන්තයේ බහළු මිලියන 02 ක් මෙහෙයුම් කිරීම.

2010 කොළඹ වරායේ බහළු මිලියන 04 ක් මෙහෙයවීම.

2011 නව ග්‍රැන්ටි දොඹකර 06 ක් සහ හුවමාරු දොඹකර 30 ක් වරායට ළඟාවීම.

2011 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ පිහිටි තෙල් පර්යන්තයේ ධාරිතාවය වැඩිකිරීම.

2011 පර්යන්ත ට්‍රැක්ටර් 50 ක් වරායට ළඟාවීම.

2011 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ දකුණු බහළු පර්යන්තය සඳහා ගිවිසුම අත්සන් කිරීම.

2011 නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පස් පිඩැලි කැපීමේ උත්සවය.

2011 දකුණු බහළු පර්යන්තයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා පස් පිඩැලි කැපීමේ උත්සවය.

2012 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ රෝ - රෝ නෞකා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

2012 බිලුමැන්ඩල් තෙල් ටැංකි සංකීර්ණයේ සිට කොළඹ වරාය දක්වා වූ පවතින ඉතා අබලන් තත්ත්වයේ ඉන්ධන නළ මාර්ගය නැවත එලීම.

මූලාශ්‍ර සටහන්

2012.12.31 දින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

අචාර්ය ප්‍රියත් බී.වික්‍රම මහතා
සභාපති

ඉන්දික කරුණාජීව මහතා
උප සභාපති

කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා
කළමනාකාර අධ්‍යක්ෂ

වෛද්‍ය සංජය සේදර සෙනරත් මහතා
විධායක අධ්‍යක්ෂ

අනුර ජයවික්‍රම මහතා
අධ්‍යක්ෂ

එස්.ආර්.ආටිගල මහතා
අධ්‍යක්ෂ

ආචාර්ය දම්තා ද සොයිසා මහත්මිය
අධ්‍යක්ෂ

ජගත් පී විජේවීර මහතා
අධ්‍යක්ෂ

ඒෂන ද සිල්වා මහතා
අධ්‍යක්ෂ

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 14 ක් පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන කළමනාකරණ කමිටුවේ රැස්වීම් හතක් (07) 2012 වර්ෂය තුළ දී පැවැත්විණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙක් අනු කමිටුව වන විගණන කමිටුව 2012 වර්ෂය තුළදී රැස්වීම් හතරක් (04) පැවැත්වීය. අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුවේ සාමාජිකයින් ලෙස ක්‍රියා කලහ.

එස්.ආර්.ආටිගල මහතා
ජගත් පී විජේවීර මහතා

කොළඹ වරාය 2012 වසරේදී විස්සේ සම ඒකක 4,187,120ක් සහ ටොන් මිලියන 61.7ක සම්පූර්ණ ටොන් ප්‍රමාණයක් මෙහෙයවනු ලැබීය. එය 2012 වසරේ අගභාගයේදී අත්විඳින ලද දේශීය සහ ගෝලීය ආර්ථිකයේ පහළ වැටීම හේතුවෙන් සමස්ථ බහළු මෙහෙයුම් 1.8%කින් ද සමස්ථ මෙහෙයුම් ටොන් ප්‍රමාණය 0.6%කින් ද පහත වැටිණ.

බහළු විස්සේ සම ඒකක මිලියන 4.19ක් වූ සමස්ථ ධාරිතාවයෙන් විශාල කොටසකට දායකත්වය සපයමින් බහළු විස්සේ සම ඒකක මිලියන 2.32ක වාර්තාගත සමස්ථ ධාරිතාවයක් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය තනිව දායකත්වය සපයන ලදී. SAGT ආයතනයෙන් 4.7% සෘණ වර්ධනය හා සැසඳීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ධාරිතාවය 0.8%ක් වැඩිවිය.

- 2011 වර්ෂයේ දී විස්සේ සම ඒකක මිලියන 4.26ක් වූ කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය 2012 වර්ෂයේ දී විස්සේ සම ඒකක මිලියන 4.19ක් දක්වා පහත වැටිණ. (පහත වැටීම විස්සේ සම ඒකක 75,767 හෝ 1.8%)

- 2011 වර්ෂය සමඟ සංසන්දනය කරන විට 2012 වර්ෂයේදී කොළඹ වරායේ අභ්‍යන්තර බහළු මෙහෙයුම් ධාරිතාවය 2.5% කින් (විස්සේ සම ඒකක 26,631) පහත වැටී ඇත.
- 2011 වර්ෂය සමඟ සංසන්දනය කරන විට කොළඹ වරායේ ප්‍රතිනැව්ගත කිරීම් බහළු මෙහෙයුම් ධාරිතාවය 1.9% කින් පමණක් (විස්සේ සම ඒකක 59,061) පහත වැටී ඇත.
- කොළඹ වරායේ මෙහෙය වන ලද සමස්ථ ටොන් මෙහෙයුම් ප්‍රමාණය ටොන් මිලියන 62.0 සිට ටොන් මිලියන 61.7 (0.6%) දක්වා පහත වැටී ඇත.
- 2011 වර්ෂයේ ඒකක 90,824 සමඟ සංසන්දනය කරන විට 2012 වර්ෂයේ දී අභ්‍යන්තර මෝටර් රථ මෙහෙයුම් ධාරිතාවය ඒකක 45,397ක (50%) දක්වා පහත වැටී ඇත.
- 2011 වසරේදී මෙහෙය වූ වාහන ඒකක 993 හා සැසැඳීමේදී 2012 වර්ෂයේදී සමස්ථ ප්‍රති අපනයන මෝටර් රථ මෙහෙයුම් ධාරිතාවය මෝටර් රථ 4,521ක් එනම් 355.3%ක වර්ධනයක් වාර්තා කෙරිණ. එය 2012 වසරේදී මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායට වාහන මෙහෙයුම් මාරුකිරීම නිසා ඇති වූවකි.

2011 වර්ෂය හා සැසඳීමේදී 2012 වර්ෂයේදී කොළඹ වරාය වෙත පැමිණි නැව් සංඛ්‍යාව 4,124 සිට 3,870 (6.2%) දක්වා පහත වැටීමක් පිළිබිඹු කෙරේ. 2011 වර්ෂයේ දී බහළු රැගත් නෞකා ප්‍රමාණය 3,187 සිට 3,092 දක්වා (3.0%) අඩුවීමක් වාර්තා කොට ඇත.

ජයබහළු පර්යන්තය වෙත අමතර බහළු ධාරිතාවයක් ගෙන්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ වෙළඳ ක්‍රමෝපායන් අනුමත කළ අතර ප්‍රමුඛ පෙළේ නැව් සමාගමක් සමඟ පර්යන්ත සේවා ගිවිසුමක් ද අත්සන් තබන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ පර්යන්ත සේවා ගිවිසුම් වලට එළඹී ඇති නැව් සමාගම් ජයබහළු පර්යන්තයේ දැනට පවතින මෙහෙයුම් ධාරිතාවය සුළු වශයෙන් ඉහළ නැංවීමට විශාල දායකත්වයක් ලබාදෙන ලදී. 2012 වර්ෂය තුළදී අලුතෙන් ප්‍රධාන නැව් මාර්ග සේවාවන් 06ක් ජයබහළු පර්යන්තය වෙත ගෙන්වා ගැනීමට කටයුතු සලස්වා ගන්නා ලදී.

කළමණාකාරීත්වයේ ආක්‍රමණශීලී වෙළඳ ක්‍රමෝපායන්, මෙහෙයුම්, මානව සම්පත් හා පර්යන්ත කළමනාකරණ පද්ධතියේ අධිශ්‍රේණිකරණය ඉහත සඳහන් කරන ලද ජයග්‍රහණයන් සඳහා විශාල දායකත්වයක් ලබාදී ඇත. ජයබහළු පර්යන්තයේ/සමඟි බහළු පර්යන්තයේ මෙහෙයුම් පද්ධතිය වෙනුවට NAVIS SPARCS/EXPRESS ප්‍රතිස්ථාපනය කරන ලද අතර එය සමස්ථ පර්යන්ත මෙහෙයුම් ඒකාබද්ධ කිරීමටත්, සැළසුම් කිරීම් හා ප්‍රවේශ දොරටුව හා පාලම අතර බහළු සීඝ්‍රයෙන් එහා මෙහා ගෙන යාමටත්, මෙමඟින් බහළු සඳහා ගතවන කාලය සහ නෞකා හරවා යැවීමේ කාලය දෙගුණයකින් අඩුකර ගැනීමටත් උපකාර වී ඇත.

වත්මන් ආර්ථික වර්ධන වේගය අඩුවීම නෞකාවන්ට සේවා සැපයීම නතරවීම, අඩු ඉල්ලුම් හේතුවෙන් බහළු වෙළඳාමට ඉමහත් බලපෑමක් ඇති කරයි. අඩු නැව්බඩු ප්‍රවාහන ගාස්තු සහ නැව් තෙල් මිළ ඉහළයාම නිසා බහළු ප්‍රවාහන නෞකා සේවා බොහොමයක ලාභය අඩුවීමක් දක්නට ලැබේ. නෞකා සමාගම් තවදුරටත් ලබන පාඩුව මඟහරවා ගනු පිණිස හවුල්කරුවන් සමඟ නෞකා සේවාවන් මෙහෙයවීම ඇතුළුව විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරමින් සිටී.

2012 වර්ෂය අගභාගයේදී අත්විඳි ආර්ථික අවපාතය හේතුවෙන් ලෝකයේ ඉහළ පෙළේ වරායන් බොහොමයක් 2012 වර්ෂයේදී එක් අංකයක වර්ධන ධාරිතාවයක් වාර්තා කොට ඇත.

2012 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම රුපියල් මිලියන 38,097.8 ක් වූ අතර එය 2011 වර්ෂය හා සංසන්දනය කිරීමේදී 22.6% ක වර්ධනයකි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් ලාභය 2011 වසරේදී රුපියල් මිලියන 7,613.3 සිට 2012 වර්ෂය වන විට රුපියල් මිලියන 12,088.4 දක්වා වර්ධනය වී ඇති අතර එය 58.8%ක වර්ධනයකි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සියළු ගණුදෙනු පිළිබඳ ගිණුම් පොත් නිසියාකාරව පවත්වා ගෙන යනු ලබන බවටත්, පවතින තත්ත්වය හා වර්ෂයේ ලාභය/පාඩුව පිළිබඳ සත්‍ය හා සාධාරණ දසුනක් පෙන්නුම් කෙරෙන අයුරින් එහි මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන බවටත්, සහතික කිරීමේ වගකීම 1971 අංක 38 දරණ මුදල් පනතේ (12) හා (13.6) වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ගිණුම් පොත් නිසියාකාරව පවත්වා ගෙන යාමට අධිකාරිය මෙහෙයවීමත්, නිතිපතා වූ සිය රැස්වීම් වලදිත් විගණන කමිටුව හරහාත් මූල්‍ය වාර්තාකරණ පිළිවෙත පුණරීක්ෂණය කිරීමත් කරනු ලැබ ඇත.

මෙම වාර්තාවෙහි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී ස්ථාවර පදනමක් මත නිසි ගිණුම්කරන ප්‍රතිපත්ති අනුගමනය කිරීමටත්, සාධාරණ හා විචක්ෂණ තක්සේරු වලින් තහවුරු කිරීමටත්, අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිල්ල යොමු කොට ඇත.

අධිකාරියේ වත්කම් ආරක්ෂා කර ගැනීමටත්, වංචා හා වෙනත් අක්‍රමිකතා වලක්වා ගැනීම හා අනාවරණය කර ගැනීමත් උදෙසා තමන්ට සාධාරණව විවෘතව පවත්නා වූ පියවරයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාර කටයුතු ක්‍රමවත් අයුරින් පවත්වා ගෙනයාමටත්, එහි වත්කම් ආරක්ෂා කර ගැනීමටත්, වාර්තාවල නිවරදතාවය හා විශ්වාසනීයත්වය හැකිතාක් දුරට තහවුරු කිරීමටත් අවශ්‍ය වන්නාවූ අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා වෙනත් පාලනවලින් සමන්විත සාර්ථක හා පූර්ණ අභ්‍යන්තර පාලන ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාක්මක කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



කපිල ලියනගමගේ
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

සිය සුපරීක්ෂාකාරී වගකීම ඉටුකිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම විගණන කමිටුවේ වගකීම වේ. මෙය සපුරාලීම සඳහා වූ කමිටුවේ ප්‍රධාන වගකීම පහත දැක්වේ.

- ✦ ඵලදායී අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා සහතික වීම.
- ✦ මූල්‍ය ප්‍රකාශණ, මූල්‍ය වාර්තා සහ විගණන ක්‍රියාවලීන් හි නිරවද්‍යතාවය සමාලෝචනය සහ අධීක්ෂණය.
- ✦ ව්‍යවස්ථානුකූල සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වන බවට සහතිකවීම.
- ✦ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ පිරිවැය පාලනය සහතික කරනු වස් පද්ධති සමාලෝචනය.

මහා භාණ්ඩාගාර නියෝජිත/ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ විසින් විගණන කමිටුවේ ප්‍රධානත්වය දරනු ලබන අතර අධිකාරියට සිය පාලන අභිවෘද්ධිය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැදගත් ක්‍රියාකාරකම් කිහිපයක් කර ගෙන යනු ලැබීය.

වැදගත් ආරම්භක අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ගයක් 2012 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සහ විගණන වැඩ සටහන කමිටුව විසින් පිළිගනු ලැබූ අතර මාසික ප්‍රගතිවාර්තා ලබා ගැනීම තුළින් එහි ක්‍රියාකාරීත්වයේ ඵලදායීතාවය නිතිපතා සමාලෝචනයට ලක් කෙරිණ. විගණකාධිපතිවරයා විසින් 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වරාය අධිකාරියේ ගිණුම් පිළිබඳ කෙටුම්පත් වාර්තාව කළමනාකරණයෙන් ඒ සඳහා ලැබුණු ප්‍රතිචාර සමඟ සමාලෝචනය කරන ලදී. අධිකාරියේ ත්‍රෛමාසික මූල්‍ය වාර්තා සහ 2011 දෙසැම්බර් මාසයෙන් අවසන්වර්ෂය සඳහා මූල්‍ය වාර්තා ලැබුණු අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙසනිර්දේශ කෙරිණ. අභ්‍යන්තර පාලන පද්ධතීන් විගණන සමාලෝචනය සමඟ අඛණ්ඩව සමාලෝචනයට ලක් කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි පසු විපරම් ක්‍රියාකාරකම් සිදු කරන ලදී. කමිටු රැස්වීම්වලදී මතු කරන ලද ඇතැම් විශේෂ කරුණු විගණන කමිටුවේ නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන ලදී.

අවශ්‍ය පරීක්ෂාවන් සහ සමබරතාවයන් පවත්නා බව විගණන කමිටුවේ අදහස වන අතර අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා එමඟින් සාධාරණ සහතිකයක් සැපයෙන බව සහ විගණනය කරන ලද ගිණුම් සාවද්‍ය තොරතුරු වලින් තොර බව හෙළි කිරීම තුළින් මූල්‍ය තත්ත්වය පවත්වා ගෙන යන ලදී. වර්ෂය තුළදී පාලනයේ අභිවර්ධිය උදෙසා කමිටුව වැදගත් දායකත්වයක් සපයන ලද අතර අධිකාරියේ කටයුතු විනිවිදභාවයෙන් පවත්වා ගෙන යාමට උපකාරී විය.

එස්. ආර්. ආටිගල
සභාපති - විගණන කමිටුව

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අනුකූලතාවය දැක්වීමේ තත්ත්වය සවිස්තරාත්මකව පහත දැක්වේ.

සේවක අර්ථ සාධක අරමුදල - අධිකාරිය සහ සේවක දායකත්වය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ස්ථිර සේවකයින් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දායකත්වය වශයෙන් 15% මුදලක් ද සේවක දායකත්වය වෙනුවෙන් 10% ක මුදලක් ද අදාළ මාසයට පසුව එළඹෙන මාසයෙහි අවසාන දිනට ප්‍රථමයෙන් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වේ.

සේවකයින්ගෙන් අඩු කරනු ලැබූ සියළුම මුදල් සහ සේවකයින් සඳහා වූ අදාළ අධිකාරියේ දායක මුදල නියමිත දින හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

සේවා නියුක්තියන්ගේ භාර අරමුදල

අධිකාරියේ 3% දායක මුදල සෑම මසකම නියමිත දින හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ තිබේ.

උපයන විට ගෙවීම

උපයන විට ගෙවීමේ බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ තිබේ.

ආදායම් බදු

2006 අංක 10 දරණ දේශීය ආදායම් 13 වගන්තිය අනුව උපයනු ලබන ආදායමට අදාළ වූ ආදායම් බදු ගෙවීම බදු ගෙවිය යුතු ආදායමක් උපයා ඇති සෑම අවස්ථාවකදීම නියමිත දිනවලදී ත්‍රෛමාසිකව ගෙවනු ලැබ ඇත.

වාර්ෂික දත්ත වාර්තා

අධිකාරියේ ආදායම බදු සම්බන්ධයෙන් වාර්ෂික දත්ත වාර්තා 2012 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙත වාර්ෂිකව ගොණු කරවනු ලැබ ඇත. මෙම වාර්තා සෑම වර්ෂයකදීම නියමිත දිනය වූ නොවැම්බර් 30 දිනට ප්‍රථම සම්පූර්ණ කොට භාර දෙනු ලැබ තිබේ.

වාර්ෂික වාර්තාකරණය

එක් එක් වසර සඳහා වූ වාර්ෂික අයවැය, ගිණුම් සහ වාර්ෂික වාර්තා සෑම වසරකදීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා

	කොළඹ	ත්‍රිකුණාමලය	ගාල්ල	2012	2011
පැමිණි නැව් සංඛ්‍යාව					
නැවබඩු නෞකා	3,812	139	52	4,003	4,101
වෙනත් නෞකා	136	22	17	175	222
වෙනත් යාත්‍රා	629	62	62	753	830
	4,577	**223**	**131**	**4,931**	**5,153**
මෙහෙයුම් ධාරිතාවය					
බහළු ටී ආර් යූ ඒකක ප්‍රමාණය					
බහළු ටී ආර් යූ ඒකක ප්‍රමාණය (ශ්‍රී ල.ව.අ.)					
ප්‍රති නැවගත කිරීම්	1,584,985	-	-	1,584,985	1,583,195
අභ්‍යන්තරික	665,291	-	-	665,291	647,482
නැවත ගබඩා කිරීම	66,573	-	-	66,573	68,769
මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය	**2,316,849**	-	-	**2,316,849**	**2,299,446**
බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (එස් ඒ ජී ටී)					
ප්‍රති නැවගත කිරීම්	1,479,782	-	-	1,479,782	1,540,633
අභ්‍යන්තරික	354,964	-	-	354,964	399,404
නැවත ගබඩා කිරීම	35,525	-	-	35,525	23,404
මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය	**1,870,271**	-	-	**1,870,271**	**1,963,441**
බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (කොළඹ වරාය)					
ප්‍රති නැවගත කිරීම්	3,064,767	-	-	3,064,767	3,123,828
අභ්‍යන්තරික	1,020,255	-	-	1,020,255	1,046,886
නැවත ගබඩා කිරීම	102,098	-	-	102,098	92,173
මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය	**4,187,120**	-	-	**4,187,120**	**4,262,887**
සාම්ප්‍රදායික මෙ.ටො.	3,405,765	2,680,367	421,673	6,507,805	6,265,388
දුව මෙ.ටො.	4,838,852	178,960	-	5,017,812	4,678,404
	8,244,617	**2,859,327**	**421,673**	**11,525,617**	**10,943,792**
සම ඒකක (මෙ.ටො.) ශ්‍රී ලං.ව.අ.					
බහළුගත නැව් බඩු	28,702,088	-	-	28,702,088	28,112,186
සාම්ප්‍රදායික නැවබඩු	3,405,765	2,680,367	421,673	6,507,805	6,265,388
දුව	4,838,852	178,960	-	5,017,812	4,678,404
මුළු සම ඒකක මෙ.ටො.	**36,946,705**	**2,859,327**	**421,673**	**40,227,705**	**39,055,978**
සම ඒකක (මෙ.ටො.) (එස් ඒ ජී ටී)					
බහළුගත නැව් බඩු	24,802,379	-	-	24,802,379	25,996,790
සාම්ප්‍රදායික නැවබඩු	-	-	-	-	-
දුව	-	-	-	-	-
මුළු සම ඒකක මෙ.ටො.	**24,802,379**	-	-	**24,802,379**	**25,996,790**
සම ඒකක (මෙ.ටො.) - කොළඹ වරාය					
බහළුගත නැව් බඩු	53,504,467	-	-	53,504,467	54,108,976
සාම්ප්‍රදායික නැවබඩු	3,405,765	2,680,367	421,673	6,507,805	6,265,388
දුව	4,838,852	178,960	-	5,017,812	4,678,404
මුළු සම ඒකක මෙ.ටො.	**61,749,084**	**2,859,327**	**421,673**	**65,030,084**	**65,052,768**
මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (ශ්‍රී ලං.ව.අ.)					
බහළුගත නැව් බඩු	72,640,931	-	-	72,640,931	71,488,979
සාම්ප්‍රදායික නැවබඩු	9,350,435	2,052,968	332,192	11,735,595	14,951,142
වෙනත්	2,549,850	508,180	49,517	3,107,547	2,675,368
මුළු ටොන් ප්‍රමාණය	**84,541,216**	**2,561,148**	**381,709**	**87,484,073**	**89,115,489**
මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (එස් ඒ ජී ටී)					
බහළුගත නැව් බඩු	43,653,456	-	-	43,653,456	40,805,183
සාම්ප්‍රදායික නැවබඩු	-	-	-	-	-
වෙනත්	-	-	-		
මුළු ටොන් ප්‍රමාණය	**43,653,456**	-	-	**43,653,456**	**40,805,183**
මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (කොළඹ වරාය)					
බහළුගත නැව් බඩු	116,294,387	-	-	116,294,387	112,294,162
සාම්ප්‍රදායික නැවබඩු	9,350,435	2,052,968	332,192	11,735,595	14,951,142
වෙනත්	2,549,850	508,180	49,517	3,107,547	2,675,368
මුළු ටොන් ප්‍රමාණය	**128,194,672**	**2,561,148**	**381,709**	**131,137,529**	**129,920,672**
පිරිස්					
සේවක මණ්ඩලය	**9,373**	**436**	**391**	**10,200**	**10,982**

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.)

		සමූහය			ශ්‍රී ලං ව අ		
		2012	2011	2011 ජනවාරි 01	2012	2011	2011 ජනවාරි 01
	සටහන			දක්වා			දක්වා
වත්කම්							
ජංගම නොවන වත්කම්							
දේපළ, යන්ත්‍රෝපකරණ හා උපකරණ	**3**	200,447,957,466	194,703,452,120	172,118,016,815	200,219,840,824	194,463,219,630	171,873,191,648
අස්පෘෂ්‍ය වත්කම්	**4**	342,602,203	521,993,078	670,586,953	342,602,203	521,993,078	670,586,953
ආයෝජනය කරන ලද දේපළ	**5**	7,330,326,998	7,336,396,431	7,350,050,978	7,547,907,162	7,564,166,395	7,580,425,628
උප සමාගම් වල ආයෝජන	**6**	-	-	-	1,000,000	1,000,000	1,000,000
සහායක සමාගම් මත ආයෝජන	**7**	46,898,710	40,294,827	33,456,063	40,030	40,030	40,030
විකිණීම් සඳහා පවතින මූල්‍ය වත්කම් (AFS)	**9**	3,924,081,397	1,077,075,989	1,152,446,038	3,924,081,397	1,077,075,989	1,152,446,038
කල්පිරීම් සඳහා තබා ඇති ආයෝජන (HTM)	**10**	1,789,068,223	1,788,143,962	1,788,669,241	1,789,068,223	1,788,143,962	1,788,669,241
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් අයවිය යුතු මුදල	**12.2**	247,992,855	262,801,091	294,986,521	247,992,855	262,801,091	294,986,521
මුළු ජංගම නොවන වත්කම්		**214,128,927,851**	**205,730,157,497**	**183,408,212,609**	**214,072,532,694**	**205,678,440,174**	**183,361,346,058**
ජංගම වත්කම්							
වට්ටෝරු භාණ්ඩ	**11**	1,819,751,295	1,694,585,948	2,543,913,808	1,819,751,295	1,694,585,948	2,543,913,808
වෙළඳ හා අනෙකුත් ලැබීම්	**12**	2,272,036,153	2,170,217,220	2,234,081,706	2,221,885,683	2,233,168,020	2,260,963,180
තැන්පතු හා අත්තිකාරම්	**13**	18,587,195,596	950,579,064	4,313,898,308	18,587,009,193	950,579,064	4,313,898,308
පෙරගෙවුම් වියදම්		133,356,007	108,403,249	64,479,492	133,356,007	108,403,249	64,479,492
සේවක ණය	**14**	4,006,504,978	3,758,818,540	4,646,910,411	4,006,504,978	3,730,344,695	4,610,445,972
අනෙකුත් මූල්‍ය වත්කම්	**15**	7,975,269,179	7,669,593,112	6,566,931,408	7,975,269,179	7,669,593,112	6,566,931,408
මුදල් හා මුදල් සමාන දෑ	**16**	668,542,170	852,705,518	581,351,691	474,476,983	689,123,726	497,324,681
මුළු ජංගම වත්කම්		**35,462,655,378**	**17,204,902,651**	**20,951,566,825**	**35,218,253,318**	**17,075,797,814**	**20,857,956,849**
මුළු වත්කම්		**249,591,583,228**	**222,935,060,148**	**204,359,779,434**	**249,290,786,012**	**222,754,237,988**	**204,219,302,907**
ස්කන්ධ හා වගකීම්							
ස්කන්ධ							
යෙදවූ ප්‍රාග්ධනය	**17**	7,591,379,785	7,591,379,785	7,591,379,785	7,591,379,785	7,591,379,785	7,591,379,785
සංචිත ප්‍රාග්ධනය	**18**	712,038,233	712,038,233	112,538,233	712,038,233	712,038,233	112,538,233
අනෙකුත් සංචිත		1,125,903	1,125,903	1,125,903	1,125,903	1,125,903	1,125,903
ණය බේරුම් කිරීමේ සංචිතය	**19**	3,828,973,373	3,828,973,373	3,828,973,373	3,828,973,373	3,828,973,373	3,828,973,373
ප්‍රතිප්‍රමාණය	**20**	74,728,281,137	76,429,013,944	76,480,827,873	74,728,281,137	76,429,013,944	76,480,827,873
විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් සංචිතය		470,321,634	478,317,226	553,688,775	470,321,634	478,317,226	553,688,775
රඳවාගත් ඉපැයීම් (හර)		(9,400,383,155)	(13,736,508,238)	(13,035,598,749)	(9,679,831,524)	(13,934,304,565)	(13,168,157,819)
මුළු ස්කන්ධ එකතුව		**77,931,736,910**	**75,304,340,225**	**75,532,935,193**	**77,652,288,541**	**75,106,543,899**	**75,400,376,123**
ජංගම නොවන වගකීම්							
ණය ගැනීම් - ශ්‍රී ලංකා රජය	**21.1**	134,887,281,927	111,904,320,057	96,706,752,538	134,887,281,927	111,904,320,057	96,706,752,538
ණයගැනීම් - මූල්‍ය ආයතන	**22.1**	3,825,841,399	4,849,110,734	3,495,998,476	3,825,094,300	4,847,451,155	3,495,998,476
රාජ්‍ය දීමනා	**23**	2,364,704,279	1,870,543,774	1,354,415,581	2,364,704,279	1,870,543,774	1,354,415,581
විලම්බිත බදු වගකීම්	**24**	12,114,566,119	12,114,566,119	12,114,566,119	12,114,566,119	12,114,566,119	12,114,566,119
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**25**	2,804,986,927	2,437,427,131	2,820,788,881	2,802,613,916	2,435,399,469	2,818,381,427
ජංගම නොවන මුළු වගකීම්		**155,997,380,651**	**133,175,967,815**	**116,492,521,595**	**155,994,260,541**	**133,172,280,574**	**116,490,114,141**
ජංගම වගකීම්							
වෙළඳ හා අනෙකුත් ණයකරුවන්	**26**	1,161,128,806	715,813,160	583,665,568	1,161,128,806	733,071,211	580,652,317
ණයගැනීම් - ශ්‍රී ලංකා ජනරජය	**21.2**	6,477,929,305	4,932,194,888	4,959,207,490	6,477,929,305	4,932,194,888	4,959,207,490
ණයගැනීම් - මූල්‍ය ආයතන	**22.2**	1,611,478,501	1,436,884,294	-	1,610,566,021	1,436,281,824	-
ලැබූ තැන්පතු හා අත්තිකාරම්	**27**	3,306,704,386	5,423,092,876	4,861,849,739	3,306,704,386	5,437,087,857	4,873,029,870
ගෙවීමට ඇති ජංගම බදු	**28**	1,350,275,077	349,925,285	310,482,910	1,342,396,169	344,245,840	300,741,841
ප්‍රතිපාදන සහ උපචිත වියදම්	**29**	1,754,949,591	1,596,841,607	1,619,116,939	1,745,512,244	1,592,531,899	1,615,181,126
ජංගම වගකීම් එකතුව		**15,662,465,665**	**14,454,752,107**	**12,334,322,647**	**15,644,236,930**	**14,475,413,515**	**12,328,812,644**
ස්කන්ධ හා වගකීම් වල මුළු එකතුව		**249,591,583,228**	**222,935,060,148**	**204,359,779,434**	**249,290,786,012**	**222,754,237,988**	**204,219,302,907**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

ආචාර්ය ප්‍රියන් බී වික්‍රම	කපිතාන් නිහාල් කැප්පෙටිපොල	ගිරාණි වන්නිආරච්චි
සභාපති	කළමනාකාර අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ (මූල්‍ය)

දිනය : 2013 පෙබරවාරි 27

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් වාර්තාව

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

		සමූහය		ශ්‍රී ලං ව අ	
		2012	**2011**	**2012**	**2011**
සටහන					
ආදායම්	**30**	32,674,751,483	27,767,486,909	32,354,138,127	27,524,918,045
සෘජු වියදම්	**31**	(18,209,072,826)	(16,272,003,671)	(18,118,623,148)	(16,262,849,959)
දළ ලාභය		**14,465,678,657**	**11,495,483,238**	**14,235,514,979**	**11,262,068,086**
අනෙකුත් මෙහෙයුම් ආදායම්	**32**	4,660,252,192	2,802,363,672	4,765,730,141	2,851,902,146
පරිපාලන වියදම්	**33**	(13,095,542,164)	(13,243,973,609)	(13,033,990,368)	(13,117,379,788)
මෙහෙයුම් ලාභය		**6,030,388,685**	**1,053,873,301**	**5,967,254,753**	**996,590,444**
ශුද්ධ මූල්‍ය පිරිවැය	**34**	(735,348,806)	(732,382,693)	(755,817,779)	(739,720,468)
සමාගම් ලාභයේ කොටස්	**7.1**	7,378,463	7,876,342	-	-
බදු පෙර ලාභය		**5,302,418,342**	**329,366,950**	**5,211,436,974**	**256,869,976**
ආදායම් බදු වියදම	**35**	(1,134,676,066)	(206,994,530)	(1,125,346,740)	(199,734,813)
වර්ෂය සඳහා ලාභය		**4,167,742,277**	**122,372,420**	**4,086,090,234**	**57,135,163**
මව් සමාගමේ ව්‍යාපාර කොටස්කරුවන් සඳහා වන වෙන්කිරීම්		**4,167,742,277**	**122,372,420**	**4,086,090,234**	**57,135,163**
වෙනත් සවිස්තරාත්මක ආදායම					
වර්ෂයේ ලාභය		4,167,742,277	122,372,420	4,086,090,234	57,135,163
විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්හි වටිනාකම් වෙනස	**9.1**	(7,495,592)	(75,371,549)	(7,495,592)	(75,371,549)
ලැයිස්තුගත නොකරන ලද කොටස් මත හානිකරණයන් සඳහා ප්‍ර	**9.2**	(500,000)	-	(500,000)	-
වසරේ මුළු සවිස්තරාත්මක ආදායම		**4,159,746,685**	**47,000,871**	**4,078,094,642**	**(18,236,386)**
මව් සමාගමේ ස්කන්ධ කොටස් හිමියන් සඳහා වන වෙන් කිරීම්		**4,159,746,685**	**47,000,871**	**4,078,094,642**	**(18,236,386)**

පිටු අංක 109 සිට 148 දක්වා මූල්‍ය ප්‍රකාශනය සඳහා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනයේ වැදගත් අංගයක් වේ.

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.)

සමූහය	යෙදවූ ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිතය	අනෙකුත් සංචිත	ණය මුදාහැරීම් සංචිතය	ප්‍රතිප්‍රමාණ සංචිතය	විකිණීම් සඳහා සංචිත	රඳවාගත් ආදායම් (ණය සඳහා)	එකතුව
2011 ජනවාරි 01 දිනට ශේෂය (පෙර සඳහන් පරිදි)	7,591,379,785	13,651,567,507	1,125,903	3,828,973,373	76,480,827,873	-	(15,034,926,191)	86,518,948,250
ප්‍රථමවරට SLFRS මූල්‍ය රෙගුලාසි භාවිතයෙන් ඇතිවූ බලපෑම	-	(13,539,029,274)	-	-	-	553,688,775	1,999,327,442	(10,986,013,057)
2011 ජනවාරි 01 ශේෂය (යළි ප්‍රකාශිත)	**7,591,379,785**	**112,538,233**	**1,125,903**	**3,828,973,373**	**76,480,827,873**	**553,688,775**	**(13,035,598,749)**	**75,532,935,193**
වසරේ ලාභය	-	-	-	-	-	-	122,372,420	122,372,420
අනෙකුත් සවිස්තරාත්මක ආදායම්	-	-	-	-	-	(75,371,549)	-	(75,371,549)
සවිස්තරාත්මක ආදායම් එකතුව								**47,000,871**
JCT මඟින් ලබාගත් වත්කම් වල වටිනාකම්	-	599,500,000	-	-	-	-	-	599,500,000
පෙර වසරේ ගැළපුම්	-	-	-	-	-	-	(875,095,838)	(875,095,838)
විකුණුම් වත්කම් වල ගැළපුම්	-	-	-	-	(51,813,929)	-	51,813,929	-
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය	**7,591,379,785**	**712,038,233**	**1,125,903**	**3,828,973,373**	**76,429,013,944**	**478,317,226**	**(13,736,508,238)**	**75,304,340,227**
වසරේ ලාභය	-	-	-	-	-	-	4,167,742,277	4,167,742,276
අනෙකුත් සවිස්තරාත්මක ආදායම්	-	-	-	-	-	(7,995,592)	-	(7,995,592)
සවිස්තරාත්මක ආදායම් එකතුව								**4,159,746,685**
අතිරික්ත ප්‍රතිප්‍රමාණයේ ගැළපුම්	-	-	-	-	(1,532,350,000)	-	-	(1,532,350,000)
විකුණුම් වත්කම් වල ගැළපුම්	-	-	-	-	(168,382,807)	-	168,382,807	-
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය	**7,591,379,785**	**712,038,233**	**1,125,903**	**3,828,973,373**	**74,728,281,137**	**470,321,634**	**(9,400,383,155)**	**77,931,736,910**
ශ්‍රී ලංකා වරාය අධිකාරිය								
2011 ජනවාරි 01 දිනට ශේෂය (පෙර සඳහන් පරිදි)	**7,591,379,785**	**13,651,567,507**	**1,125,903**	**3,828,973,373**	**76,480,827,873**	**-**	**(15,167,380,908)**	**86,386,493,533**
ප්‍රථමවරට SLFRS මූල්‍ය රෙගුලාසි භාවිතයෙන් ඇතිවූ බලපෑම	**-**	(13,539,029,274)	**-**	**-**	**-**	553,688,775	1,999,223,090	(10,986,117,409)
2011 ජනවාරි 01 ශේෂය (යළි ප්‍රකාශිත)	**7,591,379,785**	**112,538,233**	**1,125,903**	**3,828,973,373**	**76,480,827,873**	**553,688,775**	**(13,168,157,819)**	**75,400,376,123**
වසරේ ලාභය	-	-	-	-	-	-	57,135,163	57,135,163
අනෙකුත් සවිස්තරාත්මක ආදායම්	-	-	-	-	-	(75,371,549)	-	(75,371,549)
සවිස්තරාත්මක ආදායම් එකතුව								**(18,236,386)**
JCT මඟින් ලබාගත් වත්කම් වල වටිනාකම්	-	599,500,000	-	-	-	-	-	599,500,000
පෙර වසරේ ගැළපුම්	-	-	-	-	-	-	(875,095,838)	(875,095,838)
විකුණුම් වත්කම් වල ගැළපුම්	-	-	-	-	(51,813,929)	-	51,813,929	-
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය								
	7,591,379,785	**712,038,233**	**1,125,903**	**3,828,973,373**	**76,429,013,944**	**478,317,226**	**(13,934,304,565)**	**75,106,543,899**
වසරේ ලාභය	-	-	-	-	-	-	4,086,090,234	4,086,090,234
අනෙකුත් සවිස්තරාත්මක ආදායම්	-	-	-	-	-	(7,995,592)	-	(7,995,592)
සවිස්තරාත්මක ආදායම් එකතුව								**4,078,094,642**
අතිරික්ත ප්‍රතිප්‍රමාණයේ ගැළපුම්	-	-	-	-	(1,532,350,000)	-	-	(1,532,350,000)
විකුණුම් වත්කම් වල ගැළපුම්	-	-	-	-	(168,382,807)	-	168,382,807	-
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය	**7,591,379,785**	**712,038,233**	**1,125,903**	**3,828,973,373**	**74,728,281,137**	**470,321,634**	**(9,679,831,524)**	**77,652,288,541**

පිටු අංක 109 සිට 148 දක්වා මූල්‍ය ප්‍රකාශනය සඳහා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනයේ වැදගත් අංගයක් වේ.

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත).

	සමූහය		ශ්‍රී ලං ව අ	
බදු වලට පෙර ලාභය	**2012**	**2011**	**2012**	**2011**
ගැලපීම් කරන ලද	**5,302,418,343**	**329,366,950**	**5,211,436,974**	**256,869,976**
ආශ්‍රිත සමාගම් වල ලාභයේ කොටස (ශුද්ධ ලාභාංශ)	6,603,883	6,838,764	-	-
පෙර වර්ෂයේ ගැලපීම්	-	(875,095,838)	-	(875,095,838)
ක්ෂයවීම්	5,199,900,508	4,236,416,337	5,196,724,975	4,233,381,983
අස්පෘෂ්‍ය වත්කම් වල ණය හිලව්	179,400,955	173,402,166	179,400,955	173,402,166
වසරේ පාරිතෝෂික ගාස්තු හා අනෙකුත් වියදම්	888,840,509	373,732,149	888,495,160	374,111,941
ලාභාංශ ආදායම	(852,175,057)	(752,649,018)	(859,082,637)	(754,686,596)
පොලී ආදායම්	(998,719,051)	(717,053,753)	(977,940,069)	(708,968,562)
පොලී වියදම්	1,734,067,858	1,449,436,446	1,733,757,848	1,448,689,030
ස්ථාවර වත්කම් විකිණුම් වල ලාභය	6,069,268	(8,727,600)	6,069,268	(8,727,600)
රාජ්‍ය දීමනා සඳහා ණය හිලව්	(39,874,475)	(17,382,213)	(39,874,475)	(17,382,213)
ශුද්ධ විදේශ විනිමය පාඩු	4,566,871,693	3,390,109,708	4,566,871,693	3,390,109,707
මෙහෙයුම් ලාභයට පෙර කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්	**15,993,404,433**	**7,588,394,098**	**15,905,859,691**	**7,511,703,995**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්				
වට්ටෝරුගත භාණ්ඩ	(125,165,347)	849,327,860	(125,165,347)	849,327,860
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	(272,523,388)	63,864,487	(147,864,131)	27,795,160
තැන්පතු සහ අත්තිකාරම්	(17,636,616,532)	3,363,319,243	(17,636,430,129)	3,363,319,243
පෙර ගෙවුම් වියදම්	(24,952,758)	(43,923,757)	(24,952,758)	(43,923,757)
සේවක ණය/වෙනත්	(247,686,438)	888,091,871	(276,160,284)	880,101,277
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු මුදල	14,808,236	32,185,430	14,808,236	32,185,430
වෙළඳ සහ අනෙකුත් ණයහිමියන්	445,315,646	132,147,592	428,057,595	152,418,894
තැන්පතු සහ අත්තිකාරම්	(2,116,388,490)	561,243,137	(2,130,383,471)	564,057,987
ප්‍රතිපාදන හා උපචිත වියදම්	158,107,984	(22,275,332)	152,980,345	(22,649,229)
මෙහෙයුම් මගින් ඉපැයූ මුදල	**(3,811,696,655)**	**13,412,374,629**	**(3,839,250,253)**	**13,314,336,860**
ගෙවූ පොලිය	(1,734,067,858)	(1,449,436,446)	(1,733,757,848)	(1,448,689,030)
ගෙවූ පාරිතෝෂික මුදල්	(521,280,713)	(757,093,899)	(521,280,713)	(757,093,899)
ගෙවූ බදු මුදල	(134,326,274)	(167,552,155)	(127,196,411)	(156,230,814)
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ ශුද්ධ මුදල	**(6,201,371,500)**	**11,038,292,128**	**(6,221,485,225)**	**10,952,323,117**
ආයෝජන කටයුතු වලින් ලැබූ මුදල් ප්‍රවාහය				
දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම්	(184,998,684)	(371,394,591)	(183,749,200)	(358,414,205)
ස්ථාවර වත්කම් විකුණුම් වලින් ලද උත්පාදන	7,655,636	9,376,735	7,655,636	9,376,735
කෙරෙමින් පවතින වැඩ සඳහා වන ප්‍රාග්ධනය	(10,544,731,368)	(25,413,403,693)	(10,544,731,368)	(25,413,403,693)
අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කරගැනීම	(10,080)	(24,808,292)	(10,080)	(24,808,292)
ලැබූ ලාභාංශ	852,949,637	753,686,596	859,082,637	754,686,596
පොලී ලැබීම්	997,794,791	717,579,032	977,015,808	709,493,841
අනෙකුත් මූල්‍ය වත්කම් වලින් ලැබූ ශුද්ධ උත්පාදන	(905,764,873)	(987,995,171)	(905,764,873)	(987,995,171)
විකුණුම් සඳහා වන මූල්‍ය වත්කම් වල ආයෝජන	(2,866,551,000)	(1,500)	(2,866,551,000)	(1,500)
ආයෝජන කටයුතු වලින් ලැබූ ශුද්ධ ලාභය	**(12,643,655,941)**	**(25,316,960,884)**	**(12,657,052,440)**	**(25,311,065,690)**
මූල්‍ය කටයුතු වල මුදල් ප්‍රවාහය				
ශ්‍රී ලංකා රජයෙන් ලබාගත් ණය	26,446,607,821	16,426,029,611	26,446,607,821	16,426,029,611
මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය	-	2,872,563,647	-	2,872,563,647
ශ්‍රී ලංකා රජයෙන් ලබාගත් ණය යළි පියවීම	(6,477,814,731)	(4,668,488,136)	(6,477,814,731)	(4,668,488,136)
මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය යළි පියවීම	(1,627,928,997)	(177,110,976)	(1,624,902,168)	(176,591,942)
ලබාගත් රාජ්‍ය දීමනා	320,000,000	97,028,437	320,000,000	97,028,437
මූල්‍ය කටයුතු වලින් ලැබූ ශුද්ධ මුදල්	**18,660,864,094**	**14,550,022,583**	**18,663,890,923**	**14,550,541,617**
මුදල් හා මුදල් සමක වල ශුද්ධ වෙනස්වීම	**(184,163,347)**	**271,353,827**	**(214,646,742)**	**191,799,044**
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමක	**852,705,518**	**581,351,691**	**689,123,726**	**497,324,681**
වසර අවසානයේදී මුදල් හා මුදල් සමක	**668,542,171**	**852,705,518**	**474,476,984**	**689,123,726**

පිටු අංක 109 සිට 148 දක්වා මූල්‍ය ප්‍රකාශනය සඳහා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනයේ වැදගත් අංගයක් වේ.

1. සංස්ථාපිත තොරතුරු

1.1 පොදු කරුණු

1984 අංක 07 හා අංක 35 දරණ පනත්වලින් සංශෝධිත 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මඟින් 1979 අගෝස්තු 01 වැනි දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවනු ලැබීය.

1.2 ප්‍රධාන කටයුතු මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

නැව් භාණ්ඩ වාහක කටයුතු (ස්ටෙවඩෝරු), නැව්ගත කිරීම හා ප්‍රතිනැව්ගත කිරීම, ගොඩබෑම හා ගුදම්ගත කිරීම, වාප්පු කටයුතු, යාත්‍රාවලින් යාත්‍රාවලට ද නියමු ගාස්තු සඳහා බංකර සහ ගබඩා අතර ද කිමිදුම් කටයුතු සඳහා යාත්‍රා බැඳ තැබීමට සහ මුහුදු යට නැව් අළුත්වැඩියා කටයුතු, ඊට ආනුශාංගික සේවාවන් සැපයීම සඳහා යාත්‍රාවලට ජලය, ඉන්ධන සහ විදුලිබලය සැපයීම.

1.3 මුදල් වර්ෂය

අධිකාරියේ මුදල් වර්ෂය දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වේ.

1.4 ලියාපදිංචි කාර්යාලය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, තැ.පෙ.595, චෛත්‍ය පාර, අංක: 19 දරණ ස්ථානයෙහි පිහිටා ඇත.

1.5 සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දින සේවක සංඛ්‍යාව 10,200 (2010 – 10,982)

1.6 නිකුත්කිරීමේ බලයලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ 2013.02.27 දිනැති යෝජනාවට අනුකූලව වරාය අධිකාරියේ 2012.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය ලබාදී ඇත.

2.0 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

2.1 පිළියෙල කිරීමේ පදනම

වරාය අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව පිළියෙල කරන ලදි. විකිණීම සඳහා ඇති මූල්‍යමය සම්පත් වල සාධාරණ වටිනාකම අනුව වෙනස් කරන ලද ඓතිහාසික පිරිවැය යටතේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් සකස් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූල වෙමින් මූල්‍යමය ප්‍රකාශන සකස් කිරීමේදී ඇතැම් විමර්ශනාත්මක ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍යය. මෙම ක්‍රියාවලියේදී සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කිරීමෙන් තම විනිශ්චයන් වෙත පැමිණීමට කළමනාකරණයට අවශ්‍ය වේ. උසස් මට්ටමේ විනිශ්චයක් හෝ සංකීර්ණයත්වයක් අවශ්‍යවන්නාවූ ක්ෂේත්‍ර මෙන්ම උපකල්පනයන් සහ ඇස්තමේන්තු ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය සඳහා වැදගත් වන බව 2.27 සටහනේ දක්වා ඇත.

2011.12.31 දින තෙක් ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිකරණ වලට අනුව 2011.12.31 දිනෙන් අවසන් වන වාර්තා කිරීමේ කාලසීමාව ඇතුළුව මීට කලින් කාලපරිච්ඡේද සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය තම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත. ඒකාබද්ධ කරන ලද මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 01 - ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රථම වරට අනුගමනය කිරීමට අදාළව පිළියෙල කරන ලද අධිකාරියේ ප්‍රථම SLFRS මූල්‍ය වාර්තා වේ. කලින් වාර්තා කළ මූල්‍යමය තත්ත්වයන්, මූල්‍යමය කාර්යසාධනය,ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ සමූහයේ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට මාරුකිරීමේ බලපෑම මූල්‍ය ප්‍රකාශනයේ 37 වන සටහනේ සඳහන් කර ඇත.

2.2 ගිණුම්කරණ ප්‍රමිතිවල වෙනස්වීම්

වෙනත් අන්දමකින් සඳහන් කර නොමැති අවස්ථාවලදී පහත දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති වල වෙනස්කම් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන වල කාලපරිච්ඡේදයන් වෙනුවෙන් දිගටම නොවෙනස්ව අනුගමනය කරන ලදි. එමෙන්ම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිකරණයට අනුව එම ක්‍රමයට පරිවර්තනය කිරීමේ දිනට පැවති මූල්‍යමය තත්ත්වය එහි ආරම්භය ලෙස සලකන ලදි.

ඉකුත් වර්ෂයේ ඉදිරිපත්කල සහ වර්ගීකරණය කරන ලද ඒකාබද්ධ මූල්‍යමය ප්‍රකාශනයන් වඩා හොඳින් ඉදිරිපත් කිරීමට සහ මෙම වර්ෂයේ ප්‍රකාශන වලට සරිලන අන්දමින් අවශ්‍ය අවස්ථා වලදී සංශෝධනය කරන ලදි.

2.3 ඒකාබද්ධ කිරීම

2.3.1 පරිපාලිත

පරිපාලිතයක් යනු සාමාන්‍යයෙන් කැමැත්ත හිමිකම්පෑමේ භාගයකට වඩා අයිතියක් ඇති කොටස් හිමිකාරිත්වය සමඟ සමූහය යටතේ පාලනය වන මූල්‍යමය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සහිත ඒකකයක් වේ. පරිපාලිතයක පාලනය සමූහයකට මාරුකිරීමේ දිනයේ සිට පරිපාලිතයක් සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ ලෙස සැළකේ. මෙම පාලනය අවසන් වන දින සිට එය ඒකාබද්ධ තත්ත්වයෙන් ඉවත් කෙරේ.

ව්‍යාපාර සංයෝජනය සඳහා සැළකීම පිණිස අත්පත් කරගැනිමේ ක්‍රමවේදය සමූහය විසින් භාවිතාකරනු ලැබේ. පරිපාලිතය සමන්විත වන්නේ මාරුකරන ලද වත්කම් වල සාධාරණ වටිනාකම සහ අනු ආයතන විසින් දරනු ලබන වගකීම් වලිනි. පරිපාලිතය සම්පුර්ණයෙන්ම අධිකාරියට අයිති බැවින් අනු ආයතනයේ පාලනයට යටත් නොවන කටයුතු සමූහය විසින් පිළිගනු නොලැබේ.

අන්තර් ඒකක ගණුදෙනු ශේෂයන් ඉතිරිවීම්, අන්තර් සමාගම් ගණුදෙනු වලදී සිදුවන ආදායම සහ වියදම ඉවත්කරනු ලැබේ. තවද වත්කම් වලදී පිළිගනු ලබන අන්තර් සමාගම් ගණුදෙනු වලදී ඇතිවන ලාභ සහ පාඩු ද ඉවත්කෙරේ. සමූහය විසින් භාවිතා කරනු ලබන ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිතාකිරීමේ අවශ්‍යතාවය අනුව පරිපාලිතයේ ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කර ඇත.

2.3.2 ආශ්‍රිතය

ආශ්‍රිතයක් යනු සමූහයේ සැළකිය යුතු බලපෑමක් ඇති ඒකකයක සාමාන්‍යයෙන් ජන්ද අයිතියෙන් 20%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක සෘජු හෝ සෘජු නොවන කොටස් හිමිකම සහිත පාලනයක් රහිත ඒකකයකි. ආශ්‍රිතයක ආයෝජනයක් ගිණුම්ගත කරනුයේ ස්කන්ධ ක්‍රමය භාවිතා කිරීමෙනි. සාධාරණත්ව ක්‍රමවේදය යටතේ ආයෝජනය ආරම්භයේදී පිරිවැයක්

ලෙස සලකන අතර පවරාගැනීමේ දිනයෙන් පසු ආයෝජනය භාරගනු ලබන්නාගේ ලාභය හෝ පාඩුවේ ආයෝජකයාගේ කොටසෙහි වැඩිවීමක් හෝ අඩුවීමක් පිළිගනු ලබයි. සමූහයේ පශ්චාත් පැවරුම් ලාභ හෝ පාඩු කොටස් සම්පූර්ණ ආදායම් වල පශ්චාත් පැවරුම් කොටස් වල මෙහෙයවීම් අනෙකුත් ආදායම් සම්බන්ධව පිළිගෙන ඇත. මෙය ආයෝජනයේ ඉදිරියට ගෙන යනු ලබන මුදලේ සාපේක්ෂව ගැළපීම් සහිතව සළකා බලනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයකම අවසාන දිනට ආශ්‍රිතයේ වත්කම් හානිකරණයන්ට ලක්වී ඇත් ද යන්න සළකා බැලිය යුතු වේ. මෙහිදී ආශ්‍රිතයේ වත්කම් වල ධාරණ අගය ඒවායේ යළි අයකර ගත හැකි අගය ඉක්මවා ඇත්නම් එය හානිකරණ අලාභ ලෙසට හඳුනාගත යුතු අතර එය ආශ්‍රිතයේ ලාභය/අලාභයට ගැළපිය යුතුය.

2.4 විදේශ මුදල් පරිවර්තනය

2.4.1 ක්‍රියාත්මක කරනු ලබන සහ ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

සමූහයේ එක් එක් ඒකකයන්ගේ මූල්‍යමය වාර්තා වල ඇතුලත් කර ඇති ගණුදෙනු සහ ශේෂයන් එම ඒකකය ක්‍රියාත්මක ව ප්‍රාථමික ආර්ථික කටයුතු වලට සම්බන්ධ මුදල් වර්ගය භාවිතා කරමින් ගණනය කරනු ලැබේ. ඒකාබද්ධ මුදල් ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමූහයේ ඉදිරිපත් කරන මුදල් වර්ගය වේ.

2.4.2 ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් වලින් සිදුකරනු ලබන ගණුදෙනු භාවිතයේ ඇති මුදල් වර්ගයට පරිවර්තනය කරන විට එසේ කරනු ලබන්නේ එම ගණුදෙනු සත්‍ය ලෙසම සිදු වූ දින පැවති විනිමය අනුපාතික අනුවය. එවැනි ගණුදෙනු නිරවුල් කිරීම් හා ගිණුම් වර්ෂ අවසාන දිනට මූල්‍ය වත්කම් හා වගකීම් පරිවර්තනය කිරීමෙන් පැන නඟින ලාභ/අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත යුතුය.

ක්‍රමක්ෂය පිරිවැයෙහි වෙනස්වීම් වලට අදාළව පරිවර්තන වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත යුතුය.

2.4.3 දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත හා උපකරණ මුල්වරට හඳුනාගත යුත්තේ පිරිවැයට වන අතර එහි පිරිවැය ලෙස වත්කම් වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමට දැරූ පිරිවැයන් හා සමුහයේ කළමනාකරණය අදහස් කරන පරිදි වත්කම් මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට දැරිය යුතු අනෙකුත් පිරිවැයන් ඇතුළත් විය යුතුය.

2011 දෙසැම්බර් 31ට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දේපල, පිරියත හා උපකරණ ඒවායේ ප්‍රත්‍යාගණන වටිනාකම් අනුව ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය දේපල,පිරියත සහ උපකරණ වල ප්‍රතිප්‍රමාණනය කරනු ලබන මුදලේ ප්‍රමාණය දේපල, පිරියත සහ උපකරණ වල වටිනාකම සාධාරණ වටිනාකමට සමාන වන අවස්ථාවලදී ප්‍රතිප්‍රමාණනය කරන දිනට සැලකි පිරිවැය ලෙස සලකන ලදී. අනෙකුත් දේපල,පිරියත සහ උපකරණ පසුව ගණනය කරන ලද්දේ එකතු වූ ක්ෂයවීම් සහ එකතු වූ හානි අඩුකළ පිරිවැයක් ලෙසිනි.

වත්කම් වල පවත්වාගෙන යනු ලබන වටිනාකමින් හෝ වත්කමක් ලෙස හඳුනාගත් අවස්ථාවලදී පවත්වාගෙන යනු ලබන මුදල් පසුකාලීන පිරිවැය වල අන්තර්ගත කොට ඇත.

මෙසේ සිදුකරනු ලබන්නේ යම්කරුණක් සඳහා අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට එකතුවීමේ හැකියාවක් ඇති අවස්ථාවල පමණි. අනෙකුත් සියළුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කටයුතු ඒවා සිදුවන මූල්‍යමය කාලපරිච්ඡේදයට අදාළ සම්පූර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

ඉඩම්වල වටිනාකම ක්ෂය නොකෙරේ. අනෙකුත් වටිනාකම් වල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ සරල මාර්ග ක්‍රමය භාවිතා කරමිනි. මෙසේ කරනු ලබන්නේ ඒවායේ පිරිවැය හෝ පිරිවැය ලෙස සැළකිය හැකි වටිනාකම් පහත දැක්වෙන පරිදි ඒවායේ ඇස්තමේන්තුගත ජීවන කාලය අනුව වේ.

වත්කම් කාණ්ඩය		ප්‍රමාණය
මෙහෙයුම් ගොඩනැඟිලි සහ ව්‍යුහයන්	වසර 5 - 50	2% - 20%
පාවෙන උපකරණ	වසර 2 - 15	6.7% - 50%
මෙහෙයුම් උපකරණ	වසර 2 - 20	5% - 50%
යන්ත්‍ර සහ උපකරණ	වසර 2 - 20	5% - 50%
කාර්යාල සහ සුභසාධක ගොඩනැඟිලි	වසර 2 - 75	1.3% - 50%
පරිගණක උපාංග	වසර 2 - 5	20% - 50%

වත්කම් වල ධාරණ අගය, ඒවායේ යළි අයකර ගත හැකි අගයට වඩා වැඩි නම් එම ධාරණ අගය යළි අයකර ගත හැකි අගය දක්වා කපාහැරිය යුතුයි.

2.4.4 අස්පෘශ්‍ය වත්කම්

ලබාගැනීමට වැය වන්නාවූ පිරිවැය සහ නිශ්චිත මෘදුකාංග සහ පද්ධතීන් මත පදනම් වූ ලබාගන්නා ලද පරිගණක මෘදුකාංග සහ මෙහෙයුම් පද්ධතීන් ප්‍රාග්ධන වත්කම් ලෙස සලකනු ලැබේ. එකතු වූ ණය මුදල් සහ එකතු වූ හානි අඩුකිරීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් වල වටිනාකම සඳහන් කර ඇත. පහත සඳහන් පරිදි ඒවායේ ඇස්තමේන්තුගත ජීවන කාලය අඩුකොට ණය හිලවු කිරීමෙන්පසු පිරිවැය සඳහන් කර ඇත.

පරිගණක මෘදුකාංග	වසර 2 – 5	20% - 50%

පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම පිරිවැය ආශ්‍රිතව සිදුවන අතර ඒවා වැයකළ මුදල් ලෙස පිළිගෙන ඇත.

2.4.5 ආයෝජන දේපල

කුලී මුදල් අයකර ගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ආයෝජන දේපල මූලික වශයෙන් එහි පිරිවැය අනුව ගණනය කෙරේ.

2011 දෙසැම්බර් 31 දිනට ප්‍රථම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව සකස්කරන ලද මුදල් ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රත්‍යාගණනය කරන ලද මිළ ගණන් වලට අනුකූලව ආයෝජන දේපල පවත්වාගෙන ගොස් ඇත. ආයෝජන දේපලවල විකුණුම් වටිනාකම පුළුල් වශයෙන් සාධාරණ වටිනාකමට සමාන වන බැවින් ආයෝජන දේපල වල අඩංගු මුදල් එසේ නැවත වටිනාකම් කළ දින සිට පැවති සැලකි පිරිවැය ලෙස අධිකාරිය විසින් සළකන ලදි. ඒ අනුවආයෝජන දේපල සඳහන් කර ඇත්තේ එකතුවූ ක්ෂයවීම් සහ එකතු වූ හානි අඩුකළ සැලකි පිරිවැයක් ලෙසිනි. අනෙකුත් දේපල,පිරියත සහ උපකරණ පසුව ගණනය කරන ලද්දේ සමුච්චිත ක්ෂයවීම් සහ එකතු වූ හානි අඩුකළ පිරිවැයක් ලෙසිනි.

ඉඩම්වල වටිනාකම ක්‍ෂය නොකෙරේ. අනෙකුත් වටිනාකම් වල ක්‍ෂයවීම් ගණනය කරනු ලබන්නේ සරල මාර්ග ක්‍රමය භාවිතා කරමිනි. මෙසේ කරනු ලබන්නේ ඒවායේ පිරිවැය හෝ පිරිවැය ලෙස සැළකිය හැකි වටිනාකම් පහත දැක්වෙන පරිදි ඒවායේ ඇස්තමේන්තුගත ජීවන කාලය අනුව වේ.

ආයෝජන දේපල	වසර 15 - 35	2.9% - 6.7%

2.4.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වාර්තා කිරීමට භාජනය වන එක් එක් කාල පරිච්ඡේදය අවසානයේදී සමූහය විසින් එහි දේපල,පිරියත සහ උපකරණ, ආයෝජන දේපල සහ අස්පෘශ්‍ය වත්කම් වල පවත්නා වටිනාකම සමාලෝචනය කරනු ලබන අතර එම වත්කම් හානිකරණය වී ඇති බවට යම් පෙන්නුම් කිරීමක් ඇත්දැයි නිගමනය කරනු ලැබේ. එසේ පෙන්නුම් කරන්නේ නම් එවැනි හානිකරණ වලින් සිදු වූ ප්‍රමාණය තීරණය කරගැනීම සඳහා වත්කම්වල යළි අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. යම් වත්කමක යළි අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කළ නොහැකි අවස්ථා වල, සමූහය විසින් මුදල් උපයන ඒකකය තීරණය කරනු ලබන අතර එම වත්කම අයත්වන්නා වූ මුදල් උපයන ඒකකයේ අයකරගත හැකි මුදල ඇස්තමේන්තුගත කරනු ලැබේ.

අයකරගත හැකි මුදල යනු යමක් විකිණීම සඳහා වැයවන පිරිවැය සහ භාවිතයේ යමක් විකිණීම සඳහා වැයවන පිරිවැය සහ භාවිතයේ වටිනාකම අඩු කල සාධාරණ වටිනාකමේ ඉහළ මට්ටම වේ. භාවිතයේ වටිනාකම තක්සේරු කිරීමේදී අනාගත මුදල් ලැබීම් වර්තමාන වටිනාකමට අඩුකළ මුදල අනුව බදු ගෙවීමට පෙර වට්ටම් ගාස්තු ක්‍රමය අනුගමනය කරමින් ඇස්තමේන්තු කරනු ලැබේ. මෙසේ කරනු ලබන්නේ දැනට පවත්නා මුදලේ කාලීන වටිනාකම සහ වත්කමට විශේෂිත වන්නා වූ අවදානම් තත්ත්වයන් සහිත වෙළඳපල තක්සේරු පිළිඹිබු වන අන්දමින් වට්ටම් අඩුකිරීමට පෙර පූර්වයෙන් පැවති බදු තත්ත්වය භාවිතා කරමිනි. මේ සඳහා අනාගතයේදී ඇතිවන මුදල් ප්‍රවාහය සමඟ ගැලපීම් කරනු නොලැබේ.

යම් වත්කමක අයකරගත හැකි මුදල (මුදල් උපයන ඒකකය) එහි පවත්නා වටිනාකමට වඩා අඩුවෙන් ඇස්තමේන්තු කර ඇත්නම් වත්කමේ පවත්වාගෙන යනු ලබන මුදල (මුදල් උපයන ඒකකය) අයකර ගත හැකි මුදල දක්වා අඩු කෙරේ. හානි වලින් ඇති වන්නාවූ පාඩුව සම්පූර්ණ ආදායම් ප්‍රකාශනයෙන් ඉතා ඉක්මනින් හඳුනාගත හැක.

2.5 මූල්‍ය වත්කම්

2.5.1 මූලික හඳුනාගැනීමේදීම සමූහය විසින් මූල්‍යමය වත්කම් වල වර්ගීකරණය තීරණය කරනු ලබන අතර සමූහය විසින් එහි මූල්‍යමය වත්කම් පහත සඳහන් පරිදි වර්ගීකරණය කර ඇත.

(අ) කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන
(ආ) ණය සහ ලැබිය යුතු දේ
(ඇ) විකිණීම සඳහා ඇති දේ

(අ) කල් පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජනයක් යනු ණය සහ ලැබිය යුතු දේවල් හැර ස්ථීර සහ තීරණය කලයුතු ගෙවීම් සහිත ප්‍රභවය නොලත්මූල්‍යමය වත්කම් වේ. කල්පිරෙන තෙක් තබාගන්නා අයෝජන යනුවෙන් වර්ගීකරණය කර ඇත්තේ එම ආයෝජන කල්පිරෙන තෙක් තබාගැනීමට සමූහයට අදහසක් හෝ හැකියාව ඇති

ආයෝජන වේ. ආයෝජනය කල්පිරෙන තෙක් නොපවතින්නේ නම් කල් පිරෙන තෙක් තබාගන්නා ආයෝජන ජංගම නොවන වත්කම් වල ඇතුළත් කර ඇත. කණ්ඩායම් විසින් මෙම ඛාණ්ඩය යටතේ සඳහන් කර ඇත්තේ දැනට දරනු ලබන ණයකරයන් ය.

(ආ) ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ යනු ස්ථීර සහ තීරණය කළ යුතු එමෙන්ම දැනට ක්‍රියාකාරී වෙළඳපලේ දක්වා නොමැති ප්‍රභවය නොලත් මූල්‍යමය වත්කම් වේ. වාර්තාකරණයට භාජනය වන කාලපරිච්ඡේදය අවසාන වී මාස 12ට වැඩි කාලයක් ගතවන්නා වූ කල් පිරෙන වත්කම් හැර ජංගම වත්කම් වල ඇතුළත් කර ඇති ණය සහ ලැබිය යුතු දේවල් ය. මේවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. සමූහයේ ණය සහ ලැබිය යුතු දේවල් සමන්විත වන්නේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ, යළි මිළට ගත් රජයේ සුරැකුම්පත්, ස්ථීර තැන්පතු පූර්ව ගෙවීම්, අත්තිකාරම්, තැන්පත් සේවක ණය සහ වාර්තාකරණයට භාජනය වන කාලපරිච්ඡේදය අවසානයේ පැවති මුදල් සහ මුදල් සමක වලිනි.

(ඇ) විකිණීම සඳහා ඇති දෙය

විකිණීම සඳහා ඇති මූල්‍යමය වත්කම් යනු මෙම ඛාණ්ඩය යටතේ නම්කර ඇති හෝ නම්කර නොමැති වෙනත් ඛාණ්ඩයක් යටතේ වර්ගීකරණය කර නොමැති ප්‍රභවය නොලත් මූල්‍යමය වත්කම් වේ. ආයෝජනය කල් පිරෙන එකක් නොවන්නේ නම් හෝ එය වාර්තාකරණයට භාජනය වන කාලපරිච්ඡේදයට අවසානයේ සිට මාස 12ක් තුළ කටයුතු අවසන් කිරීමට කළමනාකරණයට අදහසක් නොමැති ජංගම නොවන වත්කම් වල මේවා අන්තර්ගතකොට ඇත. විකිණීමට ඇති මූල්‍යමය වත්කම් සමන්විත වන්නේ ඉදිරිපත් කර ඇති ව්‍යාපාර වස්තු ආයෝජන සහ ඉදිරිපත් කර නොමැති ව්‍යාපාර වස්තු ආයෝජන වලිනි.

2.5.2 හඳුනාගැනීම හා මුල්වරට මැනීම

ණය සහ ලැබියයුතු දේවල් මූල්‍යමය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ සමූහය විසින් මෙම ගණුදෙනු ආරම්භ කරන ලද දින සිටය. අනෙකුත් මූල්‍යමය වත්කම් පිළිගනු ලබන්නේ සමූහය මුදල් ගිවිසුමේ ප්‍රතිපාදන අනුව කොන්ත්‍රාත්තුවේ පාර්ශ්වකරුවෙකු වූ වෙළඳ ගණුදෙනු දින සිටය.

මූල්‍යමය වත්කම් ප්‍රථමයෙන් ම ගණනය කරනු ලබන්නේ සාධාරණ වටිනාකම අනුව ය. ඊට අමතරව සාධාරණ වටිනාකම දක්වා නොමැති වත්කම් ඒවායේ ලාභ සහ පාඩු තුළින් ගණුදෙනු පිරිවැය සඳහා ඇති සෘජු සම්බන්ධතාවය අනුව ගණනය කෙරේ. මූල්‍යමය වත්කම් වලින් මුදල් ප්‍රවාහයක් ලැබීමට අයිතියක් නොමැතිවිට හෝ මාරුකර ඇති අවස්ථාවකදී මූල්‍යමය වත්කම් පිළිගනු නොලැබේ. එමෙන්ම මේ තත්ත්වය යටතේ සමූහය විසින් එහි හිමිකාරිත්වයේ සියළුම අවදානම සහ ප්‍රතිලාභ සෑහෙන අන්දමින් මූල්‍යමය වත්කම් වලට මාරුකරනු ලැබේ.

2.5.3 පසුව සිදුකෙරෙන ගණනය කිරීම්

(අ) කල් පිරෙන තෙක් තබාගන්නා ආයෝජන

කල් ඉකුත්වන තෙක් දරනු ලබන ආයෝජන වන්නේ හානි වලින් පාඩු වී තිබෙනම් ඒවා අඩුකොට ඵලදායී පොලී ක්‍රමයක් අනුගමනය කරමින් පසු කාලයේ

සිදුකෙරෙන ණය හිලවු පිරිවැය වේ. පවරාගැනීමේදී සහ ගණුදෙනු පිරිවැය වලදී සිදුවන වට්ටම් අඩුකිරීම හෝ වාරික සැළකිල්ලට ගෙන ණය හිලවු පිරිවැය ගණන් බලනු ලැබේ.

(ආ) ණය සහ ලැබිය යුතු දේ

මුළු පිළිගැනීමෙන් අනතුරුව ණය සහ ලැබිය යුතු දේ ගණනය කරනු ලබන්නේ ණය හිලවු පිරිවැය අනුව වන අතර එසේ කිරීමේදී හානි සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට ඵලදායී පොලී ක්‍රමයක් අනුගමනය කිරීමෙනි.

(ඇ) විකිණීම සඳහා ඇති දේ

මුල් පිළිගැනීමෙන් අනතුරුව විකිණීම සඳහා ඇති මූල්‍යමය වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති පොලී රහිත කොටස් ආයෝජනයන් ගණනය කරනු ලබන්නේ සාධාරණ වටිනාකම අනුවය. විකිණීම සඳහා ඇති මූල්‍යමය වත්කම් වල සාධාරණ වටිනාකමේ වෙනස්කම් පිළිගනු ලබන්නේ කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනයේ විකිණීම සඳහා වෙන්කොට ඉදිරිපත් කරන ලද අනෙකුත් සම්පූර්ණ ආදායම් වේ. සමූහයේ ක්‍රමෝපායික ආයෝජනයන් වන්නා වූ පොලී සහිත කොටස් ආයෝජන ගණනය කරනු ලබන්නේ හානි වලින් සිදු වූ පාඩුව අඩුකොට ඇතිවන පිරිවැය අනුවය. මෙසේ කරනු ලබන්නේ ඒවායේ සාධාරණ වටිනාකම විශ්වාසනීය අන්දමින් ඇස්තමේන්තු කළ නොහැකි බැවිනි.

2.5.4 මූල්‍ය වත්කම් හානිවීම

(අ) ණය හිලවු පිරිවැය ක්‍රමය අනුව ඉදිරියට ගෙනයනු ලබන වත්කම් යම් මූල්‍යමය වත්කමකට හානියක් සිදුවී තිබේනම් හානියක් සිදු වී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇති අවස්ථාවක වාර්තාකරණයට භාජනය වන්නා වූ කාලපරිච්ඡේදය අවසානයේදී සමූහය ඒ බවට තක්සේරු කරනු ලැබේ. වත්කමක මුල් පිළිගැනීමෙන් අනතුරුව යම් සිද්ධියක් හෝ සිද්ධි මාලාවක ප්‍රතිඵලයක් වශයෙන් හානියක් හෝ එමගින් පාඩු ඇතිවූ බවට විෂය මූල සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍යමය වත්කමකට හානි වී ඇති බව සලකනු ලැබේ. මෙහිදී පාඩුවක් ඇතිවූ සිද්ධියක් හෝ සිද්ධිමාලාවක් මූල්‍යමය වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් කෙරෙහි බලපෑමක් ඇතිවූ විට එය විශ්වාසනීය අන්දමින් ඇස්තමේන්තුකළහැකි විය යුතුය.

ණය සහ ලැබිය යුතු දේ මෙන්ම කල් ඉකුත්වන තෙක් දරනු ලබන ආයෝජන පවත්වාගෙන යනු ලබන්නේ ණයහිලවු පිරිවැය අනුව වන අතර පාඩුවේ ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ වත්කමෙහි පවත්වාගගෙන යනු ලබන මුදලෙහි සම ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස අනුව ය. (මීට අනාගතයේදී සිදුවන්නා වූ ණය හානි අන්තර්ගත නොවේ). එසේම ඉහත සඳහන් කරන ලද මූල්‍යමය වත්කම් ඵලදායික පොලී ක්‍රමයක් මත වට්ටම්ගත කළයුතු වේ. මූල්‍යමය වටිනාකමක පවත්වාගෙන යන මුදල අඩු කෙරෙන අතර සම්පූර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනයෙන් පාඩුව පිළිගනු ලබයි.

පසුකාලයකදී හානියෙන් ඇති වූ පාඩු අඩුවන්නේ නම් සහ එම පාඩු විෂය මූල තත්ත්වය අනුව හානිය සිදුවීමෙන් පසු ඇති වූ සිද්ධියකට සම්බන්ධ බවට පිළිගන්නේ නම් එවැනි අවස්ථාවක කලින් පිළිගන්නා ලද හානියෙන් වූ පාඩුව සම්පූර්ණ ආදායම් ප්‍රකාශනයෙන් පිළිගනු ලබයි.

(ආ) විකිණීම සඳහා ඇති දෙය

මූල්‍යමය වත්කම් වලට හානියක් සිදු වී ඇති බවට විෂය මූලික සාධක තිබේදැයි වාර්තාකරණයට භාජනය වන එක් එක් කාලසීමාව අවසානයේදී සමූහය විසින් තක්සේරු කරනු ලබයි. මිළ සඳහන් කළ කොටස් ආයෝජන සම්බන්ධව සාධාරණ වටිනාකමේ වැදගත් හෝ දිගු කලක් තිස්සේ එහි පිරිවැයට වඩා අඩු වත්කම් ප්‍රමාණයක් තිබීම ද වත්කමකට හානියක් සිදුවීමක් ලෙස සැළකීමේ සාධකයක් වේ. මෙහි සඳහන් කළ ආයෝජන සම්බන්ධව එවැනි සාධකයක් පවතින්නේ නම් ලාභ සහ පාඩු ගණන් බැලීමේදී මුලින් පිළිගත් හානි අඩුකොට පවරාගැනීමේ පිරිවැය සහ වර්තමාන සාධාරණ වටිනාකම අතර වෙනස වශයෙන් සළකනු ලැබූ එකතු යළි වර්ගීකරණය කිරීම ගැළපුම් කිරීමේදී ලාභ සහ පාඩු යළි වර්ගීකරණය කිරීම ලෙස පිළිගනු ලැබේ. මිළ කළ කොටස් පිළිබඳ ආයෝජන ගිවිසුමක ලාභ හෝ පාඩු වල හානියක් ඇතැයි පිළිගනු ලබන්නේ එම ගිවිසුමේ විකිණීම සඳහා ඇති දෙය වර්ගීකරණය උදෙසා ලාභ හෝ පාඩු තුළින් ප්‍රතිවර්ග කිරීමෙනි. මෙම ප්‍රතිවර්තනය කිරීමේ මුදල අනෙකුත් සම්පූර්ණ ආදායම පිළිබඳව පිළිගනු ලබයි.

මිළ සඳහන් නොකළ කොටස් ආයෝජන සම්බන්ධව සාධාරණ වටිනාකමේ වැදගත් හෝ දිගු කලක් තිස්සේ එහි පිරිවැයට වඩා අඩු වත්කම් ප්‍රමාණයක් තිබීම ද වත්කමට හානියක් සිදුවීමක් ලෙස සැළකීමේ සාධකයක් වේ. මෙවැනි සාධකයක් මිළ සඳහන් නොකළ ආයෝජන සඳහා පවතින්නේ නම් හානියෙන් වූ පාඩුව ගණනය කරනු ලබන්නේ මූල්‍යමය වත්කමේ පවත්නා මුදල සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් අතර වෙනස සළකා බැලීමේදීය. අනාගත මුදල් ප්‍රවාහයන් තුළ වර්තමාන වෙළඳපොළ ගාස්තුවේ වට්ටම් කරන ලද මුදල ඊට සමාන වූ මූල්‍යමය වත්කම් ලෙස සළකනු ලබයි. මෙසේ හානියෙන් ඇතිවූ හානි ප්‍රතිවර්ථනය කිරීමක් සිදුනොවේ.

2.6 තොග

තොග දක්වා ඇත්තේ පිරිවැය අනුවය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථම ලැබීම්, ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය පදනම් කරගෙනය. තොග භාණ්ඩ සමන්විත වන්නේ යාත්‍රා සහ නැව් බඩු මෙහෙයවීමේ උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස් සහ පරිභෝජන භාණ්ඩ වලින් මෙන්ම ඉන්ධන සහ ලිහිසි තෙල් වලිනි. වට්ටෝරු භාණ්ඩ පරිභෝජනය සඳහා මිස නැවත විකිණීම සඳහා අදාළ නොවේ.

2.7 වෙළඳ ණය ගැනියෝ

ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී ගණුදෙනුකරුවන්ට සළසන ලද සේවය වෙනුවෙන් ඔවුන්ගෙන් අයවිය යුතු මුදල්ය. ව්‍යාපාර මෙහෙයවීමේ සාමාන්‍ය චක්‍රය අනුව එකතුවීම් අපේක්ෂා කරන අතර ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මුලදී ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය ලෙස සළකා බැලීමේදී එහි සාධාරණ වටිනාකම පිළිගනු ලැබේ. එනම් ඉන්වොයිස් ගත මුදල සහ හානි සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට මුල් ඉන්වොයිස් මුදල ගණනය කරනු ලැබේ. මෙසේ කරනු ලබන්නේ එම මුදල් කෙටි කලකදී ලැබේ යැයි බලාපොරොත්තුවෙන් වන අතර එම මුදලේ කාලීන අගය මෙහිදී වැදගත් නොවේ.

ආපසු ලැබිය යුතු ප්‍රමාද වූ ගෙවීම් වල සංඛ්‍යාවේ උපරිම ණය කාල සීමාව දවස් 28ක් වේ. හානියක් වූ බවට යම් විෂය මූල සාධකයක් තිබේ නම් එවැනි අවස්ථාවකදී ලැබිය යුතු වෙළඳ දුව්‍ය වල හානියක් ඇති වූ බව සහ එවැනි හානි වලින් පාඩුවක් සිදු වූ ලෙස සළකනු ලැබේ. වැදගත් ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය තනිතනිව හානි සඳහා තක්සේරු කරනු ලැබේ. නොවැදගත් ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය සම්බන්ධව සාමුහික පදනම මත හානි තක්සේරු කරනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය සම්බන්ධව හානි තක්සේරු කිරීමේදී පහත සඳහන් ආකෘති සහ පදනම භාවිතා කෙරේ.

(අ) තනි තනි වශයෙන් ඇගයීම් කිරීමේ ආකෘතිය : හානියෙන් සිදු වූ පාඩුව ගණනය කිරීම සඳහා පහත සඳහන් ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය වර්ග තනි තනිව සමාලෝචනය කරනු ලැබේ.

		පදනම	
i	ශ්‍රී ලංකා හමුදාවන්	මාස 12 දක්වා	ප්‍රතිපාදන නොමැත
		මාස 12න් පසු	100%
ii	රජයේ ආයතන	මාස 12 දක්වා	ප්‍රතිපාදන නොමැත
		මාස 12න් පසු	100%
iii	නීති කටයුතු යටතේ ඇති නැව්	-	100%
iv	නැව් නියෝජිතයින් - තාවකාලිකව තහනම් කර ඇති සහ ක්‍රියාත්මක නොවන	-	100%
v	නැව් නියෝජිතයින් - සුවිශේෂී ගණුදෙනුකරුවන් - හානි සම්බන්ධව විෂය මූලික සාධක ඇත්නම් පමණක් 100%ක ප්‍රතිපාදන සළසා ඇත.		

(ආ) සාමූහික ඇගයීමේ ආකෘතිය : හානියෙන් සිදුවූ පාඩුව ගණනය කිරීම සඳහා පහත සඳහන් ලැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය වර්ග සාමූහිකව සමාලෝචනය කෙරේ.

		පදනම	
i	නැව් නියෝජිතයින් - සුවිශේෂී නොවන ගණුදෙනුකරුවන්	මාස 12 දක්වා	ප්‍රතිපාදන සළසා නොමැත
		මාස 12න් පසු	හානි සම්බන්ධව විෂය මූලික සාධක ඇත්නම් පමණක් 100%ක ප්‍රතිපාදන සළසා ඇත.

2.8 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහය සම්බන්ධ ඒකාබද්ධ ප්‍රකාශනයේ මුදල් සහ මුදල් සමක වලට අයත් වන්නේ අතේ ඇති මුදල්, බැංකු වල ඇති තැන්පතු, මූලික කාල සීමාව තෙමසක් හෝ ඊට අඩු කාලයක් සහිත කෙටි කාලීන ඉහළ මට්ටමේ ද්‍රවශීලතා ආයෝජනයන් ය.

2.9 ආයෝජිත ප්‍රාග්ධනය

ප්‍රාග්ධනය යනු කොළඹ වරාය කොමිසම, වරාය නැව් බඩු සංයුක්ත මණ්ඩලය, වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව සතුව තිබූ ශ්‍රී ලංකා වරාය අධිකාරියට මාරුකර පවරන ලද සියළු දේපළ වලට අදාළ අරමුදල් වල ඇති මුදල්, සියළුම ණය, වගකීම් සහ බැඳීම් ඇතුළුව වංචල සහ නිශ්චල දේපළ වේ.

2.10 මූල්‍යමය වගකීම්

සමූහය විසින් මූල්‍යමය වගකීම් වෙනත් මූල්‍යමය වගකීම් යටතේ වර්ග කර ඇත. සමූහයේ අනෙකුත් මූල්‍යමය වගකීම් වලට අන්තර්ගත වන්නේ ණයට ලබාගත් දේවල්,වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේවල්ය. අනෙකුත් මූල්‍යමය වගකීම් මූලික අවස්ථාවලදී පිළිගනු ලබන්නේ සාධාරණ වටිනාකම සහ පිරිවැය ගණුදෙනු වලට සෘජුවම අදාළ දේවල්ය. මූලිකව හඳුනාගන්නා ලද කරුණු වලට පසුව සිදුවන තත්ත්වයන් මත මෙම මූල්‍යමය වගකීම් ගණනය කරනු ලබන්නේ ක්‍රියාත්මකව පවතින පොලී ක්‍රමය භාවිතා කරමින් මෙම ණය මුදල් යම්කිසි කාලයක් තුළ නිරවුල් කිරීමය. කොන්ත්‍රාත්තුගත බැඳීම් නිදහස් කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට සමූහය විසින් මූල්‍යමය වගකීමක් පිළිගනු නොලැබේ.

2.11 වෙළඳ සහ ගෙවිය යුතු අනෙකුත් දේවල්

වෙළඳ සහ ගෙවිය යුතු අනෙකුත් දේවල් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා ලද භාණ්ඩ සහ සේවා සම්බන්ධ ගෙවීම් නැවත ගෙවීමයි. ව්‍යාපාරයක සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක මෙන් වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේවල් ජංගම වගකීම් ලෙස වර්ග කර ඇත.

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේවල් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ මිළ අනුව වේ. එනම් ගණුදෙනු වල සහ මුල් ඉන්වොයිසියේ අදාළ මුදල පසුකාලයේදී ගණනය කිරීම් වේ. මෙම මුදල කෙටි කාලයකදී ගෙවීම අපේක්ෂා කරන අතර මුදලේ කාලීන වටිනාකම මෙහිදී වැදගත් නොවේ.

2.12 ණය ලබාගැනීම්

සමූහයේ ණයට ලබාගත් දේවල් අන්තර්ගත වන්නේ ශ්‍රී ලංකා රජය සහ මූල්‍යමය ආයතන වලින් ලබාගන්නා ලද වරාය සංවර්ධන ණය මුදල්ය. ණයට ලබාගත් දේවල් මුල් අවස්ථාවේ පිළිගනු ලබන්නේ සාධාරණ මිළ අනුව වන අතර වැයකර ඇති ගණුදෙනු වල පිරිවැය එහි ශුද්ධ ප්‍රතිඵලයයි.ණයට ගත් දේවල් පසු කාලයේදී ඉදිරියට ගෙනයනු ලබන්නේ ක්‍රියාත්මක වන පොලී ක්‍රමය භාවිතා කරමින් ණය මුදල ක්‍රමානුකූලව නිරවුල් කිරීමෙනි. පාවෙන ගාස්තුව අනුව ලබාගත් ණය මුදල් ගණනය කරනු ලබන්නේ වාර්තාකරණයට භාජනය වන කාල පරිච්ඡේදය අවසානයේදී ක්‍රියාත්මකව පවත්නා පොලී අනුපාතය එනම් පාවෙන පොලී ගාස්තුව භාවිතා කරමින් ණය මුදල යම්කිසි කාල පරිච්ඡේදයක් තුළ ගෙවා නිමකිරීමෙනි.

ණය මුදල් ගැනීමේ පහසුකම් ආරම්භ කිරීමේදී පැවති ණය මුදල පිළියෙළ කිරීමේ ගාස්තුව, ව්‍යුහාත්මක ගාස්තුව සැකසීමේ ගාස්තුව සහ කළමනාකරණ ගාස්තුව පිළිගනු ලබන්නේ ණය මුදල ලබාගැනීමේ පිරිවැය ගාස්තු ලෙසය.

වාර්තාකරණයට භාජනය කරන ලද කාලසීමාව අවසානයේ ණය මුදල නියමිත කාලයක් තුළ ගෙවීම සඳහා වැය වන පිරිවැය ඉදිරියට ගෙනයාම ගණනය කරනු ලබන්නේ ගණුදෙනු වලින් මතුවන විදේශ විනිමය ලාභ සහ පාඩු මතය. මේවා සම්පූර්ණ ආදායම් ප්‍රකාශන වල පිළිගෙන තිබේ.

2.13 ණය ලබාගැනීමේ පිරිවැය

ණයට ලබාගැනීමේ පිරිවැය සෘජුවම සම්බන්ධ වන්නේ පවරාගැනීම සහ වටිනා වත්කම් වල ඉදිකිරීම් වෙනුවෙනි. මෙම වත්කම් ඒවා බලාපොරොත්තු වූ කර්තව්‍යට යෙදීම සඳහා

සෑහෙන කාලයක් ගතවේ. මේවා එම වත්කම් වල පිරිවැයට එකතු කරනු ලබන අතර එම වත්කම් ඒවා භාවිතාකිරීමට අදහස් කරන කටයුතු සඳහා සෑහෙන අන්දමකින් ප්‍රයෝජන ගැනීමට කාලයක් ගතවේ.

අනෙකුත් සියළුම මිළට ගැනීමේ පිරිවැය පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙන් පිළිගනු ලබන අතර මේවා වැය වූ කාලය සඳහා ගණන් බලනු ලැබේ.

2.14 රජයේ ප්‍රදාන

මුදල්මය නොවන ආධාර දීමනා ඇතුළුව රජයේ ආධාර සාධාරණ වටිනාකම අනුව පිළිගනු ලබන අතර එසේ කරනු ලබන්නේ එම ආධාර ලබාගැනීමෙන් පසු කණ්ඩායම් විසින් අදාළ කොන්දේසි අනුගමනය කරනු ලබන බවට සාධාරණ සහතිකයක් තිබෙන අවස්ථාවක ය.

පිරිවැයට අදාළ රජයේ ආධාර දීමනා විලම්භනය කරනු ලබන අතර පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙන් පිළිගනු ලැබේ. මෙය වන්දි ගෙවීම් සඳහා අදහස් කරන පිරිවැයට සරිලන පරිදි අවශ්‍ය කාලයේදී සළකා බලනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ වලට අදාළ රජයේ ආධාර දීමනා රජය විසින් කල් තබන ලද ආධාරදීමනා ලෙස ජංගම නොවන බැරකම් වල ඇතුළත් කරනු ලැබේ. මේවා පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලබන්නේ එම ආදායම් වත්කම් වල අපේක්ෂිත ජීවන කාලය පදනම් කරගෙන සෘජු රේඛාවක් ලෙසිනි.

මූල්‍යමය නොවන ආධාර දීමනා මුල්‍යමය නොවන වත්කම් වල සාධාරණ මිළ අනුව ගණනය කරනු ලබන අතර දීමනා සහ වත්කම් වල සාධාරණ වටිනාකම ගිණුම්ගත කෙරේ.

2.15 ජංගම සහ විලම්භීත බදු

අදාළ කාල පරිච්ඡේදය සඳහා බදු සඳහා වැය වන මුදල සංයුක්ත වන්නේ ජංගම සහ විලම්භීත බදු වලිනි. වෙනත් සම්පූර්ණ ආදායම් වල පිළිගනු ලබන කරුණු වලට අදාළ ප්‍රමාණයට හැරෙන්නට පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයේ බදු පිළිගනු ලැබේ. මෙම අවස්ථාවේදී වෙනත් සම්පූර්ණ ආදායම පිළිගැනීමේදී බදු ද පිළිගනු ලැබේ.

දැනට බලපැවැත්වෙන ආදායම් බදු ගාස්තු වාර්තාකරණයට කාල පරිච්ඡේදයේ අවසානය සඳහා වූ බදු නීතිය පදනම්කොට ගෙන ගණන් බලනු ලැබේ. එහිදි ක්‍රියාත්මක වන්නා වූ අධිකාරිය ආශ්‍රිත ආයතන සහ උපදවන්නා වූ බදු අයකළ යුතු ආදායම සළකා බලනු ලැබේ. බදු අධිකාරීන්ට ගෙවීමට අපේක්ෂිත මුදල් උචිත පරිදි ගෙවීමට කළමනාකරණය විසින් ප්‍රතිපාදන සකස් කරනු ලැබේ.

වත්කම් සහ වගකීම් වල බදු පදනම සහ ඒවා මූල්‍යමය ප්‍රකාශන වල ඉදිරියට ගෙනයාමේ වෙනසින් මතුවන්නා වූ තාවකාලික විචල්‍යතාවයන් මත විලම්භීත බදු පිළිගනු ලැබේ. වත්කමක හෝ බැරකමක මූලික පිළිගැනීමකින් මතුවන අවස්ථා වලදී විලම්භීත බදු ගණනය කරනු නොලැබේ. තවද ගණුදෙනුව සිදුවන අවස්ථාවේ ව්‍යාපාරික සම්බන්ධතා හැරෙන්නට වෙනත් ගණුදෙනුවක් ගණනය කිරීම හෝ ගෙවිය යුතු බදු හෝ පාඩු ගණනය කිරීම අදාළ කොටගෙනය. වාර්තාකරණයට භාජනය වන කාල පරිච්ඡේදය අවසානයේදී නීතිගත කරන ලද බදු ප්‍රමාණයන් භාවිතා කරමින් විලම්භීත බදු නිගමනය කරනු ලැබේ. මෙසේ භාවිතා කිරීම අපේක්ෂා කරනු ලබන්නේ අදාළ විලම්භීත බදු පිළිගත් විට හෝ විලම්භීත ආදායම් බදු වගකීම් අවසන් කිරීමෙන් පසුවය.

අනාගත බදු වලින් ලැබෙන ලාභය තාවකාලික වෙනස්වීම් වලට බලපාන ලෙස පවත්නා විට විලම්භීත බදු වත්කම් පිළිගැනීම සිදුවනු ලැබේ.

නීතිමය වශයෙන් බලාත්මක කළහැකි අයිතියක් ඇතිවිට විලම්භීත බදු වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් කරනු ලැබේ. මෙසේ කරනු ලබන්නේ දැනට පවත්නා බදු වගකීම් සහ ආදායම් වලට විලම්භීත බදු වත්කම් සහ වගකීම් එම බදු අධිකාරිය විසින්ම පනවා ඇති විටය.

2.16 සේවක ප්‍රතිලාභ

කණ්ඩායම් විසින් ප්‍රතිලාභ සහ අදාළ ගෙවීම් සැළැස්ම නිර්වචනය කර ඇත.

(අ) නිර්වචනය කර ඇති දායකත්ව සැළැස්ම

නිර්වචනය කර ඇති ගෙවීම් සැළැස්ම පශ්චාත් සේවා ප්‍රතිලාභ සැළැස්මක් වන අතර මේ යටතේ සමූහය විසින් වෙනත් ආයතනයකට නිශ්චිත ගෙවීම් කරනු ලැබේ. තවදුරටත් ගෙවීම් කිරීමට නීතිමය හෝ වෙනත් නිශ්චිත වගකීම් ඉටුකිරීමට සමූහය බැඳී නැත. මෙම මුදල් ගෙවිය යුතු කාලය වනවිට සේවක ප්‍රතිලාභ ලෙස මෙම ගෙවීම් පිළිගනු ලැබේ. සමූහය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 15%ක් සේවක අර්ථ සාධක අරමුදලට ද 3%ක් සේවක භාරකාර අරමුදලට ද ගෙවනු ලැබේ.

(ආ) නිර්වචනය කර ඇති ප්‍රතිලාභ සැළැස්ම

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්ම සම්බන්ධව සමූහයේ වගකීම වන්නේ වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ පවත්නා නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්මේ වත්මන් වටිනාකමය. නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්ම වාර්ෂිකව ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් ස්වාධීනව සකස් කරන ලද වටිනාකම මගිනි. ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම නීර්ණය කරනු ලබන්නේ සේවකයා විසින් වර්තමාන සහ කලින් කාල පරිච්ඡේදය සඳහා සේවාවන් වෙනුවෙන් උපයාගත් ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභ අඩුකිරීමෙනි.

අනුයුක්ත ආයතනයේ නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලබන්නේ වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ 2011 දෙසැම්බර් 31 දිනට සහ සංක්‍රමික කාල පරිච්ඡේදයේ ක්‍රමවේදය භාවිතා කරමිනි.

පළපුරුදු ගැළපුම් සහ ආයු ගණක උපකල්පනයන් වල වෙනසින් මතුවන ආයු ගණක ලැබීම් සහ පාඩු ඒවා අදාළ වන්නා වූ සම්පූර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බාහිරව සපයන මුදල් භාවිතා නොකෙරේ.

(ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

සේවකයා විසින් අදාළ සේවාවන් සඳහා සපයන මුදල් අඩුකිරීමෙන් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් ගණනය කරනු ලැබේ.

2.17 ප්‍රතිපාදන සහ අසම්භව්‍ය

ප්‍රමාණාත්මක අඩුකිරීම්, නීතිමය ඉල්ලීම් සහ වෙනත් වියදම් සඳහා වූ ප්‍රතිපාදන පිළිගනු ලබන්නේ යම්කිසි අතීත කාලීන සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් නීතිමය සහ ප්‍රයෝජනවත් වන්නා වූ යුතුකමක් හැටියටය. සමූහයට අයත් ආර්ථික සම්පත් පිටතට ගලායාම සිදුවිය හැකිවන්නේ එම මුදල් විශ්වාසනීය ලෙස ඇස්තමේන්තුගත කිරීමෙනි.

වර්තමාන වගකීම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම සඳහා වූ ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ වාර්තාකරණ දිනයට අදාළ වන්නා වූ වඩාත් විශ්වාසනීය තොරතුරු පදනම් කරගෙනය. තවද වර්තමාන වගකීම් ආශ්‍රිත අවදානම් සහ අනියත අවස්ථා ද මීට ඇතුළත් වේ. සම්පත් පිටතට ගලායාමේ හැකියාව නොපවතින්නේ නම් සියළුම හදිසි වගකීම් මූල්‍යමය ප්‍රකාශන වල සටහනකින් දැක්වේ.

2.18 ආදායම් හඳුනාගැනීම

ලැබී ඇති හෝ ලැබීමට ඇති ප්‍රතිඵලයට අදාළ සාධාරණ වටිනාකම ආදායම ගණනය කිරීමේදී සළකා බැලෙන අතර මෙවැනි ඉටුකරන ලද සේවා සඳහා ලැබිය යුතු මුදල් අඩු කළයුතු ශුද්ධ මුදල, වටිනාකමට එකතු කළ බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද යන විෂයන් යටතේය. කණ්ඩායම් විසින් ආදායම පිළිගනු ලබන්නේ ආදායමට අදාළ මුදල විශ්වාසනීය ලෙස ගණනය කිරීමෙන් සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා එන තත්ත්වයන් යටතේය.

සමූහය පහත දැක්වෙන හඳුනාගනු ලැබූ එක් එක් සේවා සඳහා ආදායම පිළිගැනීමේ නිර්ණායක භාවිතා කරනු ලැබේ.

(අ) ගොඩබෑමේ සහ භාරදීමේ සේවා

ආනයන සහ අපනයන නැව් භාණ්ඩ මෙහෙයවීම සම්බන්ධව මෙම සමූහය විසින් පැටවීම, ගොඩබෑම සහ ගබඩාගත කිරීම වැනි සේවා ඉටුකරනු ලැබේ. මෙම සේවා විකිණීම සම්බන්ධ ආදායම ඒවා ඉටුකළ කාල පරිච්ඡේදය අනුව ගණන් බැලේ. තවද නිමකරන ලද කාර්යය හෝ ගණුදෙනුව ඉටුකරන ලද සේවා පදනම්කොට ගෙන තක්සේරු කරනු ලැබේ.

(ආ) නාවික සහ ආශ්‍රිත සේවා

සැහැල්ලු සේවා, ඇතුල්වීමේ ගාස්තු, කාලය ඉකුත්වීමේ ගාස්තු සහ නියමු ගාස්තු වලින් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ ඒවා ලැබිය යුතු ස්ථානය අනුව ය. එනම් යාත්‍රාව පැමිණීමේ ස්ථානයයි. නාවික සහ ආශ්‍රිත සේවා වලින් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ එම සේවාවන් ඉටුකරන ලද කාල පරිච්ඡේදය අනුව ය. මෙය පදනම් වන්නේ එම කාර්යය හෝ ගණුදෙනුව සම්පූර්ණ වීම මත සහ ඉටුකරන නියමිත සේවා තක්සේරු කිරීමේ පදනම මතය.

(ඇ) ස්ටෙවඩෝරු සේවා

බහළු මෙහෙයුම් සහ සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් සේවා සම්බන්ධ ස්ටෙවඩෝරු ආදායම පිළිගනු ලබන්නේ එම සේවා ඉටුකරන ලද කාල පරිච්ඡේදය අනුව ය. මෙය පදනම් වන්නේ එම කාර්යය හෝ ගණුදෙනුව සම්පූර්ණ වීම මත සහ ඉටුකරන නියමිත සේවා තක්සේරු කිරීමේ පදනම මතය.

(ඈ) රාජ්‍ය භාග ආදායම

රාජ්‍ය භාග ආදායම පිළිගනු ලබන්නේ අදාළ ගිවිසුමේ අඩංගු ප්‍රතිපාදන අනුව ඒවා එකතුවීමේ පදනම මතය. එස්ඒජීටි පර්යන්ත ආයතනයෙන් ලැබෙන රාජ්‍ය භාගය නිර්ණය කරනු ලබන්නේ සමස්ථ ආර්ථික බහළු ප්‍රමාණය සඳහා ගිවිසුමේ සඳහන් කාල පරිච්ඡේදය වෙනුවෙන් එකඟ වූ විස්සේ සම ඒකක ගාස්තුව අනුවය.

(ඉ) පොලී ආදායම

පොලී ආදායම පිළිගනු ලබන්නේ ඵලදායී පොලී ක්‍රමවේදය භාවිතා කරමිනි.

(ඊ) ලාභාංශ ආදායම

ලාභාංශ අදායම පිළිගනු ලබන්නේ ගෙවීමක් ලැබීම පිළිබඳ අයිතිය ස්ථාපනය වන විටය.

(උ) බදු සහ කුලී ආදායම

ආයෝජන දේපළ වලින් ලැබෙන බදු සහ කුලී ආදායම පිළිගනු ලබන්නේ බදු කාලසීමාව තුළ එකතු වූ මුදල පදනම් කරගෙනය.

(ඌ) දේපළ, පිරියත සහ උපකරණ විකුණා දැමීමේදී සිදුවන ලාභ සහ පාඩු

මෙවැනි විකුණා දැමීම් වලින් ලැබෙන ලාභ හෝ පාඩු නිර්ණය කරනු ලබන්නේ ඉදිරියට ගෙන යනු ලබන මුදල සමග සංශෝධනය කිරීමෙන් සම්පූර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශනයෙහි පිළගනු ලැබීම අනුවය.

2.19 වියදම්

මෙහෙයුම් පවත්වාගෙන යාමේ දී සිදුවන සියළුම වියදම් වාර්තාකරණ කාල පරිච්ඡේදයේ ලාභයට එකතු කරනු ලැබේ.

2.20 මූල්‍යමය වගකීම් සඳහා බැඳීම්

වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ සියළු මූල්‍ය වගකීම් පිළිබඳ බැඳීම් මූල්‍යමය ප්‍රකාශ සටහන් වල හඳුනාගෙන දක්වා ඇත.

2.21 කරුණු දැක්වීම්

සියළුම ද්‍රව්‍යමය වගකීම් වාර්තාකරණ කාල පරිච්ඡේදය වන විට හඳුනාගෙන ඇති අතර එය මූල්‍ය ප්‍රකාශනයේ සටහන් වල දක්වා ඇත.

2.22 වැදගත් ගිණුම් ඇස්තමේන්තු සහ තීරණ

මූල්‍යමය ප්‍රකාශන සකස් කිරීමේ දී කළමනාකරණය විසින් මූල්‍යමය ප්‍රකාශය සකස් කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් පිළිබඳ ගණනය හා පිළිගැනීම පිළිබඳ උපකල්පනයන් සළකා බලනු ලැබේ.

2.22.1 පහත දක්වනු ලබන්නේ මූල්‍යමය ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී සළකා බලන වැදගත් තීරණ කිහිපයකි. මේවා මූල්‍යමය ප්‍රකාශන වලදී වැදගත් බලපෑමක් කරනු ලබයි.

(අ) විලම්භනය කරනු ලබන බදු වත්කම් පිළිගැනීම

විලම්භනය කරන ලද බදු වත්කම් පිළිගැනීමක් කරනු ලැබීමේදී පදනම වන්නේ අනාගත බදු වලට භාජනය විය හැකි ආදායමේ බව්‍යතාවය තක්සේරු කිරීම සහ විලම්භනය කරන බදු වත්කම් භාවිතා කිරීමය.

2.22.2 වත්කම්, වගකීම් සහ වියදම් පිළිගැනීම සහ ගණනය කිරීම මත ඇතිවන ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත

(අ) ක්ෂය කළ හැකි වත්කම් වල පිළිබඳ ප්‍රයෝජනවත් ජීවන කාලය

කළමනාකරණය විසින් වාර්තාකරන කාලපරිච්ඡේදය තුළ ක්ෂය වන වත්කම් වල ප්‍රයෝජනවත් ජීවන කාලය ඇස්තමේන්තුගත කිරීම සමාලෝචනය කෙරිණ. මෙය පදනම් වන්නේ වත්කම් වල අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මතය. මෙම ඇස්තමේන්තු වල අනියතභාවය තාක්ෂණික කාල සීමාවන් වලට සම්බන්ධය. මෙම තාක්ෂණික කාල සීමාව අනුව කල් ඉකුත් වන මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණික උපකරණ වල උපයෝගීතාවය වෙනස් විය හැක.

(ආ) නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්ම

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්මේ වගකීම් වල වර්තමාන වටිනාකම සාධක කිහිපයක් මත රදා පවති. මෙය නීර්ණය කරනු ලබන්නේ උපකල්පනයන් කිහිපයක් භාවිතා කරමින් කරනු ලබන ආයුගණක පදනම මතය. වට්ටම් ගාස්තුත් ඇතුළුව නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්මෙහි ශුද්ධ පිරිවැය සහ වගකීම නිර්ණය කිරීමේදී මෙම උපකල්පනයන් භාවිතා කෙරේ. මෙම උපකල්පනයන්ගේ යම් වෙනස්වීමක් මත නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමේ ඉදිරියට ගැනෙන මුදල වෙනස් වනු ඇත.

2.23 ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් (SLFRSs)/(LKAS) හඳුන්වා දීම

2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ සඳහන් වූ මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ක්‍රමවේදය අනුවය. මෙය ප්‍රථම වරට සකස් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වේ. 2011 දෙසැම්බර් 31 වන දිනට අවසන් වන වාර්තාකරණ කාල පරිච්ඡේදය දක්වා වූ කාල පරිච්ඡේදය ඇතුළුව පූර්ව කාලීන වාර්තාකරණ කාල පරිච්ඡේදය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සකස් කරන ලද්දේ 2011.12.31 දින තෙක් බලපැවැත්වූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතියට අනුකූලවය.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට මාරුවීමේ දින වන 2011 ජනවාරි 01 දිනට මූල්‍ය තත්ත්වයේ මූලික සටහන් සකසන ලදී. 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 21 දින දක්වා වන වාර්තා කරන කාල සීමාවේ SLAS මූල්‍ය ප්‍රකාශන SLFRSs මූල්‍ය ප්‍රකාශන වලට යළි සැකසීමේ/ප්‍රකාශ කිරීමේ දී සිදුකරන මූලික ගැළපුම් පිළිබඳ මෙම සටහනින් විස්තර කෙරේ.

2.23.1 අනෙකුත් SLFRSs ප්‍රත්‍යෙක්ෂණ භාවිතයේදී ඇති වන විකල්ප අයබදු වලින් නිදහස් කිරීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූලික ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs) ප්‍රත්‍යෙක්ෂණ භාවිතයේ දී සමූහය විසින් පහත සඳහන් විකල්ප අයබදු වලින් නිදහස් කිරීමට තීරණය කරන ලදී.

අ) සැලකි පිරිවැයේ සාධාරණ අගය හෝ ප්‍රත්‍යාගණන අගය ලෙස

2011 දෙසැම්බර් 31 දිනට පෙර SLAS වලට අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දේපල, පිරියත හා උපකරණ වල ප්‍රතිප්‍රමාණන අගයට අනුව මූල්‍ය ප්‍රකාශනයේ තත්ත්වය ප්‍රතිප්‍රමාණන අගයට සකස් කරන ලදී. ප්‍රතිප්‍රමාණන දිනට සාධාරණ අගය

පුළුල් ලෙස සංසන්දනය කළ හැකි බැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙම ප්‍රතිප්‍රමාණන අගයන් ප්‍රතිප්‍රමාණන දිනට සැලකි පිරිවැය ලෙස තීරණය කර ඇත.

ආ) ආයෝජන දේපල සැලකි පිරිවැයේ සාධාරණ අගය හෝ ප්‍රතිප්‍රමාණන අගය ලෙස

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආයෝජන දේපල ගණනය කරන ලද්දේ 2011 දෙසැම්බර් 31 දිනට පෙර SLAS වලට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රතිප්‍රමාණන අගයට අනුව ය. ප්‍රතිප්‍රමාණන දිනට සාධාරන අගය පුළුල් ලෙස සන්සන්දනය කළ හැකි බැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙම ප්‍රතිප්‍රමාණන අගයන් ප්‍රතිප්‍රමාණන දිනට සැලකි පිරිවැය ලෙස තීරණය කර ඇත.

ඇ) ආශ්‍රිත සමාගම් වල සහ උප සමාගම් වල ආයෝජන

ආශ්‍රිත සමාගම් හා උප සමාගම් වල ආයෝජන ගණනය කිරීම හා ගිණුම්කරණය වෙනත් මූල්‍ය ප්‍රකාශන වල LKAS 2ට අනුකූලව සිදුකරන ලදි.

ඇ) පෙර හඳුනාගත් මූල්‍ය ලියකියවිලි නිශ්චය කරගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට මාරුවීමේ දිනට දිගුකාලීනව සඳහන් කරන ලද හා නොකරන ලද හිමිකාරිත්ව ලියකියවිලි සමූහය විසින් විකිණීම සඳහා ඇති ආයෝජන ලෙස නිශ්චය කර ඇත.

2.23.2 සමූහය සඳහා පහත සඳහන් විකල්ප අය බදු නිදහස් කිරීමේ බල නොපායි.

අ) SLFRS 4 - රක්ෂණ කොන්ත්‍රාත්තු, මෙහි භාවිතය සමූහයට බලනොපායි

ආ) IFRIC 4 - සැකැස්ම සඳහා (Arrangement) කල් බදු තිබෙදැයි තීරණය කිරීම, සමූහයට එවැනි සැකැස්මක් නොමැති බැවින්

ඇ) LKAS 19 - සේවක ප්‍රතිලාභ, සමූහය විසින් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙහි ආයුගණක ලැබීම් සහ පාඩු හඳුනාගන්නා බැවින්.

ඈ) LKAS 21 - සමුච්චිත භාෂා පරිවර්තන වල වෙනස්කම්, සමූහය සතුව විදේශීය මෙහෙයුම් නොමැති බැවින්

ඉ) ආශ්‍රිත සමාගම්, උප සමාගම් හා හවුල් ව්‍යාපාර වල වත්කම් හා වගකීම්, උප සමාගම් හා ආශ්‍රිත සමාගම් SLASs වලින් SLFRSs වලට මාරුවීම නිසා

ඊ) LKAS 32 - සංයුක්ත මූල්‍ය ප්‍රකාශන, සමූහය සතුව සංයුක්ත මූල්‍ය ප්‍රකාශන නොමැති බැවින්

උ) දේපල, පිරියත හා උපකරණ වල පිරිවැයෙහි අන්තර්ගත ක්‍රියාවන් නතර කිරීම සඳහා වන වගකීම ඉවත් කිරීම හා ප්‍රතිසංස්කරණ කිරීමේ වියදම් හා ඊට අදාළ වගකීම් හඳුනාගැනීමට හා ඇතුළත් කිරීමට සමූහය සතුව ක්‍රමවේදයක් නොමැති බැවින්

ඌ) IFRIC 12 - සේවා සහන සැලසීම. සමූහය සතුව එවැනි සැකැස්මක් නොමැති බැවින්

2.23.3 අනෙකුත් SLFRSs ප්‍රත්‍යක්ෂණ භාවිතයේ දී ඇති වන අත්‍යවශ්‍ය අයබදු වලින් නිදහස් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූලික ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs) ප්‍රත්‍යක්ෂණ භාවිතයේ දී සමූහය විසින් පහත සඳහන් අත්‍යවශ්‍ය අයබදු වලින් නිදහස් කිරීමට තීරණය කරන ලදී.

අ) ගිණුම්කරණ ඇස්තමේන්තු

පහත සඳහන් දෑ හැර 2011 දෙසැම්බර් 31 දින තෙක් වලංගු වන පරිදි SLAS වලට අනුකූලව සකසන ලද ඇස්තමේන්තු (2011 දෙසැම්බර් 31 දිනට) SLFRSs වලට මාරු වන දිනට හා සියළුම ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් නොවී පවතී.

i. 2011 දෙසැම්බර් 31 දිනට සහ SLFRSs වලට මාරුවීමේ දිනට පවතින තත්ත්වය පිළිබිඹු කිරීමට සමූහය විසින් අවසන් නොවූ නඩු හා හිමිකම් සඳහා වන ඉල්ලීම් වෙනුවෙන් වන ප්‍රතිපාදන සහ අස්පෘෂ වත්කම් හා දේපල පිරියත හා උපකරණ වල සමහර අයිතමයන්ගේ භාවිත ආයු කාලය සමූහය විසින් යලි ඇස්තමේන්තුගත කරනු ලැබේ.

ආ) පහත සඳහන් අනුගම්‍ය අයබද්දෙන් නිදහස් කිරීම් සමූහයට අදාළ නොවේ.

i. මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් වල
ii. හෙජ් ගිණුම්කරණය
iii. පාලනය කළ නොහැකි පොලිය

2.23.4 SLFRSs වලට මාරුවීම පිළිබඳ කරුණු දැක්වීම

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වාර්තාකරණ කාලය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති වල 2.1 සිට 2.27 දක්වා ඇති සටහන් සහ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වාර්තාකරණ කාල සීමාව සඳහා සන්සන්දනාත්මක තොරතුරු, 2011 ජනවාරි 01 දිනට එනම් සමූහය විසින් SLFRSs වලට මාරු වූ දිනට ආරම්භක ප්‍රකාශන ආදිය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ දී භාවිතා කර ඇත.

පෙර වාර්තාකරණ කාලසීමාවන් වලදී SLFRSs මූල්‍ය ප්‍රකාශනය සැකසීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අවශ්‍ය ගැළපුම් සිදුකරන ලදි. SLAS සිට SLFRSs දක්වා මාරුවීමේ දී ඇති වූ බලපෑම සමාන කොටස් හිමිකරුවන්ගේ ප්‍රතිසංධාන ප්‍රකාශනය, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය හා ප්‍රතිසංධානය සඳහා ඇති සටහන් වලින් දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

3		දේපල, පිරියත සහ උපකරණ				
			2012 ජනවාරි	එකතු කිරීම්	(ඉවත්කිරීම්)	2012 දෙසැම්බර්
		සමූහය	01 වන දිනට			31 වන දිනට
	3.1	පිරිවැය මත				
		භූමිය	50,515,360,159	847,977,712	(1,532,350,000)	49,830,987,871
		මෙහෙයුම් ගොඩනැඟිලි සහ ව්‍යුහයන්	53,103,921,682	39,368,463,388	-	92,472,385,070
		පාවෙන උපකරණ	7,361,083,817	808,388	(81,950,000)	7,279,942,205
		මෙහෙයුම් උපකරණ	10,021,749,729	12,186,217,055	(3,100,000)	22,204,866,784
		පිරියත සහ යන්ත්‍රෝපකරණ	452,591,709	40,348,466	(1,718,325)	491,221,850
		කාර්යාල සහ සුභසාධන ගොඩනැඟිලි	843,392,306	973,406	-	844,365,712
		සේවක නිල නිවාස සහ වෙනත් ගොඩනැඟිලි	483,088,258	-	-	483,088,258
		පරිගණක දෘඩාංග	428,464,385	8,969,975	(84,077,597)	353,356,763
		විදුලි හා විද්‍යුත් උපකරණ	1,860,038,648	64,938,648	(1,001,213)	1,923,976,083
		කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ	132,420,032	5,786,060	(949,087)	137,257,005
		රථවාහන	758,745,705	67,600,049	(7,768,827)	818,576,927
		වෙනත් වත්කම්	301,467,953	17,920,480	(4,209,548)	315,178,885
			126,262,324,382	**52,610,003,627**	**(1,717,124,597)**	**177,155,203,412**
	3.1.1	ක්ෂයවීම්	2012 ජනවාරි	වසර සඳහා	(ඉවත්කිරීම්)	2012 දෙසැම්බර්
			01 වන දිනට	අයකිරීම්		31 වන දිනට
		මෙහෙයුම් ගොඩනැඟිලි සහ ව්‍යුහයන්	13,386,001,416	2,624,179,397	-	16,010,180,813
		පාවෙන උපකරණ	4,016,897,935	626,061,656	(68,381,550)	4,574,578,041
		මෙහෙයුම් උපකරණ	6,969,824,902	1,465,185,164	(3,096,900)	8,431,913,166
		පිරියත සහ යන්ත්‍රෝපකරණ	320,632,790	53,884,357	(1,673,375)	372,843,772
		කාර්යාල සහ සුභසාධන ගොඩනැඟිලි	162,415,307	27,503,490	-	189,918,797
		සේවක නිල නිවාස සහ වෙනත් ගොඩනැඟිලි	123,508,758	19,630,249	-	143,139,007
		පරිගණක දෘඩාංග	352,069,996	33,495,968	(83,993,804)	301,572,160
		විදුලි හා විද්‍යුත් උපකරණ	1,188,410,299	231,971,520	(1,000,212)	1,419,381,607
		කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ	89,709,443	13,958,003	(944,141)	102,723,305
		රථවාහන	670,263,971	50,335,874	(7,754,372)	712,845,473
		වෙනත් වත්කම්	166,990,001	47,625,397	(4,205,339)	210,410,059
			27,446,724,817	**5,193,831,075**	**(171,049,693)**	**32,469,506,199**
	3.1.2	ඉදිරියට ගෙනයන දළ වටිනාකම		2012 දෙසැම්බර්	2011 දෙසැම්බර්	2012 ජනවාරි
				31 වන දිනට	31 වන දිනට	31 වන දිනට
		දේපල, පිරියත සහ උපකරණ				
		භූමිය		49,830,987,871	50,515,360,159	50,515,360,159
		මෙහෙයුම් ගොඩනැඟිලි සහ ව්‍යුහයන්		76,462,204,257	39,717,920,266	41,085,617,302
		පාවෙන උපකරණ		2,705,364,164	3,344,185,882	3,979,802,908
		මෙහෙයුම් උපකරණ		13,772,953,618	3,051,924,827	4,185,956,211
		පිරියත සහ යන්ත්‍රෝපකරණ		118,378,078	131,958,919	145,950,548
		කාර්යාල සහ සුභසාධන ගොඩනැඟිලි		654,446,915	680,976,999	705,593,332
		සේවක නිල නිවාස සහ වෙනත් ගොඩනැඟිලි		339,949,251	359,579,500	379,317,311
		පරිගණක දෘඩාංග		51,784,603	76,394,389	64,197,030
		විදුලි හා විද්‍යුත් උපකරණ		504,594,477	671,628,350	787,603,454
		කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ		34,533,700	42,710,589	52,648,078
		රථවාහන		105,731,454	88,481,734	144,499,341
		වෙනත් වත්කම්		104,768,826	134,477,952	170,540,165
				144,685,697,213	**98,815,599,565**	**102,217,085,839**
	වර්ෂය සඳහා වර්තමාන බදු වියදම්	(සටහන 35.1)	10,121,664	86,642,444	-	79,861,924
	විභජනය කළ හැකි ලාභය මත බදු		1,287,842,690	176,365,759	1,287,842,690	175,592,233
	ලාභාංශ බදු		613,300	100,000	613,300	100,000
	පසුගිය වර්ෂය තුළ වැඩිපුර ප්‍රතිපාදනව කළ ආදායම් බදු		(163,901,588)	(56,113,673)	(163,109,250)	(55,819,344)
	විලම්භනය කළ බදු අයකිරීම් / (වෙනස්වීම්)		-	-	-	-
			1,134,676,066	**206,994,530**	**1,125,346,740**	**199,734,813**

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.)

		සමූහය		ශ්‍රී ලං ව අ	
		2012	**2011**	**2012**	**2011**
35.1	**ජංගම බදු වියදම් සහ ගණකාධිකරණ ලාභ නිමවුම් අතර සැසඳුම**				
	බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය - වගකීමෙන් නිදහස්	5,302,418,343	329,366,950	5,211,436,974	256,869,976
	බදු සඳහා වෙනත් ආදායම් වගකීම් - පොලී ආදායම්	438,801,780	438,801,780	-	438,801,780
	පරිපාලිතයන්ගේ බදු පැනවිය හැකි ලාභ	91,581,102	-	-	-
	ව්‍යවස්ථාපිත ආදායම්	**530,382,882**	**438,801,780**	**-**	**438,801,780**
	භාවිතා කළ බදු පාඩු	-	(153,580,623)	-	(153,580,623)
	තක්සේරු කළ හැකි ආදායම්/ බදු පැනවීමේ ලාභ	**530,382,882**	**285,221,157**	**-**	**285,221,157**
	28%ක ව්‍යවස්ථාපිත බදු අනුපාතය මත අයකළ බද්ද (2011 - 35%)	10,121,664	86,642,444	-	79,861,924
	වර්ෂය සඳහා සාමාන්‍ය ක්‍රියාකාරකම් මත වර්තමාන බද්ද	**10,121,664**	**86,642,444**	**-**	**79,861,924**
	බදු පාඩු				
	ඉදිරියට ගෙන එන ලද පාඩු	**6,281,269,069**	**6,434,849,692**	**6,281,269,069**	**6,434,849,692**
	සිදු වූ අලාභ	-	-	-	-
	භාවිතා කළ අලාභ	-	(153,580,623)	-	(153,580,623)
	ඉදිරියට ගෙන එන ලද අලාභ	**6,281,269,069**	**6,281,269,069**	**6,281,269,069**	**6,281,269,069**

අධිකාරිය විසින් අත්විදි විදේශ විනිමය හුවමාරුවේ අලාභයෙහි හිමිකම්පෑමේ හැකියාව විවාදිතයට ලක්කර 2007/08 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු තක්සේරුව නිකුත්කර ඇත. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා දරණ තනතුර අවසන් කරන තෙක් අදාළ විදේශ විනිමය හුවමාරු පාඩු අඩු කළ නොහැකි වන අතර අධිකාරිය විසින් බදු අභියාචනා කොමිසමට අභියාචනයක් ඉදිරිපත් කෙරිණ. බදු අභියාචනා කොමිසම මගින් කොමසාරිස් ජනරාල්වරයාගේ තනතුර අවසන් කිරීම අනුමත කෙරිණ. එහි ප්‍රතිඵලයක් ලෙස බලපාන නීතිමය ප්‍රශ්න වල පදනම් මත අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අධිකාරිය අදහස් කරයි.

36. ප්‍රාග්ධන සහ වෙනත් වගකීම්වට බැඳීම්

වාර්තාකරනු ලබන කාලසීමාව අවසාන වන විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ද්‍රව්‍යමය ප්‍රාග්ධන වියදම් හෝ වෙනත් මූල්‍යමය වගකීම් වලට බැඳීම් කිසිවක් නොතිබිණ.

37. වාර්තා කරනු ලබන කාලසීමාවට පසුව ඇතිවූ සිදුවීම්

පහත දැක්වෙන දේවල් හැර දෙසැම්බර් 31 දිනට වාර්තාකරනු ලබන කාලය අතර තුර මෙම මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් හෝ එලිදරවිකිරීම් සහ අනුමැතිය ලබාදීමේ දිනය ආදී සිදුවීම් ඇති වී නොතිබිණ.

සිදුවූ විදේශ විනිමය හුවමාරු අලාභ වල හිමිකම් සම්බන්ධයෙන් 2007/08 තක්සේරු වර්ෂය සඳහා නිකුත් කළ තක්සේරු වාර්තාව සඳහා අධිකාරිය විසින් බදු අභියාචනා කොමිසම වෙත අයදුම්ක් ඉදිරිපත් කෙරිණ. 2013 ජනවාරි මාසයේදී කොමසාරිස් ජනරාල්වරයාගේ තීන්දුව බදු අභියාචනා කොමිසම මගින් අනුමත කෙරිණ. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ නීතිමය ගැටළු වල පදනම් මත අධිකාරිය විසින් අභියාචනාධිකරණයට ඇපෑලක් ඉදිරිපත්කිරීමට තීරණය කර ඇත.

37. අසම්භාව්‍ය වගකීම්

ව්‍යාපාර කටයුතු කිරීමේදී පැන නගින නීතමය හිමිකම් සඳහා අධිකාරියට ආපතික වගකීම් සතු වේ. ප්‍රතිපාදන (සටහන 29) ලෙස හඳුනා නොගන්නේ නම් කළමනාකරණය විසින් මෙම හිමිකම් සාධාරණ නොවන බවට සලකන අතර ඒවා සමතයකට පත්කිරීම සඳහා සම්පත් පිටතට ගලායෑමේ ඇති හැකියාව අවම වන බවට සලකනු ලැබේ. මෙම ගණනය කිරීම අධිකාරියේ නීති අංශයේ නීති උපදෙස් සමඟ සමායෝජනය වේ. ඒ අනුව පහත නඩු සඳහා නීතිමය හිමිකම් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොමැත.

නඩු අංකය	පෙත්සම්කරු	හිමිකම් මුදල (රුපියල්)
D.C.47064/MR	ස්විෆ්ට් ෂිපිං සහ ඩිජරජින් පුද්ගලික සමාගම	13,500,000
H.C.(Civil) 95/08	ජර්මන් එක්ස්ප්‍රස් කොළඹ	37,305,476
C.H.C 281/09 (2) DC 52526/MR	ටැන්යෝ හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගම	224,000,000
S.C (FR) 523/09	එස් ආර් විතාන	500,000
D.C Col 30944/MR	ලොයිඩ් ට්‍රෙස්ලයින් නැවිගේෂන් එස් පී ඒ	602,907,011

38. සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය කිරීම

ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, උප සමාගම්, ආශ්‍රිත සමාගම් සහ ප්‍රමුඛ කළමනාකරණ පුද්ගලයින් අධිකාරියේ සම්බන්ධිත පාර්ශ්වයන්ට ඇතුළත්ය.

38.1 මූලික කළමනාකරණ මණ්ඩලය සමඟ කරන ගණුදෙනු

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත LKAS 24 අනුකූලව "අදාළ පාර්ශ්ව අනාවරණය කිරීම", සැළසුම් කිරීම, අධීක්ෂණය සහ යම් දෙයක ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රාකාරව පාලනය කිරීම සඳහා මූලික කළමනාකරණ මණ්ඩලය මේ සඳහා වගකීම් දරනු ලබයි. ඒ අනුව විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය මූලික කළමනාකරණ මණ්ඩලය ලෙස වර්ගීකරණය කර ඇත.

මූලික කළමනාකරණ මණ්ඩලය සමඟ කළ ගණුදෙනු පහත දැක්වේ	2012	2011
වේතන සහ වෙනත් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	16,604,300	18,870,202
කාලසීමාව තුළ ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම්	271,440	1,000,000
ගෙවීමට ඇති ශේෂයන් - ණය සහ අත්තිකාරම්	699,940	1,000,000

38.2 සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගණුදෙනු

අධිකාරිය විසින් ගෙන එනු ලබන විශේෂිත සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු විස්තර පහත සඳහන් වේ.

ආයතනයේ නම	සම්බන්ධතාවය	අධ්‍යක්ෂවරුන්ගේ නම්/නියෝජිතයින්	ගණුදෙනුවේ ස්වභාවය	ගණුදෙනුවේ අගය	ශේෂය
ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය	ප්‍රධාන දායකත්වය	එස් ආර් ආටිගල මහතා	ප්‍රදානය කළ ණය	5,571,555,481	-
			නැවත ගෙවූ ණය	6,135,091,714	
			ගෙවූ පොලිය	1,863,161,694	
රජයට සම්බන්ධිත ආයතන	සම්බන්ධිත	එස් ආර් ආටිගල මහතා	සපයන ලද සේවා	111,703,207	
			සපයන ලද සේවා සඳහා ගිවිසුම්	101,770,935	97,283,993
			ආරක්ෂක තැන්පතු තැන්පත් කිරීම්	60,739,961	60,739,961
ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සමාගම	ආශ්‍රිත සමාගම	ආචාර්ය ප්‍රියත් බී වික්‍රම මහතා	රැකවරණ සේවා සඳහා ගෙවීම්	1,397,760	
			සිදු වූ වියදම් සඳහා ගෙවීම්	1,993,975	
			වැටුප් ගෙවීම්	137,667,067	
			ලැබූ සේවා සඳහා ගෙවීම්	161,235,940	
			ලැබූ ලාභාංශ	774,581	(21,878,048)
ජය බහළු පර්යන්තය	පරිපාලිත	ආචාර්ය ප්‍රියත් බී වික්‍රම මහතා	ලැබූ කුලී	18,746,939	
		ඉන්දික කරුණාජීව මහතා	පරිපාලන සහ යටිතල පහසුකම් ගාස්තු	79,961,384	
		කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා	ලැබූ ලාභාංශ	6,133,000	
		ශිරාණි වන්නිආරච්චි මහත්මිය	රැකවරණ සේවා සඳහා ගෙවීම්	7,601,479	
			ඉන්ධන සැපයීම්	1,751,618	22,451,513
සවුත් ඒෂියා ගේට්වේ පර්යන්ත (පුද්) සමාගම	ආශ්‍රිත සමාගම	කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා	ලැබූ කුලී	358,985,994	26,246,924
		ආචාර්ය සංජය සේදර සෙනරත් මහතා	ලැබූ රාජ්‍ය භාගය	798,786,198	65,780,970
			ලැබූ ලාභාංශ	840,015,288	
ලංකා කෝල් (පුද්) සමාගම	ආශ්‍රිත සමාගම	කපිතාන් ආර් ඒ ජයවික්‍රම මහතා	වර්ෂය තුළ ගණුදෙනු සිදුවී නොමැත		-
කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත සමාගම	ආශ්‍රිත සමාගම	ආචාර්ය ප්‍රියත් බී වික්‍රම මහතා	මිළදී ගත් කොටස්	2,855,001,000	-
		කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා			

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.)

			2011 SLAS යටතේ	ගැළපීම්	2011 SLFRS යටතේ	2011 ජනවාරි 01 SLAS යටතේ	ගැළපීම්	2011 ජනවාරි 01 SLFRS යටතේ
39	**කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය**							
39.1	**සමූහය**							
	වත්කම්							
	ජංගම නොවන වත්කම්							
	දේපල, පිරියත සහ උපකරණ		202,819,962,466	(335,047,132)	194,703,452,120	180,108,238,116	-	172,118,016,815
	අස්පර්ශනීය වත්කම්		-	76,926,296	521,993,078	-	30,416,630	670,586,953
	ආයෝජන වත්කම්		-	-	7,336,396,431	-	-	7,350,050,978
	ආශ්‍රිත සමාගම් වල කළ ආයෝජන		41,778,173	(1,483,346)	40,294,827	33,901,831	(445,768)	33,456,063
	විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්		598,758,763	478,317,226	1,077,075,989	598,757,263	553,688,775	1,152,446,038
	රඳවාගත් කල්පිරුණු ආයෝජන		1,788,143,962	-	1,788,143,962	1,788,669,241	-	1,788,669,241
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු මුදල		262,801,091	-	262,801,091	294,986,521	-	294,986,521
	මුළු ජංගම නොවන වත්කම්		**205,511,444,455**	**218,713,043**	**205,730,157,497**	**182,824,552,971**	**583,659,637**	**183,408,212,609**
	ජංගම වත්කම්							
	වට්ටෝරු භාණ්ඩ		1,694,585,948	-	1,694,585,948	2,543,913,808	-	2,543,913,808
	වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ		2,161,440,659	8,776,560	2,170,217,220	2,216,741,816	17,339,890	2,234,081,706
	තැන්පතු සහ අත්තිකාරම්		950,579,064		950,579,064	4,313,898,308	-	4,313,898,308
	පෙර ගෙවූ වියදම්		108,403,249	-	108,403,249	64,479,492	-	64,479,492
	සේවක ණය	IX	3,757,445,863	1,372,677	3,758,818,540	4,646,910,411	-	4,646,910,411
	වෙනත් මූල්‍ය වත්කම්		7,669,593,112	-	7,669,593,112	6,566,931,408	-	6,566,931,408
	මුදල් සහ මුදල් සමක		852,705,518	-	852,705,518	581,351,691	-	581,351,691
	මුළු ජංගම වත්කම්		**17,194,753,414**	**10,149,237**	**17,204,902,651**	**20,934,226,935**	**17,339,890**	**20,951,566,825**
	මුළු වත්කම්		**222,706,197,869**	**228,862,280**	**222,935,060,148**	**203,758,779,907**	**600,999,527**	**204,359,779,434**
	ව්‍යාපාර කොටස් සහ වගකීම්							
	ව්‍යාපාර කොටස							
	යෙදවූ ප්‍රාග්ධනය		7,591,379,785	-	7,591,379,785	7,591,379,785	-	7,591,379,785
	ප්‍රාග්ධන සංචිත		14,772,685,768	(14,060,647,535)	712,038,233	13,651,567,507	(13,539,029,274)	112,538,233
	වෙනත් සංචිත		1,125,903		1,125,903	1,125,903		1,125,903
	ණය නිවැරදි කිරීම් සංචිත		3,828,973,373	-	3,828,973,373	3,828,973,373	-	3,828,973,373
	නැවත අගය කළ සංචිත		76,429,013,944	-	76,429,013,944	76,480,827,873	-	76,480,827,873
	විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සංචිත		-	478,317,226	478,317,226	-	553,688,775	553,688,775
	රඳවාගත් උපයාගැනීම් (ණය ගැනීම්හි)		(15,510,137,516)	1,773,629,278	(13,736,508,238)	(15,034,926,191)	1,999,327,442	(13,035,598,749)
	මුළු ව්‍යාපාර කොටස්		**87,113,041,257**	**(11,808,701,032)**	**75,304,340,225**	**86,518,948,250**	**(10,986,013,057)**	**75,532,935,193**
	ජංගම නොවන වගකීම්							
	ණයට ගැනීම් - ශ්‍රී ලංකා රජය		111,904,320,057	-	111,904,320,057	96,706,752,538	-	96,706,752,538
	ණයට ගැනීම් - මූල්‍ය ආයතන		4,849,110,734	-	4,849,110,734	3,495,998,476	-	3,495,998,476
	රාජ්‍ය ප්‍රදානයන්		-	1,870,543,774	1,870,543,774	-	1,354,415,581	1,354,415,581
	විලම්භනය කළ බදු වගකීම්		-	12,114,566,119	12,114,566,119	-	12,114,566,119	12,114,566,119
	විශ්‍රාමයාමේ ප්‍රතිලාභ ගිවිසුම්		4,454,364,510	(2,016,937,379)	2,437,427,131	4,779,398,784	(1,958,609,903)	2,820,788,881
	මුළු ජංගම නොවන වගකීම්		**121,207,795,301**	**11,968,172,514**	**133,175,967,815**	**104,982,149,798**	**11,510,371,797**	**116,492,521,595**
	ජංගම වගකීම්							
	වෙළඳ සහ වෙනත් ණය හිමියන්		715,813,160	-	715,813,160	583,665,568	-	583,665,568
	ණයට ගැනීම් - ශ්‍රී ලංකා රජය		4,932,194,888	-	4,932,194,888	4,959,207,490	-	4,959,207,490
	ණයට ගැනීම් - මූල්‍ය ආයතන		1,436,884,294	-	1,436,884,294	-	-	-
	තැන්පතු සහ ලැබූ අත්තිකාරම්		5,423,092,876	-	5,423,092,876	4,861,849,739	-	4,861,849,739
	ගෙවිය යුතු වත්මන් බදු		349,925,285	-	349,925,285	310,482,910	-	310,482,910
	ප්‍රතිපාදන සහ උපචිත වියදම්		1,527,450,812	69,390,796	1,596,841,607	1,542,476,152	76,640,787	1,619,116,939
	මුළු ජංගම වගකීම්		**14,385,361,312**	**69,390,796**	**14,454,752,110**	**12,257,681,860**	**76,640,787**	**12,334,322,647**
	මුළු ව්‍යාපාර කොටස් සහ වගකීම්		**222,706,197,869**	**228,862,280**	**222,935,060,148**	**203,758,779,906**	**600,999,527**	**204,359,779,434**

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.)

			2011		2011	2011 ජනවාරි 01		2011 ජනවාරි 01
			SLAS යටතේ	ගැළපීම්	SLFRS යටතේ	SLAS යටතේ	ගැළපීම්	SLFRS යටතේ
	කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය							
39.2	අධිකාරිය							
	වත්කම්							
	ජංගම නොවන වත්කම්							
	දේපල, පිරියත සහ උපකරණ	I	202,807,499,941	(335,047,132)	194,463,219,630	180,093,787,599	-	171,873,191,648
	අස්පර්ශනීය වත්කම්	II	-	76,926,296	521,993,078	-	30,416,630	670,586,953
	ආයෝජන වත්කම්	III	-	-	7,564,166,395	-	-	7,580,425,628
	උප සමාගම් වල ආයෝජනය		1,000,000	-	1,000,000	1,000,000	-	1,000,000
	ආශ්‍රිත සමාගම් වල කළ ආයෝජන		40,030	-	40,030	40,030	-	40,030
	විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම්	IV	598,758,763	478,317,226	1,077,075,989	598,757,263	553,688,775	1,152,446,038
	රඳවාගත් කල්පිරුණු ආයෝජන	V	1,788,143,962	-	1,788,143,962	1,788,669,241	-	1,788,669,241
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු	VI	262,801,091	-	262,801,091	294,986,521		294,986,521
	මුළු ජංගම නොවන වත්කම්		**205,458,243,787**	**220,196,389**	**205,678,440,174**	**182,777,240,653**	**584,105,405**	**183,361,346,058**
	ජංගම වත්කම්							
	වට්ටෝරු භාණ්ඩ	VII	1,694,585,948	-	1,694,585,948	2,543,913,808	-	2,543,913,808
	වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ	VIII	2,224,391,460	8,776,560	2,233,168,020	2,243,623,290	17,339,890	2,260,963,180
	නැන්පතු සහ අත්තිකාරම්		950,579,064	-	950,579,064	4,313,898,308	-	4,313,898,308
	පෙර ගෙවූ වියදම්		108,403,249	-	108,403,249	64,479,492	-	64,479,492
	සේවක ණය		3,730,344,695	-	3,730,344,695	4,610,445,972	-	4,610,445,972
	වෙනත් මූල්‍ය වත්කම්	X	7,669,593,112	-	7,669,593,112	6,566,931,408	-	6,566,931,408
	මුදල් සහ මුදල් සමක		689,123,726	-	689,123,726	497,324,681	-	497,324,681
	මුළු ජංගම වත්කම්		**17,067,021,254**	**8,776,560**	**17,075,797,814**	**20,840,616,959**	**17,339,890**	**20,857,956,849**
	මුළු වත්කම්		**222,525,265,041**	**228,972,949**	**222,754,237,988**	**203,617,857,612**	**601,445,295**	**204,219,302,907**
	ව්‍යාපාර කොටස් සහ වගකීම්							
	ව්‍යාපාර කොටස							
	යෙදවූ ප්‍රාග්ධනය		7,591,379,785	-	7,591,379,785	7,591,379,785	-	7,591,379,785
	ප්‍රාග්ධන සංචිත	XI	14,772,685,768	(14,060,647,534)	712,038,233	13,651,567,507	(13,539,029,274)	112,538,233
	වෙනත් සංචිත		1,125,903	-	1,125,903	1,125,903	-	1,125,903
	ණය නිදහස් කිරීමේ සංචිත		3,828,973,373	-	3,828,973,373	3,828,973,373	-	3,828,973,373
	ප්‍රතිප්‍රමාණන සංචිත		76,429,013,944	-	76,429,013,944	76,480,827,873	-	76,480,827,873
	විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් සංචිත	IV	-	478,317,226	478,317,226	-	553,688,775	553,688,775
	රඳවාගත් උපයාගැනීම් (ණය ගැනීම්)		(15,706,122,495)	1,771,817,930	(13,934,304,565)	(15,167,380,908)	1,999,223,090	(13,168,157,819)
	මුළු ව්‍යාපාර කොටස්		**86,917,056,278**	**(11,810,512,379)**	**75,106,543,899**	**86,386,493,533**	**(10,986,117,409)**	**75,400,376,123**
	ජංගම නොවන වගකීම්							
	ණයට ගැනීම් - ශ්‍රී ලංකා රජය	XII	111,904,320,057	-	111,904,320,057	96,706,752,538	-	96,706,752,538
	ණයට ගැනීම් - මූල්‍ය ආයතන		4,847,451,155	-	4,847,451,155	3,495,998,476	-	3,495,998,476
	රාජ්‍ය ප්‍රදානයන්	XI	-	1,870,543,774	1,870,543,774	-	1,354,415,581	1,354,415,581
	විලම්භනය කළ බදු වගකීම්	XI	-	12,114,566,119	12,114,566,119	-	12,114,566,119	12,114,566,119
	විශ්‍රාමයාමේ ප්‍රතිලාභ ගිවිසුම්	XIII	4,450,414,828	(2,015,015,362)	2,435,399,469	4,776,441,210	(1,958,059,783)	2,818,381,427
	මුළු ජංගම නොවන වගකීම්		**121,202,186,040**	**11,970,094,531**	**133,172,280,574**	**104,979,192,224**	**11,510,921,917**	**116,490,114,141**
	ජංගම වගකීම්							
	වෙළඳ සහ වෙනත් ණය හිමියන්		733,071,211	-	733,071,211	580,652,317	-	580,652,317
	ණයට ගැනීම් - ශ්‍රී ලංකා රජය	XII	4,932,194,888	-	4,932,194,888	4,959,207,490	-	4,959,207,490
	ණයට ගැනීම් - මූල්‍ය ආයතන		1,436,281,824	-	1,436,281,824	-	-	-
	නැන්පතු සහ ලැබූ අත්තිකාරම්		5,437,087,857	-	5,437,087,857	4,873,029,870	-	4,873,029,870
	ගෙවිය යුතු වත්මන් බදු		344,245,840	-	344,245,840	300,741,841	-	300,741,841
	ප්‍රතිපාදන සහ උපචිත වියදම්	XIV	1,523,141,104	69,390,796	1,592,531,899	1,538,540,339	76,640,787	1,615,181,126
	මුළු ජංගම වගකීම්		**14,406,022,721**	**69,390,796**	**14,475,413,519**	**12,252,171,858**	**76,640,787**	**12,328,812,645**
	මුළු ව්‍යාපාර කොටස් සහ වගකීම්		**222,525,265,041**	**228,972,949**	**222,754,237,988**	**203,617,857,612**	**601,445,295**	**204,219,302,907**

දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.)

		2011 SLAS යටතේ	ගැළපීම්	2011 SLFRS යටතේ
40	**සම්පූර්ණ ආදායම් ප්‍රතිසංධානය**			
40.1	**සමූහය**			
	ලැබීම්	27,784,632,620	(17,145,711)	27,767,486,909
	සෘජු වියදම්	(15,882,405,435)	(389,598,236)	(16,272,003,671)
	දළ ලාභය	**11,902,227,185**	**(406,743,947)**	**11,495,483,238**
	වෙනත් මෙහෙයුම් ආදායම්	2,798,697,275	3,666,397	2,802,363,672
	පරිපාලන වියදම්	(13,170,559,099)	(73,414,510)	(13,243,973,609)
	මෙහෙයුම් ලාභ	**1,530,365,361**	**(476,492,060)**	**1,053,873,301**
	ශුද්ධ මූල්‍ය වියදම්	(684,334,775)	(48,047,918)	(732,382,693)
	ආශ්‍රිත වල ලාභ කොටස	7,876,342	-	7,876,342
	බදු වලට පෙර ලාභ	**853,906,930**	**(524,539,978)**	**329,366,950**
	ආදායම් බදු වියදම්	(206,994,530)	-	(206,994,530)
	වර්ෂය සඳහා ලාභය	**646,912,400**	**(524,539,978)**	**122,372,420**
	මව් සමාගම් කොටස්කරුවන් හට පැවරිය හැකි කොටස්	**646,912,400**	**(524,539,978)**	**122,372,420**
	වර්ෂය සඳහා ලාභය	647,019,353	(524,646,933)	122,372,420
	වෙනත් සවිස්තරාත්මක ලැබීම්			
	විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් වල අගයේ වෙනස	-	(75,371,549)	(75,371,549)
	වර්ෂය සඳහා මුළු සවිස්තරාත්මක ආදායම	**647,019,353**	**(600,018,482)**	**47,000,871**
40.2	**අධිකාරිය**			
	ලැබීම්	27,542,063,756	(17,145,711)	27,524,918,045
	සෘජු වියදම්	(15,873,251,723)	(389,598,236)	(16,262,849,959)
	දළ ලාභය	**11,668,812,033**	**(406,743,947)**	**11,262,068,086**
	වෙනත් මෙහෙයුම් ආදායම්	2,846,412,078	5,490,068	2,851,902,146
	පරිපාලන වියදම්	(13,043,835,458)	(73,544,330)	(13,117,379,788)
	මෙහෙයුම් ලාභ	**1,471,388,653**	**(474,798,209)**	**996,590,444**
	ශුද්ධ මූල්‍ය වියදම්	(689,057,796)	(50,662,672)	(739,720,468)
	බදු වලට පෙර ලාභ	**782,330,857**	**(525,460,881)**	**256,869,976**
	ආදායම් බදු වියදම්	(199,634,813)	-	(199,734,813)
	වර්ෂය සඳහා ලාභ	**582,696,044**	**(525,460,880)**	**57,135,163**
	මව් සමාගම් කොටස්කරුවන් හට පැවරිය හැකි කොටස්	**582,696,044**	**(525,460,880)**	**57,135,163**
	වර්ෂය සඳහා ලාභය	582,596,044	(525,460,881)	57,135,163
	වෙනත් සවිස්තරාත්මක ලැබීම්			
	විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් වල අගයේ වෙනස	-	(75,371,549)	(75,371,549)
	වර්ෂය සඳහා මුළු සවිස්තරාත්මක ආදායම	**582,596,044**	**(600,832,431)**	**(18,236,386)**

කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය වෙනුවෙන් සටහන්

කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය වෙනුවෙන් සටහන්

I ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන

මින් පෙර මෙහෙයුම් උපකරණ වල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණු නමුදු 2011 වාර්තා කරනු ලබන කාල සීමාව තුළ වත්කම් භාවිතා කිරීම සඳහා පැවතුණි. කෙසේ නමුත් SLFRSs සමහ සංයන්ධනය කිරීමේදී ඉහත සඳහන් කාල පරිච්ඡේදය සඳහා ප්‍රතිපාදන සළසා තිබුණි.

අධිකාරිය	SLAS අනුව	SLFRSs අනුව	ගැළපීම්
මෙහෙයවීම් සඳහා වන ප්‍රතිපාදන	-	335,047,132	335,047,132

II අස්පෘශ්‍ය වත්කම්

(අ) ප්‍රයෝජනවත් ආයුකාලය නැවත ගණනය කිරීම

SLFRSs යටතේ ඇතැම් පරිගණක මෘදුකාංග වල ප්‍රයෝජනවත් ආයු කාලය වෙනස් වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2011 වාර්තා කිරීමේ කාල සීමාව සඳහා ණය හිලව් කිරීම ප්‍රත්‍යාක්ෂණව ඇස්තමේන්තු කර ඇත.

අධිකාරිය	2011	2010
ණය හිලව් කිරීම		
SLAS අනුව	391,728,419	171,816,587
SLFRs අනුව	314,802,123	141,399,957
ගැළපීම්	**76,926,296**	**30,416,630**

(ආ) පරිගණක මෘදුකාංග නැවත වර්ගීකරණය

මින් පෙර පරිගණක මෘදුකාංග දේපළ, පිරියත සහ උපකරණ යටතේ වර්ග කර ඇත. කෙසේ නමුත් එම දේපළ SLFRSs සමහ අනුකූල වෙමින් අස්පෘශ්‍ය වත්කම් වශයෙන් නැවත වර්ගීකරණය කර ඇත.

අධිකාරිය			2011	2010
දේපළ, පිරියත සහ උපකරණ	අස්පෘශ වත්කම් වෙත			
මගින් නැවත වර්ගීකරණය	නැවත වර්ගීකරණය	ගෙන ආ ශුද්ධ අගය	521,993,078	670,586,953

III ආයෝජන වත්කම්

මින් පෙර කුලී ඉපැයීම් සඳහා රඳවාගත් කුලියට ලබාදුන් දේපල, පිරියත සහ උපකරණ යටතේ වර්ගීකරණය කර ඇත. කෙසේ නමුත් එම දේපල SLFRSs වලට අනුකූලව ආයෝජන වත්කම් වශයෙන් නැවත වර්ගීකරණය කර ඇත.

අධිකාරිය			2011	2010
දේපළ, පිරියත සහ උපකරණ	ආයෝජන දේපල			
මගින් නැවත වර්ගීකරණය	නැවත වර්ගීකරණය	ගෙන ආ ශුද්ධ අගය	7,564,166,395	7,580,425,628

IV මූල්‍ය වත්කම් - විකිණීම් සඳහා ඇති (AFS)

SLAS පෙර වියදම් යටතේ ගිණුම්ගත කර ඇත දීර්ඝ කාලීන විකිණිය හැකි ව්‍යාපාර කොටස් SLFRS යටතේ විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් වශයෙන් නම් කර ඇති අතර සාධාරණ අගයට තක්සේරු කිරීම වෙනුවෙන් විකිණීම් සඳහා ඇති එවැනි ආයෝජන අවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර සඳහන් කළ පරිදි සාධාරණ අගය සහ ඉදිරියට ගෙන එන ලද අගය අතර වෙනස "විකිණීම සඳහා ඇති වෙන්කිරීම්" වශයෙන් හඳුනාගෙන ඇත.

අධිකාරිය	SLASයටතේ අගය ගෙන එනු ලබන අගය	SLFRS යටතේ ගෙන එනු ලබන අගය	සාධාරණ අගයේ වෙනස්කම් 2011	2010
සාධාරණ අගය වෙනස්වීම් මත ලාභ/(පාඩු)				
2010 දෙසැම්බර් 31 දිනට	18,885,150	572,573,925	-	553,688,775
2011 දෙසැම්බර් 31 දිනට	18,885,150	497,202,376	478,317,226	-
AFS වෙන්කිරීම් වල හඳුනාගත් ලාභ/(පාඩු)			**478,317,226**	**553,688,775**

කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය වෙනුවෙන් සටහන්

V **පරිණත වන තෙක් රඳවාගත් ආයෝජන HTM - ණය හිලව් කළ වියදමෙහි තක්සේරු කර ගෙන එනු ලබන අගය**

මුලදී ණයකර වල ආයෝජන වියදම සහ ලැබිය යුතු පොලිය ගිණුම්ගත කෙරුණි. ඒ අනුව වෙන් වෙන් රේඛීය අයිතමයක් වශයෙන් ගිණුම්ගත කෙරිණ. කෙසේ වෙතත් SLFRs ට අනුව පරිණත වන තෙක් රඳවාගත් ආයෝජන වශයෙන් ණයකර වල ආයෝජනයන් නම්කර ඇති අතර එලදායි පොලී අනුපාත ක්‍රමය භාවිතා කර ණය හිලව් කල වියදම තක්සේරු කෙරුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආයෝජන HTM වලින් ලැබිය යුතු පොලිය එවැනි ආයෝජනයන්හි ඉදිරියට ගෙන එන ලද වටිනාකම් සමඟ ගැලපුම් කර ඇත.

අධිකාරිය	SLAS යටතේ ගෙන එනු ලබන අගය	SLFRS යටතේ ගෙන එනු ලබන අගය	ප්‍රතිඵලදායක පොලිය මත ගැළපීම් 2011	2010
ණය හිලව් කිරීමේදී තක්සේරු කර ගෙ එනු ලබන අගය				
2010 දෙසැම්බර් 31 දිනට	1,742,970,000	1,788,669,241		45,699,241
2011 දෙසැම්බර් 31 දිනට	1,742,970,000	1,788,143,962	45,173,962	

VI **රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවෙන් ලැබිය යුතු මුදල**

මුලදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු මුදල් හා සම්බන්ධිත නිවාස ණය සඳහා බැංකුව වෙත හුවමාරු කල මුදල් ජංගම වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇත. වාර්තා කරනු ලබන කාලසීමාවෙන් පසු මාස 12ක් ඇතුළත ලැබිය යුතු දේ ඉටුකර ගැනීම බලාපොරොත්තු විය නොහැකි බැවින් ලැබිය යුතු දේ ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. SLFRSs හා අනුකූලවීමේදී ප්‍රතිඵලදායක පොලී අනුපාත ක්‍රමය භාවිතා කර ලැබිය යුතු දේ ණය හිලව් කළ වියදම් තුළ තක්සේරු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස එවැනි ලැබිය යුතු දේවල ගෙන එනු ලබන අගය

අධිකාරිය	SLAS යටතේ ගෙන එනු ලබන අගය	SLFRS යටතේ ගෙන එනු ලබන අගය	ප්‍රතිඵලදායක පොලිය මත ගැළපීම් 2011	2010
ණය හිලව් කිරීමේදී තක්සේරු කර ගෙන එනු ලබන අගය				
2010 දෙසැම්බර් 31 දිනට	292,152,191	294,986,521		2,834,330
2011 දෙසැම්බර් 31 දිනට	260,298,454	262,801,091	2,502,637	

VII **වට්ටෝරු භාණ්ඩ - මාර්ගස්ථ බඩු**

මුලදී ප්‍රාග්ධන වත්කම් සහ පාරිභෝජනය කිරීම සඳහා මිළදී ගැනීම් වෙනුවෙන් අත්තිකාරම් ගෙවීම් වට්ටෝරුගත භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇත. කෙසේ වෙතත් ප්‍රාග්ධන වියදම් සහ පාරිභෝජනය සමඟ අනුකූලවීම් මත අත්තිකාරම් සඳහා "නැන්පතු සහ අත්තිකාරම්" වශයෙන් මෙම

අධිකාරිය		2011	2010
වට්ටෝරුගත භාණ්ඩ වලින්	නැන්පතු සහ අත්තිකාරම් වලට		
නැවත වර්ගීකරණය	නැවත වර්ගීකරණය	233,282,731	330,744,796

VIII **වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ**

(අ) හානිකිරීම් සඳහා ප්‍රතිපාදන

හානිවීමේ ස්වභාවය හා පදනම වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස SLAs යටතේ හඳුනාගත් හානිවීම් සඳහා වන ප්‍රතිපාදන SLFRs අනුකූලව නැවත ගණනය සහ ගැලපුම් කරනු ලැබේ.

අධිකාරිය	2011	2010
SLAS යටතේ ප්‍රතිපාදන	356,057,179	415,193,583
SLFRSs යටතේ ප්‍රතිපාදන	358,861,680	403,252,523
(හිඟ)/අතිරික්ත ප්‍රතිපාදන ගැළපුම්	(2,804,501)	11,941,061

(ආ) අන්තර් වස්තු ජංගම ගිණුම් මත ගැළපුම් සිදුකිරීම - ජය බහළු පර්යන්තය

ජංගම ගිණුම් ශේෂයන් ප්‍රතිසංධානය කිරීම සඳහා අන්තර් - ඒකක ජංගම ගිණුම් - JCT වල ගැලපුම් කර ඇත.

SLAS අනුව	38,092,547	27,132,778
SLFRSs අනුව	49,673,609	32,531,607
ගැළපීම්	11,581,062	5,398,829
මුළු ගැළපුම්	**8,776,560**	**17,339,890**

කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය වෙනුවෙන් සටහන්

කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය වෙනුවෙන් සටහන්

ආ) උපචිත වියදම් මත සිදුකළ ගැලපීම් - ජය බහළු පර්යන්තයේ සිට අන්තර් ඒකක ජංගම ගිණුම් - ජය බහළු පර්යන්තය

මුලදී ජය බහළු පර්යන්තය වෙත ගෙවීමට සිදු වූ වියදම් සහ ගෙවිය යුතු දෑ උපචිත වියදම් යටතේ වර්ගීකරණය කර ඇත. කෙසේ වෙතත් SLFRSs සමඟ අනුකූල වීමේදී එවැනි වියදම් ජය බහළු පර්යන්තය සමඟ ජංගම ගිණුම් වල ගැලපීම් සිදුකර ඇත.

අධිකාරිය		2011	2010
උපචිත වියදම් වලින්	ජංගම ගිණුම් වෙත		
නැවත වර්ගීකරණය	නැවත වර්ගීකරණය - ජ.බ.ප.	580,000	340,000

IX සේවක ණය - සාධාරණ අගය මත තක්සේරු කළ ගෙන එන වටිනාකම් සහ ණය හිලව් කිරීමේදී පසුව සිදුකළ තක්සේරු

මුලදී උප සමාගම් වල සේවකයින්ගේ ණය සහන පොලී අනුපාත මත සපයා දී ඇති අතර වියදම් මත ගිණුම්ගත කෙරිණ. SLFRSs ට අනුකූලව ණය ලාබදුන් දිනයේ සිට වෙළඳපොළ පොලී අනුපාතයන් උපයෝගී කොටගෙන සාධාරණ අගය මත මුලිකවම තක්සේරු කර ඇත. ණය මුදලෙහි සාධාරණ අගය සහ මුලික මුදල අතර වෙනස පෙර ගෙවූ කාර්යය මණ්ඩල වියදම් වශයෙන් හඳුනාගැණිත. ඉන් අනතුරුව ප්‍රතිඵලදායක පොලී අනුපාතය උපයෝගී කරගනිමින් සේවක ණය හිලව් කළ වියදම් මත තක්සේරු කර ඇත.

සමූහය	SLAS යටතේ ගෙන එනු ලබන අගය	SLFRS යටතේ ගෙන එනු ලබන අගය	ප්‍රතිඵලදායක පොලිය මත ගැළපීම් 2011	2010
2010 දෙසැම්බර් 31 දිනට	-	-	-	-
2011 දෙසැම්බර් 31 දිනට	3,757,445,863	3,758,818,540	(1,372,677)	-
			(1,372,677)	-

X වෙනත් මූල්‍ය වත්කම් - ණය හිලව් කිරීමේ වියදම් මත තක්සේරු කර ගෙන එනු ලබන අගය

මුලදී වියදම් සහ ලැබිය යුතු පොලිය මත කෙටිකාලීන ආයෝජන ගිණුම්ගත කිරීම අනුව විවිධ වූ රේඛිය අයිතම වශයෙන් ගිණුම්ගත කෙරිණ. SLFRSs සමඟ අනුකූල වීමේදී සාධාරණ පොලී අනුපාත ක්‍රමය උපයෝගී කරගෙන කෙටිකාලීන ආයෝජන ණය හිලව් කිරීම් මත තක්සේරු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස එවැනි ආයෝජන ගෙනඒම පිළිඹිබු වන පරිදි කෙටිකාලීන ආයෝජන වලින් ලැබිය යුතු පොලී ගැළපීම් සිදුකර ඇත.

අධිකාරිය	SLASයටතේ අගය ගෙන එනු ලබන අගය	SLFRS යටතේ ගෙන එනු ලබන අගය	සාධාරණ අගයේ වෙනස්කම් 2011	2010
ණය හිලව් කිරීමේ අගය මත තක්සේරු කළ ගෙන එනු ලබන අගය				
2010 දෙසැම්බර් 31 දිනට	6,511,920,893	6,566,931,408		55,010,515
2011 දෙසැම්බර් 31 දිනට	7,612,891,705	7,669,593,112	56,701,407	

XI සංචිත

අ) නැවත වර්ගීකරණය

SLFRSs හි ඉල්ලීම් හේතුවෙන් සංචිතයේ විලම්භිත බදු වගකීම් හා රාජ්‍ය ප්‍රදානයන් ජංගම නොවන වගකීම් ලෙස නැවත වර්ගීකරණය කෙරිණ.

අධිකාරිය		2011	2010
සංචිතයෙන්	නැවත වර්ගීකරණය		
නැවත වර්ගීකරණය	ජංගම නොවන වගකීම්	12,114,566,119	12,114,566,119
රාජ්‍ය ප්‍රදානයන්	ජංගම නොවන වගකීම්	1,870,650,441	1,354,415,580
		13,985,216,560	**13,468,981,699**

ආ) දඩ අරමුදල් සංචිතයෙහි සිදුකළ ගැළපීම්

මුලදී වැරදි සහගත ක්‍රියාවන් වලට සේවකයින්ගෙන් අයකර එකතුකරගත් දඩ මුදල් සංචිත ලෙස ගිණුම්ගත කර ඇත.කෙසේ වෙතත් SLFRSs සමඟ අනුකූල වෙමින් අධිකාරිය ඒවා ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියට යලි තක්සේරු කෙරිණ. ඒ අනුව එකතු කරගත් දඩ වෙනත් ඒවා වශයෙන් හඳුනා ගැණිත.

දඩ මුදල් සංචිත	ආපසු ලැබීම් වලට	2011	2010
වලින් ගැළපීම්	ගැළපීම්	75,430,974	70,047,575
		14,060,647,534	13,539,029,274

කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය වෙනුවෙන් සටහන්

XII ණයට ගැනීම්

මුලදී ණයගැනියන්ගෙන් ලැබුණු මූලික මුදල් සහ ගෙවිය යුතු පොලි වියදමෙහි ණයට ගැනීම් ගිණුම්ගතකර ඇත. ඒ අනුව ගෙවිය යුතු පොලිය වෙන්වූ රේවිය අයිතම වශයෙන් ගිණුම්ගත කර ඇත. SLFRSs හා අනුකූල වීමේදී ණයට ගැනීම් වෙනත් මූල්‍ය වගකීම් වශයෙන් නම්කර ඇති අතර ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කර ණය හිලව් කළ වියදමට තක්සේරු කෙරිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ණයට ගැනීම්හි ගෙවිය යුතු පොලිය ණයට ගැනීම් වල ඉදිරියට ගෙන ඒමේ අගය පිළිඹිබු වීමට ගැලපීම් සිදුකර ඇත.

ශ්‍රී ලංකා රජය

අධිකාරිය	SLAS යටතේ ගෙනඒමේ අගය	SLFRS යටතේ ගෙනඒමේ අගය	ඵලදායී පොලිය මත ගැලපීම් 2011	2010
ණය හිලව් කළ අගයට ගණනය කරන ලද ඉදිරියට ගෙන ආ අගය				
2010 දෙසැම්බර් 31 දිනට	101,302,891,512	101,665,960,028		363,068,516
2011 දෙසැම්බර් 31 දිනට	116,479,442,571	116,836,514,945	357,072,374	
			357,072,374	363,068,516

XIII විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ වගකීම

මුලදී සම්පූර්ණ කරන ලද සේවා කාලයෙන් අර්ධ මාසික වැටුප ගණනය කිරීමේ පදනම මත කණ්ඩායම විසින් විශ්‍රාම ගැන්වීමේ වගකීම තීරණය කෙරිණ. SLRFSs සමඟ අනුකූල වීමේදී සුදුසුකම් ලත් පවත්නා උපදේශනය භාවිතාකර විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ වගකීම තක්සේරු කිරීමටත් ඒකක ණය ක්‍රමය ආරක්ෂා කරනු පිණිසත් භාවිතා කරන ලද එහි නිර්නායකයන් කණ්ඩායම විසින් වෙනස් කෙරිණ. ගිණුම්කරණ ප්‍රතිපත්ති වගකීම් ගණනය කිරීම සඳහා වෙනස්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2012 - 2011 වාර්තාකරණ කාල සීමාවේ දී ප්‍රෙත්‍යාක්ෂණ ලෙස ගැළපුම් කර ඇත.

	සමූහය		අධිකාරිය	
	2011	2010	2011	2010
SLAS අනුව ගෙන එනු ලබන වටිනාකම	4,454,364,510	4,779,398,784	4,450,414,828	4,776,441,210
SLFRSs අනුව ගෙන එනු ලබන වටිනාකම	2,437,427,131	2,820,788,881	2,435,399,469	2,818,381,427
ගැළපුම්	**2,016,937,379**	**1,958,609,903**	**2,015,015,359**	**1,958,059,783**

XIV ප්‍රතිපාදන සහ උපචිත වියදම්

මුලදී නීතිමය හිමිකම් සඳහා සාමාන්‍ය ප්‍රතිපාදන එකක් පමණක් සළසා ඇත. කෙසේ නමුත් SLRFSs සමඟ අනුකූලවීමේදී SLRFSs මගින් විශේෂයෙන් සඳහන් කළ ප්‍රතිපාදන සම්බන්ධයෙන් වූ මිණුම් දණ්ඩ පදනම් කරගත් එවැනි හිමිකම් සඳහා ප්‍රතිපාදන හඳුනාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2010 සහ 2011 වාර්තාකරනු ලබන කාලසීමාව සඳහා කරන ලද වැඩිපුර ප්‍රතිපාදන ප්‍රත්‍යාක්ෂණ ලෙස ගළපා ඇත.


මුලදී (භාවිතා නොකළ නිවාඩු) හි අපේක්ෂිත වියදම සඳහා වගකීම අධිකාරිය විසින් හඳුනා නොගැණින. කෙසේ වෙනත් SLRFSs සමඟ අනුකූල වීමේදී ප්‍රතිපාදන සිදුකර ඇත.


අධිකාරිය	SLAS යටතේ ගෙනඒමේ වටිනාකම		SLFRSs යටතේ ගෙනඒමේ වටිනාකම		වැඩි/(අඩු) ප්‍රතිපාදන	
	2011	2010	2011	2010	2011	2010
නීතිමය හිමිකම සඳහා ප්‍රතිපාදන	245,275,087	288,684,561	8,160,174	935,560	(237,114,913)	(287,749,001)
කෙටිකාලීන හානිපූර්ණය කරන ලද සේවයට වාර්තා	-	-	306,505,709	364,389,788	306,505,709	364,389,788
ව්‍යාපාර වස්තු වල සම්පූර්ණ ගැලපීම්					**69,390,796**	**76,640,787**


කොටස්කරුවන්ගේ ව්‍යාපාර වස්තු ප්‍රතිසංධානය වෙනුවෙන් සටහන්


XV	**සවිස්තරාත්මක ආදායමෙහි වෙනස්වීමේ සාරාංශය**		
	සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙහි සිදුකරන ලද ගැලපීම් පහතින් දක්වා ඇත.		
		සමූහය	අධිකාරිය
		2011	**2011**
	SLAS යටතේ සවිස්තරාත්මක ආදායමෙහි එකතුව	**647,019,353**	**582,596,044**
	පසුගිය වසරේ ගැලපීම් වල ක්ෂයවීම් සහ වෙනස්වීම්හි ප්‍රතිපාදන යටතේ ගැලපීම්	(446,862,156)	(446,862,156)
	නීතිමය හිමිකම් සඳහා අතිරේක ප්‍රතිපාදන	(50,634,088)	(50,634,088)
	වෙළඳ ලැබීම් වල හානිකිරීම් වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන	(14,745,562)	(14,745,562)
	වැඩිපුර ප්‍රතිපාදන වල වෙනස්වීම් සඳහා - කෙටි කාලීන හානිපූර්ණය කරන ලද සේවයට වාර්තා කිරීම	57,884,079	57,884,079
	- විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ වගකීම	57,085,399	56,955,579
	අස්පෘශ්‍ය වත්කම් වල ප්‍රයෝජනවත් ආයුකාලයෙහි නැවත තක්සේරු කිරීම පිණිස ගැලපීම්	46,509,666	46,509,666
	ජංගම වත්කම් ප්‍රතිසංධානය කිරීම සිදුකිරීමට ගැලපීම් - ජ.බ.ප	6,182,232	6,182,232
	ප්‍රදානයන් අයකර ගැනීමේ ණය හිලව් කිරීම්	106,667	106,667
	පසුගිය වසර ගැලපුම් කිරීමේ වෙනස්වීම් වල ප්‍රතිඵලයක් වශයෙන් ආදායමට ගැලපීම්	5,383,401	5,383,401
	එකතු කළ දඩ මුදල් අනෙක් ආදායම් ලෙස හඳුනාගැනීම	(17,145,711)	(17,145,711)
	පසුගිය වසර ගැලපුම්හි වෙනස්වීම් වල ප්‍රතිඵලයක් ලෙස ඉඩම් මත පොලී වියදමට ගැලපීම	(50,662,672)	(50,662,672)
	ආරක්ෂක අංශ වලින් වෙළඳ ලැබිය යුතු දේ ලියා ඉවත්කිරීම	(118,432,316)	(118,432,316)
	සේවක ණය මත ඵලදායක පොලියෙහි ගැලපීම්	2,614,753	-
	ආශ්‍රිත සහ උප සමාගම් වලින් ලැබුණු ලාභාංශ මත ගැලපීම්	(1,823,671)	-
	ආශ්‍රිත සමාගම් වලින් කොටස් හුවමාරු කිරීම මත ගැලපීම්	(106,953)	-
	විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වල අගය වෙනස් කිරීම	(75,371,549)	(75,371,549)
	SLFRS/LKAS යටතේ සවිස්තරාත්මක ආදායමෙහි එකතුව	**47,000,871**	**(18,236,387)**


දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා






මෙහෙයුම් හා වෙනත් වියදම්
35,000
30,000
25,000
20,000
15,000
10,000
5,000
0
-5,000
රු. මිලියන
2012 වියදම රුපියල් මිලියන වලින්
2011 වියදම රුපියල් මිලියන වලින්
වැඩිවීම (අඩුවීම)
%
වියදම්


මෙහෙයුම් නැවිබඳු ප්‍රමාණය විශ්ලේෂණය (මෙ.ටො.)
කොළඹ වරාය (ශ්‍රී ලං ව අ + එස් ඒ පී ටී)
තොගකඩන, තොග හා ද්‍රව 18%
ප්‍රතිනැවිගත බහළු 65%
අභ්‍යන්තරික බහළු 17%
ප්‍රතිනැවිගත බහළු
අභ්‍යන්තරික බහළු
තොගකඩන, තොග හා ද්‍රව


මෙහෙයුම් ආදායම පිළබඳ විශ්ලේෂණය
වරායයන් තුනෙහිම
ප්‍රතිනැවිගත බහළු 17%
වෙනත් 40%
තොග කඩන, තොග හා ද්‍රව 8%
අභ්‍යන්තරික බහළු 35%
ප්‍රතිනැවිගත බහළු
අභ්‍යන්තරික බහළු
තොග කඩන, තොග හා ද්‍රව
වෙනත්

ටීසිබී/එස්එල්ඊඒ/එෆ්ඒ/2012 **2014 පෙබරවාරි 17 දින**

සභාපති
ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගමේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගමේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 33 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2013 නොවැම්බර් 19 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත්

අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 පරිපාලිත හා ආශ්‍රිත සමාගම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව පරිපාලිත සමාගමක් ලෙස සීමාසහිත ජයබහළු පර්යන්ත සමාගමත්, ආශ්‍රිත සමාගමක් ලෙස සීමාසහිත වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගමත් පැවතුන අතර මේවායේ හිමිකම් පිළිවෙලින් 100%ක් සහ 39.97%ක් ලෙස පැවතුණි.

මෙම සමාගම් දෙකෙහි විගණනය ප්‍රසිද්ධ ගණකාධිකාරි වෘත්තියේ නියැලී සිටින වරලත් විගණන සමාගම් දෙකක් මගින් සිදුකර තිබුණි.

1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

2.1.1 මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.1.2 මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බැලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්තවයක් පිළිබිඹු කරන බව මා දන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ ප්‍රමිති 07 ප්‍රකාර ගිණුම් වර්ෂය අවසාන වන දිනට මූල්‍ය උපකරණ වල සාධාරණ අගය (Fair Value) ගණනය කිරීමේ දී පැන නගින අවදානම් ස්වභාවය හා ප්‍රමාණය ද ඒ සම්බන්ධයෙන් ගනු ලබන කළමනාකරණ ක්‍රියාමාර්ග ද මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කළ යුතු වුවත්, එකී අවදානම් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ප්‍රකාර කඩා ඉවත් කළ ගොඩනැඟිලි වල වටිනාකම් හා ඉවත් කිරීමට නියමිත ගොඩනැඟිලි වල වටිනාකම් දේපළ, පිරියත හා උපකරණ ගිණුම් ශේෂ වලින් අපහරණය කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නීරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ, ගාල්ල හා ත්‍රිකුණාමලය වරායන් වල වාර්ෂික මෙහෙයුම් ප්‍රතිඵල වෙන වෙනම ගණනය කර ඉදිරිපත් කර තිබුණ ද හම්බන්තොට වරාය සඳහා වෙනම මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ හම්බන්තොට වරායේ මෙහෙයුම් ආදායම් හා වියදම් කොළඹ වරායේ මෙහෙයුම් ආදායම් හා වියදම් සමඟ එකට ගළපා තිබීම හේතුවෙන් කොළඹ හා හම්බන්තොට වරායන්හි තථ්‍ය වාර්ෂික මෙහෙයුම් ප්‍රතිඵලය වෙන් වෙන්ව හඳුනාගත නොහැකි වී තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නීරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රක්ෂිත වටිනාකම රු.597,854,000ක් වූ මෙහෙයුම් ගොඩනැඟිලි සහ රු.1,646,000ක් වූ විදුලි හා විද්‍යුත් උපකරණ පෞද්ගලික සේවා සමාගමක් විසින් 2008 ජූලි මාසයේ දී වරාය අධිකාරියට පවරා දී තිබුණි. මෙම වත්කම් 2008, 2009 සහ 2010 වර්ෂ තුළ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී එකී වත්කම් පිළිගත් තක්සේරුකරුවෙකු ලවා ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව රක්ෂිත වටිනාකමට ගිණුම්ගත කර තිබුණි.

(ආ) වර්ෂ 51/2කට පෙර රේඛීය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ කාර්ය මණ්ඩලයේ පරිහරණයට දෙන ලද රුපියල් මිලියන 2ක් වටිනා වාහනයක් අනතුරකට භාජනය වීම හේතුවෙන් නැවත භාවිතයට ගත නොහැකි වන පරිදි විනාශයට පත් වී තිබුණි. එකී වාහනය සඳහා වූ අලාභය රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය කර ගැනීමට හා පොත් වලින් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම වාහනය සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බව සභාපතිවරයා විසින් දන්වා ඇත.

(ඇ) කන්කසන්තුරය වරායේ දියකඩනයේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ගෙවා තිබූ රු.4,715,000ක් වූ මුදලින් කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදුකර නොතිබුණි. එම මුදල ලැබිය යුතු අත්තිකාරම් මුදලක් ලෙස පෙන්නුම් කිරීම වෙනුවට වියදම් ලෙස කපාහැර තිබුණි.

(ඈ) මිළදි ගැනීම් සඳහා ලබා දී තිබූ රු.1,590,057ක් වූ අත්තිකාරම් මුදලින් භාණ්ඩ හා සේවා ලබාගෙන තිබුණ ද ඒවා වියදම් ලෙස ගිණුම් ගතකිරීම වෙනුවට වසර 04ක කාලයක් තිස්සේ අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශය අනුව 2012 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පිළිවෙලින් රු.20,808,894,876ක් සහ රු.4,467,833,192ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු රු.243,462,030ක් සඳහා ශේෂ තහවුරු කිරීමේ ලිපි යවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂ වලින් රු.188,267,940ක් වටිනා ශේෂ සඳහා පමණක් ශේෂ සනාථ කිරීමේ ලිපි යවා තිබුණි. එය මුළු ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන් ආසන්න වශයෙන් සියයට 4ක ප්‍රමාණයක් විය.

(ඇ) නැව් නියෝජිත ආයතන වලින් 2012 දෙසැම්බර් 31 දිනට රු.776,329,102ක් වූ ලැබියු යුතු සහ රු.238,006,720ක් වූ ගෙවිය යුතු ශේෂ ගැළපීමෙන් පසු ශුද්ධ අගය ලෙස රු.538,322,382ක් දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නීතිමය කටයුතු වලට යොමු කර තිබූ නැව් නියෝජිත ණයගැතියන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂයකට වැඩි පැරණි ශේෂ වල එකතුව රු.272,815,237ක් වී තිබුණි.

(ii) රාජ්‍ය ආයතන වලින් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය තුළ වර්ෂ 01 සිට 04 අතර කාලයක සිට පැවත එන පැරණි ණය ශේෂ රු.24,153,565ක් ද වර්ෂ 5ට වැඩි පැරණි අයවිය යුතු ණය ශේෂය රු.21,168,033ක් ද වී තිබුණි.

(ඈ) ප්‍රාග්ධන වියදම් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබුණු අත්තිකාරම් මුදලින් 2012 දෙසැම්බර් 31 දිනට නොපියවන ලද වර්ෂ 5ක් ඉක්ම වූ ශේෂය රු.5,719,890ක් විය.

(ඉ) වෙළඳ නොවන ණයගැතියන් යටතේ දැක්වෙන අධිකාරිය විසින් දේපළ හා සුභසාධන ආපනශාලා පවත්වාගෙන යාම වෙනුවෙන් ලබාදුන් පරිශ්‍ර වල විදුලි පරිභෝජනය වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.80,956,850ක් වූ ශේෂය තුළ වර්ෂ 5ක් ඉක්ම වූ ශේෂය රු.1,943,983ක් විය.

(ඊ) වෙළඳ නොවන ණයගැතියන් යටතේ දැක්වෙන අධිකාරිය සතු පරිශ්‍ර කුලියට හා බද්දට දීම වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු මුදල් හා කුලී ආදායම් ශේෂය තුළ වර්ෂ 5ක් ඉක්ම වූ ශේෂය රු.31,892,451ක් විය.

(උ) නැව් නියෝජිතයින්ගෙන් නියමිත පරිදි මුදල් අයකර ගැනීමකින් තොරව සේවා සපයා තිබීම හේතුවෙන් ත්‍රිකුණාමලය වරායේ නැව් නියෝජිත ආයතන වලින් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.48,480,202ක් වූ මුදලින් රු.11,976,498ක් එනම් සියයට 25ක් බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සළසා තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාණිජ පදනමින් පවත්වාගෙන යනු ලැබූ ජෙට් ලයිනර් නෞකාවේ මෙහෙයුම් කටයුතු සඳහා අධිකාරියෙන් සළසන ලද සේවාවන් සඳහා 2009 වර්ෂයෙන් පසු අයවිය යුතු රු.15,828,326ක් 2013 අගෝස්තු 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

ඉහත කරුණු සළකා බැලීමේදී අධිකාරියේ ණය අයකර ගැනීම් සහ ණය පියවීම් ක්‍රියාවලිය ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. මෙම තත්ත්වය අධිකාරියේ ද්‍රවශීලතාවයට ද අහිතකර ලෙස බල නොපැවැත්වේය යන්න බැහැර කළ නොහැකි විය.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

විෂයය	වටිනාකම රු.000'	ඉදිරිපත් නොවූ සාක්ෂි
රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ගුවන් විදුලි දත්ත ජාලය	60,739	ශේෂ සනාථ කිරීම්
අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කළයුතු වියදම්	1,798	- එම -
අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු	1,761	- එම -
ක්‍රියාත්මක භාණ්ඩ වෙන්දේසි	(353,321)	- එම -

2.2.6 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

	නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ)	2000 අංක 38 දරණ දේශීය ආදායම් පනත 111(අ) වගන්තිය	ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුප් සහ අනෙකුත් ඉපැයීම් වෙනුවෙන් උපයන විට බදු ගෙවීම් පුද්ගලිකව වැටුපෙන් ගෙවිය යුතු වුව ද 2008 වර්ෂයේ සිට 2012 වසර දක්වා වසර 5ක් සඳහා එකතුව රුපියල් මිලියන 1,998ක් වූ උපයන විට ගෙවීම් බදු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවා තිබුණි.
(ආ)	2012 ඔක්තෝබර් 24 දිනැති අංක එෆ්ඩී/එෆ්ඒ/සි/41/2012 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාර තෙවන පාර්ශ්වීය ශේෂ සනාථ කිරීම සඳහා 2012 ජනවාරි 31 දිනට පෙර විගණන අංශය වෙත අදාළ ලිපි භාරදිය යුතු වුවත්, වටිනාකම රු.158,056,334ක් වූ ශේෂ සනාථ කිරීම් ලිපි 74 විගණන අංශය වෙත ඉදිරිපත් කර තිබුණේ 2013 අප්‍රේල් 03 දින දී ය.
(ඇ)	2008 ජූනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	(i) චක්‍රලේඛයට පටහැනිව නිල වාහන සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 44 දෙනෙකු වෙත රු.40,000 බැගින් මාසික දීමනාවක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට

එසේ ගෙවන ලද මුළු දීමනාව රු.20,720,000ක් විය.

(ii) චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව නිල වාහන සඳහා හිමිකම් ඇති නිලධාරීන් 5 දෙනෙකුට රු.30,000ක් වූ මාසික දීමනාව වෙනුවට රු.40,000 බැගින් ගෙවා තිබිණි. වැඩිපුර ගෙවා තිබූ මුදල රු.920,000ක් විය.

(iii) චක්‍රලේඛයට පටහැනිව නිල වාහන සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 29 දෙනෙකුට මාසිකව ලීටර් 150ත් 180ත් අතර ඉන්ධන ප්‍රමාණයක් ලබා දී තිබුණි. වැඩිපුර ගෙවා තිබූ ඉන්ධන වල වටිනාකම රු.6,468,142ක් විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ සමුහයේ මෙහෙයුම් කටයුතු වලින් බදු වලට පසු රුපියල් මිලියන 4,167.74ක ශුද්ධ ලාභයක් ලබා තිබුණු අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු වලින් බදු වලට පසු රුපියල් මිලියන 122.37ක ශුද්ධ ලාභයක් ලබා තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී බදු වලට පසු ශුද්ධ ලාභය රුපියල් මිලියන 4,045.37කින් වාසිදායක ලෙස වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාකාරකම් හා වෙනත් ආදායම් වල රුපියල් මිලියන 6,765ක වර්ධනය හා ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ වියදම් රුපියල් මිලියන 1,944කින් අඩුවීම එම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙකක් සඳහා සමූහයේ සංඛ්‍යාත්මක තොරතුරු පහත දැක්වේ.

	වර්ෂය		
	2012	**2011**	**2010**
මෙට්‍රික් ටොන් එකකට ශුද්ධ ලාභය රුපියල්	278	180	87
මුළු ආදායම රුපියල් මිලියන	37,341	30,577	28,512
මුළු වියදම රුපියල් මිලියන	32,039	30,248	29,701
බදු වලට පෙර ශුද්ධ ලාභය/(පාඩුව) රුපියල් මිලියන	5,302	329	(1,189)
ආදායම් බදු රුපියල් මිලියන	1,135	207	157
බදු වලට පසු ශුද්ධ ලාභය/(පාඩුව) රුපියල් මිලියන	4,167	122	(1,032)

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙකක් සඳහා වූ සමූහයේ ප්‍රමාණාත්මක අනුපාත සහ ප්‍රතිශත කිහිපයක් පහත දැක්වේ.

	වර්ෂය		
	2012	**2011**	**2010**
පිරිවැටුමට බදු පසු ලාභය/(අලාභය) සියයට	11.16	0.39	(3.62)
දීර්ඝ කාලීන ණය වලට ස්කන්ධ ප්‍රාග්ධනය සියයට	0.51	0.58	0.79
වත්කම් පිරිවැටුම සියයට	0.15	0.14	0.14
කාරක ප්‍රාග්ධන අනුපාතය	1:2.2	1:1.19	1:1.34
ක්ෂණික අනුපාත	1:1.06	1:0.78	1:1.13
ණය ස්කන්ධ අනුපාතය	1:1.89	1:1.64	1:1.21

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබුණු මෙහෙයුම් කටයුතු වලට අදාළ වූ සංඛ්‍යා ලේඛන හා වාර්තා විශ්ලේෂණය කිරීමේ දී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කොළඹ වරාය

(i) නාවික යාත්‍රා පැමිණීම (යාත්‍රා ගණන)

යාත්‍රා වර්ගය	වර්ෂය		විචලනය වාසි/(අවාසි)		
	2012	**2011**	**2010**	**2011/12**	**2010/11**
බහළු	3,092	3,187	3,076	(2.9)	3.6
සම්ප්‍රදායික	52	68	56	(23.5)	21.4
වෙනත්	726	869	778	(16.4)	11.7
	3,870	**4,124**	**3,910**	**(6.2)**	**5.5**

2010 වර්ෂය හා 2011 වර්ෂය සැසඳීමේදී කොළඹ වරායට නැව් පැමිණීම 214ක වැඩිවීමක් හෙවත් සියයට 5.5ක වර්ධනයක් පෙන්නුම් කළත් 2011 වර්ෂය හා 2012 වර්ෂය සැසඳීමේ දී නැව් පැමිණීම 254ක් හෙවත් සියයට 6.2කින් පිරිහී තිබුණි.

(ii) බහළු මෙහෙයුම් (විස්සේ සම ඒකක)

කොළඹ වරාය	වර්ෂය			විචලනය වාසි/(අවාසි)	
	2012	**2011**	**2010**	**2012/11**	**2011/10**
				%	**%**
දේශීය	1,020,255	1,046,886	932,244	(2.54)	12.30
ප්‍රතිනැව්ගත කිරීම් හා යළි ඇසිරීම්	3,166,865	3,216,001	3,205,197	(1.53)	0.34
එකතුව	**4,187,120**	**4,262,887**	**4,137,441**	**(1.78)**	**3.03**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේ දී කොළඹ වරායේ බහළු මෙහෙයුම් විස්සේ සම ඒකක 125,446කින් එනම් සියයට 3.03කින් වර්ධනය වී තිබුණු නමුත් 2011 වර්ෂය හා සැසඳීමේදී 2012 වර්ෂයේ දී බහළු මෙහෙයුම් විස්සේ සම ඒකක 75,767කින් එනම් සියයට 1.78ක පිරිහීමක් පෙන්වා තිබුණි.

- අධිකාරියට වැඩි ආදායමක් ප්‍රතිනැව්ගත කිරීම් හා යළි ඇසිරීම් මත අයකරනු ලබන වරාය ගාස්තු වලින් පහසුවෙන් ඉපැයිය හැකි වුවත් ප්‍රතිනැව්ගත කිරීම් වැඩි ප්‍රමාණයක් අධිකාරිය වෙත ලබාගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී නොතිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිනැව්ගත කිරීම් සියයට 1.52කින් පිරිහී තිබුණි.

- 2003 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා දස අවුරුදු කාලය තුළ කොළඹ වරාය තුළ අධිකාරියේ බහළු මෙහෙයවීමේ ධාරිතාවය මුළු බහළු හැසිරවීමේ ප්‍රතිශතයක් ලෙස සැළකීමේ දී සියයට 68 සිට සියයට 55 දක්වා සීඝ්‍ර පහත වැටීමක් සිදු වී තිබුණි.

(ආ) ත්‍රිකුණාමලය වරාය

2010 වර්ෂය හා සැසඳීමේ දී 2011වර්ෂයේ දී ත්‍රිකුණාමලය වරාය වෙත නාවික යාත්‍රා පැමිණීම යාත්‍රා 17කින් හෙවත් සියයට 15.59කින් අඩු වී තිබුණු අතර 2011 වර්ෂය හා සැසඳීමේ දී 2012 වර්ෂයේ නාවික යාත්‍රා පැමිණීම යාත්‍රා 35කින් හෙවත් සියයට 27.77කින් වර්ධනය වී තිබුණි.

(ඇ) ගාල්ල වරාය

2010 වර්ෂය හා සැසඳීමේ දී 2011 වර්ෂයේ ගාලු වරායට යාත්‍රා පැමිණීම යාත්‍රා 4කින් හෙවත් සියයට 5.7කින් වර්ධනය වී තිබුණු අතර 2011 වර්ෂය හා සැසඳීමේ දී 2012 වර්ෂයේ දී යාත්‍රා පැමිණීම 25කින් හෙවත් සියයට 34කින් පිරිහී තිබුණි.

(ඈ) සියළුම වරායයන් (කොළඹ, ත්‍රිකුණාමලය හා ගාල්ල)

සියළු වරායන්හි 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේ දළ නැව් බඩු මෙහෙයුම් වල වැඩිවීම මෙට්‍රික් ටොන් 3,667,471ක් වූ අතර එය සියයට 4.3ක වර්ධනයක් විය. 2011 වර්ෂයට සපේක්ෂව 2012 වර්ෂයේ දළ නැව් බඩු මෙහෙයුම් වල වැඩිවීම මෙට්‍රික් ටොන් 1,631,416ක් වූ අතර එය සියයට 1.8ක වර්ධනයක් විය. එබැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වර්ධන වේගය අඩු වී තිබුණි.

(ඉ) මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය

2010 නොවැම්බර් මස මෙම වරාය මෙහෙයුම් කටයුතු සඳහා විවෘත කළ අවස්ථාවේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාලය තුළ එනම් මාස 26ටම නැව් 43ක් වැනි අඩු නැව් ප්‍රමාණයක් පමණක් පැමිණ තිබුණි. වරාය වෙත නැව් ගෙන්වා ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම හා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය ගැන්ට්‍රි දොඹකර ඉතා කඩිනමින් සවිකිරීම කෙරෙහි ද අවධානය අධිකාරිය යොමුකළ යුතුව තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද වලනය නොවන තොග කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 5 ඉක්ම වූ තොගය රු.959,252,462ක් වූයෙන් එය මුළු තොග වටිනාකමින් සියයට 57.45ක් විය. කෙසේ වෙතත් අධිකාරියේ ගබඩා ඉඩකඩ සීමිත බැවින් ගබඩා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට මෙම තොගය බාදාවක් වී තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.36,379,222කට කන්කසන්තුරය වරාය මාර්ග පද්ධතිය හා ජැටිය වැඩි දියුණු කිරීම සඳහා අධිකාරිය හා රාජ්‍ය සමාගමක් සමඟ එකඟතාවයකට එළැඹී තිබුණ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4 මාර්ගෝපදේශයට පටහැනිව පිළිගත හැකි අත්තිකාරම් සුරක්ෂණයකින් තොරව කොන්ත්‍රාත් මුදලින් සියයට 20ක් ඉක්මවා සියයට 50ක් වන පරිදි රු.17,257,001ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එම අත්තිකාරම් වලින් රු.5,719,890ක් වසර 6ක කාලයක් මුළුල්ලේ නොපියවූ අත්තිකාරම් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) වසර 35ක කාලයක් සඳහා පුද්ගලික ආයතනයට බදු දී තිබූ භූමිය ඇතුළු එහි පිහිටි ගොඩනැඟිලි, යන්ත්‍ර සූත්‍ර ඇතුළු සමාගමට අයත් සියළුම වත්කම් වලට අදාළව 2012 වර්ෂය වෙනුවෙන් වරිපනම් බදු ලෙස රු.3,388,000ක අධිකාරියේ නමින් ගෙවීම් කිරීමට සිදුව තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂය අවසානය දක්වා දොළොස් අවුරුදු කාලය තුළ කොළඹ වරාය තුළ අධිකාරිය බහළු මෙහෙයවීමේ ධාරිතාවය මුළු බහළු හැසිරවීමේ ප්‍රතිශතයක් ලෙස සැළකීමේ දී සියයට 86 සිට සියයට 55 දක්වා සීඝ්‍ර පහත වැටීමක් සිදු වී තිබුණි. කෙසේ නමුත්, කොළඹ වරායේ තරඟකාරීව කටයුතු කරන පුද්ගලික සමාගමක් එම කාලය තුළ බහළු මෙහෙයවීමේ ධාරිතාවයේ සීඝ්‍ර වර්ධනයක් හිමිකරගෙන තිබුණි. පසුගිය දොළොස් වසර තුළ බහළු හැසිරවීම් පහත පරිදි පිරිහී තිබුණි.

මෙහෙය වන ලද බහළු විස්සේ සම ඒකක					
වර්ෂය	අධිකාරිය		පෞද්ගලික සමාගම		එකතුව
	ඒකක	%	ඒකක	%	
2001	1,396,946	86	229,670	14	1,626,616
2002	1,206,694	68	558,025	32	1,764,719
2003	1,334,900	68	624,439	32	1,959,339
2004	1,320,845	59	899,720	41	2,220,565
2005	1,523,794	62	931,526	38	2,455,320
2006	1,743,669	57	1,335,411	43	3,079,080
2007	1,834,734	54	1,546,497	46	3,381,231
2008	1,747,670	50	1,739,668	50	3,487,338
2009	1,714,488	49	1,749,809	51	3,464,297
2010	2,167,173	52	1,970,268	48	4,137,441
2011	2,299,446	54	1,963,441	46	4,262,887
2012	2,316,849	55	1,870,271	45	4,187,120

බහළු මෙහෙයවීම වරායක ප්‍රධාන කාර්යය වුවත් එය අධිකාරියෙන් ගිලිහි ක්‍රමානුකූලව පුද්ගලික ආයතනය සතු වෙමින් පවතින බව ඉහත දත්ත වලින් තහවුරු වේ.

වසර 35ක කාලයක් සඳහා ඉදිකර මෙහෙයුම් කර භාරදීමේ (BOT) ක්‍රමය යටතේ අධිකාරිය සතු හොඳම ගැඹුරු නැව් තටාංකාංගණ 03 පුද්ගලික ආයතනයකට ලබා දී අධිකාරියේ කටයුතු සඳහා නැව් තටාකාංගණ 02ක් පමණක් තබාගෙන තිබීම මෙම පිරිහීමට ප්‍රධානතම හේතුව වී තිබුණි.

(ආ) ත්‍රිකුණාමලය වරායේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය ඉතා දුර්වල මට්ටමක පැවතීමත් අඩු නැව් සංඛ්‍යාවක් පැමිණීමත් අඛණ්ඩව පාඩු ලැබීමට හේතු වී තිබුණි. කෙසේ වුවද පසුගිය වර්ෂ කිහිපය තුළ ලබා තිබුණු පාඩුව ක්‍රමයෙන් අඩුවෙමින් පැවතුණි.

වර්ෂය	පාඩුව රු.මිලියන
2007	405
2008	379
2009	319
2010	383
2011	318
2012	240

(ඇ) ගාලු වරාය වෙත පැමිණෙන නැව් සංඛ්‍යාව අඩුවීම මත මෙහෙයුම් ක්‍රියාකාරීත්වය ඉතා දුර්වල මට්ටමක පැවතීමත් අඛණ්ඩව පාඩු ලබා තිබුණි. කෙසේ වුවද පසුගිය වර්ෂ කිහිපය තුළ ලබමින් තිබූ පාඩුව ක්‍රමයෙන් අඩුවෙමින් පැවතුණි.

වර්ෂය	පාඩුව රු.මිලියන
2007	275
2008	279
2009	399
2010	345
2011	147
2012	47

(ඈ) අධිකාරිය සතුව පවතින ටග් යාත්‍රා සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ සියළු වරාය වල නාවික මෙහෙයුම් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවූ අතර ඒවා වසර 15 සිට වසර 30 දක්වා වූ කාලයක් පාවිච්චි කරන ලද පැරණි යාත්‍රා විය. ඒවා නිතර නිතර කාර්මික

දෝෂ වලට ලක්වීම සහ නඩත්තු කිරීම් සිදුකළ යුතුව තිබුණි. මෙම තත්ත්වය එසේම තිබිය දී ටග් යාත්‍රා අළුත්වැඩියා කටයුතු සඳහා භාරදී 2012 දෙසැම්බර් 31 දිනට වසර දෙකකට අධික කාලයක් ගත වී තිබුණ ද ඒවායේ අළුත්වැඩියාව නිමකර භාර නොදුන් ටග් යාත්‍රා පිළිබඳ විස්තර පහත දැක්වේ.

ටග් යාත්‍රාවේ නම	අළුත්වැඩියා කටයුතු සඳහා භාරදුන් දිනය
අයිරාවන	2011.01.09
සිංහබාහු	2011.04.07

4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අධිකාරියට අවශ්‍ය අමතර සේවාවන් උපදේශක සේවා සමාගමක් හරහා ඉටුකරවා ගැනීම වෙනුවෙන් කොමිස් වශයෙන් රු.52,064,941ක අමතර මුදලක් එකී සමාගමට ගෙවා තිබුණි.

(ආ) බැංකු කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් රාජ්‍ය බැංකුවකට අයකිරීමකින් තොරව පරිශ්‍ර 03ක් ද පෞද්ගලික බැංකුවක් හා රාජ්‍ය බැංකුවකට පරිශ්‍ර 03ක් ඉතා අඩු නාමික කුලියක් යටතේ අධිකාරියට අයත් ගොඩනැඟිලි බදු දී තිබුණි.

(ඇ) ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපන් බැංකුව (JBIC) ආධාර වැඩ සටහන යටතේ වූ රු.මිලියන 6,000ක නිර්මාණ කොන්ත්‍රාත්තුවක් ගාලු වරායේ දියකඩනයේ ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 455.5ක් වැය කිරීමෙන් පසු 2008 දෙසැම්බර් 31 දින සිට එම ඉදිකිරීමේ කටයුතු නවතා තිබුණි.

(ඈ) ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ කොළඹ වරාය කාර්‍යක්ෂම කිරීම සහ වරාය පුළුල් කිරීම සඳහා වූ උපදේශක සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා රු.මිලියන 1,199ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුව හා අධිකාරිය එක්ව වියදම් කර තිබුණි. එයින් රු.මිලියන 399ක් කොළඹ වරායේ කාර්‍යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වැය කිරීමෙන් පසු එම යෝජනාව ක්‍රියාත්මක කිරීම අධිකාරිය විසින් අත්හැර තිබුණි.

4.5 ආර්ථික නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සියළු පහසුකම් වලින් අංග සම්පූර්ණ ඔලුවිල් නාවික අභ්‍යාස ආයතනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.80,467,283ක් වැයකර තිබුණත් එක් පාඨමාලාවක් හෝ පවත්වා නොතිබුණි. ඉකුත් වර්ෂයේ දී පාඨමාලා හැදෑරූ ශිෂ්‍ය සංඛ්‍යාව 5ක් වුවත් ඒ වෙනුවෙන් 68 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව අභ්‍යාස ආයතනය පිහිටුවීමේ මූලික අරමුණ ඉන් ඉටු වී නොතිබූ අතර සේවකයින් විශාල සංඛ්‍යාවක් ඊට යෙදවීම තුළින් අධිකාරියට විශාල අතිරේක වැය බරක් දැරීමට සිදු වී තිබුණි. මේ වන විට මෙකී අභ්‍යාස ආයතනය අග්නිදිග විශ්ව විද්‍යාලයට පැවරීමට කටයුතු කරමින් පවතින බව සභාපතිවරයා විගණනයට දන්වා තිබුණි.

(ආ) අධිකාරිය විසින් 2000 හා 2008 වර්ෂ වලදී සමාගම් දෙකක රු.2,500,000ක මුදලක් ආයෝජනය කර තිබුණ ද කිසිදු ප්‍රතිලාභයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. 2013 වර්ෂයේ දී EDI නෙට්වර්ක් පුද්ගලික සමාගමෙන් මිළ දී ගත් රු.500,000ක් වූ කොටස් වටිනාකම පොත් වලින් ලියා හැර තිබුණි.

(ඇ) නවතම ටග් යාත්‍රාවක් රු.මිලියන 600 සිට 700 අතර මිළකට මිළ දී ගැනීමට හැකිව තිබියදී එය නොසළකා 2010 – 2012 වර්ෂ සඳහා කුලියට ගත් ටග් යාත්‍රා 2ක් වෙනුවෙන් කුලී ලෙස රු. මිලියන 600ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) කුලී පදනම මත පසුගිය වර්ෂ වල ලබාගෙන තිබූ ටග් යාත්‍රා 03ක් සඳහා එක් යාත්‍රාවකට දිනකට ඇ.ඩො.3,750ත් 5,000ත් අතර ප්‍රමාණයක් ගෙවා තිබුණි. නමුත් කුලියට ගත් ටග් යාත්‍රා උපරිම උපයෝජනයක් වන පරිදි භාවිතා කර නොතිබුණි. වැඩි එන්ජින් ධාරිතාවයක් හා ඉන්ධන දහනය අඩු එම ටග් යාත්‍රා වලින් සමහර යාත්‍රාවන් දිනකට ගමන් වාර දෙකකට පමණක් යොදාගෙන තිබූ බව මේ සම්බන්ධව වූ දත්ත අනුව තහවුරු විය.

(ii) එක් යාත්‍රාවක් දිනකට ගමන් වාර දෙකකටත් අඩු ප්‍රමාණයක් යොදාගෙන තිබුණ ද එකී යාත්‍රාව සඳහා දිනක කුලිය ලෙස අවම වශයෙන් රු.465,000ක් ගෙවිය යුතුව තිබුණි.

4.6 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රති අපනයනය සඳහා නැව් නියෝජිතයන් විසින් රැගෙන එන ලද ඝන මීටර් (CMB) 3515ක් වූ බෝට්ටු 04ක් දින 112ක කාලයක් වරායක් තුළ තබා ගැනීම වෙනුවෙන් වරාය ගාස්තු වක්‍රය (Tariff) අනුව ගබඩා/බිම් ගාස්තුව වශයෙන් රු.67,233,290ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. වරාය මෙහෙයුම් කොට්ඨාශයේ ඉහළ විධායක නිලධාරීන්ගේ සාවද්‍ය ගාස්තු ගණනය කිරීම් නිසා රු.55,213,465ක් අඩුවෙන් අයකර තිබුණෙන් අධිකාරියට රු.55,213,465ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) අධිකාරියට අයවිය යුතු ගාස්තු අයකර ගැනීමේ පවතින දුර්වලතා හේතුවෙන් 2006 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අයවිය යුතුව තිබූ රු.105,491,135ක් වූ ගාස්තු ගිණුම් වලින් කපා හැර තිබුණි.

(ඇ) වාණිජ පදනමකින් පවත්වාගෙන යනු ලැබූ නෞකාවක් වෙනුවෙන් අධිකාරිය විසින් සපයන ලද සේවා වෙනුවෙන් 2007 සිට 2009 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.5,659,734ක් වූ මුළු මුදලම සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියාහැර තිබුණි.

(ඈ) අධිකාරිය තමන් සතු පරිශ්‍ර කුලියට දීමෙන් අයවිය යුතු බදු කුලී ආදායමින් රු.2,656,871ක් සඳහා නීතිමය පියවර ගැනීමට නොහැකි බව නීතිපති විසින් දන්වා තිබුණි.

(ඉ) 2012 දෙසැම්බර් 31 දිනට රේඛීය අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කළයුතු රු.1,615,659ක් අමාත්‍යාංශ වල නම් වෙනස්වීම හේතුවෙන් අයකර නොගෙන පොත් වලින් ලියාහැර තිබුණි.

4.7 නිෂ්ක්‍රිය ඌණ උපයෝජිත වත්කම්

අධිකාරිය සතුව ලෙවල් පොටර් වර්ගයේ දොඹකර 03ක් තිබිය දී හා ඉන් 02ක් භාවිතයට නොගෙන තිබියදීත් එය නොසළකා තවත් එවැනිම දොඹකර 2ක් මිළ දී ගෙන තිබුණි. කෙසේ වෙතත්, මෙම දොඹකර 02 පවා සවිකර තිබුණේ විශාල වශයෙන් භාණ්ඩ නැව් නොපැමිණෙන වර්තමානයේ නැව් වල සුළු අළුත්වැඩියාවන් සිදුකිරීමට ගන්නා තටාකාංගනයක විය.

4.8 වෙනත් ආයතන වෙත වත්කම් මුදාහැරීම

අධිකාරියේ මාධ්‍ය ඒකකය මගින් රේඛීය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ මාධ්‍ය ආවරණය කිරීම් වෙනුවෙන් අධිකාරියේ වාහන, ඉන්ධන, සේවකයින් සහ උපකරණ අවස්ථා 11ක දී භාවිතා කිරීමට ඉඩ දී තිබුණි. අධිකාරියට අදාළ නොවූ මාධ්‍ය ආවරණය කිරීම් වෙනුවෙන් යොදවන ලද වාහන 3ක් වෙනුවෙන් මාසික අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු.274,850ක් වූ අතිරේක ඉන්ධන ලීටර් 2,390 භාවිතා කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

5.1 සංයුක්ත සැළැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ දැක්ම (Vision) අනුව 2015 වන විට ආසියාවේ ප්‍රධානතම නැව් මෙහෙය වන වරාය බවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පත්කරන බව දක්වා තිබුණි. අධිකාරියේ මූල්‍ය තත්ත්වය, බහළු මෙහෙයුම් හැසිරවීම හා නාවික යාත්‍රා පැමිණීම පිළිබඳ දත්ත අනුව පසුගිය වර්ෂ සමඟ සසඳා බැලීමේ දී කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.


(ආ) සංයුක්ත සැළැස්මෙහි සඳහන් 'අප දැක්ම' (Our Mission) යටතේ වූ සේවාලාභීන් පදනම්ව ලොව පිළිගත් පහසුකම් හා විශිෂ්ඨ සේවාවක් සැළසීමෙන් ප්‍රතිලාභ වර්ධනය කර ගැනීම ලෙස සඳහන් කර තිබුණි. පසුගිය වසර දහය තුළ කොළඹ වරායේ නැව් බඩු මෙහෙයුම් කටයුතු වලදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දායකත්වයට සාපේක්ෂව පෞද්ගලික සමාගමේ දායකත්වය ක්‍රම ක්‍රමයෙන් වැඩි වී තිබූ බව තහවුරු වී තිබුණි.

(ඇ) අධිකාරියේ අභිමතාර්ථ යටතේ දැක්වෙන ගාලු වරාය ප්‍රාදේශීය වරායක් ලෙස සංවර්ධනය කිරීම හා කොළඹ වරායේ දී මෙහෙය වනු ලබන වාණිජමය නැව් බඩු මෙහෙයවීම සඳහා විකල්ප වරායක් ලෙස සංවර්ධනය කිරීම දැක්වුවත් 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ දත්ත සැසඳීමේ දී ගාලු වරායේ නැව් පැමිණීමේ අඩුවීම හා ගාලු වරාය දිගින් දිගටම පාඩු ලැබීම හේතුකොට ගෙන මෙම අභිමතාර්ථ ඉටු වී නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු ය.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැතියෝ/ණයහිමියෝ පාලනය
(ඇ) ආයෝජන
(ඈ) තොග පාලනය
(ඉ) වත්කම් පාලනය



එච් ඒ එස් සමරවීර
විගණකාධිපති

ටීසී/බී/එස්එල්පීඒ/එෆ්ඒ/2012 **FD/FA/C/82-XV/2012/14(2)(c)** **2014 මාර්තු 27 දින**

විගණකාධිපති
රජයේ විගණන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගමේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) ප්‍රමිත අංක 07 අනුව මූල්‍ය උපකරණ වල සාධාරණ අගය පිළිබඳව පැහැනගින අවදානමේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වාර්තාව පිළියෙල කර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කර තිබුණි. ප්‍රමිත අංක 07 අනුව මෙම අවදානම් ස්වභාවය හෙළිදරව් කළ යුතු වුවත් එය පැහැදිලිවම මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ වාර්ෂික වාර්තාව සමඟ කළමනාකරණ තීරණ ගැනීම සඳහා යොමුකළ යුතු බවට අදාළ ප්‍රමිත අනුව දක්වා නොතිබූ බැවින්, අදාළ වාර්තාව, වාර්ෂික වාර්තාව සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශන වල සටහනක් ලෙස ඉදිරිපත් කළයුතු බැව් විගණන වාර්තාවේ දක්වා ඇති බැවින් ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන වල මේ බව හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2012 වසරේ දී කඩා ඉවත් කරන ලද ගොඩනැඟිලි වල වටිනාකම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2013 වසරේ ගිණුම් ශේෂයෙන් අපහරණය කිරීමට කටයුතු කර ඇත.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) ගාල්ල හා ත්‍රිකුණාමලය යන වරායන් සඳහා වෙනමම ජංගම ගිණුම් හරහා ගිණුම් කටයුතු පවත්වාගෙන යනු ලබයි. නමුත් අවසාන ගිණුම් පිළියෙල කරනු ලබන්නේ කොළඹ වරාය සමඟ ඒකාබද්ධවය. මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ ගිණුම් තැබීම කොළඹ වරාය සමඟ කරගෙන යන අතර 2013.11.01 දින සිට මාගම්පුර වරාය කළමනාකරණ සමාගම මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පරිපාලන කටයුතු සිදුකරනු ලබන අතර එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ. එබැවින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ ආදායම් වියදම් ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට 2013 වසරේ සිට කටයුතු කර ඇත.

(ආ) මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ මෙහෙයුම් ආදායම්, වියදම් කොළඹ වරායේ මෙහෙයුම් ආදායම් වියදම් සමඟ එකට ගළපා තිබුණ ද මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායට වෙනමම පිරිවැය ගිණුම් අංකයක් (Cost Center) දී ඇති බැවින් අදාළ ආදායම්, වියදම් වෙනමම හඳුනාගත හැක.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ලංකා මැරයින් පෞද්ගලික සමාගම 2008 ජූලි මාසයේ දී උසාවි නියෝගය මත වත්කම් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරණ ලදී. අදාළ වත්කම් JCT සමාගම විසින් පාලනය කෙරේ. අදාළ වත්කම් පවරාගන්නා අවස්ථාවේ දී ලංකා මැරයින් පෞද්ගලික සමාගමෙහි පොත් අගයන් ඉතා සාධාරණ වටිනාකම් ලෙස සළකා අදාළ වත්කම්

අධිකාරිය විසින් ගිණුම්ගත කරන ලදී. 2012 වර්ෂයේ සිට නව ගිණුම්කරණ ප්‍රමිත වලට (SLFRS) අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ අතර එහිදී දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීමට පිරිවැය පදනම් ක්‍රමය (Cost Model) තෝරාගත් අතර උපකරණ වල වටිනාකම සඳහා වඩාත් සාධාරණ අගය ලෙස පිරිවැය පදනම සළකා ඇත.

(ආ) මෙම වාහනය සම්බන්ධයෙන් තඹුත්තේගම උසාවියේ නඩුවක් විභාග වෙමින් පවතින අතර එහි අවසන් තීන්දුවෙන් පසු මේ පිළිබඳ කටයුතු කරනු ලැබේ.

(ඇ) කන්කසන්තුරය වරායේ දියකඩනයේ අළුත්වැඩියා කටයුතු සිදුනොකිරීම හේතුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල් සියල්ලම මේ වන විට අදාළ ආයතනයෙන් නැවත අයකරගෙන ඇත.

(ඈ) ඉදිරියේ දී ඉතිරි ගිණුම් ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) වාර්තාවේ සටහන් ලැබිය යුතු මුදල සකස් වී ඇත්තේ වරාය අධිකාරිය විසින් වෙනත් ආයතන වල සේවාවන් ලබාගැනීමේ දී ඔවුන් වෙත තැබූ තැන්පතු හා අත්තිකාරම් මුදල් වලිනි. අධිකාරිය ශේෂ සනාථ කිරීම් වෙළඳ ණයගැතියන්ට පමණක් යැවූ අතර 2013 වර්ෂයේ සිට එම ලැබිය යුතු ශේෂයන් සඳහා ද ශේෂ සනාථ කිරීමේ ලිපි යැවීමට කටයුතු කර ඇත.

(ආ) මින් ඉදිරියට තුන්වන පාර්ශ්වයකින් සනාථ කිරීම් ලබාගත හැකි ශේෂ සඳහා සනාථ කිරීමේ ලිපි යැවීමට කටයුතු සකස් කර ඇත.

(ඇ) (i) මෙම ශේෂයට අදාළව නීතිමය කටයුතු තවම අවසන් වී නොමැති බැවින් උසාවි තීන්දු ලැබීමෙන් අනතුරුව නිරවුල් කිරීමේ කටයුතු කරනු ලැබේ.

(ii) රාජ්‍ය ආයතන වලින් අයවිය යුතු ශේෂ වලින් රු.4,336,014ක මුදලක් මේ වන විට අයකරගෙන ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

(ඈ) මෙම මුදලින් දැනට අයකර ගැනීමට ඇති රු.1,732,070ක මුදල නිමකර ඇති වැඩ ප්‍රමාණයට එරෙහිව පියවීමට කටයුතු කරනවා ඇත.

(ඉ) වසර 5කට වැඩි ශේෂයෙන් රු.747,993ක මුදලක් මේ දක්වා අයකරගෙන ඇත. ඉතිරි මුදල අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමටත්, එසේ කළ නොහැකි ශේෂ, පොත් වලින් ලියා හැරීමටත් කටයුතු කෙරේ.

(ඊ) අයවිය යුතු බදු මුදල් කුලී ආදායම් ශේෂය තුළ වසර 05ක් ඉක්ම වූ ශේෂය තුළ රු.17,052,468ක මුදලක් අයකර ගැනීමට අධිකාරිය අදාළ ආයතන සමඟ සාකච්ඡා කරමින් පවතී. රු.12,183,111ක් සඳහා අධිකාරිය නීතිමය පියවර ගනිමින් සිටී. රු.1,190,621ක් සඳහා නීතිපති විසින් නීතිමය පියවර ගැනීමට නොහැකි බව දන්වා ඇති බැවින් එම මුදල පොත් වලින් ලියා ඉවත් කිරීමට කටයුතු කෙරේ. ඉතිරි රු.1,466,250ක් ගෙවීම අදාළ ආයතනය පැහැර හැර ඇති බැවින් නැවත නීති උපදෙස් ලබාගැනීමට කටයුතු කෙරේ.

(උ) මෙම ණය ශේෂයන් යුධමය වාතාවරණයක් පැවති කාල පරාසයට අයත් වන අතර යුධමය වාතාවරණය තුළ උතුරට භාණ්ඩ හා මගී සේවාවන් අඛණ්ඩව ලබාදීමට අවශ්‍ය වූ බැවින් අත්‍යවශ්‍ය සේවා පදනම මත හේදයකින් තොරව නැව් නියෝජිත ආයතන වලට හා රාජ්‍ය ආයතන වලට සේවා සැපයීමට සිදුවිය. මෙම මුදල් අයකර

ගැනීමේ පැවති අවිනිශ්චිතාව මත මෙසේ බොල් හා අඩමාන ණය ප්‍රතිපාදන වශයෙන් වැඩි ප්‍රතිශතයක් සැළසීම සිදු කෙරුණි.

2013 වර්ෂය වන විට මෙම මුදලින් රු.2,357,182ක මුදලක් අයකර ගැනිමට කටයුතු කර ඇත.

(ඌ) අයවිය යුතු සම්පූර්ණ මුදලම මේ වන විට අයකරගෙන ඇත.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ගුවන් විදුලි යන්ත්‍ර ජාලය

මෙම විමසුමට අදාළ ගුවන් විදුලි දත්ත ජාලය සඳහා අවශ්‍ය උපකරණ තොග හතර වතාවකට ආනයනය කරන ලදී. රේගු විමර්ශනයක් සඳහා එම සෑම අවස්ථාවකදී ම එකී භාණ්ඩ තොග ශ්‍රී ලංකා රේගුව විසින් රඳවාගත් අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද ආයතනික බැඳුම්කරයක් මත සහ එම භාණ්ඩ වලට අදාළ රේගු තීරු බදු වලට සමාන මුදලක් තැන්පත් කිරීමෙන් අනතුරුව රේගුව විසින් භාණ්ඩ නිදහස් කරන ලදී. එහි ඇතුළත් වූ වැට් බදු වරාය අධිකාරිය විසින් අයකරගෙන ඇත. ඉතිරි මුදල එම භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා රේගුවට ගෙවිය යුතු තීරු ගාස්තු මුදල වන බැවින් එය තැන්පතුවක් වශයෙන් සැළකිය නොහැක. රේගු විමර්ශන අවසන් වූ පසුව මෙය වියදමට හර කිරීමට කටයුතු කරනු ඇත.

අමාත්‍යාංශය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කළ යුතු වියදම්

මෙම ශේෂය පොත් වලින් කපා හැරීමට කටයුතු කර ඇත.

අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු තැන්පතු

මෙම මුදලින් රු.1,750,585.10 ශේෂ සඳහා සනාථකිරීමේ ලිපි රජයේ විගණන අංශයට භාර දී ඇත. ඉතිරි මුදල් කම්කරු උසාවියේ පවතින නඩු සඳහා තැන්පත් කර ඇති බැවින්, ඒ සඳහා ශේෂ සනාථ කිරීම් ලබාගැනීම අසිරු තත්ත්වයක පවතින නමුත් 2013 වර්ෂයේ සිට ශේෂ සනාථ කිරීමේ ලිපි යැවීමට කටයුතු කර ඇත.

ක්‍රියාත්මක භාණ්ඩ වෙන්දේසි

මෙතෙක් තුන්වන පාර්ශ්වයේ ශේෂ සනාථ කිරීම් කර ඇත්තේ පිටස්තර ආයතන වල තිබෙන වරාය අධිකාරිය සතු තැන්පතු සඳහා පමණි. ක්‍රියාත්මක භාණ්ඩ වෙන්දේසි ගිණුම් පවතින්නේ ටෙන්ඩර් වෙන්දේසි වෙනුවෙන් අප වෙත තබා ඇති පිටස්තර පුද්ගල/ආයතන වලට අදාළ ගාස්තු වේ. මෙතෙක් ඒ සඳහා ශේෂ සනාථ කිරීම් ලිපි ගෙන්වා නොගත් අතර 2013 වර්ෂයේ සිට ශේෂ සනාථ කිරීමේ ලිපි යැවීමට කටයුතු කර ඇත.

2.2.6 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) 2000.06.09 දින මහා භාණ්ඩාගාරය හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලබාදුන් එකඟතාවයකට අනුව උපයන විට ගෙවීම් බදු මුදල් අධිකාරිය මගින් ගෙවීම සිදුකෙරේ.

(ආ) ශේෂ සනාථ කිරීම් ලේඛන සකස් කිරීමේ දී ඉදිරියට චක්‍රලේඛානුකූලව කටයුතු කිරීමටත් හා ප්‍රමාදයන් සිදු නොවීමට කටයුතු කිරීමටත් අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

(ඇ) (i) එවකට වරාය අධිකාරියේ සභාපතිතුමා විසින්, 1984.08.15 දින අංක 264 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව 1987.09.29 දින නිකුත් කළ ලේකම් කාර්යාලීය චක්‍රලේඛ අංක ලේ/69 පරිදි නිල වාහන පාවිච්චි කිරීම සඳහා අදාළ නිලධාරීන්ට අවසර ලබා දී ඇත.

(ii) කළමනාකරණ කමිටු තීරණයකට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක PE/COM/29/GEN දරන ලිපිය මගින් කුලී පදනම මත ලබාගත් වාහන සඳහා ගෙවීම් කිරීමේ දී වෙළඳපොළ පවතින මිල ගණන් අනුව මෝටර් රථ සඳහා රු.50,000ක් ගෙවීමටත්, වෑන් රථ සඳහා රු.60,000ක් ගෙවීමටත් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව කුලී පදනම මත මෝටර් රථ ලබාගත්තේ නම් එක් රථයකට රු.50,000ක් ගෙවීමට සිදුවේ. එබැවින් රු.40,000ක දීමනාවක් ගෙවීමෙන් විගණන වාර්තාවේ සඳහන් කාල පරිච්ඡේදය තුළ රු.920,000ක වැඩිපුර ගෙවීමක් නොව පිරිවැය ඉතිරියක් වරාය අධිකාරිය ලබාගෙන ඇත.

(iii) ඉහත (i) හි සඳහන් කළ නිලධාරීන්ට ඉන්ධන ලබාගැනීමට ද හිමිකම ඇත. ලබාදෙන ඉන්ධන සීමාව වැඩිවීම සිදුවන්නේ හුදෙක්ම සේවා අවශ්‍යතා හා උවමනා අනුවය. මෙය වරාය පනතේ 07 (ඊ) වගන්තිය මගින් ලබා දී ඇති බලතල අනුව ලබාදිය හැක.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

අපගේ ගණනය කිරීම් අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාකාරකම් හා වෙනත් ආදායම් වල වර්ධනය රු.මිලියන 7,047ක් හා ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ වියදම අඩුවීම රු.මිලියන 1,994ක් ලෙස විය යුතු අතර අනෙකුත් සංඛ්‍යා දත්ත හා එකඟ වේ.

3.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

ශුද්ධ මූල්‍ය පිරිවැය සකස් වී ඇත්තේ මූල්‍ය ආදායමට මූල්‍ය වියදම් ගැළපීමෙන් පසුව (මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 34 අනුව) බැවින් අපගේ ගණනය කිරීම් අනුව පහත පරිදි සංඛ්‍යා දත්ත හා අනුපාතයන් විය යුතු අතර අනෙකුත් සංඛ්‍යා දත්ත හා අනුපාතයන් සමඟ එකඟ වේ.

	වර්ෂය	
	2012	**2011**
මෙට්‍රික් ටොන් එකකට ශුද්ධ ලාභය	103	3.13
මුළු ආදායම රුපියල් මිලියන	38,334	31,287
මුළු වියදම රුපියල් මිලියන	38,039	30,965

අනුපාතයන්

	වර්ෂය	
	2012	**2011**
පිරිවැටුමට බදු පසු ලාභය/(අලාභය) සියයට	10.87	
දීර්ඝ කාලීන ණය වලට ස්කන්ධ ප්‍රාග්ධනය සියයට	1.78	1.55
ක්ෂණික අනුපාතය	1:2:14	

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) කොළඹ වරාය

(i) නාවික යාත්‍රා පැමිණීම

සඳහන් සංඛ්‍යා තොරතුරු නිවැරදිය.

2011 වර්ෂය හා සැසඳීමේ දී 2012 වර්ෂයේ පැමිණි නැව් සංඛ්‍යාව 6.2%ක අඩුවීමක් වාර්තා වුවද එසේ වීමට හේතුව විශාලත්වයෙන් වැඩි නැව් වල පැමිණීමයි.

2011 වර්ෂයේ වරායට පැමිණි නැවක දළ ටොන් ප්‍රමාණය 30,923ක් ද, 2012 වර්ෂයේ කොළඹ වරායට පැමිණි නැවක දළ ටොන් ප්‍රමාණය 32,979ක් ද දක්වා වැඩි විය. 2012 වර්ෂයේ ජාත්‍යන්තර නාවික ක්ෂේත්‍රයේ අඩු වර්ධනයක් පෙන්නුම් කරයි. තවද ජයබහළු පර්යන්තයෙහි හා සමගි බහළු පර්යන්තයෙහි නෞකා මෙහෙයුම් ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය 2012 වසර අවසාන වන විට ඉහළ නංවාලීමට කටයුතු කර ඇත.

(ii) බහළු මෙහෙයුම් (විස්සේ සම ඒකක TEUs)

සඳහන් සංඛ්‍යා තොරතුරු නිවැරදිය.

- 2012 වර්ෂයේ කොළඹ වරායේ මෙහෙය වූ මුළු බහළු සංඛ්‍යාව විස්සේ සම ඒකක 4,187,120කි. එය පසුගිය (2011) වසරේ මෙහෙය වූ බහළු ප්‍රමාණයට වඩා 1.8%ක අඩුවීමකි.

  පවතින සංඛ්‍යා දත්ත වලට අනුව ඉන්දියානු වරායන් අතරින් ප්‍රධාන වරාය වන ජවහර්ලාල් නේරු වරාය 2011 වසරේ බහළු මෙහෙයුම් සංඛ්‍යාව විස්සේ සම ඒකක මිලියන 4.31සිට 2012 වසර වන විට බහළු මෙහෙයුම් සංඛ්‍යාව විස්සේ සම ඒකක මිලියන 4.25 දක්වා එනම් 1.41%ක අඩුවීමක් පෙන්නුම් කර ඇත. හොංකොං වරාය 2012 වසරේ බහළු මෙහෙයුම් සංඛ්‍යාව 2011 වසරට සාපේක්ෂව 5.4%ක අඩුවීමක් පෙන්නුම් කර ඇති අතර රොටඩෑම් වරාය එය නොවෙනස්ව පවත්වාගෙන ගොස් ඇත. බොහෝ යුරෝපා වරායන්හි පසු බැස්මට යූරෝ කළාපිය අර්බුදය හේතු සාධක වී ඇත.

  ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පාරිභෝගික භාණ්ඩ වල ප්‍රධාන ගැනුම්කරු ඇමරිකාව වන අතර සමහර භාණ්ඩ වල වෙළඳපොළ පහත වැටීම්, නොනවත්වා පවතින අභ්‍යන්තර දේශපාලන අර්බුද මෙන්ම අරාබි ගල්ෆ් රටවල අස්ථාවරත්වය ද ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ වල වෙළඳපොළ පහත වැටීමට හේතු වී ඇත.

- පෙර පෙන්වා දුන් පරිදිම ලෝක ආර්ථික අර්බුදය හේතුවෙන් ආසියාවේ සිට යුරෝපා හා ඇමරිකා එක්සත් ජනපද වෙළඳපොළට (විශේෂයෙන් ඉන්දීය උප මහද්වීපයෙන්) ගලාගිය නැව් භාණ්ඩ ප්‍රමාණය අඩුවීම වේ. 2012 වසරෙහිදි එවන් පසුබෑමකට ලක්වුවද 2013 වසරෙහි ඔක්තෝබර්

මස වන විට 2012 වසරට සාපේක්ෂව 4%ක ප්‍රතිනැවිගත කිරීමේ බහළු ප්‍රමාණයේ වැඩිවීමක් සිදුවී ඇත.

- 2011 වසරේ දී 54%ක් ව තිබූ වෙළඳපොළ කොටස 2012 වන විට 55%ක් දක්වා වර්ධනය වී ඇති අතර 2013 වසරෙහි ඔක්තෝබර් එය 58% දක්වා වර්ධනය කිරීමට හැකි වී ඇත. 2002 වසරෙහි 68%ක් පවතින විට සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගම සම්පූර්ණ ධාරිතාවයෙන් කටයුතු නොකළ අතර පසුව ඔවුන්ගේ අති නවීන බහළු පහසුකම් වල වර්ධනය හේතුවෙන් යම් ආකාරයක තරඟකාරී තත්ත්වයකට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මුහුණ දුනි.

(ආ) ත්‍රිකුණාමලය වරාය

2011 වසරට සාපේක්ෂව 2012 වර්ෂයේ ජිප්සම් (Gypsum) ගොඩබෑම් සඳහා ටෝකියෝ සමාගමට පැමිණි නෞකා ගණන 20කින් වැඩි වී ඇති අතර දියඹ නැංගුරම් මෙහෙයුම් කටයුතු සහ විශේෂ ප්‍රතිනැවිගත මෙහෙයුම් (Special Transshipment Operations) නිසා 2012 වසරේ නාවික පැමිණීමේ වර්ධනයක් සිදු වී ඇත.

(ඇ) ගාල්ල වරාය

හොල්සිම් නිෂ්පාදන සමාගමේ අවශ්‍යතාවය මත ආනයනය කරනු ලබන සිමෙන්ති නිෂ්පාදන මත ගාල්ල වරායෙහි මෙහෙය වන නැව් ප්‍රමාණය තීරණය වේ. හොල්සිම් සමාගමේ කර්මාන්ත ශාලාව නවිකරණය හේතුවෙන් නිෂ්පාදන අඩුකිරීම සිදුව ඇති අතර එය ද නැව් ප්‍රමාණය අඩුවීමට බලපා ඇත. තවද හොල්සිම් සමාගම ගෙන්වනු ලබන සමහර නැව් කොළඹ වරාය වෙත රැගෙනවිත් මහා මාර්ගය ඔස්සේ එම අමු ද්‍රව්‍ය සහ සිමෙන්ති ප්‍රවාහනය කිරීම ද මෙසේ නැව් ප්‍රමාණය අඩුවීමට හේතු වී ඇත. ඊට අමතරව සෝමාලියා මුහුදු ප්‍රදේශයේ ඇති අනාරක්ෂිතභාවය හේතුවෙන් සංචාරක නැව් හා රුවල් යාත්‍රා පැමිණීම ඉතා අඩු වී ඇති අතර එය ඉදිරියට ද බලපානු ඇත.

(ඈ) සියළුම වරායන් (කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල)

දේශීය ආනයන හා අපනයන වෙළඳාමෙහි ඇති වී ඇති පසුබෑම හේතුවෙන් මෙහෙයුම් කරන ලද ආනයන හා අපනයන බහළු සංඛ්‍යාවේ 2.5% සහ ලෝක ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රතිනැවිගත කිරීමේ බහළු සංඛ්‍යාවේ 1.9%ක අඩුවීමක් පෙන්නුම් කිරීම හේතුවෙන් මෙහෙයුම් කරන ලද ටොන් ප්‍රමාණය ද සෘණ අගයක් ගන්නා ලදී. සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් වල ද දේශීය ආනයන හා අපනයන මෙහෙයුම් කළ ටොන් ප්‍රමාණයේ ඇති වී ඇති සෘණාත්මක අගය ද මීට හේතු වී ඇත.

(ඉ) මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායෙහි මෙහෙයුම් කටයුතු 2010 නොවැම්බර් මස ආරම්භ කළ අතර වර්තමානයේ කළාපයේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය බවට පත්ව තිබේ.

මෙහෙයුම් කටයුතු ආරම්භයේ සිට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය තුළ නැව් 155ක මෙහෙයුම් කටයුතු වාර්තා වී ඇත. මෙහෙයුම් කටයුතු වල සංඛ්‍යාත දත්ත පහත පරිදි වේ.

නැව් වර්ගය	නැව් ගණන	හැසිරවීම	එකතුව (ටොන්)
වාහන	153	ඒකක 71,654	117,331.48
නැව් බඩු	2	pkg 2,681	5,570.00
එකතුව	**155**		**122,901.48**

ගැන්ට්‍රි දොඹකරයන්හි තත්ත්වය

ගැන්ට්‍රි දොඹකරයන්හි I වන හා II වන අදියරයන්හි සැළසුම් කටයුතු මේ වන විට අවසන් වී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි නිලධාරීන් විසින් චීනයේ ZPMC කෝපරේෂන්හි නිල සංචාරයක යෙදෙමින් සමීක්ෂණ කටයුතු සිදුකරන ලදී. පළමු ගැන්ට්‍රි දොඹකර තොග 2014 වර්ෂය මැද වන විට දියත් කිරීමට සැළසුම් කර ඇත.

අනාගත සංවර්ධනය පිළිබඳ උපායශීලි ප්‍රවේශයන්

පහත සඳහන් සංවර්ධන කටයුතු මගින් මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායෙහි පහසුකම් ඉහළට නංවන අතර ඒ තුළින් නැව් විශාල ප්‍රමාණයක් වරාය තුළට ආකර්ශනය කරගැනීමට බලාපොරොත්තු වේ. Tank Farm සංකීර්ණයේ සහ Bunkering පහසුකම් වලට අදාළ පූර්ව සුදානම් කටයුතු සහ පරීක්ෂාවන් මේ වන විට සම්පූර්ණ කර ඇත. එම නිසා තෙල් ටැංකි සංකීර්ණයට අවශ්‍ය ඉන්ධන ලබාගැනීමට තෙල් ප්‍රවාහන නෞකා අනාගතයේ දී වරාය තුළට පැමිණීම අපේක්ෂා කළ හැක. ඒ අතරතුර නැව් වලට තෙල් සැපයීමේ සේවයක් මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය තුළ ප්‍රධාන ව්‍යාපාර අංශයක් වශයෙන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය කාර්මික වරායක් වශයෙන් සංවර්ධනය කිරීමේ කටයුතු වලට මේ වන විට මුලපුරා ඇත. එම නිසා වරාය ඇතුළත තම ව්‍යාපාර ස්ථාන පිහිටුවීමට කැමති ආයෝජකයන්ට යෝජනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබේ. මේ සඳහා තෝරාගත් ආයතන නුදුරු අනාගතයෙහිම ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු සඳහා වරාය පහසුකම් උපයෝගී කර ගැනීමට පැමිණෙනු ඇත.

ගොඩනැගීමේ කටයුතු වල II වන අදියර ආරම්භ වී නිමවීමේ තත්ත්වයට ළඟා වී තිබේ. ඒ තුළින් මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායෙහි ධාරිතාවය වැඩිකිරීම අපේක්ෂා කෙරේ.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මෙම භාණ්ඩ වර්ෂ 05 සිට 15 හෝ ඊට වැඩි කාලයක් ගබඩාකර තබාගත්තේ අදාළ යන්ත්‍ර සූත්‍ර එපමණ කාලයක් හෝ එයටත් වැඩි කාලයක් ප්‍රයෝජනයට ගන්නා නිසාය. විශාල මූල්‍ය වටිනාකමකින් යුත් යන්ත්‍ර සූත්‍ර මිළ දී ගැනීමේ දී බොහෝ විට ඒ සමඟ අමතර කොටස් ලබාදීම ද සිදුවේ. එම අමතර කොටස් වටිනාකම ද තොග ගිණුම්ගත වේ. සමහර ප්‍රමාණයන් ප්‍රයෝජනයට ගැනීම සිදුවන්නේ වර්ෂ 10 – 15 පමණ ගත වූ පසුය.

එසේම මෙම අමතර කොටස් විවෘත වෙළඳපොළේ ඉක්මනින් මිළ දී ගත නොහැක. විශාල යන්ත්‍ර වල බොහෝ අමතර කොටස් සමහර අවස්ථාවන්හි දී විදේශ වලින් ඇණවුම් කර ලබාගත යුතුය. එසේම සෑම වර්ෂයකම අදාළ තොග පිළිබඳ මනා දැනුම් ඇති ඉංජිනේරු වැඩ කළමනාකරුවන් හා අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ නිලධාරීන්ගෙන් ද සමන්විත කමිටු මගින් තොග සමීක්ෂණය කර තවදුරටත් අවශ්‍ය නොවන තොග නිසි පරිපාටි ප්‍රකාරව ඉවත්කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) කන්කසන්තුරය වරායේ දියකඩනයේ අළුත්වැඩියා කටයුතු සිදුනොකිරීම හේතුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල් සියල්ලම මේ වනවිට අදාළ ආයතනයෙන් නැවත අයකර ගෙන ඇත.

(ඇ) අදාළ ආයතනය සමඟ 1999 වසරේ දී එළැඹ ඇති බදු ගිවිසුමට අනුව එම ආයතනයට බදු දී ඇති පරිශ්‍ර භූමිය සඳහා වරිපනම් බදු වරාය අධිකාරිය විසින් ගෙවිය යුතු වේ.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 1999 වර්ෂයේ දී වරාය අධිකාරිය සතුව පැවති රැජිණ පාලම වසර 30ක් සඳහා ඉදිකර මෙහෙයුම් කර භාරදීමේ (BOT) ක්‍රමය යටතේ නැංගුරම්පළවල් 03ක් ප්‍රතිව්‍යුහගත කරන වැඩ සටහන යටතේ පෞද්ගලික ආයෝජකයෙකු සඳහා ලබාදෙන ලදී.

ඒ තුළින් කොළඹ වරාය ආසියාවේ ප්‍රධාන බහළු මෙහෙයුම් වරායක් ලෙස ඉදිරියට පැමිණීම සිදු වූ අතර රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය අතර තරඟකාරිත්වය වැඩිවීම තුළින් සමස්ථයක් ලෙස කොළඹ වරාය තුළ බහළු මෙහෙයුම් ධාරිතාවය ඒකක 1,626,616 සිට 2012 වර්ෂය වන විට බහළු මෙහෙයුම් ධාරිතාවය ඒකක 4,187,120ක් දක්වා වැඩිවීම සිදුවිය. ඒ අතරම තරඟකාරිත්වය නිසා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනයන් තුළ කාර්යක්ෂමතාවය වැඩිවීම සිදුවිය.

පෞද්ගලික අංශයේ අළුත් නැංගුරම්පොළවල් නවීන යන්ත්‍රෝපකරණ හා සිත් ඇදගන්නා සුළු සේවාවන් මුලින්ම ලබාදීම තුළින් අධිකාරිය සතු වෙළඳපොළ ඒකාධිකාරිය ක්‍රමයෙන් ගිලිහියාම සත්‍යයක් වුවත් 2010 වසරේ සිට අධිකාරිය නැවතත් කාර්යක්ෂමතාවය වර්ධනය හා නොයෙකුත් ප්‍රතිව්‍යුහගත වැඩ සටහන් තුළින් සේවාදායකයන්ගේ ආකර්ශනය ලබාගැනීම හේතුවෙන් වෙළඳපොළ ප්‍රතිශතය 2010 වසරේ 53% සිට 55% දක්වා වර්ධනය කරගෙන ඇත. එය අභිබවමින් 2013 වර්ෂය වන විට තව තවත් ඉහළ යන බව අවධාරණය කළ යුතු වේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා පැරණි යන්ත්‍ර සූත්‍ර වෙනුවට අළුතින් යන්ත්‍ර සූත්‍ර ලබගැනීමත් සේවකයන්ගේ ආකල්පමය වෙනස තුළින් සේවා දායකයන්ට උපරිම කාර්යක්ෂම සේවාවක් ලබාදෙමින් ගුණාත්මකභාවය වර්ධනය කරගනිමින් පවතී. ඒ අනුව වරාය අධිකාරිය 2013 වසරේ දී ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද ජාතික ව්‍යාපාර තත්ත්ව සම්මාන උළෙලේ දී දෙවන ස්ථානය ලබාගැනීමට හැකියාව ලැබී තිබේ.

(ආ) ත්‍රිකුණාමලය වරාය

රට තුළ යුධමය වාතාවරණය නිමාවීමත් සමඟ ත්‍රිකුණාමලය වරාය හරහා උතුරට නැව් මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම නැවතීමත් සමඟ ත්‍රිකුණාමලය වරායෙහි නෞකා මෙහෙයුම් කටයුතු වල අඩුවීමක් සිදුවිණි. දැනට පැමිණෙන නෞකා වලින් 70%ක් ප්‍රීමා, ටෝකියෝ සිමෙන්ති සමාගම් වල මෙහෙයුම් කටයුතු සඳහා පැමිණි නෞකාවන් වේ. එම නෞකා වලින් නාවික ගාස්තු හා මෙහෙයවන ලද ටොන් ප්‍රමාණයට අනුව ගාස්තුවක් (Throughput Charge) අයකිරීම සිදුවේ. මේ වන විට හොල්සිම් සිමෙන්ති සමාගම විසින් ක්ලින්කර් නෞකා මෙහෙයුම් කිරීමට සැළසුම් යොදා ඇති අතර නව VISION 2020 ක්‍රමෝපාය සැලැස්ම යටතේ වරාය ආශ්‍රිත කර්මාන්ත ඉදිකිරීම සඳහා ආයෝජකයන්ගෙන් යෝජනාවන් ලබාගෙන ඇගයීම් මට්ටමේ පවතී.

(ඇ) ගාල්ල වරාය

හොල්සිම් නිෂ්පාදන සමාගමේ අවශ්‍යතාවය මත ආනයනය කරනු ලබන සිමෙන්ති නිෂ්පාදන මත ගාල්ල වරායෙහි මෙහෙය වන නැව් ප්‍රමාණය තීරණය වේ. හොල්සිම්

සමාගමේ කර්මාන්ත ශාලාව නවීකරණය හේතුවෙන් නිෂ්පාදන අඩු කිරීම සිදුව ඇති අතර එයද නැව් ප්‍රමාණය අඩුවීමට බලපා ඇත. තවද හෝල්සිම් සමාගම ගෙන්වනු ලබන සමහර නැව් කොළඹ වරාය වෙත රැගෙනවිත් මහා මාර්ගය ඔස්සේ එම අමු ද්‍රව්‍ය සහ සිමෙන්ති ප්‍රවාහනය කිරීම ද මෙසේ නැව් ප්‍රමාණය අඩුවීමට හේතු වී ඇත.

ඊට අමතරව සෝමාලියා මුහුදු ප්‍රදේශයේ ඇති අනාරක්ෂිතභාවය හේතුවෙන් සංචාරක නැව් හා රුවල් යාත්‍රා පැමිණීම ඉතා අඩු වී ඇති අතර එය ඉදිරියට ද බලපානු ඇත. ඉහත කරුණු 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ යාත්‍රා පැමිණීම අඩුවීමට බලපා ඇත. කෙසේ වුවද මේ වන විට වරායෙන් පිටත නැංගුරම් ලා ඇති නෞකා වෙනුවෙන් (Out Port Limit) (OPL) සපයනු ලබන සේවාවන් තුළින් සැළකිය යුතු ආදායමක් ලබා ගැනීමට හැකි වී ඇත.

(ඇ) අධිකාරිය සතුව පවතින ටග් යාත්‍රා සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ සියළු වරාය වල නාවික මෙහෙයුම් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන වසර 15 -30ක් දක්වා වූ ජීවිත කාලයක් වන පැරණි යාත්‍රා වන නමුත් එයින් යාත්‍රා 06ක් ම වසර 10 – 15 ජීව කාණ්ඩයට අයත් වේ.

අප සැළසුම් කර ඇති පරිදි ටග් යාත්‍රා සඳහා අළුත්වැඩියා කටයුතු සිදු කිරීමේ දී පාලන මැදිරිය සඳහා සේවය කරන අධිබලයක් ඇති (Duty Tugs) අළුත්වැඩියා කටයුතු කිරීමට ප්‍රමුඛත්වය ලබාදෙයි. ඒ අනුව ප්‍රමුඛත්වය දී ඇති ටග් යාත්‍රා වල අළුත්වැඩියා කටයුතු අවසන් වූ පසු සේවකයන් සිටින ප්‍රමාණය අනුව අනෙකුත් ටග් යාත්‍රා වල අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලබන බැවින් විගණන වාර්තාවේ සඳහන් ටග් යාත්‍රා වල අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇත. එසේ වීමට බොහෝ සේ බලපා ඇත්තේ දිනපතා සිදුවන දක්ෂතා ඇති සේවකයන්ගේ විශ්‍රාමයාමේ ක්‍රියාවලිය නිසා මේ වන විට ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති සේවකයන්ගේ හිඟතාවයන්ය.

කෙසේ වුව ද මේ වනවිට මෙම යාත්‍රාවන් දෙක කොළඹ වරායේ හා ත්‍රිකුණාමලය වරායේ සේවයේ යොදවා ඇත.

4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

(අ) නෞකා මෙහෙයුම් කටයුතු වලදි ජයබහළු පර්යන්තය විසින් සැපයිය යුතු සහායක සේවාවන් වන බහළු වල අඟුළු දැමීම/ අඟුල් නිදහස් කිරීම හා ශීත කළ බහළු වල උෂ්ණත්වය අධීක්ෂණය කිරීමේ සේවාවන් සඳහා වරාය අධිකාරියේ සේවකයන් යෙදවුයේ නම් විශාල වියදමක් දැරිය යුතු වේ. එම තත්ත්ත්වය තුළ දැනට ශ්‍රම වෙළඳපොළෙහි ගෙවනු ලබන ඉතා අඩු දෛනික වැටුපෙන් පදනම් කරගත් මිළක් යටතේ මෙම සේවාවන් ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගම හරහා ලබාගැනීමට කටයුතු කර ඇත.

(ආ) වරාය අධිකාරියේ අවශ්‍යතාවය මත අධිකාරිය වෙත කරනු ලබන ගෙවීම් කටයුතු වෙනුවෙන් ලංකා බැංකුව වෙත මුදල් එකතු කිරීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට කළමනාකාරිත්වයේ අනුමැතිය පරිදි කුලී රහිතව පරිශ්‍ර 03ක් ලබා දී ඇත. මෙම පරිශ්‍ර බලපත්‍ර කාර්යාලයේ කැනල් අංගනයේ හා පැලියගොඩ ගබඩා සංකීර්ණයේ පිහිටා ඇත. එකී මධ්‍යස්ථාන තුළ සාමාන්‍ය බැංකු කටයුතු සිදුනොවන අතර වරාය භාවිතා කරන්නන්ගේ බැංකු කටයුතු පමණක් කරනු ලැබේ.

වරාය සේවකයන්ගේ වැටුප් බැංකු මගින් ලබාගැනීමට කටයුතු කර ඇති බැවින් සේවකයන්ගේ සුභසාධනය සඳහා වරාය පරිශ්‍ර තුළ බැංකු කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

එම බැංකු වරාය පරිහරණය කරන්නන් හා අධිකාරියේ සේවකයන් පමණක් භාවිතා කරනු ලැබේ. මෙම කරුණු සැළකිල්ලට ගෙන හැටන් නැෂනල් බැංකුවේ ඒ ටී එම් යන්ත්‍ර පවත්වාගෙන යන පරිශ්‍ර 02 හා මහජන බැංකුව පවත්වාගෙන යන පරිශ්‍රය නාමික කුළියකට ලබා දී ඇත.

(ඇ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් 2007 වසරේ පෙබරවාරි මාසයේ දී ගාලු වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පැසිපික් කන්සල්ටන්ස් ඉන්ටර්නැෂනල් (PCI) උපදේශන සමාගම පත්කර ගන්නා ලදී. මෙම උපදේශන සමාගම විසින් විස්තරාත්මක සැළැස්ම නිර්මාණය කිරීම සහ ටෙන්ඩර් වල තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් ඇතුළත්ව ව්‍යාපෘතියට අදාළ පෙර ඉදිකිරීම් අදියර දක්වා සියළුම සේවාවන් නිමකරන ලදී. මේ උපදේශන සමාගමට රුපියල් මිලියන 455.5ක් ගෙවා තිබුණි. නමුත් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව මෙන් තුන් ගුණයක් පමණ වූ ඉතා අධික මූල්‍ය යෝජනාවන් ලැබීම හේතුවෙන් බලාපොරොත්තු වූ පරිදි ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය.

මේ අතරතුර කාලයේ දී PCI සමාගමේ උපදේශන අත්දැකීම් හා ප්‍රවිණයන් ඇතුළුව සියළුම උපදේශන ව්‍යාපාර කටයුතු ඔරියන්ටල් කන්සල්ටන්ස් (OC) නමැති ජපන් සමාගම විසින් අත්කර ගන්නා ලදී.

එබැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්ව අනුමැතිය ඇතිව නව උපදේශන සමාගමේ සේවාව යොදා ගනිමින් ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කර සමස්ථ ගාලු මුහුදු බොක්කම ආවරණය වන පරිදි දියකඩනයක් ඉදිකිරීම සඳහා සැළසුම් සකස් කරමින් සිටී. මෙම ව්‍යාපෘති සඳහා ඉහත ව්‍යාපෘතිය සඳහා වූ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ ආධාර යොදා ගැනීමට නියමිතය. ව්‍යාපෘතියේ නව විෂය පථය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ද, වෙරළ සංරක්ෂක දෙපාර්තමේන්තුවේ ද, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ද අනුමැතිය ලැබී ඇති අතර යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

(ඈ) කොළඹ වරාය පුවල් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබුවේ කොළඹ වරායේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නිර්දේශය මතය. මෙම ව්‍යාපෘතියේ දියකඩනය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සාර්ථකව නිමකර ඇති අතර දකුණු බහළු පර්යන්තයේ පළමු මීටර් 400හි බහළු මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත.

4.5 ආර්ථික නොවූ ගණුදෙනු

(අ) ඔලුවිල් අභ්‍යාස ආයතනය පිහිටුවීමේ අරමුණ ඉටුනොවී එය පවත්වා ගැනීමෙන් අධිකාරියට දරන්නට සිදුව ඇති විශාල අතිරේක වැය බර පිළිබඳව ඉහළ කළමනාකාරීත්වයේ අවධානය යොමු වී ඒ සඳහා ක්‍රියාත්මක කරන්නට යෙදුන සැළසුම් පිළිබඳව පැහැදිලි කරන ලදී. එම සැළසුම් සම්බන්ධයෙන් 2013.05.23 දින පැවති වරාය අධිකාරියේ කළමනාකරිත්ව කමිටු රැස්වීමේ දී එම ආයතනය අග්නිදිග විශ්ව විද්‍යාලයට කුලී පදනමින් පැවරීමේ කාර්ය සහ එහි කාර්යය මණ්ඩලය කොළඹ වරායට ස්ථාන මාරුකිරීම පිළිබඳවත් තීරණ ගෙන ඇත. ඒ අනුව මේ වන විට ඔලුවිල් අභ්‍යාස ආයතනය අග්නිදිග විශ්ව විද්‍යාලයට පැවරීම සිදුකර ඔලුවිල් අභ්‍යාස ආයතනයේ කාර්යය මණ්ඩලය කොළඹ වරායට ස්ථාන මාරුකිරීම සඳහා ක්‍රියාකරමින් සිටී.

(ආ) EDI නෙට්වර්ක් පුද්ගලික සමාගම (රු.500,000)

සමාගමේ රු.500,000ක් කොටස් මිළදී ගෙන තිබූ අතර 2013.09.10 දින වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය පරිදි පොත් වලින් කපා හැර ඇත.

සී/ස ලංකා කෝල් පුද්ගලික සමාගම (රු.2,000,000)

ලංකා කෝල් සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීමේ දී 2012 වර්ෂයේ වාණිජ මෙහෙයුම් වලින් ඉපැයූ ලාභයෙන් කොටසක් හවුල්කරුවන් වෙත ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. නමුත් ලංකා කෝල් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය 2012 වසරේ ගිණුම් මේ වන තෙක් අවසන් කර නොමැත. එබැවින් ලංකා කෝල් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය ඇතිකරගෙන තිබෙන ගිවිසුම අනුව ඉහත සඳහන් ගිණුම් කටයුතු අවසන් වන තෙක් හා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් ප්‍රතිපූර්ණය කිරීම සිදුවන තෙක් ලංකා කෝල් සමාගමට කිසිදු ලාභාංශයක් ගෙවීමට නොහැකි බව දන්වා ඇත.

(ඇ) i/ii

ටග් යාත්‍රා ගනු ලබන්නේ දෛනික පදනම මත නොව මාස 03 හෝ 06 වැනි කාලයක් සඳහා කුලී පදනම මත වේ. එබැවින් නාවික ගමනාගමන කටයුතු යෙදෙන ආකාරය අනුව ටග් යාත්‍රා වල මෙහෙයුම් කටයුතු සඳහා යොදවනු ලබන වාර ගණන තීරණය වේ. දැනට කුලී පදනම මත පසුගිය වසර වලදී ලබාගෙන ඇති ටග් යාත්‍රා වලින් එක් ටග් යාත්‍රාවකට දිනකට ගෙවා ඇති උපරිම මුදල ඇමරිකන් ඩොලර් 4,250ක් පමණි.

4.6 හඳුනාගත් පාඩු

(අ) මෙම සිද්ධිය සම්බන්ධයෙන් දැනට අල්ලස් හා වංචා විමර්ශන කාර්යාංශය විසින් පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් වූ විගස අදාළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත. එමෙන්ම 1979 අංක 58 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීමේ පනතෙහි අයිතම් අංක 42(ඒ) යටතේ මෙම අඩුවෙන් අය කරගෙන ඇති ගාස්තු අදාළ නෞකා සමාගමෙන් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගනිමින් පවති.

(ආ) 2006 වර්ෂයේ සිට 2009 දක්වා වූ අයවිය යුතු බිල්පත් ගාස්තු අයකර ගැනීම සඳහා නොකඩවාම කටයුතු කළ ද රාජ්‍ය ආයතන මුදල් ගෙවීමේ දී මූල්‍ය රෙගුලාසි වලට යටත්ව ලබා දී ඇති මුදල් ප්‍රතිපාදන යටතේ සහ රාජ්‍ය මූල්‍ය නීති පද්ධතියක පාලනයට යටත් ව සිදුකරන බැවින් ද රාජ්‍ය ආයතන වෙත සපයන සේවාවන් අත්‍යවශ්‍ය සේවා ලෙස සලකන බැවින් එම සේවාවන් අත්හිටුවා ගාස්තු අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයකට යාමට ද නොහැකිවීම වැනි හේතූන් නිසා රජයේ ආයතන වලින් අයවිය යුතු ගාස්තු අයකර ගැනීමට නොහැකි වීම හෝ ප්‍රමාදවීම සිදුවේ.

රටේ යුධමය වාතාවරණයක් පැවති අවධියේ දී රටේ හා වරායේ ආරක්ෂක කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව කරන ලද සේවාව සළකා මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ලබාගන්නා ලද සේවාවන් සඳහා ඒ වන විට ගෙවිය යුතුව තිබූ ශේෂය කපාහරින ලෙස නාවික හමුදාවෙන් වරින් වර සභාපතිතුමා වෙත කරන ලද ඉල්ලීම් ද සළකා බැලීමෙන් අනතුරුව 2006 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අයවිය යුතුව තිබූ රු.105,491,135ක මුදලක් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත ලියාහැරීමට කටයුතු කරන ලදි.

(ඇ) ජෙට් ලයිනර් නෞකාව 2009ට පෙර යුධමය කාල පරිච්ඡේදයේ දී යොදාගනු ලැබුවේ හමුදා භටයින් ප්‍රවාහනයට සහ හමුදාවට සහ උතුරේ ජනතාවට අවශ්‍ය අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහායි. එම නිසා එම කාලය තුළදී මෙකී නෞකාව වාණිජ පදනමකින් සේවය සඳහා යොදවා නොගත් බව අපගේ හැඟීමයි. එසේ හෙයින් 2007 වසරේ සිට 2009 දක්වා වූ අයවිය යුතු ශේෂයන් යුධ වාතාවරණය සළකා කපා හරින ලෙස නාවික හමුදාව කරන ලද ඉල්ලීම සළකා බලා 2011 වර්ෂයේ දී එම වර්ෂයේ

සමාලෝචිත වර්ෂයට අදාළව ලියාහරින ලද අවස්ථාවේ දී ජෙට් ලයිනර් නෞකාවට අදාළ වූ ශේෂයක් ද ලියාහරින ලදී.

(ඇ) රු.1,190,621ක් සඳහා නීතිපති විසින් නීතිමය පියවර ගැනීමට නොහැකි බව දන්වා ඇති බැවින් එම මුදල පොත් වලින් ලියා ඉවත් කිරීමට කටයුතු කෙරේ. ඉතිරි රු.1,466,250ක් ගෙවීම අදාළ ආයතනය පැහැර හැර ඇති බැවින් නැවත නීති උපදෙස් ලබාගැනීමට කටයුතු කෙරේ.

(ඉ) වසර ගණනාවක් තිස්සේ අයකරගැනීමට නොහැකි වූ බැවින් පොත් වලින් ලියා ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

4.7 නිශ්ක්‍රීය ඌණ උපයෝජන වත්කම්

මෙම දොඹකර අලුතින් සවි කළද ඒවා ධාවනය කිරීම සඳහා තිබූ යකඩ පිලි ඒ සඳහා සුදුසු තත්ත්වයක නොතිබුණි. ඒ අනුව නැවත එය අලුතින් තැනවූ අතර ඒ සඳහා වසරකට ආසන්න කාලයක් ගතවීය. මීට අමතරව නව දොඹකර පාවිච්චිය සඳහා පැරණි දොඹකර සඳහා අයකරන ලද ගාස්තුව වූ පැයකට ඇමරිකානු ඩොලර් 06 ප්‍රමාණවත් ගාස්තුවක් නොවූ බැවින් එය වැඩි කිරීමට අනුමැතිය ලබාගැනීමට ප්‍රමාදවීම ද මෙම දොඹකර සේවා කටයුතු සඳහා යොදවා ගැනීම ප්‍රමාදවීමට තවත් හේතුවක් විය. කෙසේ වුවද මේ වන විට මෙම දොඹකර 02 මෙහෙයුම් කටයුතු සඳහා යොදවාගෙන ඇත. මේ වන විට පැයකට ඇමරිකානු ඩොලර් 40ක අයකරගෙන (භාණ්ඩගාර අනුමැතිය මත) නැව් සමාගම් වලට සේවය සපයනු ලැබේ.

බොහෝමයක් සාම්ප්‍රදායික නෞකා වල ඔවුන්ගේ ම නෞකා දොඹකර ඇති නිසා ඒවායින් නැව් බඩු ගොඩබෑම හා පැටවීම සිදුකරයි. දොඹකර නොමැති නෞකා වලින් නැව් බඩු මෙහෙයුම් කිරීමට මෙම වරායට පැමිණි අවස්ථා වලදී එම දොඹකර වල සේවාව ලබාගැනීමට කටයුතු කර ඇත.

4.8 වෙනත් ආයතන වෙත වත්කම් මුදාහැරීම

වරාය අධිකාරියට බාහිර කටයුතු සඳහා මාධ්‍ය ආවරණය කිරීමේ දී විගණන කමිටුව ලබාදුන් උපදෙස් පරිදි කටයුතු කිරීමට අවශ්‍ය විධිවිධාන මේ වන විට යොදා ඇති අතර මීට පෙර වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය ලෙස පැවතිය දී අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යවරයාගේ කටයුතු මෙන්ම අමාත්‍යාංශයේ කටයුතු සඳහා මාධ්‍ය සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට වෙනම කාර්ය මණ්ඩලයක් සිටිය ද නව අමාත්‍යාංශ වෙන් කිරීමත් සමඟ වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය වෙත තිබූ මාධ්‍ය කාර්යය මණ්ඩලය ගුවන්සේවා අමාත්‍යාංශය සඳහා ස්ථාපිත කිරීම හේතු කොටගෙන වරාය අමාත්‍යාංශය වෙනුවෙන් මාධ්‍ය කාර්යය මණ්ඩලයක් නොමැති විය. එම නිසා වරාය අමාත්‍යාංශය වෙනුවෙන් මාධ්‍ය කාර්යය මණ්ඩලයක් ලබාගැනීම පිණිස මුදල් අමාත්‍යාංශය වෙත ලිඛිතව දන්වා ඇත.

එසේම මින් ඉදිරියට මාධ්‍ය ආවරණ ලබාදීමේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියට පමණක් අදාළව එම කටයුතු කිරීමටත් වරාය අධිකාරියට සෘජුව අදාළ නොවන කිසිදු කටයුත්තක් වෙනුවෙන් මාධ්‍ය ආවරණ ලබාදීම සඳහා කටයුතු නොකිරීමටත් අමාත්‍යාංශය සඳහා මාධ්‍ය කාර්යය මණ්ඩලයක් ලබාගැනීම කඩිනම් කිරීමටත් කටයුතු කරනු ලැබේ.

5. ගිණුම් කටයුතු හා යහ පාලනය

5.1 සංයුක්ත සැළැස්ම

(අ) 2015 වන විට ආසියාවේ ප්‍රධානමතම නැව් මෙහෙය වන වරාය බවට පත්කිරීම සඳහා විවිධ ක්‍රමෝපායන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දියත් කර ඇති අතර එය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා "VISION 2020" නමින් 2013 වසරේ සිට 2020 දක්වා වූ නව

ක්‍රමෝපායන් සැලැස්මක් ඉදිරිපත් කර ඇත. 2011 වසරට සාපේක්ෂව 2012 වසරේ දී සමස්ථයක් වශයෙන් සුළු පසුබෑමක් පෙන්නුම් කළ ද 2013 වසරෙහි ඔක්තෝබර් වන විට එම තත්ත්වය මගහරවමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන බහළු පර්යන්ත වලින් බහළු මෙහෙයුම් ප්‍රමාණයෙහි 8%ක වර්ධනයක් පෙන්නුම් කිරීමට හැකි වී ඇත.

(ආ) එලිසබෙත් රැජින පර්යන්තය BOT පදනම යටතේ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගමට මෙහෙයුම් කටයුතු සඳහා භාරදීමත් සමඟ තරඟකාරී ස්වභාවයක් ගැනීම සාමාන්‍ය ස්වභාවයකි. එසේ වුවද ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන ජය බහළු පර්යන්තයෙහි හා සමගි බහළු පර්යන්තයෙහි මෙහෙයුම් කළමනාකරණ පද්ධතියෙහි සිදුකළ නවීකරණයන් හා සේවකයින් දැනුවත් කිරීමේ වැඩ සටහන් තුළින් ක්‍රමිකව ඵලදායිතාවය නංවාලීමට කටයුතු කර ඇති අතර ඒ තුළින් වෙළඳපොළ කොටස 57% ක මට්ටමකින් පවත්වා ගැනීමට හැකි වී ඇත. තවද 2013 වසරෙහි ඔක්තෝබර් මස වන විට 2012 වසරට සාපේක්ෂව සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගමෙහි මෙහෙයුම් කළ බහළු ප්‍රමාණය විස්සේ සම ඒකක 106,000කින් පමණ අඩුවන විට ජයබහළු හා සමගි බහළු පර්යන්ත දෙකෙහි මෙහෙයුම් කළ බහළු ප්‍රමාණය විස්සේ සම ඒකක 170,000කින් පමණ වැඩි කරගැනීමට සමත් වී ඇත. ඒ අනුව දැනට ක්‍රියාවට නංවමින් පවතින "VISION 2020" ක්‍රමෝපාය සැළැස්ම තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි මෙහෙයුම් කටයුතු වල වර්ධනයක් අපේක්ෂා කෙරේ.

(ඇ) දැනට ක්‍රියාවට නංවා ඇති "VISION 2020" සත් අවුරුදු ක්‍රමෝපායන් සැළැස්මට අනුව ගාලු වරාය තුළ සැහැල්ලු රුවල් යාත්‍රා (Yacht) වලින් පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇති අතර ඒ තුළින් සංචාරකයින් දකුණු පළාතට ආකර්ශනය කර ගැනීමට කටයුතු කරමින් සිටී. තවද වරායෙන් පිටත නැංගුරම්ලා ඇති නෞකාවන්ට (Out Port Limit (OPL)) අවශ්‍ය සේවාවන් සැපයීම තුළින් සැළකිය යුතු ආදායමක් ඉපැයීමට හැකි වී ඇත.

06. පද්ධති පාලනය

විගණන වාර්තාවේ දැක්වෙන ක්ෂේත්‍රයන් පිළිබඳව මනා අභ්‍යන්තර පාලන ක්‍රම අනුගමනය කරමින් පවති. ඒ අනුව

(අ) මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලිය 2012 වර්ෂයේ දී නව ගිණුම්කරණ ප්‍රමිත භාවිතාකරමින් ORACLE පරිගණක පද්ධතිය හරහා සිදු කෙරිණ. ඒ සඳහා ක්ෂේත්‍රයේ පළපුරුදු හා ව්‍යත්තීය නිපුණතාවයකින් යුතු ආයතනයක සහාය ද ලබාගන්නා ලදී. එහිදි එම නව ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව 2011 වර්ෂය හා 2010 වර්ෂයේ ද ගිණුම් සංශෝධනය කරන ලදී.

දැනට අධිකාරියේ ගිණුම් ප්‍රධාන වශයෙන් ප්‍රධාන ලෙජරය සහ නැව් නියෝජිත ආදායම් (Agent Revenue) ORACLE පරිගණක පද්ධතිය හරහා සිදු කෙරේ. මෙමගින් අධිකාරියේ ගිණුම්කරණ ක්‍රියාවලිය ඉතා කාර්‍යක්ෂමව හා නිවැරදිව සිදුකර ගැනීමට හැකිවී තිබේ. විශේෂයෙන්ම නැව් නියෝජිත ආදායම් ORACLE පද්ධතිය හරහා සිදුවීම තුළින් නැව් නියෝජිතයන්ගෙන් ලැබෙන ආදායම කාර්‍යක්ෂමව එකතුකර ගැනීමට හැකිවීම, බිල්පත් නිරවුල් කිරීම කාර්‍යක්ෂම වීම මගින් අධිකාරියේ ආදායම ඉහළ නංවාලීමට හැකිවීම පමණක් නොව එම ගණුදෙනු කාර්‍යක්ෂමව ගිණුම්ගත වීමෙන් ආයතනයේ ගිණුම්කරණ ක්‍රියාවලිය ද මනා පාලනයකින් සහ කාර්‍යක්ෂමව සිදු කෙරේ.

(ආ) නැව් නියෝජිත ආයතන වලට සේවාවන් සැපයීමේ දී නෞකාවක් වරායට පැමිණීමේ සිට පිටත්වීම දක්වාත් නෞකා විසින් ගෙන එන ලද භාණ්ඩ වරායෙන් පිටතට යාම දක්වාත් සපයනු ලබන සේවාවන් වැඩි ප්‍රමාණයක් සඳහා බිල්ගත කිරීම් පරිගණක පද්ධතියක් තුළින් සිදුවේ. එසේම ප්‍රායෝගිකව පරිගණක ගත කළ නොහැකි බිල්ගත

කිරීම සුළු ප්‍රමාණයක් තිබුණ ද ඒ සඳහා ද පාලන ක්‍රම යොදා ඇති බැවින් මනා පාලනයකින් සිදුවේ. ගාස්තු අය කිරීමේ දී මේ වන විට බොහෝ සේවාවන් සඳහා අත්තිකාරම් ලබා ගැනීමෙන් අනතුරුව සේවාවන් සැපයීම සිදුකරන බැවින් අයවිය යුතු ණය ප්‍රමාණය සීමා කර ගැනීමට හැකිව ඇත. එහෙත් රජයේ ආයතන සහ රජයේ හමුදා වලින් ගාස්තු අයකර ගැනීමේ දි පුද්ගලික නැව් නියෝජිතයින්ට ගනු ලබන ක්‍රියාමාර්ග ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ නොහැකි බැවින් එම ගාස්තු අයකර ගැනීමේ ප්‍රමාදයක් පවතී.

එසේම නීතිමය කටයුතු සඳහා යොමු කර ඇති අයවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදුවනුයේ උසාවි තීන්දු වලින් අනතුරුව බැවින් එම තීන්දු ප්‍රමාදවීම නිසා ණය අයකර ගැනීම අපහසු වී ඇත.

(ඇ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආයෝජන ප්‍රශස්ථ පොලී ආදායමක් ලැබෙන අයුරින් සිදුකරයි. එහිදී ආයෝජන මුදල් වලට ඇති අවදානම ද සළකා බලනු ලබයි. අධිකාරියේ එදිනෙදා ආදායමෙන් වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කළ පසු ඉතිරි වන ආදායම ප්‍රති මිළ දී ගැනීම් (Repo Investment) එක් දින ආයෝජන (Over Night Investment) ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරනු ලබයි. මෙසේ ආයෝජන සිදුකිරීමට අධිකාරිය ඉතා විශ්වාසනීය මූල්‍ය ආයතන තෝරාගෙන ඇත. (මහජන බැංකුව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව) ප්‍රශස්ථ පොලී ආදායමක් ලබාගැනීම සඳහා ආයෝජනය සිදුකිරීමට පෙර මෙම මූල්‍ය ආයතන වලින් පොලී අනුපාත විමසා බලන අතර, ඉහළ පොලී අනුපාතයක් ලබාදෙන මූල්‍ය ආයතනයේ ආයෝජනය කරනු ලබයි. තවද මෙසේ ආයෝජන සිදුකිරීමේ දී අනාගතයේ දී දැරීමට සිදුවන වියදම් ද සළකා බලා මූල්‍ය අර්බුදයක් ඇති නොවන අයුරින් ආයෝජනය කරනු ලබයි.

(ඉ) සැපයුම් ද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය වඩා කාර්‍යක්ෂමව හා නිවැරදිව ඉටුකිරීමේ අරමුණින් ORACLE පරිගණක පද්ධතිය දැනට ක්‍රියාත්මක වෙමින් පවති. ඉදිරියේ දී තොග පාලන කටයුතු මේ හරහා පුළුල්ව ක්‍රියාත්මක කිරීමට හැකිවනු ඇත.

(ඊ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම් උපයෝජනය නංවාලීම සඳහා වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. මෙය දැනට CARDARS පරිගණක පද්ධතිය හරහා සිදුකරන අතර ඉදිරියේ දී වත්කම් වල උපයෝජනය තවදුරටත් වැඩි කිරීමට ORACLE පරිගණක පද්ධතිය හඳුන්වාදීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී.



ආචාර්ය ප්‍රියත් බී වික්‍රම
සභාපති

නම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ව්‍යවස්ථාපිත තත්ත්වය

1979 අංක 51 දරණ පාර්ලිමේන්තු පනතේ විධි විධාන ප්‍රකාරව කොළඹ වරායේ කොමිෂන් සභාව, වරාය නැව්බඩු සංයුක්ත මණ්ඩලය හා වරාය සැසැඳුම් හා ආක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කර 1979 අගෝස්තු 01 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවනු ලැබීය.

සංස්ථාපිත වටිනාකම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය දේශීය ආර්ථිකයට පුළුල් දායකත්වයක් දක්වන ආයතනයකි. ආදයම් උපයන හා සේවා සපයන ප්‍රධාන පෙළේ ආයතනයක් වශයෙන් අධිකාරිය ඉටු කරනු ලබන කාර්යභාරය තුළින් එය විශිෂ්ඨ සේවාවක සෘජුවම නිරත වී ඇත. වරාය අධිකාරිය සමග විවිධ කාර්යයන්හි නිරත ආයතන හා සේවා දායකයන් සමග පවත්නා ක්‍රියාකාරී සම්බන්ධතාවය එහි දියුණුවට පදනම් වී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ගුණාංග පහත සඳහන් අයුරින් වර්ග කළ හැක.

- රඳා පැවැත්මේ හැකියාව
- කාලීනත්වය හා නිරවද්‍යතාවය
- කාර්ය සාර්ථකත්වය සඳහා වගකීම
- කණ්ඩායම් හැඟීම
- කැපවීම
- ඵලදායිතාවය හා ප්‍රත්‍යාභිඥාණය
- අවංක කාර්ය සාධනය

ඉහත සඳහන් සාර ධර්ම වරාය අධිකාරියේ සියළුම සේවක කොටස් කෙරෙහි පවත්වාගෙන යාම සභාපතිතුමාගේ, ප්‍රධාන විධියක නිලධාරි, කළමණාකාර අධ්‍යක්ෂතුමාගේ සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමණාකාර කාර්ය මණ්ඩලයේ වගකීම වේ.

ප්‍රධාන කාර්යාලය

කොළඹ වරාය

අංක. 19 වෛත්‍ය පාර
කොළඹ 01
දුරකථන: (+94 11) 2421201, 2421231
ෆැක්ස්: (94 11) 2440651

ගාල්ල වරාය

ක්ලොසන්බර්ග් ජැටිය
මාගාල්ල
ගාල්ල
දුරකථන: (+94 91) 2232213, 2234936

ත්‍රිකුණාමලය වරාය

ඇතුල් වරාය පාර
නව පරිපාලන ගොඩනැගිල්ල
චීන වරාය
ත්‍රිකුණාමලය
දුරකථන: (+94 26) 2222460

බැංකුකරුවෝ

ලංකා බැංකු (ප්‍රධාන බැංකුකරු)
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

විගණකයින්

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නො.306/72,පොල්දුව පාර
බත්තරමුල්ල

වෙබ් අඩවිය: www.slpa.lk